sinhalaebooks.com

# FIVE ARE TOGETHER AGAIN

Enid Blyton

පන් පසිඳුවන් 21

# අවසන් වික්‍රමය



අනුවාදය

දිලීප් ප්‍රසන්න

Scanned with CamScanner

sinhalaebooks.com



ENID BLYTON – FAMOUS FIVE 21

F I V E  A R E  T O G E T H E R  A G A I N

# පන් පසිඳුවන් 21

# අවසන් වික්‍රමය

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



DO NOT COPY

**FAMOUS FIVE – 21**

**FIVE ARE TOGETHER AGAIN**

**PAN PASINDUWAN – AWASAN WIKRAMAYA**

**Sinhala Translation by DILEEP PRASANNA SENEVIRATHNE**

**ද ස රු  ප්‍රකාශන**



Scanned with CamScanner

sinhalaebooks.com



ENID BLYTON – FAMOUS FIVE 21

FIVE ARE TOGETHER AGAIN

# පන් පසිඳුවන් 21

# අවසන් වික්‍රමය

DO NOT COPY

පරිවර්තනය

දිලීප් ප්‍රසන්න සෙනෙවිරත්න

ද ස රු ප්‍රකාශනයකි



Scanned with CamScanner

sinhalaebooks.com



# පෙරවදන

එනිඩ් බ්ලයිටන් විසින් ලියන ලද ෆේමස් ෆයිව් කතා මාලාවේ අවසන් කෘතිය සිංහලයෙන් ලියා තබනුයේ කුඩා කල රස විදි මතයක් සිහිපත් කිරීම පිණිස ම ය .මෙම කතා මාලාවට අයත් පෙර සඳහන් කෘතීන්හි සඳහන් කළ පරිද්දෙන් මෙය ද 2008-10 අතර කාලයේ කරන ලද පරිවර්තනයකි . ළමයෙකුව සිටි කලයේ ලියන ලද්දක් බැවින් ගුණ වලට වැඩි අවකාශයක දොස් පැතිර පැවතිය හැකි ය .

මෙය ද ඔබේ රස වින්දනයට හේතුවක් වේවා ය පතමි .

- මෙහි එන ඇතැම් සිතුවම් වර්ණ ගන්වා දුන් ගේ අවට පොඩි උන් සේරට ම ස්තූතියි .

දිලීප් ප්‍රසන්න

2021-8-2

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com








Scanned with CamScanner

sinhalaebooks.com



DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 01

# නිවාඩු කාලය නැවතත් ඇවිදින්

DO NOT COPY

" අනේ බං ජෝර්ජ් .. පොඩ්ඩක් දගලන්නෙ කරන්නෙ නැතු ව එක විදිහට ඉඳපන්කෝ .. කෝච්චියත් යන්නෙ ගැස්සි ගැස්සී හාවො පනින්නැහේ . ඉතිං උඹත් ඒ ජනේලෙන් මේ ජනේලෙට දුව දුව දගලද්දි මට හිතෙනෙම කොයි වෙලේ හරි මගේ කකුල් දෙක උඩ ම පත බෑවෙයි කියලා"

ජුලියන් නො රුස්සන ස්වරයෙන් එක පාරට ම කිව්වේ තව දුරටත් ඉවසාගෙන ඉන්න බැරි ම නිස යි . ඒත් ජෝර්ජ් නම් අබ මල් රේණුවක්



Scanned with CamScanner

sinhalaebooks.com



තරම් වත් ජුලියන්ගේ කතාව මායිම් කරන බවක් පෙනෙන්නට තිබුණේ නෑ .

" හරි හරී .. අපි දැං කිරින් වලට ගොඩාක් ළඟයි . ඉතිං උඹ මට කියන්නේ මේ විදිහට දඟලන්නේ නැතුව දත කට පියාගෙන බකන් නිලාගෙන ඔහේ ඉන්න කියල ද ? මට මුලු වාරයක් ම ටිමී ව දකින්න හම්බුනෙත් නෑ . ඉතිං මිට එයාව දකින කන් ඉවසිල්ලක් නෑ .අන්න ඒකයි මම ජනේලයක් ජනේලයක් ගානෙ දුව දුව හැම වෙලේම අපි කිරින් වලට කොච්චර ළං වෙලා ද කියලා බලන්නේ . මේ ඒක නෙමෙයි ඔයාලට හිතෙන්නෙ නැද්ද ටිමියා මෙලහටත් ස්ටේශමට ඇවිල්ලා අපි එනකන් බලාගෙන පිස්සුවෙන් වාගෙ බුර බුරා ඉන්නව ඇති කියල ?"

එවර නම් ඩික්ට බකස් ගා සිනා ගියේ ය .

" අප්පා ඔය තරම් මෝඩ වෙන්න එපා ජෝර්ජ්. ටිමී දක්ෂ බල්ලෙක් කියන එක නම් ඇත්ත . ඒත් ඉතිං ඌට දුම්රිය කාල සටහනක් කියවන්න තරම් දක්ෂතාවක් නම් කවදාවත් ලැබෙයි කියලා හිතන්ට බෑ"

ඩික් අයියා මොනවා කීවත් ජෝර්ජ්ගේ කතාවේ කිසියම් ඇත්තක් ද තියෙනව කියලයි ඈන්ට නම් හිතෙන්නේ . පුංචි ඈන් හරිම බැරෑරුම් විදිහට මේ වගේ කතාවක් කීවේ ඒ නිසයි .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" ඇත්තට ම ජෝර්ජ් ගෙදර එනව කියල දැනගන්න ටිමීට නම් කාල සටහනක් ඕන නෑ .ජෝර්ජ් ඉස්කෝලෙන් ගෙදර එන දවසට ටිමී දවස ම ගේට්ටුව ගාවට වෙලා මුර ලූ . පාරට එනව යි එහෙ මෙහෙ දුවනව යි එක ම විකාරයක් කරනව කියල ජෝර්ජ්ගෙ අම්මා කියනව"

" අනේ මගෙ අහිංසක ටි ..." මී අකුර සම්පූර්ණ කර ගන්නට ජෝර්ජ්ට එවර නම් අවස්ථාවක් ලැබුණෙ නෑ . ජුලියන් කල් ඇතුව ම කිව්ව වගේ ජෝර්ජ් එක පාරට ම ජුලියන්ගෙ කකුල් දෙක උඩට ඇදගෙන වැටුණේ පිටිමුට්ටයක් බිම අතෑරියා වගේ .ඒත් ඒත් ඉතිං හෙමින් හෙමින් නැගිට ගත්ත ජෝර්ජ් කිසිම දෙයක් සිද්ද නො වුනු ගානට ජනේලය දෙසට ඇවිදින්න පටන් ගත්තා . ඊ ළඟට අනික් අයගේත් කන් බිහිරි කරවන තරම් සද්දෙන් මෙන්න මෙහෙම බෙරිහන් දෙන්නත් පටන් ගත්තා .

" අපි කිරින් ස්ටේශමට හොඳට ම කිට්ටු වෙලා . අන්න බලන්න සිග්නල් පෙට්ටිය . සිග්නල් එක පහළට දාලා .. හුරේ ..."

ජෝර්ගෙ ඥාති සහෝදරයො දෙන්නා සහ සහෝදරිය ජෝර්ජ් දිහා බලා සිටියේ දරා ගන්නත් බැරි තරමේ පුදුමයකින් . ඇත්තට ම නිවාඩුවට ගෙදර එන හැම වතාවක ම ජෝර්ජ් හැසිරෙන්නේ මේ විදිහට ම තමයි . ඒකට හේතුව එයාගෙ මුළු මහත් ඔලු ගෙඩියම ටිමීගෙන් පිරී ඉතිරී යන නිසා කියලත් ජෝර්ගේ නෑදෑයො තුන් දෙනා දන්නවා . ජුලියන් හිනාවකුත් මූණෙ පුරෝගෙන ජෝර්ජ් දිහා තවත් ටික වෙලාවක් බලාගෙන හිටියෙ හරිම කල්පනාකාරී විදිහට . කොටට කපන ලද කොණ්ඩයත් , පිරිමි ළමුන් අදින ඇඳුම් ඇඳීමත් හේතු කොටගෙන එන්න එන්න ම ජෝර්ජ් කොල්ලෙක් වගේ පේනවා නේද



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



කියලා ජුලියන්ට හිතෙනවා . ජෝර්ගේ ඇස් වල වුනත් තියෙන්නේ හරිම අධිෂ්ටාන ශීලී බැල්මක් . ජෝර්ජ්ට හැමදාමත් ඕන වුනේ කොල්ලෙක් වගේ වෙන්න කියලා ජුලියන් දන්නවා . කට හඬින් , සිතුම් පැතුම්වලින් විතරක් නෙමෙයි හැසිරීමෙනුත් ජෝර්ජ් උත්සාහ කළේ පිරිමි ළමයෙක් වගේ ඉන්න . ජෝර්ගේ සැබෑ නම වූ ජෝර්ජිනා යන්නෙන් කවුරු හරි ඇට කතා කළොත් ඈ උත්තර නොදී ඉන්න පුරුදු වුනෙත් කොල්ලෙක් වගේ පෙනී ඉන්න එයාට තිබ්බ මෙන්න මේ අමුතු විදිහේ පිස්සුව නිසා ම යි .

" ඔන්න ඔන්න අන්තිමේදී අපි කිරින් ස්ටේශමට ආවා" මහා හයියෙන් ගිරිය යටින් අත් දෙකත් උස්සගෙන ජෝර්ජ් බෙරිහන් දුන්නා . සත්තකින් ම ඈ ජනේලයෙන් එළියට වුනත් පනින්න ඉඩ තියෙනවා කියලයි අනික් ළමයින්ට සිතෙන්නේ ." මට අන්න අපේ පෝටර්ලා පේනවා ... හලෝ .. පීටර් ... ඔන්න අපි ආයෙත් ගෙදර ආවා. අපි ආයේ ගෙදර ආවෝ ..."

ජෝර්ජ් කීවාක් මෙන් ඔවුන් රැගත් කෝච්චිය බොහෝම දිග ගමනකට පස්සෙ අන්තිමේ කිරින් දුම්රිය ස්ටේශමට සේන්දු වුනා . ජෝර්ජ් දුම්රියේ සිට ම හඬ ගෑ පීටර් ජෝර්ජ් දිහාවට අතක් වනමින් සිටියා . ජෝර්ජ් අත දරුවා කිරි සප්පයා කාලෙ ඉඳල ම තමයි පීටර්ස් එයාව දැන හඳුනගෙන හිටියේ . දුම්රිය නතර වෙනවත් එක්ක ම වගේ එක පාරට ම දොර හැර ගත්ත ජෝර්ජ් එක පාරට ම බිමට පැන්නේ ටිමී ව දැක බලා ගන්න තිබ්ච්ච ඉස්පාසුවක් නැතිකම නිසාම යි .

ඒ වුනත් ඒ වුනත් ජෝර්ගේ බලාපොරොත්තු සේරම කුනාටුවකට අහුවුනා වගේ හේදිලා යන්න වැඩි වෙලා ගත වුනේ නෑ . ඇත්තට ම



DO NOT COPY
Scanned with CamScanner

sinhalaebooks.com



සිද්ද වුනේ ජෝර්ජ් හීනෙකින් වත් හිතුවෙ නැති දෙයක් බව නම් නොකියා ම බෑ . ජෝර්ජ් මොන තරම් බලා පොරොත්තුවෙන් හිටියත් ඇගේ ආදරණීය බල්ලා ටිමී තම ස්වාමිදුව පිළි ගන්නට ස්වේශමට ඇවිත් හිටියේ නෑ .

" ඔයා අද එනව කියලා සමහර විට ටිමීට අමතක වෙන්න ඇති . සමහර විට කාලසටහන කියවද්දි ඌට පොඩ්ඩක් වැරදුනාද දන්නෙත් නෑනේ"

ඩික් සමච්චල් සහගත හඬකින් එහෙම කියන කොට කුඩා දැරියට දැනුනේ දරා ගන්න බැරි තරම් ශෝකයක් . ඒ වගේ ම කෝපයක් . ඇය යක්ෂාවේශ බැල්මකින් පුරුදු විදිහට ම ඩික්ට සංග්‍රහ කළේ අන්න ඒ නිස යි . ඒ අතර පීටර්ස් සිනාවෙන් මූණ පුරවාගෙන ඔවුන් දිහාවට ආවා . පුරුදු විදිහට ළමයි සිව් දෙනාව පිළි ගන්නත් ඔහු අමතක කළේ නෑ . මේ පන් පසිඳු ළමයි පිරිස - ඒ කියන්නේ ටිමී හෙවත් ඔවුන්ගේ සුරතල් බල්ලා ද ඇතුලු ව - දැන් නම් නාඳුනන කෙනෙක් කිරින් වල ඇත්තේ ම නැති තරම්.ළමුන්ගේ බඩු බාහිරදිය ලට්ට ලොට්ට සියල්ල ම හනි හනික ට්‍රොලියට පටවා ගත්ත පීටර්ස් ඔවුන්ට මෙන්න මෙහෙම කිව්වා .

" මම මේ බඩු ටික ඉක්මනට ම කිරින් කොටේජ්වලට එවන්නම් . වෑන් දැන් එයි . ඉතිං කොහොමද ඉස්කෝල කාලෙ ජීවිතේ එහෙම ?"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" නියමයි" යි ඔහුට උත්තර දුන්නේ ඩික් විසින් . " ඒත් ඉතිං ඉස්කෝල කාලෙ දැනෙන්නේ නම් ගොඩාක් දිග කාලයක් විදිහට . කොහොමත් මේ සැරේ පාස්කු වලට නිවාඩු දුන්නේ වෙනදාට වඩා ගොඩාක් පරක්කු වෙලානෙ . අම්මෝ අර බලන්නකෝ ප්‍රිම්රෝස් මල් වැව්ලා තියෙන ඇටි . මොනතරම් ලස්සනයි ද ?"

මොන තරම් ලස්සන දේවල් තිබ්බත් ජෝර්ජ් නම් ඒ කිසි දෙයක් දිහා ඇහැක් වත් ඇරලා බැලුවේ නෑ . ඒ වෙනුවට එයාගෙ හිත පුරා ම වැඩ කරන්නේ ටිමී ගැන සිතිවිලියි . ඇත්තට ම ටිමී කොහෙද ? දුම්රිය පොළේ ම කොහේ හරි තැනක උඹ ඔවුන් ව හොයා ගන්නට බැරි ව අතරමං වෙලාවත් ද ? මේ වතාවේ වෙනදා මෙන් ඈ පිළි ගැනීමට ටිමී නාවේ කුමක් නිසා ද ? අනික් හැම සැරයක ම එන ටිමීගේ මේ වෙනස් වීමට හේතුව කුමක් විය හැකි ද ? මෙන්න මේ විදිහේ අටෝරාශියක් සිතුවිලි ජෝර්ජ්ගේ සිතට මේ මොහොතේ නැගෙනව . ඒ සැම සිතුවිල්ලක් ම ඇයට ගෙන එන්නේ බියකරු හැඟුම් සමුදායක් .

" ඩික් . ඔයාට හිතෙන්නෙ නැද්ද ටිමීට අසනීප වෙලා හරි මාව අමතක වෙලා හරි කියල .. නැත්තම් ..."

ජෝර්ජ් ඊ ළගට කියන්න ගියේ මොකක් වුනත් ඒක ඒ තරම් හොඳ කතාවක් නම් නොවන බව ඩික්ට දැනෙනවා . තරමක සැර පරුෂ හඬක් මුවට නගා ගනිමින් ඇගේ කතාවට බාදා කරමින් ඩික් මෙහෙම කීවේ ඒ නිස යි .



DO NOT COPY

sinhalaebooks.com



" නිකන් කට කැඩිච්ච කතා කියන් නැතිව ඉන්නවා ජෝර්ජ් . මෝඩියක් වගේ හැසිරෙන එකේ තේරුම මොකක්ද ? ටිමී මෙලහටත් එන්න විදිහක් ඇතුව ගෙදරට වෙලා ඔයා එනකන් මග බලාගෙන ඇති . ඕන්න ඔන්න බලාගෙන . අයියෝ තව චුට්ටෙන් අර ට්‍රොලියට ඔයාව හැප්පෙනවත් එක්ක"

ජෝර්ජ් බූකවා බුම්මා ගත්තා . ඩික් කුමක් කීවත් ටිමී අසනීපයෙන් බව ඇයට දැනෙනවා . එහෙම නැත්තම් මොකක් හරි අණතුරක් වෙලා වත් ද කියලත් ඇයට හිතෙනව . එතකොට නම් ජෝර්ජ්ට දැනෙන්නේ බඩ පපුවත් එක්ක පිච්චිලා යන ගතියක් . සමහරක් විට ගෙදර ඉවුම් පිහුම් කටයුතු කරන ජොආනාට ටිමියා ලිහන්නට අමතක වුනා වත් ද කියන සැකයත් ඇගේ හිතට නැගෙනවා .

" අනෙ මට සල්ලි තිබ්බ නම් මම ඉක්මනට ටැක්ශියක් අරන් ගෙදර යනවා" හිතුවක්කාරී ලෙසින් පසුම්බිය සාක්කුවෙන් පිතටට අදිමින් ජෝර්ජ් කිව්වා . " ඔයාලට පුලුවන් වටේ පිටේ සිරි නරඹ නරබා ගාට ගාටා ගෙදරට එන්න . මීට කළින් කවදාවත් කෝච්චිය එන වෙලාවට ටිමී නැවිදින් ඉදලා නෑ . මං එයා ගැන හොයල අලන්න ඕන . මට නම් හිතෙන්නෙම එයාට මොකක් හරි කරදරයක්"

" අනේ අනේ ටිමීට කිසිම කරදරයක් වෙලා නෑ ජෝර්ජ් . අනික් එක ඔයත් කැමතියිනෙ වෙනදට කිරින් කොටේජ් වලට පයින් ඇවිදගෙන ම යන්න . හිතන්න යන අතරෙ අපිට දකින්න ලැබෙන දේවල් .. ඔයාගෙ ආදරණීය දූපත .. කිරින් බොක්ක .... ඒක වටේට තියෙන ගල් පර්වත ..ඇයි ඒ ගල් පර්වත වල මුහුදු රළ වදින සද්දෙ අහගෙන ඉන්නත් ඔයා ආසයිනෙ .."



Scanned with CamScanner

sinhalaebooks.com



ඇත්තට ම ඈන් ඒ වගේ කතාවක් නම් කිව්වේ ජෝර්ජ්ගේ කලබලකාරී හිත හැදෙන්නත් එක්කයි . ඒත් ජෝර්ජ්ට ඈන්ගෙන් නම් ලැබුනේ ටිකක් සැර වැඩි උත්තරයක් බව නම් කිව යුතුයි

" ටැක්ෂියක් අරන් යන්න තරම් සල්ලි පර්ස් එකේ තියෙනවා . මම කුලියට වාහනයක් අරන් ඉක්මනට ගෙදර යනවා . ඔයාලා කැමති නම් මාත් එක්ක එන්න පුලුවන් . නැත්තම් සිරි බල බලා ඇවිදගෙන එන්න . ටිමී ගැන මට තරම් රුදාවක් කොහොමත් ඔයාලට තියෙන්න හැටියක් නෑනේ . මට ඕන මගේ ටිමී බලන්න විතරයි . නල්ල මලේ දූපත් . මුහුදු රැළි . මට ඔච්චගෙන් ඇති වැඩක් නෑ . ටිමී එක්කො ලෙඩ වෙලා . නැත්තම් ඇක්ෂිඩෙන්ට් වෙලා .මට ඒක දැනෙනවා"

" හරි හරි උඹට ඕන මගුලක් කර ගනින්කෝ" යි කියන්නට ජූලියන්ට සිතුනත් ඔහු කතා කළේ ජෝර්ජ්ගේ කනස්සලු සිත තේරුම් ගත්තාක් වැනි ස්වරූපයකිනි .

" හරි ජෝර්ජ් .. ඔයා හොඳයි කියලා හිතෙන දෙයක් කරන්නකෝ . ඒ වුනත් ඔහොම කලබල වෙල නම් ඉතිං කොරොස් කටේවත් අත දා ගන්න බැරි වෙයි . ඊටත් ටිමීට කිසිම කරදරයක් නැතුව යහතින් ගෙදර ඇති කියලත් මට නම් විශ්වාසයි . එයාට කෝච්චිය එන වෙලාව හොයා ගන්න බැරි එන්න ඇති . හරි එහෙනම් කිරින් කොටේජ්වලදි හම්බෙමු . පරිස්සමින් ගෙදර යන්න"

ඉතිං අන්තිමේදී අයියලා දෙන්නා තමන්ගේ කුඩා නැගෙණිය ඈන් ද සමගින් කිරින් නිවස දක්වා පයින් ම ගමන් කරන්නට පටන් ගත්තා . මේ පයින් යන ගමනෙදි ඇත්තට ම ඔවුන්ට දක්නට ලැබෙන්නේ

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



වචනයෙන් කියන්නත් බැරි තරම් සුංදර ම සුන්දර දේවල් . කිරින් මුහුදු බොක්කත් , කිරින් දූපතත් නැවතත් හකින්නට ලැබීම මොන තරම් වාසනාවක් ද කියලා ඒ අයට හිතෙනවා . ඒ අතර ඈන් කිරින් දූපත දිහා බලා ගෙන මෙන්න එහෙම කියන්න පටන් ගත්තේ ජෝර්ජ් ගැන කල්පනා කරන අතර ම යි .

" මේ වගේ සුරුවම් දූපතක් අයිති කර ගන්න තරම් ජෝර්ජ් මොන තරම් වාසනාවන්තයිද නේද ? අවුරුදු ගානක් තිස්සේ පවුලට දූපතක් අයිති වෙලා තියෙනවා .. එහෙම තිබිලා එක පාරට ම එයා ගෙ අම්මා දූපත ජෝර්ජ්ට ම අයිති කර ගන්න දෙනවා ... ඇත්තට ම ෆැනී නැන්දා හිතාගෙන ඉන්න ඇත්තේ නම් ජෝර්ජ් ටිකක් ලොකු වුනාම දූපත එයාට දෙන්න . ඕන ඔට්ටුවක් මේකි දූපත ඉල්ලලා යකා නටන්න ඇති . නැත්තම් ඉතිං ළමයෙක්ට කොයි ලෝකෙද කියන්නකෝ දූපතක් අයිති වෙන්නේ .. කොහොම වුනත් ජෝර්ජ් කියන්නේ පුදුමාකාර වාසනාවක් තියෙන කෙනෙක් කියලයි මට නම් හිතෙන්නේ .. මම් ඇත්ටටම ටිමීට මොකක් හරි කරදරයක් වෙලා ඇති කියලා ඔයාලට හිතෙනව හ ? ටිමීට උන හෙම්බිරිස්සාවක් හරි හැදිල තිබ්බොත් නම් මේ නිවාඩුවෙම ගන්න දෙයක් නැති වෙයි"

" අනේ ජෝර්ජ්ගෙ විකාරනෙ . ඔහොම කලබල වෙලා පුලුවන්ද . ඕන්න බලන්නකෝ අපි යනකොට ජෝර්ජ් ටිමී එක්ක කූඩුවට වෙලා අපි එනකන් බලා ඉදීවි"

ඩික් සිනාසෙමින් කියන්නට පටන් ගත්තේ ඈන්ව විතරක් නෙවෙයි ජුලියන්වත් හිනස්සවමින්. ඒ අතර ම ඔහු ඇතින් වන දර්ශනය පිළිබඳව ද අවධානය යොමු කරන්නට අමතක කළේ නෑ .

DO NOT COPY

sinhalaebooks.com



" අහා අර බලන්ඩලා ..මුහුදයි කිරින් දූපත යි මොනතරම් ලස්සනට පේනව ද කියලා .."

" වෙනද වගේම හරිම ලස්සනයි නේද ? බ්ලනකෝ පූසො වගේ කැගහන මුහුදු ලිහිණියො දූපත වටේ වෙනද වගේ ම රවුම් ගහන අපූරුව ...දූපතේ තියෙන මන්දිරය වුනත් වෙනදා වගේ ම හරී ම ලස්සනයි . කොයි තරම් ගරා වැටිල තිබ්බත් මන්දිරේ ගිය පාර තිබ්බට වඩා එක ගලක් වත් අඩු වෙලා නෑ කියල මට මෙතනට කියන්න පුළුවන්"

" අනේ මේ නිකන් බොරු කියන්නේ නැතුව ඉන්න ජුලියන් ... මෙතන ඉදන් ඔච්චර ඈත තියෙන දෙයක් ඔයාට පේන්න විදිහක් නෑ .."

ජුලියන් අයියාගේ කතාවට ඇන් කීවේ දෑස් ලොකු කරගෙන කරකවා වඩාත් හොදින් කිරින් දූපත පරික්ෂා කරමින් .

" නිවාඩුව පටන් ගත්තා ම පලවෙනි දවසෙ හිතෙන්නෙ නිවාඩු කාලෙ සෑහෙන්න දිග එකක් කියලනේ .. හැමදා ම හිතෙන්නේ එහෙමයි . මුලු ලෝකෙ ම දවස් අපේ ඉස්සරහ තියෙනවා වගෙයි"

" ඔව් ඉතිං ඊට පස්සෙ එහෙ බලල මෙහෙ බලද්දි නිවාඩුව ගිහින් ඉවරයි. ඒක නෙමේ . දැං නම් ජෝර්ජ් ගෙදරට ම ගිහින් ඇති නේද ?"

" ඔව් .." ඩික් උත්තර දුන්නේ ජුලියන්ට එකග වෙන හඩකින් . " චුට්ටකට කලින් ජෝර්ජ් නැග්ග ටැක්ෂිය හදට යන රොකට් එකක් වගේ යනව මන් දැක්කා . මොනව ද ඔට්ටු . ජෝර්ජ් කාරෙක ඇතුලෙ



Scanned with CamScanner

sinhalaebooks.com



යකා නටනව ඇති හැටට පාගන්න කියල .අන්න අර දුමක් නගිනව පේන්නෙ කොහෙන්ද දන්නව ද ? ඒ දුම එන්නේ කිරින් ගෙදරින්''

තවත් ස්වල්ප වේලාවක අවෑමෙන් කිරින් නිවසේ ඉදිරි ගේට්ටුව සමීපයට ම පැමිනෙන්නට ළමයින්ට හැකි වුනා . ඔවුන් ගේට්ටුව අසළට එනවත් එක්කම වගේ ජෝර්ජ් ජෝර්ජ් ඔවුන් සිටි දෙසට දුවගෙන ආවේ ඒ තරම් ප්‍රසන්න මුහුණකින් නම් නො වේ .ඈ සිටින්නේ හඬමින් බව ජුලියන්ට දකින්නට ලැබුනේ එතකොට යි . ජෝර්ජ් හඬමින් සිටින බව දකින විට නම් තම සිරුර හිරි වැටී යන බවක් ජුලියන්ටත් දැනෙන්න පටන් ගත්තා . අනිවාරෙන් ම ටිමීට මොකක් හරි කරදරයක් වෙලා ! ළමුන්ට සිතුණේ එපමණයි .

“ ජෝර්ජ් ජෝර්ජ් මොකද වෙලා තියෙන්නේ . කෝ ටිමී ... අනේ දෙවියනේ අපේ ටිමීට මොකද ?''

පපුව පුරා ම තැති ගැන් ම පුරෝ ගත්තු පුංචි ඈන් ජෝර්ජ් පසුපස දුවන්නට පටන් ගත්තේ ඒ විදිහට කෑ ගහන ගමන් .ඇත්තට ම ඔවුන්ගේ ටිමීට මොකක් හරි අණතුරක් සිදු වෙලා කියන හැඟීම ඈන්ට නම් කොහොමවත් උහුල ගන්න බැරි තරම් .

“ අපිට නිවාඩුවට ගෙදර ඉන්න විදිහක් නෑ .. අපිට කොහේ හරි යන්න සිද්ද වෙනවා මහ නරක දෙයක් සිද්ද වෙලා''

ජෝර්ජ් හඬන අතරම කියෝගෙන කියෝගෙන ගියේ හුස්ම ගන්නත් අමතක කරමින් . ඒ අතර ඩික් කෝපවත් හඬින් ජෝර්ජ්ට කෑ ගහන්න වුනා .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com





Scanned with CamScanner

sinhalaebooks.com



" විකාර කියවන්නෙ නැති ව ටිමීට මොකද වෙලා තියෙන්නේ කියල කියනවා මෝඩියේ .. කෝ අපේ ටිමී"

ජෝර්ජ් ඩික් දිහා එවර නම් බැලුවේ හැඩුම නවතා අතකින් කඳුලු පිස දමමින් . වෙනදා වගේ ම තමයි . තාමත් ජෝර්ජ් ලේන්සුවක් පාවිච්චි කරන්නේ නම් කලාතුරකින් .

" නෑ නෑ ටිමීට මොකවත් වෙලා නෑ . ඒත් අනේ අපේ හොඳ ජොආනා .."

කිරින් ගෙදර ඉවුම් පිහුම් ඇතුළු ගොඩක් වැඩ කටයුතුවලට සහය වන්නට ෆැනී නැන්දාට සිටින හිතවත් සේවිකාව ජොආනායි . ඇත්ත වශයෙන් ම ළමුන් කවුරුත් ඇයට දක්වන්නේ නොමඳ ආදරයක් . ඇයත් එහෙම ම තමයි . ටිමීට කරදරයක් නෑ කියන ආරංචිය ඔවුන්ට සහනයක් ගෙනාවත් ජොආනා කරදරයක වැටිලා කියන ආර්ංචියත් එක්ක ඒ සැනසිල්ල එකපාරට ම හේදිලා ගියා .

" ජොආනාට රතු උන හැදිලා . ඉතිං අපිට මේ පාර නිවාඩුව කිරින් ගෙදර ගත කරන්න විදිහක් නෑ"

" මට තේරෙන්නෙ නෑ . ජොආනාට අසනීප නම් එයානෙ ඉස්පිරිතාලෙ ගෙනියන්නේ . අපිට ඇයි ඒකෙන් කිරින් කොටෙජ්වලින් යන්න සිද්ද වෙන්නේ ? අනික අපිට ෆැනී නැන්දට ගෙදර දොරේ වැඩවලට උදව් වෙන්නත් පුලුවන්නෙ . අනේ පව් ජොආනා . කොහොම වුනත් ජෝර්ජ් උඹ ඔහොම වලලන්න තියාගන්න එපා . මේ

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



දවස්වල රතු උන කියන්නේ හරි සාමාන්‍ය ලෙඩක්නෙ . කොහොමින් කොහොමහරි පව් අපේ ෆැනී නැන්දා .එනවා ජෝර්ජ් බොරුවට නාහෙන් අඩන් නැතුව . අපි ගිහින් ඔයාගෙ අම්මගෙ හිත හදමු . එයා තවත් කෙට්ටුවෙයි ගෙදර වැඩ සේරම එයාට තනියම ම කරන්න සිද්ද වුනොත් . අපි කට්ටියත් ඉද්දි එයාට තවත් අමාරුයිනේ . හැබැයි අපි ෆැනී නැන්දට හැම වැඩකට ම උදව් වෙන්න එක පයින් සූදානම් කියලා ගිහින් එයාට කියමු . එන්න ...”

ඩික් මෙවන් අවස්ථාවක කටයුතු කළ යුතු ආකාරය සම්බන්ද ව පවත්වාගෙන ගිය දීර්ඝ දේශනාව බිඳලමින් ජෝර්ජ් කතාවට හරස් වුනා

“ ඔය කියවිල්ල නවත්තන්වා ඩික් . අපිට කිරින් කොටේජ්වල මේ සැරේ ඉන්න විදිහක් නෑ . අම්ම අඩු ගානෙ මාව වත් දොරෙන් ඇතුළට වද්ද ගත්තෙ නෑ . එයා මට පයින් ගහල පැන්නුවා වගේ වත්තට වෙලා ඉන්න කිව්ව .දොස්තර මහත්තයත් එනව ලු මග. මේ කිසි දෙයක් මට තේරෙන්නෙ නෑ”

ඒත් එක්ක ම වගේ කිරින් නිවසේ කාමරයක් දෙසින් ෆැනී නැන්දාගේ කට හඩ ඇසෙන්නට පටන් ගත්තා . ඔවුන්ගේ ආදරණීය ෆැනී නැන්දා හෙවත් ජෝර්ගේ අම්මා කාමරයේ ජනේලයෙන් හිස පිතටට දමාගෙන කතා කරන්නට වුනේ වෙනදා මෙන් ළමුන් පිළිගන්නට එන්නට කිසිම බලා පොරොත්තුවක් ඇගේ හිතේ නො තිබුණු ගානට යි .

“ ළමයි .. ඔයාලා හැමෝම ඔතන ඉන්නවා නේද ? අනේ ජූලියන් පුතේ . පොඩියකට මේ කිට්ටුවට එන්න .. හා හා ජූලියන් විතරයි”



DO NOT COPY

sinhalaebooks.com





Aunt Fanny was leaning out of a bedroom window

ෆැනී නැන්දා එහෙම කිව්වත් ළමුන් සිව් දෙනාම ෆැනී නැන්දා හොඳින් පේන මානයට එක ම හැල්මේ දුවගෙන ආවා .

" අහන්න දරුවනේ ..අපේ ජොආනාට රතු උන හැදිලා .එයාව ඉස්පිරිතාලෙට ගෙනි යන්න ඇම්බියුලන්ස් එකක් මග එන ගමන්"



Scanned with CamScanner

sinhalaebooks.com



" නැන්දා කිසි දේකට කරදර වෙන්න එපා . ජොආනාව උස්සලා ඇම්බියුලන්ස් එකට දාන වැඩේ අපි කරන්නම්"

ජුලියන් ගත් කටට ම කියා දැම්මේ ෆැනී නැන්දාට උදව් උපකාර කිරීමේ පරම අවංක චේතනාවෙන් . ඒත් ෆැනී නැන්දා ඔහුගේ උදව් කිරීම එකපාරට ම ප්‍රතික්ෂේප කරලා ඊ ළඟට කීවේ මේ වගේ කතාවක් .

" අනේ ජුලියන් .. ඔයාටවත් තාම මේව ගැන හරි හැටි තේරුමක් නැති හැඩයි . මේ බලන්නකෝ . මාමටවත් මටත් තාම රතු උන නෑ . ඒ වුනත් ජොආනා හිටියේ අපි එක්ක නිසා අපිට නිරෝධායනය වෙන්න සිද්ද වෙලා තියෙනවා . ඉතිං අපිට කාව වත් ගෙදරට ගන්නවත් අපි කිට්ටුවෙන් කවුරුවත් තියා ගන්නවත් විදිහක් නෑ . මොකද බැරි වෙලා හරි රෝග කාරක විශ බීජ අපේ ඇගේ තිබ්බොත් අපෙන් තව අයටත් බෝ වෙන්න පුළුවන් .මං කියන්නේ මොකක්ද කියලා ඔයාට තේරෙනවා නේද ? නිවාඩුවට ගෙදර ආව ඔයාල ව ගෙට වත් ගත්තෙ නැත්තෙ ඒ නිසයි . අනික මට බයයි මාමයි මායි ඔය හතර දෙනාට ම බෝ කරයි කියලා"[i]

ඇත්තට ම නැන්දාගේ කතාව ජූලියන්ට විතරක් නෙමෙයි අනික් තුන්දෙනාට මත් හොඳාකාරව ම වැටහෙනවා . ඒ අතර නහය ඉහළට අදිමින් ශෝකී සුසුම් හෙලමින් ජෝර්ජ් එයාගේ බරපතල ම ප්‍රශ්නයත් ඉදිරිපත් කරන්නට පටන් ගත්ත .

" ඒ කියන්නේ මට ටිමීව ගන්නත් බැරි ද ? එයාවත් නිරෝදායනය කරල ද ?"

sinhalaebooks.com



" අනේ පිස්සු කියවන්න එපා ජෝර්ජ් . ඔයා කවද හරි හල තියෙනවා ද ඔයා ඔය ඇහැන් බල්ලන්ට සරම්ප හරි කක්කල් කැස්ස හරි මිනිස්සුන්ට හැදෙන අනික් වෙන අසනීප හරි හැදෙනව කියලා ? ඔයා කැමති ඕනම වෙලාවක ඔයාගෙ ටිමී කූඩුවෙන් එලියට ගත්තාට අපේ කමක් නෑ"

ජෝර්ගේ මුහුණට හඳ පායා ආවේ ඉන් පසුව යි .ඇත්තට ම රටක් රාජ්‍යක් දිනුවාක් බඳු පෙනුමක් ඈ කෙරෙන් පළවෙන හැටි හැමෝට ම පේනවා .ටිමීගේ නම කියමින් ඈ නිවසේ පිටිපස්ස පැත්තට දුවන්නට පටන් ගත්තේ හරියට ම තුවක්කුවකින් පිට වුනු වෙඩි උණ්ඩයක් වගේ .ඒත් සමග ම ටිමීගේ පිළිගැනීමේ ගීතය ද මහා හයියෙන් කාට කාටත් ඇහෙන්නට පටන් ගත්තා .

" ෆැනී නැන්දේ . අපෙන් වෙන්න ඕන උදව්වක් මොනව හරි තියෙනම් දෙපරක් හිතන්නෙ නැති ව කියන්න" ඒ අතර ජුලියන් කිව්වා . " අපිටත් ගෙදර යන්න විදිහක් නෑ . මොකද අපේ ගෙදර සේරමලා තාම ජර්මනියට ගිය පාර ඇවිල්ලා නෑ . ඉතිං අපිට හෝටලක වත් නතර වෙන්න සිද්ද වෙයි ද ?"

" නෑ නෑ ළමයෝ . කලබල නො වී ඉන්නකෝ . මම හිතල බලන්නම් ඔයාල හැමෝටම ගිහින් නිවාඩුව ගත කරන්න පුලුවන් තැනක් ගැන . අම්මෝ ඔයාලට අහෙනවද ටිමීගෙ කටේ සද්දෙ . පව් ජෝන් . එයාගෙ ඔලුව පැලෙන්න තරම් රස්නෙයි"

" අන්න ඇම්බියුලන්ස් එක එනවා" නැන්දාගේ කතාව අතරෙ ම ඈන් එක පාරට ම දැනුම් දුන්නා . රෝහලට අයත් ගිලන් රථයක් ඒ සමග ම ඇවිත් නිවසේ ඉදිරි ගේට්ටුව ළඟ නවත්වනු ලැබුවා . එයින් පිතටට

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



බැහැපු රෝහල් සේවකයො දෙන්නෙක් කිරින් කොටේජ් නිවසේ ඉදිරි දොර වෙත පැමිණියේ ඇඳක් ද ඔසවාගෙන යි . ෆැනී නැන්දා ජනේලය ගාවින් ඉවත් වෙලා ඇතුළට ගියේ ජොආනාට ගිලන් රථය පැමිණි බව දැනුම් දීමට විය යුතුයි .

" එයාලා අර ඇතුළට ගියේ ජොආනාව අරන් එන්න" යි ජුලියන් පැහැදි කළා .

ඇත්තට ම ජුලියන් නිවැරදි යි . ඔහු කීවාක් මෙන් රෝහල් සේවකයෝ යළිත් නිවසින් එළියට ආවේ ඔවුන් ගේ හිත හොඳ ජොආනාද සමගයි . ඈ ගිලන් ඇඳ මත වැතිරීගෙන බලා සිටියේ ඉතාමත් ම අසරණ විදිහටයි. මේ හැම දෙයක් ම ළමුන්ගේ හිත් තුළ ඇති කරන වේදනාව දරා ගන්නත් බැරි තරම් . බ්ලැන්කට් වලින් එතී ඇඳ මත නිදා හුන් ජොආනා කොයි තරම් අමාරුවෙන් හිටියත් ළමුන් පිරිස දැක අත වනන්නත් අමතක කළේ නෑ .

" මම ඉක්මනට ම ආපහු එන්නම්කෝ" ජොආන් කීවේ වෙනදාට වඩා ගොරහැඩි ස්වරයෙකින් කියල නම් ළමුන්ට හිතුණා . " ඔයාලට පුලුවන් හැටියට කිරින් නෝනාට උදව් වෙන්නත් අමතක කරන්න එපා .. මේ වගේ කරදර කරන්න සිද්ද වුනු එක ගැන ගොඩාක් කනගාටුයි කිරින් නෝනා"

" අනේ අසරණ ජෝන්" ඈන් කීවේ හිත පුරා උපන් ශෝකයෙන් . මේ වෙද්දි ඇගේ ඇස්වලට කඳුලුත් එන්න පටන් අරන් . " ඉක්මනින් සනීප වෙන්න ජෝන් .. ඔයා නැති අඩුව අපිට හුගාක් දැනෙයි"

DO NOT COPY

sinhalaebooks.com



ගිලන් රථයේ දොර ජොආනා ඇතුළට දමා ගන්නවත් එක්ක ම වගේ වැහිලා ගියා .ඉතිං ඊට පස්සේ එය හෙමින් හෙමින් ලෙඩාවත් අරගෙන කිරින් කොටේජ් නිවසින් ඈතට ..ඈතට ගමන් කරන්න වුනා .කොහොමින් කොහොම හරි ඊ ළඟට අපි මොකද කරන්නේ කියන ගැටලුව නම් තාමත් ළමයින්ට තියෙනවා . ගිලන් රථය නො පෙනී යනවත් එක ම වගේ ඩික් ජුලියන් දිහාට හැරිලා මෙහෙම ඇහුවේ ඒ බර පතල ප්‍රශ්නයට උත්තරයක් ලබා ගන්න අපේක්ෂාවෙන් .

“ අපි එතකොට මොකද දැං කරන්නේ ? ගෙදර යන්නත් බෑ . මෙහේ ඉන්නත් බෑ . ආ මේ ඉන්නෙ ටිමී .. ඉතිං කොහොමද කොල්ලෝ ..දෙයියන්ගෙ නාමෙට උඹට රතු උණ හැදුන් නැති එක නම් ලොකු දෙයක් .. අඩේ අඩෙ බැහැපන් බැහැපන් මගෙ ඇගෙන් බිමට .. අම්මෝ යකෝ උඹේ ලෙවකෑමේ හැකියාව සෑහෙන්ට වර්ධනය වෙලා නොවැ .”

ලෝකෙ පෙරළුනත් වගේ වගෙක් නැති ගානට ඒ වෙලාවේ එතන හිටිය එක ම හාදයා ටිමී විතරයි . ඇත්තට ම ළමුන් හතර දෙනා තමන් ළඟ ඉන්න වෙලාවට හැමදාමත් ඌ හිටියේ නැව ගිලුණත් බෑන් චූන් සෙයියාවෙන් . ටිමී කොහොම හැසිරුණත් ළම්යින්ට නම් දැනෙන්නේ අන්තෝ ජටා බහිජටා ගැටලුවක ඔවුන් මැදිහත් උනු බවක් බව කිව යුතුම යි . ඉතිං ඇත්තට ම ඔවුන් ඊ ළඟට කළ යුත්තේ කුමක්දැයි කවුරු කවුරුත් තදින් කල්පනා කරන්න පටන් ගත්තා . ඔවුන් යන්නේ කොහට ද ? නිවාඩුවේ ආරම්භක දවස ම මොන තරම් සවුත්තු එකක් ද ? ඔයා දැන් එයාලගෙ ඇගේ නගින එක නවත්වන්න ඕන ටිමී . ඒයි ඒයි මොන ජාතියේ බල්ලෙක් ද මේ .. බැහැපන් බැහැපන් .. කවුරු හරි

DO NOT COPY

sinhalaebooks.com



දැක්කොත් හිතයි උඹ උපන් තේකට රතු උන කියලා ලෙඩක් ගැන අහල ඒ කියල . ඔය ළමයින්ට ඉන්න දීලා බැහැපන් ටිමී ..”

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 02

## සැලසුම් රසක්

DO NOT COPY

ගිලන් රථය ජොආනා රැගෙන ගොස් ටික වෙලවක් ගත වුනත් ජෝර්ජ් තවමත් සිටින්නේ ගොඩාක් සිත් තැවුලෙන් . ඇත්තට ම ඇය මුලින් හිතාගෙන හිටිය වගේ ටිමීට අසනීපයක් හෝ අනතුරක් නො වී තිබීම එක අතකට සහනයක් වුනත් ඒ වෙනුවට ජොආනා අසනීප වී තිබීම කොහොමඅත් එයට දරා ගන්නට පුලුවන් වුනේ නෑ . ඒ වගේ ම ජො ආනා ගිලන් රථයක නංවාගෙන රැගෙන යනු දැකීමත් ජෝර්ගේ වේදනාව තව තවත් වැඩි කරන්නට හේතුවක් වුනා .



Scanned with CamScanner

sinhalaebooks.com



" අනේ ජෝර්ජ් දැං වත් ඔය නහයෙන් අඩින එක නවත්ත ගන්න" ඈන් කියන්නට පටන් ගත්තේ ජෝර්ගේ සිත් තැවුල නිවා දමන අදහසින් . " අපි මේ වෙලාවේ දුකින් අඩ අඩා ඉන්න එකේ කිසිම තේරුමක් නෑ . ඒ වෙනුවට ඔලුව කල්පනා කරලා මේ අවස්ථාවට මුහුණ දෙන්න විදිහක් හොයා ගන්න එකයි අරන්න ඕන "

" මම අම්ම ව බලන්න ඇතුළට යනවා . එයා ව නිරෝදායනය බැරි නම් මොනව කරල තිබ්බත් මට කමක් නෑ"

මුරන්ඩු හඬින් එක පාරට ම එහෙම කියපු ජෝර්ජ් හනික ගේ ඇතුළට යන්න සූදානම් වුනා . ජුලියන් වහා ඇගේ අතින් අල්ලාගෙන ටිකක් සැර අ ඩින් මෙන්න මෙහෙම කිව්වා .

" අනේ මේ පිස්සු නොකර ඉන්නවා ජෝර්ජ් . අඩන ගැහැණු ළමයෙක් වගේනෙ හැසිරෙන්නෙ . අනේ , මහ ලොකුවට කොල්ලෙක් වගේ වෙන්න ඕන කියල නේද හැම වෙලේ ම දොඩවන්නෙ . අයියෝ පව් පුංචි අඩන බබා . පව් ජෝර්ජිනා නංගි"

ජෝර්ජ් එක පාරට ම නහයෙන් ඇඩිල්ල නවතා දමා ජුලියන් දෙස හෙලුවේ දවා හලු කරවන බැල්මක් . ඇත්තට ම මෙච්චර වෙලා දැනුනු මුලු ලෝකය ම නැති වුනා වගේ ගතිය ජෝර්ගේ මුහුණින් පහවෙලා ගිහින් එක පාරට ම කෝපයක සේයාවක් මෝදු වෙන්න පටන් ගත්තා . ඇයට ජුලියන්s අමග තද කේන්තියක් ඇත්තට ම දැනෙනවා . තමාට පුංචි ගැහැණු ළමයෙක් වගේ කීම නම් කොහොමත් ඉවසගන්න පුලුවන් දෙයක් නෙවෙයි . ඒ විතරක් හ . ජුලියන් ඇයට ජෝර්ජිනා යැයි කතා කිරීමත් ජෝර්ජ්ගේ කෝපය වර්දනය කරවන්න හේතුවක්

DO NOT COPY

sinhalaebooks.com



වුනා . එක පාරට ම නැවතත් හොස්ස අගින් මැස්සා යන්නට බැරි පරණ ජෝර්ජ් ඒත් සමඟ ම නිර්මාණය වුනා . ඇය ජුලියන්ට අත මිට මොලවා පහරක් ගහන්න උත්සාහ ගත්තෙත් ඒ නිස යි .

" අන්න එහෙම ඉන්නවකො ජෝර්ජ්" ජුලියන් සිනා වෙමින් ම කිව්වා . " බලන්න . ටිමිත් පුදුම වෙලා ඔය දිහා බලන් ඉන්න හැටි . මීට කලින් ඌ ඔයා අඬනව දැකල තියෙන්නෙත් කලාතුරකින් . ඔයා ඔහොම නාවර පෙරාගෙන අඬද්දි ඌත් බය වෙනවා"

" මම මේ අඬනවා නෙමෙයිනෙ . මට ජෝන් ගැන දුක හිතුණා . අනික අපිට නිවාඩුවට මෙහෙ ඉන්න ලැබෙන්නෙ නැති එක ගැනත් දුක හිතුණා"

" ෆැනී නැන්ද කාට ද ටැලිෆෝන් කරනවා මට ඇහෙනවා'

තියුණු කන් දෙකක් තිබුණු ඈන් එක පාරට ම කාටත් ඇහෙනවිදිහට කිව්වා . ඇය හිටියේ ටිමීගේ ඔලුව අත ගාන ගමන් . ටිමී ඇගේ අත ලෙවකන්න උත්සාහ කරමින් අපූරු රංගනයක් දක්වන්නට පටන් අරගෙනයි තිබුණේ . මේ වන විටත් ටිමී නම් පිළිගැනීමේ ගීත ගයා ගායන වාදන පවත්වා ළමුන්ට පිළිගැනීමේ උත්සවයක් ස්වේච්ඡාවෙන් ම පවත්වා හමාරයි . ඇත්තටම ජෝර්ජිනා යළිත් දැකීමට ලැබීමේ ප්‍රීතියෙන් ඌ හිටියේ උන්මාදයට පත් වෙලා කියල කිව්වොත් බොරුවක් නෙමෙයි . ඒ වගේම ජෝර්ගේ මේ දුක් මුසු හැසිරීමත් ඌට හරි හැටි තේරුම් ඒරුම් කොට ගත නොහැකි කාරණාවක් .

" අපි මෙන්න මෙහෙ න් වාඩි වෙලා ෆැනී නැන්දා මොනව හරි කියන කන් කලබල නොකර බලන් ඉමු"

DO NOT COPY

sinhalaebooks.com



තණ කොළ වවා තිබුනු මිදුලේ වාඩි ගනිමින් ජුලියන් යෝජනා කෙරුවා. ඊ ළගට එයා වැඩි හුරටත් මෙහෙම කිව්වා .

" කිරින් කොටේජ් වලදි අපි මීට කළින් නම් කවදාවත් මේ තරම් මෝඩ විදිහට හැසිරිලා නෑ කියලා මට සහතිකයි . තව ටිකකින් ආපහු ෆැනී නැන්දා ජනේලය ගාවට එයි .එයාට දැනටමත් අපිට මොකද කරන්නේ කියන එක ගැන හොඳ අදහසක් ඇති . ආ ටිමී අම්මෝ මට මෙතන ඉඳගෙන ඉන්න දීලා පොඩියක් පැත්තකට වියන්කෝ . අයියෝ උඹ මගේ බෙල්ලත් එක්ක ලෙව කනවා . තව ටික වෙලාවක් ඔහොම මාව ලෙවකෑවොත් උඩට ගිහින් තුවායක් අරන් එන්න කියලා උඹව ගේ ඇතුලට යවන්නත් මට සිද්ද වෙයි'

'

ජුලියන්ගේ පුංචි විහිලුවට ළමයි හැම දෙනම හිනා වුනා . ඒ පුංචි විහිලුවෙන් පස්සේ කාට කාටත් කිසියම් සහනයක් දැනෙන්නත් පටන් ගත්තා . හැමෝම තණ ගොල්ල මත වාඩි වෙලා ෆැනී නැන්දාගේ උත්තරය බලා පොරොත්තුවෙන් දැං බලාගෙන ඉන්නවා .

" ඔන්න ෆැනී නැන්දා ටෙලිෆෝන් එක තිබ්බා" ඈන් එයාගෙ කණේ බලය පෙන්වමින් නැවතත් කිව්වා . " ඔන්න දැං එයා ජනේලෙ ගාවට ඇවිදගෙන එනවා"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" අම්මෝ ඈන් ඔයාගෙ කන් දෙක නම් වෙලාවකට බල්ලෙක්ගේ වගේ . ටිමීගෙ වගේ. මට නම් ඔය කියන කිසි ම දෙයක් ඇහුනෙ නෑ"

ඩික් ඈන්ට ඒ විදිහට කිව්වේ හරිම ප්‍රශංසනීය හඬකින් . ඒ අතර ෆැනී නැන්දා ජනේලය අසලට පැමිණියා . ළමුන් දෙසට වඩාත් මුහුන නැඹුරු කරගෙන ඇය කතාව ආරම්භ කළා .

" සේරම හරි ළමයිනේ .. මම ඔයාල වෙනුවෙන් හැම දෙයක් ම සූදානම් කරා . මම ජෝර්ගෙ තාත්තගෙ යාළු විද්‍යාඥ මහචයී හේලින්ට ටෙලිෆෝන් කරා . එයා දවසක් දෙකක් අපි එක්ක එන්න ඉන්නයි හිතාගෙන හිටියෙ . අපි ව නිරෝදායනය කරලා කියලා කිව්ව ගමන් ම එයා ඇහුවේ ඔයාලා ගැන . මම අහන්නත් කලින් එයා කිව්වා ඔයාල ව නිවාඩුවට එහාට එවන්න කියලා . ඒකට ටින්කරුත් ගොඩාක් කැමති වෙයි කියලයි එයා නම් කියන්නේ . ඔයාලට මතක ඇතිනේ එයාගෙ පුතා ටින්කර් ව . කට්ටියට ඔන්න එහෙනම් ආයෙත් පාරක් එකට නිවාඩුවක් ගත කරන්න හම්බෙන්නයි යන්නෙ"

DO NOT COPY

ෆැනී නැන්දා එහෙම කියද්දි නම් ළමුන්ට සේරම ප්‍රශ්න අමතක වෙල ගියා කිව්වොත් නිවැරදි යි . සත්තකින් ම දැං නම් ඔවුන් හැමෝට ම දැනෙන්නෙ වචනයෙන් කියා නිම කළ නොහැකි තරම් සතුටක් .

" ටින්කර් ... දෙයියනේ .. මගෙ ජීවිතේට ඔය කොල්ලව නම් අමතක වෙන්නෙ නෑ" යි ජූලියන් ප්‍රීතියෙන් බෙරිහන් දුන්නා . " ඇයි මිනිහගෙ වඳුරු තඩියා .. උත් ජීවිතේට අමතක කරන්න බෑ . ඔයාට මතක ද



Scanned with CamScanner

sinhalaebooks.com



නැන්දේ .. එයා තමයි අර රාස්ස ගල ප්‍රදීපාගාරය අයිති කොල්ලා ..( පන් පසිඳුවන් සහ යක්ෂයාගේ ප්‍රදීපාගාරය - දිලීප් ප්‍රසන්න) අපි එයාත් එක්ක නිවාඩුවකට ඒ ප්‍රදීපාගරෙට ගිහින් නිධානයක් හොයා ගත්ත හැටි ඔයාට මතකය නේද ?''

" හරි මට ඒක මතකයි . ඒ වුනාට මං කැමති නෑ ඔයාලා මේ පාරත් ප්‍රභීපාගාරෙක නැවතිලා ඔය හොඳට තියෙන අඩු බඩු කඩා ගන්නවට . අනික් එක දවසක් රෑ ලොකු කුණාටුවක් ඇවිල්ලා ඔය ප්‍රදීපාගාරය සෑහෙන්න විනාශ වෙලා ගිහින් . දැං ඒකෙ කාටවත් නවතින්න පුළුවන් තත්වයක් නෑ''

ෆැනී නැන්දා එහෙම කියන කොට හැමෝගෙන් ම නැගුණෙ බලා පොරොත්තු සුන් වීමෙන් නැගෙන අදෝනා හඬක් .. දුක් මුසු කෙඳිරියක් නගමින් ටිමියාත් ඒක ට ම හවුල් වුනා . පන් පසිඳුවන් කීව ම ටිමීත් අයිති වෙන නිසා ටිමීගෙනුත් ඒ වගේ කෙඳිරියක් නැගෙන එක සත්තකින් ම සාධාරණයි .

" ඉතිං එහෙනම් අපි යන්නේ කොහෙට ද ? ටින්කර්ගේ ගෙදර ද ?''

" ඔව්. ඔයාලට මෙතනින් ලිට්ල් හොලෝ වලට යන බස් එකක් අල්ලා ගන්න පුළුවන් . ඒකෙන් ගිහින් මහාචාර්‍ය හේලින්ගේ ගෙදර තියෙන බිග් හොලෝව් වලින් බහින්න . අනේ මට වාවන්න්නෙ නෑ ළමයි ඔයාල ව මේ ආපෞ පයින් ගෙට වත් ගන්නෙ නැතුව තැනින් තැන යවන්න සිද්ද වුනු එක ගැන .ඒත් ඒ ඔක්කොට ම වඩා මගෙන්

DO NOT COPY

sinhalaebooks.com



හරි මාමගෙන් හරි ඔයාලට රුධිර උන හැදෙයි කියලා මට බයයි . මම ඔයාලට සල්ලි ටිකක් ලැබෙන්න සලස්වන්නම් එහෙදි වියදමට ගන්න . අනේ ඉතිං එහෙනම් දැං බස් එකක් අල්ල ගන්න . හැබැයි ඉතිං ඔයාලට එහේ ගිහින් ප්‍රීතෙමත් කාලයක් ගත කරන්න ලැබෙන බව නම් මට සහතිකයි . ඔයාලගෙ ටින්කර් වගේ ම ඔයාලගෙ වඳුරු පැටියත් ඉන්නවනේ .. ආ මොකද ළමියි ඒ වඳුරගෙ නම ? මට නම් දැං මතකත් නෑ';

" මිස්චීෆ් (දගයා)" ළමුන් හැමෝම එක හඬින් නැන්දාට උත්තර දුන්නා. ඈන්ට මීට ඉහත නිවාඩුවක මිස් චීෆ් ද ටිංකර් ද සමග නටපු නාඩගම් සේරම වගේ එක පොදියට මතක් වෙලා ලොකු හිනාවක් මූනට නැගුනා .

" තව විනාඩි දහයකින් විතර ලිට්ල් හොලෝ විලට මෙතනින් බස් එකක් යනවා . ඔයාලට පුළුවන් ඒක අල්ලා ගන්න . ජුලියන් ඔයාට පුළුවන් නේද සේරමල බලා ගන්න . ඔයාලා ඔක්කොමලා ජුලියන් අයියා කියන දේට අවනත වෙන්නත් අමතක කරන්න එප . ජුලියන් බස් එක එන්න කලින් ඔයාලගෙb අඩු මුට්ටු ටික ලැහැස්ති කර ගන්න . කොම්දොස්තරවත් උදව්වට අල්ලගෙන ඒ ටික බස් එකට පටව ගන්න . ඉතිං හැමෝම ගොඩාක් සතුටින් නිවාඩුව ගත කරලා ආපහු එන්න . ඒ වගේ ම තමා මට කාඩ් එකක් දෙකක් එවන්නත් අමතක කරන්න එපා . කොහොම වුනත් මටයි මාමටයි දෙන්නට රතු උණ ඇති කියලා මං හිතන්නෙ නෑ . ඒත් බෝ එලා ද නැද්ද කියලා අපිට තවම හරියට ම කියන්න බෑ නේ . මාත් ඔයාලට ඒ ඉවිස්තර කියලා පෝස් කාඩ් එකක් එවන්නම්කෝ . ඒ වගේම මම ඔයාලට වියදමට ගන්න සල්ලි ටිකකුත්



Scanned with CamScanner

sinhalaebooks.com



එවන්නම් . හරි හරි ඉතිං දැං ඔයාල නිකන් දුකෙන් වගේ ඉන්න එපා . එහෙනම් බස් එක අල්ලගෙන පරිස්සම ට ගිහින් ඉදලා එන්න ඕනි''

"හරි හරි ෆැනී නැන්දේ .. අපි හොඳින් ඉන්නම් .. ඒ වගේ ම මේ හැම දේකට ම ඔයාට ගොඩාක් ස්තූතියි''

ජුලියන් නැන්දාගේ හිත හදන විදිහට එහෙම කියලා තව මේ විදිහටත් කිව්වා .

'මම මෙයාල ව ඇහේ දාල වගේ බලා ගන්නම් නැන්දේ . ඉටිං ජෝර්ජ් දැං වත් පොඩ්ඩක් හිනාවෙලා ඉන්න . මමත් හිතන්නෙ නෑ නැන්දට වත් මාමටවත් ලෙඩේ බෝ වෙලා ඇති කියලා . ගුඩ් බායි එහෙනම්'

ඊ ළගට ළමුන් සියලු දෙනා ටිම්වත් කැටුව ඉස්සරහ ගේට්ටුව ගාවට ඇවිදගෙන ගියා . තවමත් ඔවුන්ගේ බඩු බාහිරාදිය තිබුණේ ගේට්ටුව ගාවම යි . ඒ අතර ජුලියන් ඈන් දිහාවට හැරිලා නායකත්වය ප්‍රදර්ශනය කරන්නට අමතක කළේ ත් නෑ .

"ඈන් ඔයා පාරට ගිහින් බස් එකට අත දාල බස් එක නවත්ත ගන්න . එතකොට ඩික් එන්න මාත් එක්ක මේ බඩු මුට්ටු ටික බස් එකට දා ගන්න මට උදව් කරන්න . අනේ දෙයියනේ .. ටින්කරුයි මිස් චීෆුඉ දෙන්න එක්ක අපිට මේ පාරත් හොඳ පිස්සුවක් නටන්න පුළුවන් කියලා මට හිතෙනවා . ඇත්තට ම මට නම් මතක් වෙනකොටත් මාර උද්යෝගයක් දැනෙන්නේ''

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ජුලියන් එහෙම කීවත් ජෝර්ජ්ට නම් ඒ තරම් උද්දාමයක් දැනුනේ නෑ . ඇගේ මුහුණේ තාමත් තියෙන්නෙ බුම්මා බුකවා ගත් පෙණුමක් .

“ මම නම් එහෙම හිතන්නෙ නෑ . මම ටින්කර්ට කැමතියි . එයා අපූරුයි . විනෝදශීලියි . ඒ වගේ ම මිස්චීෆුත් නියමයි . හැබැයි පුතෝ උඹලා නිකන් වත් අමතක කරන්න එපා මෙදා පොටේ ටින්කර්ගේ තාත්තත් අපි එක්ක නවතින්න එනවා කියල නම් . එයාගෙ හැටි දන්නවනේ . හොස්ස අගින් මැස්සා යන්න ඇරි කෙනෙක් විත්තිය . හැම තිස්සෙම කෑම බීමයි , කෝට් එකයි , පර්ස් එකයි වගේ මොනවා හරි අමතක කරගෙන යකා නටන කැත පුරුද්දකුත් ඒ මනුස්සයාට තියෙනව කියලා අමුතුවෙන් කියන්න ඕනි නෑනේ . මට නම් කලින් වතාවේ එපා වුනා”

“ ඕක නම් ඒ තරම් ගනන් ගන්න දෙයක් නෙමේ . අනික ඔය තරම් අසුභවාදී වෙන්නත් එපා ජෝර්ජ් . සමහර විට ටින්කර්ගේ තාත්ත ට ත් අපි ව එපා වෙයි . එයා මොකක් හරි අමාරු වැඩක පැටලිලා එහෙම හිටියොත් ළමයි හතර දෙනෙක් එයාගෙ ගේ ඇතුළෙ දඟ වැඩ කරන කොට ඒ මනුස්සයට ලෝකෙම එපා වෙයි . ඇයි ඒ මදිවට ලොකු ලෙවකන පිස්සුව තියෙන බල්ලෙකුත් පාලනය කරගන්න එයාට සිද්ද වෙනවනේ”

ජුලියන් ජෝර්ට ඒ වගේ කතා වක් කියද්දී ජෝර්ජ් එකපාරට ම ජුලියන්ට හරස් වුනා .



Scanned with CamScanner

sinhalaebooks.com



“ ආපෝ ටිමී නම් එයාව ලොවින්න යන්නෙ නෑ . මම කියන්නේ මම නම් ටින්කර්ගේ තාත්තට පොඩ්ඩක් වත් කැමති නෑ කියන එකයි . ඉතිං ටිමීත් එයාට කැමති නෑ . ඒ කියන්නේ ලෙවකන්න යන්නෙ නෑ’

කොහොම වුනත් මේ හොස්ස අගින් මැස්ස යා නොහැකි දඩබ්බර කෙල්ල පාලනය නම් ලේසි පහසු කරතව්‍යක් නොවන බව ජූලියන්ට වැටහෙනවා . ඉක්මනින් ම මුහුණට නැගෙන නපුරු බැල්ම වුනත් කවදාවත් ජෝර්ජ්ගේ වෙනස් නොවන ඉරියව්වක් බව ඔහු දන්නවා .

ළමුන් කතා බහේ නියැලෙන අතරම ලිට්ල් හොලෝව් දක්වා යන බස් රථය කිරින් නිවස අසළට පැමිණියා . පාරේ බස් එක එනකන් බලාගෙන ඉඳපු ඇන්ට බස් රථය නවතා ගන්න බැරි වුනේ නෑ . බසයේ රියදුරා ළමුන්ගේ ලට්ට ලොට්ට බසයට පටවා ගන්නට උදව් කළේ කිසිම අදි මදි කිරීමකින් තොරව . ඇත්තට ම ඔහු වුනත් මේ පන් පසිඳුවන් කට්ටිය ව ඉතාම හොඳින් අඳුනනවා . ළමුන් පිරිස බසයට නැගුණු පසු ඔහු ඔවුන් සමගින් කතාවකට මුල පිරුවේත් ඒ හැඳුනුම්කම නිසා ම යි .

DO NOT COPY

“ ඉතිං ඔයාලා ආපහු ඉස්කෝලෙට යන්න ද හදන්නේ ? අනේ මේ පාර ඉස්කෝලෙ හරි ඉක්මනට පටන් අරන් වගේ . මම හිතාගෙන හිටියේ ඔයාලට නිවාඩු ලැබෙන්න ඇත්තෙත් මේ අද ඊයෙ කියල’

“ නෑ නෑ “ ජූලියන් උත්තර දුන්නා . “ අපි මේ බිග් හොලෝ වලට යනවා නිවාඩුව ගත කරන්න . ඔයාලා එහේට යනවා නේද ?”



Scanned with CamScanner

sinhalaebooks.com



" ඔව් ඔව් අපි යන්නේ බිග් හොලෝව් පහු කරගෙන තමයි" කොන්දොස්තරවරයා උත්තර දුන්නා . : ' ඔයාලා එහේ කොහේද නවතින්න යන්නේ ?"

" මහාචාර්ය හේලින්ග් ලෑ ගෙදර . මම හිතන්නෙ බිග් හොලෝවල ඉඳන් එයාගෙ ගෙදරට වැඩි දුරක් නැතුව ඇති"

" ආ ඔව් . ගමට වගේ ම ඒ ගෙදරට කියන්නෙත් බිග් හොලෝව් කියලා. බස් එක යන්නේ ඒ ගේ පහු කරගෙන නිසා එතනින් ම බඩු ටික බා ගන්න මම ඔයාලට උදව් කරන්නම් . අප්පා .. ඔය ළමයි ඉන්නෙ එහේ නම් ඔයාලගෙ කට්වල් ගැන ටිකක් පරිස්සමින් අල්පනාවෙන් හිටියොත් හොඳයි . නාකි හේලින් උන්නැහේ ටිකක් අමුතු තාලේ මිනිහෙක් . එයාට ඕනි විදිහට මොනවත් සිද්ද වෙන්නෙ නැත්තම් යකා නගල ඩෙගා නටන පුරුද්දක් මනුස්සයට තියෙනව . සරයක් කාගෙ ද අස්සයෙක් මිනිහගෙ වත්තට ගියා කියල ඌ ව හැතැම්ම ගානක් ඈතට පන්නලයි නතර වුනේ . ඉතින් ඔන්න ඔය වගේ මනුස්සයෙක් . ඔයාල බිග් හොලෝව් වලදී ගොඩාක් පරිස්සමින් ඉන්න ඕන ඒ නිසයි . එයාට යකා නැග්ගොත් ඔයාලව මොකක් හරි මැෂින් එකකට දාල පුංචි පුංචි කෑලිවලට කපලයි නවතින්නේ"

ළමෝ රියදුරාගේ විහිළු කතාවට මහා හයියෙන් හිනා වෙන්න පටන් ගත්තා . ඇත්තට ම ඒ වෙලාවෙ නම් හැමෝගෙන් ම පෙන්නෙන්න

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



තිබුනේ සියලු ප්‍රශන අකා මකා වී ගිය බවක් . ඒ අතර ජුලියන් මහාචාර්‍ය තුමා ගැන කීවේඑ මේඑ වගේ කතාවක් .

" සම්පූර්න අවධානයම තමන්ගෙ වැඩ කටයුතු වලට යොදාගෙන ඉන්න ගොඩක් මිනිස්සුන්ට වෙනවා වගේ මහාචාර්‍යතුමාටත් අනික් දේවල් අමතක වෙනවා . ඒක හැරුණාම ඉතිං එයාගේ මහ ලොකු වැරද්දකුත් නෑ .මගෙ මොලේ නම් හරිම හෙමින් වැඩ කරන්නේ . ඒත් මගේ ක්වින්ටන් මාමගේ මොලේ නම් පැයකට හැතැම්ම සීයක් විතර වේගයෙන් වැඩ කරනවා .මං හිතන්නේ හේලින් මහාචාර්‍යතුමාගේ මොළෙත් ඒ වගේ ඇති . කමක් නෑ අපි ඉතිං බලමුකෝ එයත් එක්ක ජාමෙ බේරගෙන ඉන්න පුළුවන් වෙයිද කියල "

බිග් හොලෝ දක්වා යන ලමුන් පිරිසත් රැගෙන ලිට්ල් හොලෝ දක්වා යන බසය හෙමින් හෙමින් කිරින් වල ඇති වල ගොඩැලි සහිත පාර ඔස්සේ ඉදිරියට ඉදිරියට ඉදිරියට ම ගමන් කරන්න පටන් ගත්තා . ජනේලයෙන් පිතට නෙත් හෙලාගෙන සිටින ළමුන් සිව් දෙනාට නිල් ම නිල් පාට මුහුදු තීරයත් දකින ඕන ම කෙනෙක් වසග කරගන්න උනත් සමත් ඔවුන්ගේ කිරින් දූපතත් මේ වන විට හොදින් පේනවා .ඒ අතර ජෝර්ජ් කිරින් දූපත දිහා බලාගෙන ලොකූ උසුමක් හෙලන්නට පටන් ගත්තේ මේ වගේ කතාවක් කියන ගමන් .

" අනේ අපිට දූපතට යන්න තිබ්බ නම්. ඔයාලට මතක හ අපි ඉස්සර නිවාඩුවට ආවම කෑම ජාතිත් අරගෙන දූපතට පික්නික් යනවා . මම කැමතියි දවසක ටින්කර්වත් මගේ දූපතට එක්කන් ගිහින් වටා පිටා ව

DO NOT COPY

sinhalaebooks.com



පෙන්වන්න . ඕන දෙයක් ඔට්ටුයි ඌ ඉරිසියාවෙ පැලෙනවා . එයාට ප්‍රදීපාගාරයක් තිබ්බට දූපතක් නැනෙ . දූපතක් ප්‍රදීපාගාරWෙකට වඩා වටිනවා''

" ඔයා හරි ජෝර්ජ් . ටින්කර්ගෙ ප්‍රදීපාගාරෙ ලස්සනයි තමයි . ඒකට ගොඩාක් ලස්සනට වට පිටාව වුනත් ජේනවාත් තමයි . ඒ වුනත් කිරින් දූපත තරම් ඒ කිසි දෙයක් වටින්නේ නෑ . කවදාවකත් අමතක කරන බැරි මොකක්දෝ බැඳීමක් අපිට වුනත් කිරින් දූපත එක්ක තියෙනවා . මං ඒකනේ අනික් හැම දේකට ම වඩා දූපත්වලට ආසා කරන්නේ''

ජුලියන් එහෙම කියන කොට නම් ජෝර්ජ්ට දැණුනේ පුදුමාකාර සතුටක් . ඉහේ මලක් පිපුණා වගේ හිනාවකුත් ගැහැණු ළමයාගේ මුහුණට නැගුණා . ඒ අතර පුංචි ඈනුත් ඒ කතාවට හවුල් වුනේ මෙහෙම කියමින්

" ඔව් දූපත් කියන්නේ මහ අමුතුම ජාතියක් . මං වුනත් දූපත් වලට හරි ම කැමති යි . ජෝර්ජ්ට වගේ ම මටත් දූපතක් තිබ්බ නම් කොච්චර හොඳද ? හැබැයි මහ විශාල එකක් නම් නෙමේ . මට බලා කියා ගන්න පුළුවන් ගානේ දූපතක් . ඒ වගේ ම මට නිදා ගන්න පුළුවන් තරමේ ගල් ගුහාවකුත් ඒකෙ තියෙන්න ඕන''

" ඒත් වැඩක් නැනෙ ඈන්'' ඩික් ඈන්ට පුංචි තට්ටුවක් දමමින් ඔවුන්ගේ කතාවට එකතු වුනා " ඔයා කැමති ගොඩාක් මිනිස්සු එක්ක ඉන්නනේ . යාලුයිවෝ ඇති කරගන්නනේ ඔයාට හැම වෙලේ ම



DO NOT COPY
Scanned with CamScanner

sinhalaebooks.com



වුවමනාව තියෙන්නේ . ඉතිං ඔයාට පුංචි දූපතක් තිබුනත් ඔයාට හොඳට ම පාලු දැනිලා තනි පංගලමේ ඒකෙ ඉන්න හිතෙන එකක් නෑ"

" ඇත් කොහොම වෙතත් එක්කෙනෙක් නම් දැනට ම යාලුවෝ ඇති කර ගන්නයි හදන්නේ"

ජුලියන් කිව්වේ ටිමී දෙස බලමින් . මෙතුවක් වෙලා ජෝර්ගේ දෙපා මත වැතිරගෙන හිටි ටිමී එතනින් නැගිටලා මහළු මනුස්සයෙක්ගේ බෑග් එක ඉව කරන්නට පටන් අරන් තිබුණා .මහළු මනුස්සයා ටිමීගේ ඔලුව අත ගාලා ඌව සුරතල් කරා පමනක් නොවෙයි . මල්ලේ තිබුණු බිස්කට් එකකුත් ටිමීට ලබා දෙන්න තරම් නිර්ලෝභී වුනා .

" වට පිටාවේ කොච්චර මිනිස්සු හිටියත් අපෙ ටිමීට මොකද ඉතිං .. කවුරුහරි කෙනෙක් මස් කට්ටක් හරි බිස්කට් එකක් හරි දෙනව නම් ඒ ඇති එයාට"

" ලැජ්ජා නැද්ද ටිමී හිගා කන්න" ජෝර්ජ් කීවේ මහලු මනුස්සයාට නම් ඇහෙන්නේ නැති වෙන ගානට සිහින් හඬකින් . " මගේ ළගට එනව ටිමී . නැත්තම් මිනිස්සු හිතයි අපි උබට ඇති වෙන්න කන්න බොන්න දෙන්නේ නෑ කියලා . ඇත්තට ම උබ ඔහොම හැසිරුණාට කිරින් වල ඉන්න ඕනම බල්ලෙක්ට වැඩියෙන් උබට කන්න බොන්න හම්බෙනවා කියල මං දන්නවා . හා බලන්න කියපන් පූසගේ කෑම එකත් හොරා කෑවෙ කවුද කියලා"



Scanned with CamScanner

sinhalaebooks.com



ටිමී තවත් එක මොහොතක්ටවත් පමා වුනේ නෑ . ඌ වහාම තම ස්වාමි දුව ළඟට දුව ගෙන ආවා . ඇවිත් ආදර්ණීය ලෙව කෑමකිනුත් ජෝර්ජ්ට සංග්‍රහ කෙරුවා . ඊට පස්සේ පාඩුවේ ජෝර්ජ්ගේ දෙපා මුල ඔලුව තියාගෙන බිම වැතිර ගත්තා . මේ වෙන කොටත් ඔවුන් රැගත් බස් රිය වේගයෙන් ඉදිරියට ඇදෙනවා . ඇතැම් තැන්වලදී බස් එක නවත්වන්නේ මගීන්ට බහින්න ඕන වෙන නිසා . ඒ වගේ ම කාට හරි නගින්න ඕන වුනා ම ත් මද වෙලාවකට බස් රථය නතර කරනවා . කෙනෙක් බහින නගින හැම වෙලාවක ම ටිමී ඔලුව උස්සලා මද බැල්මක් දැම්මත් කිසිම කෙනෙක්ට ගොරවන්න පුප්පන්න නම් ඉදිරිපත් වුනේ නෑ . දැං එයා හැසිරෙන්නේ බස් වල කටයුතු සිද්ද වෙන්නේ මේ පිළිවෙලට බව අවබෝද කරගත්තා වගෙයි . ටිමීගේ මේ අපූරු හැසිරීම සම්බන්දයෙන් කොන්දොස්තර්ට වුනත් ඇති වුනේ හරිම ප්‍රසන්සනීය හැඟීමක් . ඔහු ජෝර්ජ් ළගට ඇවිල්ලා මෙන්න මෙහෙම කිව්වේ ඒ නිස යි .

“ අනේ මේ බස් එකට නගින හැම බල්ලෙක් ම මෙයා වගේ වෙනව නම් කොච්චර හොඳද ? හරි ළමයි එහෙනම් දැන් ඔයාලා බැහැ ගන්න ලෑස්ති වුනොත් හොඳයි . ඊ ලග නැවැතුම් පොළ බිග් හොලොව් වල”

“ බොහෝම ස්තූතියි” ජුලියන් ඉතාම ආචාරශීලී විදිහට කිව්වා . ඒත් සමග ම ළමුන් හැම දෙනාම බස් එකෙන් බැහැ ගන්න සූදානම් වුනා

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com





ලී වලින් හදන ලද විශාල ගේට්ටුවක් අබියස අන්තිමේදී බස් එක නැවැත්තුවා . රුස්ස ගස් යට ඉදි කර ඇති විශාල නිව හනක් ගේට්ටුව තුළින් ඔවුන්ට දැක ගන්නට ලැබුණා .

" බිග් හොලෝව් ... " ජුලියන් ගෙදරට කියන නම කාටත් ඇහෙන විදිහට ආයෙත් සැරයක් කිව්වේ ගස් වලින් වට වී තිබෙන නිවස දිහා හොදින් බලමින් . ඇත්තට ම වැවී තියෙන ගස් නිසා ගේ පේන්නේ



Scanned with CamScanner

sinhalaebooks.com



බෙනයක් ඇතුළෙ තියෙනවා වගේ . බිග් හොලෝව් කියන්නෙත් ලොකු බෙනය වගේ තේරුමක් තියෙන නමක් නිසා එයාට හිතෙන්නේ ගෙදරට තියෙන්නෙත් නමට ම ගැලපෙන පෙනුමක් කියලයි .

" ඔන්න අපි එහෙනම් තැනට ආව . බැලූ බැල්මට නම් පේන්නේ හරීම අමුතු තැනක් වගේ . ගුප්ත පාලු ගතියකුත් තියෙනවා . හරි හරි අපි මේ පාලු ගතිය නැති අරලා ගමුකෝ ..දැං බලමු ටින්කර් කොහේද කියලා . මිනිහා අපි ව දැක්කම සතුටින් උඩ යයි කියන එක නම් මට සහතිකයි . විශේෂයෙන් ම ටිමී ව දැක්කම . ඒයි ඩික් බකන් නිලා ඉන්නෙ නැතුව මේ බෑග් ටික බාගන්න මට ටිකක් උදව් කරනවකෝ"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 03

# ටින්කර් හා මිස්චීෆ් ආයෙමත්

DO NOT COPY

ළමයි හතර දෙනා සහ ටිමී විශාල ගේට්ටුව හැරගෙන ඇතුළට ගියා . සත්තකින් ම ඒක ගොඩාක් පරණ මළ බඳුන ගේට්ටුවක් . ඒ නිසා ම ගේට්ටුව විවර කරන කොට නැගුණේ ඉතා ම අප්‍රසන්න කිරි කිරි හඬක් . ටිමී පවා ඒ සද්දයට තිගැස්සිලා මහා හයියෙන් බුරන්න පටන් ගත්තා .
" ෂ් කෑගහන්න එපා ටිමී" ජෝර්ජ් කීවේ ටිමීට අනතුරු හඟවන හඬින් . " ඔයා ඔය විදිහට බුරන්න තියා ගත්තොත් මහාචාර්යතුමා එක්ක පැටලෙන්නයි සිද්ද වෙන්නේ ආව ගමන් ම . බලන්න මේක හරිම නිශ්ශබ්ද ගෙදරක් . ඒ වගේ ම හරි ම අමුතු තැනක් . මම හිතන්නේ අපිත් මී මැස්සො වගේ මුනු මුනු ගානට කතා කරන එක හොදයි . ඉතිං



Scanned with CamScanner

sinhalaebooks.com



ඔයාටත් අද ඉදන් සිද්ද වෙන්නේ මුනු මූනුගාලා බුරන්න පුරුදු වෙන්න තමයි''

ටිමී ඒ පාර නම් මෙච්චර වෙලා නගපු උස් බිරුම් හඬ සිහින් කෙදිරියක් තරමට පරිවර්තනය කර ගත්තේ හරියට ම ජෝර්ජ් කිව්ව දේවල් අකුරක් නෑර තේරුම් ගත්තා වාගේ . එතැන් සිට ඌ ගමන් කරන්න පටන් ගත්තෙත් ජෝර්ජ්ගේ ඇගේ ගෑවෙන නොගෑවෙන ගානට . ඔවුන් ටිමී හ සමග නිවස දක්වා තියෙන කුඩා බෑවුම බහින්නට පටන් ගත්තා . නිවස පුරා ම තියෙන්නේ හරි ම අමුතු හුදෙකලා බවක් බව ළමුන්ට පෙනවා . නිවසේ ජනේල පිහිටා තිබුණේත් කිහිපයක් පමණයි . මේ සෑම දේකින් ම ළමුන් තුළ ඇති වන්නේ කුතුහලයක් මෙන් ම පුදුමයක් .

DO NOT COPY

" මහාචයීතුමා එයාගෙ වැඩ ගැන මිනිස්සු හෝදිස්සියෙන් ඉදී කියල හරි ම පරිස්සමෙන් වැඩ කරනවා ඇති මගෙ හිතේ . ඒකයි මෙච්චර ලොකු ගේකට මෙච්චර අඩුවෙන් ජනෙල් වුනත් තියන්න ඇත්තෙ . හේලිමහාචාර්යතුමා ගොඩාක් රහසි ගත පරීක්ෂන කරන කෙනෙක් වෙන්න ඇති''

ඈන් විස්තර කරලා ඒ වගේ කතාවක් කියන කොට ඩික් ද ඈගේ කතාවට මේ විදිහේ අදහසක් ඉදිරිපත් කෙරුවා.

" මම අහලා තියෙනව හේලින් මහචායීතුමා හැතැම්ම ගනන් දිග ඉලක්කම් එක්ක ජීවත් වෙන කෙනෙක් කියලා . දවස්ක් ටින්කර් කිව්වා මිස්චිෆ් ගැන කතාවක් . මිස්චිප් මහාචායීතුමාගෙ ඉලක්කම් කොලයක් අහුවෙලා හපලා . මහචායීතුමා ඉලක්කම් කොළයෙන් ටිකක් හරි බේර



Scanned with CamScanner

sinhalaebooks.com



ගන්න කියලා හිතාගෙන මිස් චීෆ් පස්සේ වරුවක් විතර පන්නලා තියෙනවා . ඔයලා දන්නවනේ මිස් චීෆ්ගේ හැටි . මිනිහා හා ගුලක් අස්සේ රිංගලා දවස් දෙකක් යනකන් එළියට ඇවිල්ලා නෑ . ඉතිං ඒකෙන් ගන්නම දෙයක් තිබිල නෑ"

අහිංසක මිස් චීෆ් .. මහාචාර්යතුමාට ඇති බය නිසා ම දවස් දෙකක් තිස්සේ හා ගුලක් තුළ සැඟවී සිටි ආකාරය සිහියට නැගෙන විට ළමුන් හැමෝට ම හයියෙන් හිනා ගියා . ඒ අතර ජුලියන් ටිමීට කිසියම් අවවාදයක් ලබා දෙන්නත් අමතක කරේ නෑ .

' ටිමී ඔයා එහෙම මිස් චීෆ් එක්ක එකතු වෙලා ඔය වගේ නොහොබිනා දඩබ්බර වැඩ කරන්න එහෙම යන්නෙ නෑ . උඹ කන්න ගන්න හැම පත්තර පිටුවක් ගැනම හරිම කල්පනාවෙන් .. කන්න කලින් දෙපාරක් නෙමේ දහ වතාවක් විතර බලපන්"

" එයා ඔය වගේ ඔලමොට්ටල වැඩ කරන්නෙ නෑ" ජෝර්ජ් ටිමීගේ පැත්තට කතා කළේ ඉබේට ම . " එයා කන්න ඕන මොනව ද නොකන්න ඕන , මොනව හ කියලා හොදට දන්නවා"

" ආනේ ඇත්ත ද ? එහෙනම් එයා ගිය නිවාඩුවේ මගේ නිල් පාට සෙරෙප්පු දෙක කෑවෙ මොන ජාතියේ කෑමක් කියලා හිතාගෙන ද කියමු බලන්න" ඈන් කීවේ හිනා වෙන ගමන් ම යි .

ටිමියා බිරුම් හඬක් නගා ඈන් දිහ බලලා වල්ගය වනන්නට පටන් ගත්තා . ඊට පස්සේ නිකන් හරියට ' සමාවෙන්න ඈන්" කියන්නට



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



වගේ පුංචි ගැණු ළමයා දිහා බලාගෙන ඉඳලා එයාගෙ මූහුන ලෙවකන්නට පටන් ගත්තා .

" අනේ අනේ ටිමියෝ උඹ මගේ සෙරෙප්පු ඔක්කොම කෑවත් මං උඹට දෝෂයක් කියන්නේ නෑනේ ..ඒත් ඉතිං හොඳම එක තෝරගන්නෙ නැතුව පොඩියක් පරන පාවිච්චි කරපු කක් තෝර ගන්න තිබ්බනේ"

ඈන් කියවගෙන කියවගෙන ගියේ ළමුන් කවුරු කවුරුත් සිනහවේ ගිල්වමින් . ඒ අතර ටිමී හදිසියේ ම බිරීම නවත්වා අසළ වන පඳුරක් දිහා කුතුහලයෙන් බැලුවා .ඊ ලගට අනතුරක සේයාවක් හදිසියේ ම දැනුනා වගේ එක දිගට සිහින් ගෙරවුම් මාලාවක් ම පිට කරන්නට වුනා .ජෝර්ජ් වහා ම ක්‍රියාත්මක වී ටිමීගේ කරපටිය තදින් අල්ලා ගත්තේ පඳුර අස්සේ සිටින විශ ගෝ්ර සරපයෙක් වත් ටිමීට ඉව වැටුනdා හ කියන සැකයෙන්

" ශර්පයෙක් වත් දන්නෙ නෑ . එහා ගෙදර බල්ලත් පඳුරක් අස්සේ ඉඳපු සරපයෙක් අල්ලන් ගිහින් ඌ බල්ලාගේ කකුලකට දශ්ට කරලා සෑහෙන කාලයක් වද වින්දා .අහකට යනව ටිමී . ඒකා විෂ ගෝ්ර පොළගෙක් එහෙම නම් ඌත් එක්ක ඔට්ටු වෙන එක නුවණට හුරු නෑ"



DO NOT COPY

sinhalaebooks.com



ජෝර්ජ් මොනවා කීවත් ටිමී ගෙරවිල්ල නම් මොහොතකට වත් නතර කරේ නෑ . විශ ගෝර ශර්පයෙක් නම් ළමයිනුත් සිටින වෙලාවේ කීයට වත් බකන් නිලාගෙන සිටීමේ පුළුවන් කමක් ඌට ඇත්තේ ම නෑ . මේ ළමයි හතර දෙනා ආරක්ෂා කළ යුතුය කියන හැඟීම හැම තිස්සේ ම ටිමීගේ හිතේ තියෙනවා . ඒ වෙනුවෙන් ජීවිතය වුනත් පරදුවට තියන්න ඌ ඕනෑ ම වෙලාවක සූදානම් .

එවර ඒ ඉව පෙරටත් වඩා තදින් බල්ලාගේ නහයට හසුවුනා .. ඒක නම් විෂ ගෝර ශර්පයෙකුගේ හුර්ගන්දයක් නෙමෙයි . හිත මිතුරු සුවඳක් . උද්දාමයෙන් පිරී ඉතිරී යන රාවයක් නංවා ගත් ටිමී ජෝර්ජ් ද ඇදගෙන ම එක පිම්මට ම පදුරට පැන්නේ අන්න ඒ නිස යි .ඊ ළගට පදුරෙන් එළියට පදුර අස්සේ සැඟවී මෙතුවක් වෙලා ටිමීගේ ඉව එක්ක කොකම් පෑ හැංගිමුත්තා මතු වුනා . ඇත්තට ම ඒ නම් විෂ ගෝර සර්පයෙක් හෝ උරග වර්ගයට අයත් අයෙක් හෝ නම් නෙවෙ යි . ටිමියා ද සමග පදුරෙන් එළියට ආ අමුත්තා ටින්කර්ගේ අදරනීය දිදුලන දෑසැති පුංචි වදුරු මිත්‍රයා වුන මිස් චීෆ් දගයා යි .

මොනවදෝ මුමුණමින් බුකුම් බුකුම් සංගීතයෙන් පිළි ගැනීමේ ගීය ගයමින් මිස් චීෆ් ටිමීගේ පිට මතට නැග ගත්තේ ඉතා ම සංතෝශයෙන් . ඊ ළගට ඌ ටිමීගේ කොළරය යටින් ඇගිලි යවා ගත්තේ හරියට ම ආදරයෙන් වැළඳගන්නට උත්සාහ ගන්නවා වගේ .

“ ආනේ මිස් චීෆ් ...” සිව් දෙනාට ම එක් හඩින් කෑ ගැහුණා .. ඇත්ත වශයෙන් ම කලකට පසු හිත මිතෘ වදුරු මිත්‍රයා දක්නට ලැබීම ඔවුනට

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com







Scanned with CamScanner

sinhalaebooks.com



ගෙනාවේ පුදුමාකාර සතුටක් . "එහෙනම් උඹ කාටවත් කලින් අපි ව පිළි ගන්න මගට ආවා"

වදුරු භාෂාවෙන් මොන මොනවදෝ කියමින් මිස් චීෆ් එක පාරට ම ජෝර්ගේ උරහිසට පැන්නා . ඊ ළගට ඌ නතර වුනේ ජුලියන්ගේ උරහිස උඩයි . ඔහුගේ කනෙන් ඇද හැඩ බලා ආදරය පළ කොට අවසාන කල වදුරු මිත්‍රයා තුන් වෙනුවට තෝරාගෙන තිබුනේ ඩික්ගෙ උරහිස යි . අන්තිමේ දී ඈන්ගේ උරහිසට පැන බෙල්ලේ වෙලී සුරතල් වෙන්නටත් මිස්චීෆ් අමතක කළේ නෑ . මිස් චීෆ්ගේ ඇස් ප්‍රීතියෙන් දිලිසෙන්නට වූවේ ළමුන්ගේ ආගමනය ඌට අපමන සතුටක් වූ නිසාවෙන් .

" අනේ මූ අපි ආව එක ගැන හරියට සංතෝශ වෙනවා වගෙයි . ,මිස් චීෆ් කෝ ඔයාගේ ටින්කර් ?"

මිස් චීෆ් හනි හනික ඈන්ගේ උරහිසින් බිමට පැන්නා . ඊ ලගට ඈන් කීව හැම දෙයක් ම තේරුම් ගත්තා වගේ පාර දිගේ ගේ දිහාවට ඇවිදින්න පටන් ගත්තේ විටින් විට පිටිපස්ස බලමින් ළමුන්ටත් ඌ පසුපස එන ලෙස දන්වමින් .ඔවුන් ටික දුරක් මිස් චීෆ් පසු පස ගමන් කරා . ඇත්තට ම මිස් චීෆ්ගේ මග පෙන්වීම හිතුවාට වැඩියෙන් වේගවත් නිසා ඔවුනට ගමන් කරන්න සිද්ද වුනේ දුවනව වගේ . එක පාරට ම සැර පරුෂ කට හඩක් නිවසේ අනික් පසින් ඇසෙන්නට පටන් ගත්තේ ඒ අතරයි .

DO NOT COPY

sinhalaebooks.com



" උඹලා මොකද මෙහෙ කරන්නේ . මෙතනින් මක බැව්ලා යන අතක තොලොව් වෙලා යනවලා . මේක පෞද්ගලික ඉඩමක් බව පේන්නේ නැද්ද ? මම පොලිසියට කතා කරන්ඩ කලින් යනවා"

ඒ කතාවට ඇත්තට ම ළමුන් පස් දෙනා පුදුමාකාර විදිහට බියපත් වුනා කීවොත් බොරුවක් නෙමෙයි . ඇත්තට ම අද නම් දවස ඒ තරම් හොද නෑ කියලයි දැන් නම් එයාලට හිතෙන්නේ . යන යන හැම තැනින් ම ඔවුන් ව එළවා දමන කොට ඒ වගේ සිතිවිල්ලක් ඇති එන එක පුදුමයක් නෙමෙයි . ඒ අතර ජූලියන් එක පාරට ම කටහඬේ අයිතිකාරයා හඳුන ගන්නට සමත් වුනා . එතන හිටියේ හේලින් මහාචාර්ය තුමා මිස වෙන කවුරුවත් නෙමෙයි . හිතට පුලුවන් තරම් ධෛර්ය අරගත්තු ජූලියන් මහා චාර්ය තුමා ලඟට ගිහින් හැකි උපරිම අයුරින් ආචාරශීලී අඩින් කතා කරන්නට පටන් ගත්තා .

" සුබ සැන්දෑවක් සර් . මම හිතනවා අපෙන් ඔයාට ගොඩාක් කරදර වෙන්න ඇති කියලා . ඒ වුනත් අපේ නැන්දා නම් කිව්වේ සර් අපිට එන්නය කිව්වා කියලයි"

" මොන නැන්දෙකd් හ ? අනේ මේ නිකන් පච කියවන්න ලෑස්ති වෙන්න එපා . මං දන්න නැන්දෙක් නෑ . මං දන්නවා උබලා ආවේ මොකට ද කියලා . අද උදේ පත්තරේ තිබ්බ ගොන් ආර්ටිකල් එක දැකලා ඕප දූප හොයන්න ආව කරදර කාරයෝ . උබලා විතරක් නෙමේ අද දවසට ආව තුන් වෙනි කණ්ඩායම තමා උබලා . ඉක්මනට යන අතක යනවා යන්න . අර බලු තඩියත් අරගෙන ම යනවා . ආව මෙතන බල්ලොත් උස්සන් ඔත්තු බලන්න ."

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



මහාචාර්යතුමා ඉවක් බවක් නැතුව දොඩවන්න පටන් ගද්දී ළමුන්ට දැණුන අසරණකම වචනයෙන් කියන්නත් බැරි තරම් . ඒත් ජුලියන් හිතාමත් ම ඉවසිල්ලෙන් කරුනු කාරණා තේරුම් බේරුම් කරන්නට උත්සහ ගත්තා .

" ඒත් සර් ඔයා ඇත්තට ම අපි ව දන්නෙ නැද්ද ? ඔයාත් සැරයක් අපේ ගෙදර නවතින්න ඇවිත් තියෙනවා .ඔයා දන්නව ද ..."

" බොරු කියන එකේ වුනත් ර්මාවක් තියා ගන්නවා මනුස්සයෝ .. මම මේ අවුරුදු ගානකින් ගෙයින් එළියට ගිහින් නෑ . එහෙව් එකේ මං කොහොමද තමුන් ලෑ ගෙදර නවතින්න ආවා වෙන්නේ .''

ජුලියන් කතාව කරගෙන යන අතර තුරම මහාචාර්යතුමා තොරතෝංචියක් නැතිව කියවන්නට පටන් ගත්තා . ළමයින්ට වගේ ම ටින්කර්ට වුනත් මහචාර්යතුමාගේ සැර පරුෂ හැසිරීම ගෙන දුන්නේ දරා ගන්න බැරි තරම් බියක් . හැඩුම් හඩින් වදුරු බසින් මොන මොනවදෝ තෙපලූ මිස් චීප් එක පාරට ම පදුරු අතරට වැදී සැඟව ගත්තේ ළමුන් තව තවත් හුදෙකලා කරමින් .

" මට පේන්නේ ලොක්කා අග මුල මාරු කරගෙන' ජුලියන් බොහෝ ම සිහින් හඬකින් ඩික්ට කොදුරා කිව්වා . ' කොයිකටත් අපි ටිකක් පල්ලම් බහින එක නුවණට හුරුයි . අපි ආවේ මේ මනුස්සය ම අපිට එන්න කියලා කිව්ව නිසානෙ කියන එකවත් මෙයාට මතක නෑ .මිස් චීෆ් ටින්කර්වත් අඬ ගහගෙන ආවොත් නම් ප්‍රශ්නෙ විසඳෙනවා"

ඒ අනුව ළමුන් පස් දෙනා ටිමී ද කැටුව නැවතත් ගේට්ටුව දෙසට ඇවිදගෙන යන්නට පටන් ගත්තා . මහාචාර්ය තුමා දවසක් අශ්වයා එළ



DO NOT COPY

sinhalaebooks.com



වූ විදිහට ම කෝපයෙන් බනින අතර ම ඔවුන් පසු පස ගමන් ගත්තා . හදිසියේ ම බිම දිගේ යන රොකට්ටුවක් වගේ හැල්මේ දුවගෙන ඔවුන් ඉදිරියේ ටින්කර මතු වුනේ වාසනාවට වගේ . මිස් චීෆ් ටින්කර්ගේ උරහිසේ වාඩි වී කොලුවාගේ කොණ්ඩයෙන් අදිමින් සිටි අයුරින් ම ටින්කර් කැඳවාගෙන ආවේ නුවණැති මිස් චීෆ් බවත් ඔවුන්ට පැහැදිලි යි . " මාර දක්ෂ වඳුරෙක්" ඒ දැක ජූලියන් තමාට ම කියා ගත්තේ මිස් චීෆ් දිහා ආදරයෙන් බලමින් .

" තාත්තා .. අපේ යාලුවන්ට ඔය විදිහට බනින්නේ ඇයි" කෝපයෙන් තප්පුලන තත්තගේ ඉස්සරහට ම පැන ටින්කර් ඇහුවේ හරි ම කනගාටුවෙන් . " ඔයාට මතක නැද්ද ඔයා ම එයාලට මෙහේ එන්න කියල කිව්වා'

" මේ මොන විකාරයක් ද ටින්කර් . මට මතක නෑ එහෙම දෙයක් . කවුද එතකොට මේ ගොල්ලෝ ?"

" අර ඉන්න ගෑණු ළමයා ජෝර්ජ් . ඔයාට මතක නැද්ද අප්පා මිස්ටර් කිරින්ගේ දුව ? එතකොට අනිත් අය කිරින් මහත්තයගෙ නෑදෑ වෙන ළමයි . එතකොට මේ එයාලගෙ බල්ලා ටිමී . අයියෝ ඔයාට කිසිම දෙයක් මතක නැනෙ . කිරින් මහත්තයයි කිරින් මහත්මියයි රතු උන හැදිලා නිරෝධායනය කරල ඉන්න විත්තිය දැන ගත්තමයි ඔයා ම යි මෙයාලට එන්න කිව්වේ'

ටින්කර් තාත්තා ඉදිරියේ කියවගෙන කියවගෙන යනවා . ඇත්තටම ඔහු සිටින්නේ මේ වෙලාවෙ ඕනෑවටත් වඩා කලබලයෙන් . කතාව අතරෙම ටින්කර්ගේ අත පය පවා ඒ මේ අත විසික් වෙනවා . ඔහුගේ හිහා

sinhalaebooks.com



බලා සිටින ඕනෑ ම අයෙකුට පෙනෙන්නේ ටින්කර් නටනවා , එහෙම නැත්තම් රංගනයක් ඉදිරිපත් කරනවා වගේ .

" මොකෝ තමුසෙ ඔය නටන්නේ . මුලින් ම ඔය නටන එක නවත්තලා ඉන්නවා . මට නම් මතක නෑ මං කාටවත් මෙහේ එන්න කියලා ආරාධනා කරා කියලා . මම එහෙම කිව්ව නම් ජෙනී දන්නව ඇති . ඉන්නවා මම ජෙනීගෙන් අහලා බලන්නම්'

" ඔයා ජෙනීට කිව්වා තමයි" ටින්කර් එවර බෙරිහන් දුන්නේ කෝපය වගේ ම සතුටකුත් එක්ක . ඒ වගේ ම තාමත් අර ඔහුගේ නැටිල්ල නම් නතර වෙලා නෑ . ටික වෙලාවක් ඒ දිහා බලා සිටි මිස් චීෆ් ඒකට ම එකතු වෙමින් හරි ම සතුටින් ඔහුගේ රංගනයත් පටන් ගත්තා .

" ජෙනී තාමත් ඇදන් අස් පස් කරන ගමන් . මමත් හිටියේ එයාට උදව් කර කර . එයා ඉන්නෙත් හොඳට ම කේන්ති ගිහින් . ඔයාගේ උදේ කෑම එක තාමත් මේසේ උඩ . ඔයා උදේට කාලත් නෑ . දැන් රෑ කෑම වෙලාවත් ලං වීගෙන එන්නෙ . එයා උදේ කෑම එක අයින් කරල දැමා"

"අහා ඒක තමයි එහෙනම් මට මෙච්චර කේන්ති එනව ඇත්තේ ." එවර නම් හේලින් මහා චාරය තුමාකීවේ පෙර පැවති රොස් පරොස් ස්වභාවයෙන් නෙමේ . අර නපුරු බැල්ම වෙනුවට ඔහුට මහාහයියෙන් හ් ඉනා යන්නත් පටන් අරන් . ඔහුගේ මේ අලුත් වෙනස දකිනකොට නම් ළමයින්ට වුනත් මෙච්චර වෙලා දැනුන බිය කරු බව දුරු වෙලා ගිහින් අපූරු හිනාවක් මුහුණුවලට නැගුණා . ඒ වගේ ම හේලින් මහා චාර්‍ය තුමා මොන තරම් අපූරු මනුස්dසයෙක් හ කියලත් යාලට හිතෙනව . ලෝකෙ ම දැණුම මොළෙ තියන් ඉන්න මේ මනුස්සයාට

sinhalaebooks.com



සාමාන්‍ය දේවල් සේරම අමතකයි . තමන් ගත් දුරකතන ඇමතුම් , තමාව හම්බෙන්න ආව උදවිය විතරක් නෙමේ කෑම කන එක පවා ඔහුට අමතක යි .

" මේක වරදවා වටහා ගැනීමක් සර් .. අපේ ගෙදර රතු උන නිසා නිරෝදයනය කරපු නිසා ඔබ තුමා අපට ආරාදනා කරපු එක ම හරී ම කරුණාවන්තකමක් . අපි වැඩිය සද්ද බද්දයක් නැතිව ඔබ තුමාට කරදර නොවෙන විදිහට ඉන්න හිතාගෙන ඉන්නේ . ඒ වගේ ම ඔබ තුමාට මොකක් හරි උදව්වක් උපකාරයක් ඕන වුනා ම ඒකට උදව් කරන්නත් අපි ලෑස්තියි . "

මහා චාරය තුමාගේ වෙස් පෙරළෙමින් පවතින අවස්ථාවේ ජූලියන් ගොඩාක් ආචාරශීලී විදිහට එහෙම කිව්වා .ඒ කතාව අහපු ගමන් ළමුන් දිහා හොදින් නිරීක්ෂනය කරපු මහාචායී තුමා අන්තිමේ ටින්කර් දිහාට හැරුණේ මෙහෙම කියමින්

" ඔයාට එයා කියපු දේ ඇහුණද ටින්කර් .. ඇයි ඔයාටත් බැරි ඒ විදිහට ඉන්න . මගේ වැඩවලට කරදර නොවෙන විදිහට සද්ද බද්ද නැතිව ඉන්න ඔයාටත් පුලුවන් වුනා නම් කොච්චර වටිනවද ? හරි හරි ළමයා .. මම ගොඩාක් බැරේරුම් රහසි ගත කටයුත්ත්ක තමයි මේ දවසවල යෙදිල ඉන්නෙ . ඉතිං ඔයා කියන විදිහට මගේ වැඩවලින් අයින් වෙලා මේ ටින්කර්වත් අයින් කරගෙන ඉන්න පුළුවන් නම් උබලා ටික දොහක් මෙහේ නැවතිලා ඉටියාට මට කාරියක් නෑ. හැබැයි එක දෙයක් . බැරි වෙලාවත් අර කුළුන පැත්තේ යන්න බෑ . හැමෝට ම යි මං මේක කියන්නේ . කවුරුවත් කුළුනට නැගලා මට අහු වෙන්න එපා"

DO NOT COPY

sinhalaebooks.com



මහාචාර්‍ය තුමා ජුලියන් දිහාට හැරිල එහෙම කියන කොට ළමයි හැමෝම ඔහු කී හිහාවට බැල්මක් හෙලුවා .එතකොට තමයි ගස් අතරින් උස්ව ඉදිකොට ඇති වැඩි මහතක් නැති උස කුලුන ඔවුන්ට දක්නට ලැබුනෙ . ඇත්ත වශයෙන් ම එය නම් ළමුන්ගේ කුතුහලයට හේතුවක් වූ බව නොකියා ම බැරි කාරණාවක් . ඒ කිච්ච උස ම උස කුලුණ ඉහළින් වානේ පෙති වැනි යමක් පිතටට දක්නට ලැබෙනවා .එය දකින ළමයින්ට සිහියට නැගෙන්නේ ගුවන් යානයක අවර පෙති . හමාගෙන එන සුළගෙන් ඒ වානෙ පෙති සෙලවෙනකොට ඔවුන්ගෙ කුතුහලය තව තවත් වර්දනය වුනා .

“ ඒ වගේ ම තමයි මගෙන් ඒ ගැන ප්‍රශ්න අහන්නත් හිතන්නවත් එපා” දැන් මහාචාර්‍යතුමා කියන්නේ මරුමුස් බැල්ම ජෝර්ජ් දෙසට යොමු කරගෙනයි . “ මම ඇරුනම මේ ගැන දන්න එක ම මනුස්සයා මේ ළමයගේ තාත්තා විතරයි . එයා දන්නව මේ වගේ දේවල් ගැන කෙල බිඳක්වත් නොහෙලා ඉන්න”

“ අපි හීනෙන්වත් කාටවත් ඒ ගැන කියන්නේ නෑ සර් . මාව විශ්වාස කරන්න සර් . අපි ඔයාට කිසිම කරදරයක් කරන්නේ නෑ . මේ වෙලවෙ අපිට මෙහේ එන්න කියපු එක ම ලොකු දෙයක් . ඒ වගේ ම ඔබ තුමාට අපෙන් මොකක් හරි උපකාරයක් අවශ්‍ය වුනොත් බොහොම සතුටෙන් අපි ඒක කරනවා”

ජුලියන් එහෙම කියන කොට මහාචාර්‍ය තුමට මෙ අපූරු කොල්ලා ගැන ඇති වුනේ ඇත්තට ම හරි ම පැහැදීමක් . මේ වන විට නම් හොස්ස අගින් මැස්සා යන්න බැරි කුකුල් කේන්තිකාර මහාචයීතුමා ටිකින් ටික

sinhalaebooks.com



සන්ත දාන්ත තීන්ත කූඩුවක් වෙන්න පටන් අරන් . ඔහු ජූලියන් දිහාවට හැරිලා මෙහෙම කිව්වා .

" ඔයා හරි ම බුද්ධිමත් ළමයෙක් වගෙයි මට පේන්නේ . එහෙනම් හැමෝට ම ගුඩ් බායි . මං දැන් වත් ගිහිල්ලා මගේ උදේ කෑම එක කන්නම් . මම හිතනවා බැදපු බිත්තරයි බේකනුයි ඇති කියලා . දැන් නම් මට යකෙක් කන්න බඩගිනියි"

මහාචාර්යතුමා එහෙම කියන කොට ළමයින්ගේ මුහුණුවල ඇඳුනේ හරි ම සැනසිලි සහගත සිනා රැල්ලක් . ඒත් එක්ක ම තමයි ටින්කර්ටත් මෙහෙම කියන්න අතක් වුනේ .

" තාත්තා ජෙනී ඒ කෑම එක අස් කරා කියලා මම ඔයාට කීවේ . දැන් රෑ කෑම වෙලාවටත් වෙලාව හරියාගෙන එන්නේ"

" හරි හරි එහෙනම් . මං ඉතිං ඒකටවත් කල් වේලා ඇතිව එන්නම්'

ඉතින් අපූරු මහාචාර්යතුමා කිසිම දෙයක් සිද්ද නොවුනු ගානට නිවස ඇතුලට ගියා . ළමයි පස් දෙනාත් ටින්කර් සමග එක්ක ව ඔහු පසු පසින් නිවස දෙසට ඇවිදින්න වුනා . දේවල් හොඳ අතට හැරෙන බවක් බැලූ බැල්මට පේන්න තිබ්බත් ළමුන්ට සේම සත්තුන්ටත් දැනෙන අවුල් සහ ගත බව නම් තාමත් එහෙමමයි . ඊ ළගට මහාචාර්යතුමා මොන විදිහේ පෙරළියකට , කුනාටුවකට පත් වෙයි ද කියලා කාටවත් හිතා ගන්න බෑ .

DO NOT COPY

sinhalaebooks.com



ජෙනී ඉක්මනින් ම ඔවුන්ට ඉතා ම උසස් රාත්‍රී කෑමක් ලබා දුන්නා . තම්බපු අල , කැරට් ස්ටුවක් , පීස් ඇමූ සූපයක් සහ තවත් බොහෝමයක් දෑ ඒ කෑම වේලේ අඩංගුවැ තිබුණා .

" නියමෙ ම කෑම වේලක්" මහාචාර්‍ය තුමා කීවේ හරිම සතුටින් . " මේ වගේ බ්‍රේක්ෆස්ට් එකක් හම්බුනේ සෑහෙන කාලෙකින්"

" මේ හවස කෑම තාත්තේ"

කොහොමින් කොහොම හරි දැන් නම් ළමුන්ට හිතෙන්නේ මහාචාර්‍ය තුමා හිතුව තරම් නපුරු මනුස්සයෙක් නොවෙයි කියලා . ඔහු ඇතුළෙ හරි ම සුන්දර විනෝදශීලී මනුස්සයෙක් ඉන්න බව ඔවුන්ට දැනෙනවා . ඒත් ඉතිං ඒ වුනත් කොයි මොහොතක හෝ මේ විනෝදශීලී මනුස්සයා ගොරෝන පුප්පන රාක්ෂයෙක් බවට පත්වෙන අවත් ඔවුන්ට අමුතුවෙන් අනතුරු හඟවන්නට වුවමනා නෑ .

මහචාර්‍ය තුමා තවත් සුලු වෙලාවක් ඔවුන් අමග ගත කළා . ඊට පස්සේ කාමරයෙන් පිට වෙලා පසේජයකින් අතුරුදන් වුනා . ඔහුගේ වැඩ කටයුතු කරන කාමරය පිහිටා ඇත්තේ අන්න ඒ පැසේජයේ කොහේ හරි තැනක කියලා ළමුන්ට හිතුනා . කොහොමින් කොහොම හරි කාට කාටත් ඇගට ලේ බිඳක් හෙලුනේ මේ අමුතු තාලේ කුනාටු මනුස්සයා ඔවුන්ගේ දෑස් වලට නොපෙනී ගියාට පස්සේ .

" එහෙනම් අපි ඉක්මනට මේ දේවල් අස් පස් කරමු . මම ඔයාලට කාමර පෙන්වන්නම් ඊට පස්සේ. ඔයලට මෙහේදි කම්මැලි කමක් දැනෙන එකක් නම් නෑ කියලා සහතිකයි"

sinhalaebooks.com



ටින්කර් අන්තිමට එහෙම කිව්වේ හරි ම අවංක චේතනාවෙන් . ඇත්තට ම සිද්ද වුනු හැම දේකට ම පස්සේ තමන්ගේ යාලුවන්ට දුකක් කාන්සියක් පාලුවක් නොදැනෙන අයුරින් එයාල ව සතුටින් තියන්න ඕන කියන හැඟීම ඔහුට තියෙනවා . සත්තකින් ම ටින්කර් .. කම්මැලිකම නැති කිරීම ගැන නම් ඔයා වැඩිය කලබල වෙන්න අවශ්‍ය නෑ . පොඩ්ඩක් ඉවසීමෙන් බලාගෙන ඉන්න .. පස් දෙනාටත් ඔයාටත් ඇති තරම් ත්‍රාස ජනක අද්දැකීම් ළග ළග ම එනවා .....

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 04

# ජෙනීගේ හරි ම අපූරු අදහස

DO NOT COPY

ටින්කර් බදේසි කිහ්පයක් රැගෙන ඒමේ අදහසින් කුස්සියd හෙසට ගමන් කෙරුවා .ටිමී ව පවා තිගැස්මට ලක් කරන අමුතු ම මාදිලියේ හඬක් ටින්කර්ගෙන් නැගෙන්නට වුනේ ඔහු මෙසේ ගමන් කරන අතරෙ යි

" දෙයියෝ සාක්කි . මේ ටින්කර්ගේ වාහන පිස්සුව තාමත් නැති වෙලා නෑ නොවැ ." ජුලියන්ට කියවුනේ ටින්කර් නගන්නේ මෝටර් රථයක හඬක් බව වැටහුනාට පස්සෙයි . " මේ කන්දොස්කිරියාව



Scanned with CamScanner

sinhalaebooks.com





Scanned with CamScanner

sinhalaebooks.com



ඉවසලා ම මහාචාර්යතුමට පිස්සු හැදෙන් නැති එකත් පුදුමයි . මොන ජාතියේ වාහනයක් කියල ද දැන් ටින්කර් හිතාගෙන ඉන්නේ .. ආ සද්දෙ හැටියට නම් මිනිහා මෝටර් බයිසිකලයක්''

මෝටර් බයිසිකලයේ හඬ එක පාරට ම බ්‍රේක් වදින හඬක් බවට පරිවර්තනය වුනේ මහා ගෝෂාවක් නිවස පුරා ඇති කරමින් .ටිමී පෙරටු කොට ගනිමින් පස් දෙනා ම වහා ම කුස්සිය හ් සට දුවන්න පටන් ගත්තේ සිදු වුනේ කුමක්දැයි දැන කියා ගැනීමේ අදසින් .

" ඇක්ෂිඩෙන්ට් ..." මෝටර් සයිකලයේ රියදුරා කීවේ නැගීs ඉටීමට උත්සහ කරන ගමන් . " මම ආපු ගැම්මට ම වංගුව ගත්තා . වාහනේ බිතියේ හැප්පුනා .. ඉස්සරහ රෝදෙයි මඩ්ගාඩ් එකයි ඉවරයි''

" අනේ අනේ බං .. උඹ තාමත් පොඩි එකෙක් වගේ කාර් බයිසිකල් ට්‍රැක්ටර් ලොරි වෙන පුරුද්ද නවත්තගෙන නැද්ද ? අයියෝ උඹ අපිට පිස්සු හදවවන්නයි හදන්නේ . ඒ දවස් වලත් එහෙමනේ . ගේ පුරා ම වාහන එලවන්න පටන් අරන් අපිට පිස්සු හැදෙව්වා . තාමත් උඹට මොකක් හරි වාහනයක් වගේ වෙන්න හිතෙන එක නවත්තගන්න බැරි එක නම් පුදුමයක්''

සිනාසෙමින් වුවත් ජූලියන් තරමක තරවටුවකුත සමගින් ටින්කර්ට කිව්වා .ටින්කර් රිදුම් දෙන අතක් පිරි මදින ගමන් ජූලියන්ට කිව්වේ මෙහෙම කතාවක් .

' ඇත්තට ම මට ඉබේට ම එහෙම හිතෙනවා . කොහේ හරි යන්න හදන කොට එක පාරට ම මට වාහනයක් ආරූඪ වෙනවා . ඔයාල අහගෙන ඉන්න තිබ්බෙ ඊයෙ මම එක පාරට ම කාර් අරන් යන

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ලොරියක් වුනා ම දාපු සද්දෙ . තාත්ත ඇත්තට ම හිතුවෙ ඇත්ත ම ලොකු ලොරියක් වත්තට ඇවිල්ලා කියලා . එයා ඩ්‍රයිවර්ට හොඳවයින් දෙකක් කතා කරන්න හිතාගෙන එළියට ඇස්සේ දුම්මල වරමත් අතට අරගෙන. ඒ වුනාට එතන හිටියෙ මම නේ . මෙන්න මේ වගේ සද්දායක් මම දැම්මේ"

ඒ හත් සමගම වාහන පිස්සුවා නැගුවේ පැසේජය දෙදරව යන තරමේ කන් බිහිරි කරවන ශබ්දයක් . ජුලියන් එක පාරට ම ක්‍රියත්මක වෙලා ටින්කර් ව කුස්සියට තල්ලු කරලා දොරත් වසා දැම්මා .

" මේ පාර නම් තමුසෙ ගෙ තාත්තට ඇත්ත්ටටම පිස්සු හැදෙන්න ඇති ටින්කර් . දැන් වත් ඕඕක නවත්වනවකො අප්පා . පොඩ්ඩක් ලොකු ළමයෙක් වගේ හැසිරෙන්න ඉගනගන්නවකෝ '

" බුදු ම්මෝ මට නම් බෑ ලොකු වෙන්න ජුලියන් . බලන්න මගේ තාත්තා දිහා . එයාට කන්නත් අමතකයි . සමග්හර වෙලාවට පාරට බහින්නේ එක මේස් එකක් විතරක් දාගෙන . මට නම් බේ මොනවා අමතක කරත් කෑම බීම අමතක කරන්න . මට හැම වෙලේම කන්න ඕන"

ටින්කර්ගේ කතාවලට හිනා නොවී ඉන්න එක නම් හරි ම අමාරුයි . ඔහු මෙහෙම කිව්වෙත් ඉනා වෙන අතරමයි .

" හරි හරි ඉතිං දැන් ඔය ට්‍රේ එකක් අරන් එනවකෝ .. මේ ටික සුද්ද බුද්ද කරල දාමු . මං මේ ඔයාගෙ හොඳට කියන්නේ ටින්කර් . කාර් එකක් හරි මොකක් හරි වාහනයක් වෙන එක මීට පස්සෙ නවත්ත ගන්න ම බෑ වගෙ දැනුනොත් ඒ වැඩේ ගෙයින් එළියට් ගිහින් කරන්න



DO NOT COPY

sinhalaebooks.com



වත් පුරුදු වෙන්න .මුලු ගේම දෙදරනව බං . උබේ ශද්දෙ ඕනැවටත් වැඩියි''

"ඒ කියන්නේ මම මේ අනුකරණ වැඬේ නියමෙට ම කරනව කියන එකනේ . ඔයා අහල බලන්නකෝ මම ප්ලේන් එකක් වෙන හැටි . මම බබරේ සද්දේ වුනත් හෘඉයට ම කරනවා''

තම ගැන ම ගොඩාක් ආඩම්බරයෙ එහෙම කියපු ටින්කර් ඊ ළගට මේ අර අදින්නේ මොdකට හ කියලා ජුලියන්ට තේරුණා .

" හා හා දැන් එපා .. අනේ පින් සිද්ද වෙයි ටින්කර් දැන් මනුස්ස සෙයියාඅවෙන් ගිහින්ලා ට්‍රෙ එක අරන් එන්න . අනික මිස් චීෆ්ට මගේ දකුණු කකුල උඩින් අයින් වෙන්නත් කියන්න . ඌ හිතන් ඉන්නේ ඒක පුටුවක් කියලා'

මිස් චීෆ් නම් ටින්කර් නෙමෙයි සක්කරයා කීවත් ජුලියන්ගේ පා සිංහාඩසනයෙන් අයින් වෙන්න සූදානම් බවක් පෙනුනේ නෑ . ඌ තව තවත් ඔහුගේ කකුල බදාගෙන හරි බරි ගැහී වාඩි වුනා .

" හරි හරි මිස්චීෆ් . මට ඉතිං මෙහෙම දවස පුරා ම උබව කකුල උඩ තියාගෙන ඇවිදින්න කරන්න බෑ නේ ඉතිං'

" කකුල පොළොවේ ගහන්නකෝ . එතකොට ඌ යනවා''

ටින්කර් උපදෙස් දුන්නා . ජුලියන් ඉක්මනින් ම කකුල පොළොවේ ගහලා කාමරය වටේ ඇවිදින්න වුනා . කෝපවත් හඬක් පිට කර මින් මිස් චීෆ් එක පාරට ම ජුලියන්ගේ පා සිංහාඅසනය අමතක කර දමා මේසයක් උඩට පැන ගත්තා .

DO NOT COPY

sinhalaebooks.com



" කාලෙකට කලින් ඌ තාත්තගෙ කකුල උඩත් ඔය විදිහට වාඩි වෙන්න පුරුදු වෙලා හිටියා . තාත්තට ඇවිදින්නත් අමාරු වුනා . ඒත් තාත්ත ඒ ගැන වගේ වගක් නැතිව හිටියේ . ඒ පාර මිස්චීෆ් තාත්තගෙ ඔලුව උඩට නැගලා ඉන්න පුරුදු වුනා . තාත්ටට ඒත් ගානක් වුනේ නෑ . එයා හිතුවේ එයා ගේ ඇතුළෙත් තොප්පියක් දාගෙන ඉන්නවා කියලා"

හැමෝ්ට ම හිනා යන එක නම් ඒ පාර කොහොමවත් නවත්ත අන්න පුළුවන් වුනේ නෑ . ඒ අතර ජුලියන් ආයෙත් පාරක් මෙහෙම කිව්වා

" දැන් වත් එන්නකෝ . මේසෙ අස් පස් කරල දාමු . අපි ටේ වල දාගෙන අඩු ටික කුස්සියට ගේමු . ගැනු ළමයි දෙන්නාට පුලුවන්නෙ එතකොට ඒව හෝදල දාන . හැබැයි ඉන්කර් මිස් චීෆ්ට නම් තෙ පෝච්චිය එහෙම උස්සන් එන්න ඉඩ තියන්න එපා"

ළමුන්ගේ උදව් කිරීම සම්බන්දයෙන් ජෙනී සැබැවින් ම ගොඩාක් සතුටු වුනා . එයා මිටි තරබාරු කාන්තාවක් . කොයි තරම් ඉක්මනින් ගෙදර කටයුතු ඉටු කලත් ඇය ඇවිද්දේ කරේ ද තරමක අපහසුවෙන් .

" මම ඔයාගෙ යාලුවන්ට කාමර පෙන්වන්නම් ටින්කර් . ඒත් ඔයා දන්නවනේ ටින්කර් අපි අලුත් වැඩියා කරගන්න යවපු මෙට්ට වලින් ගොඩාක් ඒවා තාමත් ආපහු ලැබුනේ නෑ . මම ඔයාගෙ තාත්තට එයාලට කතා කරන්න කියලා දාස්වතාවක් කිව්ව . කෝ ඒත් එයාට කොහෙද ඒව ගැන මතකයක්'

ජෙනී නෝක්කාඩු ස්වරයෙන් එහෙම කියන කොට ටින්කර් ගොඩාක් තැවුලට පත් වුනා .

DO NOT COPY

sinhalaebooks.com



" අයියෝ ජෙනී . එතකොට මෙයාලට අර ඇඳන් දෙකේ නිදාගන්න වෙන්නේ මෙට්ටයක් නැතිව ද ? අපි දැන් මොකද කරන්නේ ?"

" තාත්ට කියන්න කෝල් කරලා මෙට්ට ටික ගෙන්න ගන්න කියලා . එයාල වෑන් එකකින් ඉක්මනට ගෙනල්ලා දෙයි'

වෑන් .. ඒ වචනය ඇසූ සැනින් වෑන් එකක් බවට පත් වූ ටින්කර් දෙතුන් වතාවක් කෑම කාමරයත් කුස්සියත් අතරේ ධවනය වුනා . මිස් චීෆ් ද ඉතා ම සතුටින් කොහේදෝ දුර බැහැර ගමනක් යෑම සඳාහා ටින්කර් වෑන් එකට නැගුනා . ටින්කර් වෑන් එකේ ශබ්දය හරි ම තාත්වික විදිහට අනුකරණය කරනවා . මේ සියල්ල ම බලාගෙන ඉන්න ළමයි බඩ අල්ලාගෙන හිනාවෙනවා .

හරියට ම වෙඩිල්ලක් පිට වෙනව වගේ කාමරයේ දොර ඇරගෙන මහාචායීතුමා එක පාරට ම මතු වුනේ යක්ෂාරූඪ වෙලා .

" ටින්කර් .. මෙහෙ වරෙන් .."

" සොරි තාත්තේ .. මම නිකන් මෙට්ට් අරන් එන වෑන් එකක් වුනා . ඔයාට ඉතින් අමතක වුනානෙ එයාලට කෝල් කරල බලන්නත් . දැන් මෙයාලට නිදා ගන්න දෙන්න විදිහක් නෑ"

ටින්කර් එහෙම කිව්වත් යක්sහාරූඪ මහාචායීවරයාට ඒ කතාව ඇහුන බවක් පෙනුනේ නෑ . ඔහු ටින්කර් අල්ලා ගන්නා අදහසින් .. අල්ලාගෙන හොඳ පාඩමක් උගන්වන අදහසින් ඔහු පස්සේ එළවන්නට පටන් ගත්තා . ටින්කර් දෙපාරක් නොසිතා උඩු මහළට දුවන්න පටන් ගත්තේත් ඒ සමගයි . මිස් චීෆ් ද ටින්කර් පසු පසින් ඉහළ මාලයට

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



නැගුණා . මහචායී තුමා ටින්කර්ව අලා ගත නොහැකි වූ තැන ජෙනී දෙස කෝපවත් දෑසින් බලමින් මෙහෙම කිව්වා

‘ ජෙනී . තමුන්ට ළමයෙක් බලා ගන්න බැරි ද / මං ඔහේට සල්ලි ගෙවන්නේ මොන හේතුවකට කියල ද හිතාගෙන ඉන්නෙ ?”

“ උයනවටයි ගේ සුද්ද කරලා තියාගන්නවටයිනේ’ කිසිම බයක් හැකක් නැතිව ජෙනී මහාචායීතුමාගෙ මූනට ම කිව්වා . “ ඒත් සර් මම ළමයි බලා ගන්න නර්ස් කෙනෙක් නෙමෙයිනේ . අනික නර්ස් ලා දුසිම් බාගයක් හිටියත් ඔයාගෙ පුතා ටින්කර්ගේ කට නම් වහනවා බොරු . ඔයාට ටින්කර්ගෙ සද්ද බද්ද නැතිව ගේ තියා ගන්න ඕන නම් එයාව ගෙයින් පිට කරන්න . ඇත්තට ම ඔයාට තියෙන හොඳම විසඳුම ඒක . කූඩාරම් රෙදිත් අරගෙන ගිහින් යාලුවොත් එක්ක එළියේ කූඩාරම් ග් හගන්න කිව්ව නම් සේරම ප්‍රශ්න විසදෙනවා . මේ දවස්වල කාලගුනෙත් උනුසුම්නේ . මෙට්ට තව ම ඇවිල්ලත් නෑ . අනික ඒ ළමයි ඒ වගේ දෙයක් කරන්නත් ගොඩාක් කැමති වෙයි . මට පුළුවන් එයාලගේ කෑම සකස් කරලා ළගට ම ගිහින් දෙන්න වුනත් . නැත්තම් පොඩ්ඩන්ට වුනත් පුළුවන් ඇවිල්ලා එයාලගේ කෑම අරගෙන යන්න”

මහා චායීතුමා ජෙනී දෙස බලා සිටියේ බදාගෙන වැළඳගෙන ඉබගෙන ඉඹගෙන යන්න හිතුණා වගේ .ළමුන්ටත් හිතෙන්නේ ඒක නම් හරිම අපූරු යෝජනාවක් කියලයි . ඇත්තට ම මහාචා තුමා ජෙනීගේ අදහසට කැමැත්ත පළ කළොත් එතුමාගේ ප්‍රශ්න වගේම ඔවුන්ගේ ප්‍රශ්නත් විස්සදෙනවා . මේ වගේ කාලගුණයක එළියේ කූඩාරමක් ගහගෙන ඉන්න ලැබෙන එක මොන තරන් නම් අපූරුද ? මහාචයී තුමා සමග මේ නිවසෙ ජීවත් වෙනවාට වඩා එය මොනතරම්

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



නම් ඇගට ගුණ ද ? ටිමීත් වල්ගය වනලා සියුම් බිරුම් හඬක් නැගුවේ හරියට

‘ ඒක නම් නියම අදහසක්’’ කියන්න වගේ .

“ හොද අදහසක් ජෙනී .. ඇත්ත්ට ම හොද අදහසක්’’ මහාචාර්‍ය හේලින් බොහොම සතුටෙන් කිව්වා “ අර වදුරු තඩියාත් මෙයාල එක්ක කූඩාරම් ගහද්දි යනව නම් හොදයි . එතකොට උංට ජනේලෙන් මගේ කාමරේට පැනලා මගේ පරීක්ෂන ආකෘති එක්ක නාඩගම් නටන්න ඕන වෙන්නෙත් නෑනෙ’’

එහෙම කියගෙන ම මහාචාර්‍යතුමා එයාගෙ කාමරයට නැවතත් ඇවිදගෙන ගියා . කාමරයට ඇතුල් වුනාට පස්සෙ ගේම හෙල්ලෙන තරම් සද්දෙන් දොරත් වහ ගත්තා .ඒ සද්දෙ මොන තරම් විශාල එකක් හ කියනව නම් ටිමීත් තිගැස්සිලා බිරුම් හඬක් නැගුවා . බියට පත් උනු මිස් චීෆ් නම් කළේ උඩ මහලට නගින තරප්පු පෙළෙ ඉදන් එක පාරට ම බිමට පනින එක .ටින්කර් කළේ ජෙනීවත් බදාගෙන නටන එක .

“ ආ මට දෙයක් මතක් වුනා ජෙනී . අපිට තියෙන්නේ මගෙ පුංචි ටෙන්ට් එක විතරනේ . අපිට තව දෙකක් ඕන වෙනවා . ඉන්න මං තාත්තගෙන් තව කූඩාරම් රෙදි දෙකක් ගන්න ද කියලා අහලා එන්නම්’’

සතුටේ තරම කොයි තරම් ද කියනව නම් ටින්කර් හිටියේ උන් හිටි තැන් පවා අමතක වුනු ගානට . ඔහු එක පාරට ම තමා පස්සෙන් පන්නන් ආපු කෝපවත් මහාචාර්‍ය තාත්තගේ කාමරයට ඉගිල්ලිල ගියා. ජුලියන් වහ ක්‍රියාත්ම වී ඔහුව නවතා ගන්නට හිතුවත් ඒ වෙන විටත් ටින්කර් හිටියේ හේලින් මහාචාර්‍යතුමා ගේ අද්‍යාන කාමරයේ .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" අපිට තව කූඩාරම් දෙකක් ඕන තාත්තේ .. මම කඩෙන් ගන්න ද ?"

ටින්කර් ඇසුවේ හැතැම්ම ගානක් දුර සිටින කෙනෙක් ගෙන් අහනවා වගේ මහා හයියෙන් ..

" දෙයියන්ගෙ නාමෙට මට මගේ පඩුවෙ ඉන්න දීලා ටෙන්ට් දෙකක් බැරි නම් හයක් හරි අරගන්නවා ටින්කර් .." අඩු ශබ්දයකින් එහෙම කියපු මහා චායී තුමා ඊ ළගට අකුනක් ගහනවා වගේ " අරන් මේ ගෙදරින් එළියට පලයන් .." කියලා මහා හයියෙන් බෙරිහන් දුන්නා .

" ස්තූතියි තාත්තා"

එහෙම කියපු ටින්කර් එක පාරට ම කාමරයෙන් එලියට පියාඹන්න සූදානම් වුනා . ඒත් එක්ක ම මහාඅචායී තුමා මේ වගේ ප්‍රශ්නයක් ඔහුගෙන් ඇහුවේ හරියට කෝමා එකක් හැදිලා හිටිය මනුස්සයෙක් වගේ .

" ඒත් මොන එහෙකට ද මේ හදිස්සියේ ඔයාට ටෙන්ට් ඕන වෙලා තියෙන්නේ ?"

තාත්තාට උත්තර දිදී තවත් කාලය නාස්ති නොකළ ටින්කර් මහා ගෝෂාවක් නැගෙන සේ දොරත් වහගෙන ඉක්මනට ම අනික් අය සිතින තැනට ආවා .

" අපේ තාත්තට අලුත් මතක ගබඩාවක් හොයා ගන්න ඕනි වෙයි වගේ . බලන්නකෝ . එය අපිට එලියේ කූඩාරම් ගහන්න කියලා මේ දැන් කීව කියලවත් යාට මතක නැනේ"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" මෙ ගෙදරින් එළියට යන්න ලැබෙන එක නම් හොදයි තමයි . අපේ ජෝර්ගෙ තාත්ත ත් ඔය විදිහමයි . අල් පෙනිත්තක් බිම වැටෙන සද්දෙ ඇහුණත් කෑ ගහනවා . අපි එයලගෙන් ඇත් වෙලා ඉන්න එක තමා හොද ම දේ"

ඈන් කිව්වේ කල්පනාකාරී හඩින් . ඒ කතාවට ජෝර්ජ්ද යමක් එකතු කරන්නට අමතක කළේ නෑ .

" ආයෙත් එහෙනම් අපි කූඩාරම් ගහන්නයි යන්නේ . එහෙනම් අපි මෙහෙම කරමු . ර් ළග බස් එක අල්ලගෙන අපේ ගෙදරට ගිහින් අපේ කූඩාරම් දෙක අරන් එමු . මම ඒව ඔක්කොම වත්තේ මඩුවේ දාල තියෙන නිසා ගේ ඇතුලට යන්න ඕනත් නෑ . අපිට ජිම් ව අල්ල ගන්න පුළුවන් නම් එයා ලවා මෙහාට ඒ ටික ගෙන්න ගන්න පුලුවන් . ඔයාලා දන්න වනේ අර කුරියර් කරන එක්කෙනා"

" ආ ඔව් ඔව් . එයා අද මෙහෙට කොහොමත් එනවා . මම එයාට ටෙලිෆෝන් කරන්නම් . ඔයාලට ඉක්මනට ම කූඩාරම් දෙක ලැබෙයි . මහාචාරයතුමා ගැන අහිතක් හිතන්න එපා ඉතිං හොද ද ? එයා ගොඩක් කරුණාවන්තයි . ඒකනේ ඔයාලව මෙහෙ ගෙන්න ගත්තේ . ඒත් ඔයාලට එයා එක්ක මේ ගේ ඇතුළෙ හිටියොත් ඔයාලගෙ නිවාඩුවත් සවුත්තු වෙනවා . එළියෙ කූඩාරම් ගහගත්තම කාට කාටත් හොදයිනේ .මම බිමට එලන රෙදි හොයා දෙන්නම්"

ජෙනී කිව්වේ හරිම හිතවත් විදිහට . ඒ අතර ජූලියන් එයාගේ කට හඩ අවදි කරලා මෙහෙම කිව්වා .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" ඒ ගැන හිත් කරදර කර ගන්න එපා ජෙනී . අපි ඒ හැම දේම අරන් එන්නම් . කොහොමත් අපි නිතර කූඩාරම් ගහන නිසා හොඳ පලපුරුද්දක් වගේ ම අවශ්‍ය කලමනා සේරමත් තියෙනවා"

" කොහොමහරි කමක් නෑ එළියේ එළදෙන්නු හිටියෙ නැත්තම් මට ඒ ඇති . අපි අන්තිමට කූඩාරම් ගහපු පාර මගේ ටෙන්ට් එකෙන් එළදෙනක් ඔලුව දැම්මනෙ ඇතුලට . අම්මෝ මම බය වුනු තරමක් . මට එළියට එන්න විදිහකුත් නැතුව ඇතුලෙ ඉන්න විදිහකුත නැතිව මන් හිටියෙ''

ඇන් එහෙම කියද්දී මද සිනාවක් මුවගට නගා ගත්ත ජෙනී ඇයට දුන්නේ සැනසිලි දායක උත්තරයක් .

" නෑ නෑ අපේ වත්තේ එළ දෙන්නු නෑ"

ඉතිං කවුරු කවුරුත් හිත පුරා ගිය සංතෝශයෙන් යුතු ව කෑම මේසය අස් කරන කටයුත්තේ ඉතුරු කොටස කිරීමට ජෙනීට උදව් කරන්න පටන් ගත්තා . ජෙනී වුනත් ළමුන් සමග කටයුතු කළේ ඉතාමත් ම හිතවත් විදිහට . ඒ වැඩේ අවසාන කරපු ජෙනී කූරියර් කාරයාට දුර කතන ඇමතුමක් දීමට යන්න සූදානම් වුනා . එතකොට ම තමයි ජෝර්ජ්ට ජොවානා ගැන මතකයට නැගුණේ .

" අයියෝ මට අමතක වුනානේ . මම ජොආනාට මල් ටිකක් යවන්න හිතාගෙන හිටියට මල් ගන්න අමතක වුනානේ'

" ඉතිං ඔයා ම ගිහින් මල් විකුණන තැනට කෝල් එකක් ගන්නකෝ"



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



ජෙනී එහෙම කිව්වත් මහාචාර්‍ය හේලින්ගේ කාමරයට ගිහින් දුරකතන ඇමතුමක් ගැනීමට ජෝර්ජ් තුළ තිබුනේ බිය ජනක ස්වභාවයක් . ඒ නිසයි ඇය මෙහෙම කතාවක් කිව්වේ .

‘ අපි කොහොමත් දැන් කූඩාරම් රෙදි ටික සූදානම් කරන්න ආපහු කිරින් වලට යනවනේ . මොකද කුරියර් කාරයාට ගෙදරට ගිහින් කූඩාරම් රෙදි හොයාගන්න කියන්න බැනේ .කිරින් වලින් හොද මල් ටිකක් ගන්න පුළුවන් කියල මට නම් සහතිකයි .ආ එන ගමන අපට බයිසිකලුත් අරගෙන එන්න පුළුවන්නේ . ඒවා මෙහෙදි ගොඩක් ප්‍රයෝජනවත් වෙයි’

“ හරි එහෙනම් ඔයාලා දැම්ම ම ගිහින් ඒ දේවල් අරගෙන එන්නකෝ . මොකද ඔයාලට තේ වෙලාව වෙනකොට ආපහු එන්න බැරි වුනොත් මට තමා මහාචාර්‍ය තුමාට උත්තර බදින්න වෙන්නේ’

ජෙනී කිව්වේ කල්පනා කාරී හඬින් . එතකොට ම ජුලියනුත් මේ වගේ අදහසක් ඉදිරිපත් කෙරුවා .

“ අපි සේරමලා කිරින්වලට ආපහු යන්න ඕන නෑ . මට ඈන්ගේ බයිසිකලේ මගේ එක පදින ගමන් ලේසියෙන් ම අරන් එන්න පුළුවන් හැඩල් එකෙන් අල්ලගෙන .”

“ ජෝර්ජ් ඔයා එන්නත් ඕනි නෑ . මට පුලුවන් ඔයාගෙ බයිසිකලේ අරන් එන්න . මම මල් ටිකත් ඕඩර් කරන්නම් . ඔයා ඈන් එක්ක මෙහෙට වෙලා ඉන්නකෝ”

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ඩික් ද ජෝර්ජ් හිභාට හැරිලා ඒ විදිහට කිව්වේ පුංචි ඇන් ඔවුන් කවුරුවත් නැති ව මෙහෙ දාල යන්නට තිබුනු නො කැමැත්ත නිසා ම යි.ඒ තරම් කැමැත්තෙන් නො වුනත් ජෝර්ජ් ඒ කතාවට එකග වුනා . ඊට සුලු වේලවකට පස්සේ ඩික් ද සමගින් ජූලියන් නැවතත් කිරින් බලා යන්න පිටත් වුනා . ටින්කර්ට නම් සිද්ද වුනේ ගැහැණු ළමුන් දෙදෙනා සමග ජෙනීට උදව් කරන්නයි .ඒත් ඒත් ඒත් ඉතිං ටින්කර්ගේ උදව් උපකාරවලට නම් ජෙනී ඒ තරම් මනාපයක් දැක් වූවේ නෑ . කැඩෙන බිදෙන බඩු මුට්ටු බේරා ගැනීමේ අදහසින් ටින්කර්ව සේවයෙන් නිදහස් කිරීමට ජෙනී ගෘහපාලිකව ඒකමතිකව තීරණය කළා .

" ටින්කර් ඔයා වත්ත පල්ලෙහාට ගිහින් ලස්සන රොල්ස් රොයිස් කාර් එකක් වෙන්නකෝ … ඔයා හැතැම්ම තිහ හතලිහක් දිව්වට පස්සේ පෙට්‍රල් ටිකක් ගහගන්න නම් මේ පැත්තට ආවට කමක් නෑ'

" ඒ කිව්වෙ ලෙමනේඩ් නේද ?" ටින්කර් ගේ මුහුනට නැගුණු සිනාවේ තිබුනේ ඉතා ම අහිංසක පාටක් . " නියමයි . මට කාලෙකින් රොල්ස් රොයිස් කාර් එකක් පදින්න බැරි වුනා . මං වත්ත පල්ලෙහාට ම ගියා ම තාත්ත්ට කොහොමවත් මාව ඇහෙන එකක් නෑ"

ඒ අනුව ටින්කර් පිටවී ගියාට පස්සේ ජෙනී සමග එකWතු උනු ගැහැණු ළමුන් දෙදෙනා ඉතා ම ඉක්මනින් කුස්සියේ වැඩ කටයුතු ටික අවසන් කළා . ඒ වුනත් මිස් වීෆ්ගේ කරදරයෙන් බේරෙන එක ලේසි උනේ නෑ නෑ . එක පාරට ම කැබිනෙට්ටුවක් උඩට නැග ගත් මිස් වීෆ් එහි තිබුණු හැම දෙයක් ම බිමට පෙරළලා එක ම පෙරළියකa් එති කළ බවත් නො කියා ම බෑ.

sinhalaebooks.com



තවත් සුලු වෙලාවකින් ජනේලයෙන් ඇතුළට ඔලුව දාපු ටින්කර් ගැහැණු ළමුන් දෙදෙනාට ගෙනාවේ අපූරු යෝජනාවක් .

" එළියට එන්නකෝ ටිකකට . අපි කූඩාරම් හයි කරන්න හොඳ තැනක් බලමු . මට හම්බුනා හොදට හෙවන තියෙන තැනක් . මට දැන් මේ රොල්ස් වැඩේ එපා වීගෙන එන්නේ"





Scanned with CamScanner

sinhalaebooks.com



" ඔයා යන්න ඈන් . මට ටිකක් මෙහෙම ඉන්න ඕන"

ජෝර්ජ් එක පාරට ම ඈන්ට එහෙම කිව්වා . ඒ නිසා ඈන් ටින්කර් එක්ක තණ කොළ වැවී තිබුණු විශාල ගෙවත්තට දිහාවට ගමන් කරා .පුංචි ගේට්ටුවක් ඇරගෙන ඔවුන් පිවිසියේ පිට්ටනියක් බදු තැනි තලා භූමි භාගයකට යි . එක පාරට ම ටින්කර් ශෝකයට පත් හඬකින් මේ වගේ කතාවක් කිව්වේ අනපේක්ෂිත යමක් ඒ වන විට සිද්ද වෙමින් තිබූ නිසයි .

" අනේ දෙවියනේ . අර අලනෑ ්නකෝ ර පාර දිගේ එන කැරවෑන් දිහා.ඒව එන්නේ මෙහාට . එහා පැත්ත ගේට්ටුවෙන් ඒවා ඉක්මනින් ම ඇතුලට එයි . යකෝ මේක අපේ ඉඩමක්නේ . මේ පිට්ටනියත් අයිති අපිට . ඉන්න ඈන් මම ඉ ක්මනින් ම එයාල ව එලවලා එන්නම්"

එහෙම කිව්ව ටින්කර් පුලුවන් තරම් වේගයෙන් පිටුපස ගෙවුව දිහාට දුවන්න වුනා . මේ වන විට ඔහුගෙන් පෙනෙන්නේ කේන්ති ගිය වෙලාවට හේලින් මහාචාර්ය තුමාට තියෙන පෙනුමට ම සමාන පෙනුමක් .

" අයියෝ මෙහාට එන්න ටින්කර් .. ඔයා හදන්නේ ප්‍රශ්නයක් දාගන්න . ආපහු එනවා ටින්කර් .."

ඈන් බියපත් හඩින් බෙරිහන් දුන්නා . ඒ වුනත් ටින්කර් නම් එය අබ මල් රේනුවක් තරම් වත් සැලකිල්ලට නොගෙන ඉදිරියට ඉදිරියට ම දුවගෙන යනවා . මේ වෙද්දි ටින්කර්ගේ ඔලුවත් කෙලින් වෙලා . හරියට සටනකට යන සොල්දාදුවෙක් වගේ . ඔහු දැන් මේ සූදානම්

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



වන්නේ අහම්බෙන් වගේ වත්තට ඇතුළුවෙන කැරවෑන් කාරයින්ට හොඳවයින් දෙකක් කතා කරන්නට යි .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 05

## සංචාරක සර්කස් කණ්ඩායම

DO NOT COPY

ටින්කර් කැරවෑන් දිහාට දුවගෙන ආකාරය ඈන් බලාගෙන සිටියෙ බියෙන් ඇලලී ගත් දෑසින් යුතුව යි . ඒ වන විටත් වත්තේ කෙළවරේ ගේට්ටුව ගාවට කැරවෑන් හතරක් ම ළඟා වෙලා අවසන් . තවත් විශාල වෑන් කිහිපයක් මාවතේ තියෙන හැටිත් ඈන් ට පේනවා . ඒ විශාල කැරවෑන් වල ලොකු අකුරෙන් මෙන්න මෙහෙම ලියලා තිබුණා

“ ටැපර්ගේ සංචාරක රඟමඩල”

“ ආ වරෙන්කෝ මගේ  වත්තට . මං කියලා දෙන්නම් මිස්ටර් ටැපර්ට හොද ම සිංහලෙන්”



Scanned with CamScanner

sinhalaebooks.com



ටින්කර් තමන්ට ම කියා ගත්තේ හිතට දැනෙනට වූ කෝපය නිසා ම යි . වෙන ඕන ම දේකට මුහුණ දෙන සූදානම් ශරීරයෙන් යුතු ව මිස් චීෆ් ද ඔහුගේ උරහිසේ බලාගෙන ඉන්නවා .

ඒ අතර කැරවෑන් වල ඉඳපු ළමයි හතර පස් දෙනෙක් වඳුරා සමග බලා සිටින කොල්ලා දිහා බලා සිටියේ පුදුමයෙන් පිරී ඉතිරෙන දෑසින් . ඒ අතරින් පුංචි ම පිරිමි ළමයා ටින්කර් හිභාට දුවගෙන එන්නට වුනා . එයා වඳුරා දිහ බලලා සතුටින් කෑ ගහන්නට පටන් ගත්තා .

" හරිම හීලෑ වඳුරෙක්නේ .. අපේ චිම්ට වඩා ගොඩාක් පුංචි යි ... එයා ගේ නම මොකක්ද ?"

ඒ වුනත් ඒ කොල්ලා සමග පයිරු පාසානම් පැවැත්වීමේ වුවමනාවක් ටින්කර්ට තිබුනේ නෑ . ඔහු සැර පරුශ හඩක් මුවගට නගා ගන්නට උතසහ ගත්තා .

" තමුන්ගෙ වැඩක් බලා ගන්නවා . කොහෙද තමුසෙලෑ මහ ලොකු ටැපර් ?"

" මිස්ටර් ටැපර් ද ? ආ ඔයා කියන්නේ අපේ සීයා . එයා මේ වෙලාවේ ටිකක් බිසී . අර ලොකු කැරවෑන් එකට එහා පැත්තේ . මේ වෙලාවෙ නම් එයාට කතා කරන්න ටිකක් අමාරුයි"

ළමයාගේ කතාව යන්තමින් හෝ මායිම් නො කළ ටින්කර් ටැපර් සොයාගෙන ඇවිද ගෙන ගියා . නපුරු පෙනුමැති මුහුණක් සහිත පඳුරක් වගේ වැවුනු රැවුලක් තිබුනු මිනිසෙක් ඔහුට මුන ගැසුනා . ඔහුගේ ඇහි බැම වුනත් මූනෙන් බාගයක් විතර වැහෙන තරමට ලොකුයි . ඒ ගන

DO NOT COPY

sinhalaebooks.com



ඇඟි බැමත් රැවුලත් මැදින් පිහිටා තිබෙන කුඩා නහයත් දෑසත් , මිනිසාට ඇති කළේ අසාමාන්‍ය පෙණුමක් . ඒ වගේ ම මේ කියන මනුස්සයාට තිබුනෙත් එක කනක් විතරයි . ටින්කර්ගේ හදිසි ආගමනය දෙස ප්‍රශ්නකාර බැල්මක් හෙලන ගමන් ඔහු මිස් චීෆ් දෙසට අත දිගු කළා .

" අත ගන්න අහකට . නැතම් මගේ වදුරා ඔය අත කාල දයි . එයා අමුත්තන්ට කැමති නෑ"

මිනිසා මද සිනාවක් පෑවා . ඊ ලගට ඔහු තම කටහඬ අවදි කලා . ඔහුට තිබුණේ ඉතා ම ගැඹුරු කටහඩක් .

" මේ ලෝකෙ ඉන්න කිසිම වඳුරෙක්ට මම අමුත්තෙක් නෙමෙයි . වදුරෙක් වත් චිම්පන්සියෙක් වත් මගේ හඩට අනුමත නො වී ඉන්නෙ නෑ . ගෝරිල්ලෙක් වුනත් මට හීලෑයි"

" ඒ වුනාට මගේ වදුරා ඔහේට හීලෑ වෙන්නේ නෑ. මං ඔහේට කියන්න ආවෙ ..."

එහෙත් එහෙත් ටින්කර් කියන්නට ගිය දෙය කියා ගන්නවත් ඉඩක් ලැබුනේ නැත . එක් වර ම මිස් චීෆ්ගේ හඩට සමාන හඩක් මිනිසාගේ උගුරෙන් නැගුනා . මිස් චීෆ් ඔහු දෙස පුදුමාකාර ඇල්මක් හෙලුවේ ඒ සමගයි . කාලෙක ඉදන් දන්න හඳුනන යාලුවෙක් හදිසියේ හමුවුනා වැනි ප්‍රීතිමත් බැල්මක් මිස් චීෆ්ගේ මුහුණේ තිබුණා . තවත් තපර කිහිපයක් එක එල්ලේ ම මිනිසා හෙස බලා සිටි මිස් චීෆ් ඉන් පසුව එක එල්ලේ ම මහල්ලාගේ උරහිසට පැන්නේ ටින්කර් සහ මුලින් ම අසරණ කරමින් .

DO NOT COPY

sinhalaebooks.com



" දැක්ක ද ?" වචනයක් හෝ කියා ගත නො හැකිව ගල් ගිල්ලාක් මෙන් බලා සිටින කොලුවා දෙස බලමින් මිනිසා සිනා පිරි මුවින් කිව්වා . ' දැක්ක ද එයා දැනට ම මගේ යාලුවෙක් වෙලා ඉවරයි . හරි හරි ඔහොම බුම්මගෙන මා දිහා බලන්ට ඕන නෑ . මට ඔය මේ වඳුරු පැටියා ටික දවසකට තියා ගන්ට දීල බලන්න . මම ඌට පුංචි ට්‍රයිසිකලයක් පදින්ට පුරුදු කරන්නම් දවස් දෙකෙන් . මොකද මගෙ ජීවිත කාලෙම මම කලේ වඳුරො වගේ සත්තු පුරුදු පුහුණු කරන එකයි"

" මෙහෙ වරෙන් මිස්චීෆ් .." ටින්කර් කෑ ගැහුවේ දරා ගත නො හැකි තරමේ කෝපයකින් . වඳුරාගේ හැසිරීම ටින්කර්ට ගෙනෙන්නේ කෝපයක් වගේ ම පුදුමයක් . මිස් චීෆ් තවමත් මහලු මනුස්සයාගේ බෙල්ල බදාගෙන බලා ඉන්නව . ටින්කර්ගේ අඬ ගැසීම කනකටවත් ඇසුනු බවක් උගෙන් පළ වෙන්නේ නෑ . ඒ අතර විසල් සිනහවක් මුහුනට නගා ගනිමින් ලොකු මනුස්සයා මිස් චීෆ් ව ගලවලා ටින්කර් අතට දුන්නා .

" මේන්න ඔය ළමයගේ යාලුවා .. එයා ඇත්තට ම හරී ම කීකරු පුංචි හාදයෙක් . හරි දැන් කියමු බලන්න මොනව ද ඔයාට මට අර කියන්න තියෙනවා කියල කිව්වේ ?"

" මම ආවේ මේ ඉඩම මගේ තාත්තට ඒ කියන්නෙ මහාචාර්ය හේලින්ට අයිති එකක් බව කියන්න . ඉතිං ඔහේට ඔහේගෙ කැරවෑනුත් අරගෙන මෙතනට එන්න කිසිම අයිතියක් නෑ . කරුණා කරලා මේවා අරගෙන මෙතනින් යන්න . මායි මගේ යාලුවොයි මෙතන කූඩාරම් ගහන්න හිතාගෙන ඉන්නෙ .ඒකයි"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ටින්කර් කලබලයත් ඉවසීමත් මිශ්‍ර වූ හඬකින් එහෙම කියාගෙන යද්දි මහත මනුස්සයා කතා කරේ පුදුමාකාර ඉවසීමකින් . තලතුනා වැඩිහිටියෙක් හැටියට ඇත්ත අශයෙන් ම ඔහු කතා කළ විලාශය අගය කරන්න වටින බව නම් නොකියා ම බෑ .

" අහා ඒකද කාරණාව . ඉතිං අපි ඕකට සංඩු සරුවල් එන්ට වුවමනාවක් නැනෙ දරුවෝ . ඔයාලා කූඩාරම් ගහන්න කැමති පැත්තක් තෝර ගන්න . අපි අනික් පැත්තේ අපේ කැරවෑන් නවත්ත ගන්නම් . අපි ඔයාලගෙ වැඩවලට ඇඟිලි ගහන්න හොස්ස පොවන්න එන්නේ නෑ . ඔයාලත් අපේ වැඩ රාජකාරි වල්ට අත පොවන්න එන්නේ නෑ"

ඒ අතර ම ටින්කර්ගේ වයසේ යැයි සිතිය හැකි ළමයෙක් එතනට ඇවිත් මෙහෙම ඇහුවා .

" මේ වදුරු පැටියාව මෙයා විකුනනවා කියල ද කියන්නේ සීයේ?'

" පිස්සු කතා කරන්න එපා" ටින්කර් එක පාරට ම පිරිමි ළමයාගේ මුහුණට කඩා පැන්නා . " මම ආවේ ඔයාලටයි ඔයලගෙ කැර වෑන් වලටයි යන අතක යන්න කියන්න මිසක් මගේ වදුරු පැටියට ගානක් කතා කරගන්න නෙමෙයි .මේ ඉඩම අයිති මගේ පවුලට . එච්චරයි"

" ඒ වුනත් දරුවෝ අපිට අවුරුදු ගානක් පරන බලපත්‍රයක් තියෙනවා . අවුරුදු දහයකට වරක මෙතන කැරවෑන් ගහලා මේ ඉඩමෙ අපේ සර්කස් එක පෙන්වන්න අපිට අයිතියක් තියෙනවා . ඔයා විශ්වාස කලත් නැතත් ටැපර්ගේ සර්කස් එක 1648 අවුරුද්දේ ඉදලා සෑම අවුරුදු දහයකට ම සැරයක් මේ ඉඩමේ අපි පෙන්නුවා . දැං ඉතින් මෙතන ආරවුල් ඇති කර ගන්නේ නැතුව ගෙදර යන්ට



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com

එනිඩ් බ්ලයිටන්



Scanned with CamScanner

sinhalaebooks.com



“ තමුසේ මහා බොරු කාරයෙක් . මම කතා කරනවා පොලීසියට . කියනවා තාත්තට. කියන ....”

දරා ගන්න බැරි තරම් කෝපයෙන් ,පුපුරන දෑසින් , ෆේලින් මහාවායී සෙයියාවෙන් ටින්කර් කෑ මොර දුන්නා . ටින්කර්ගේ කතාව අහවර වෙන්නත් කළින් ඔහු අසල හුන් පිරිමි ළමයා මහලු මනුස්සයා හා ටින්කර් අතර ට පැනලා අත පය උරුක් කරමින් ටින්කර්ට බැන වදින්නට පටන් ගත්තා “ අඩෝ මේ ..මගේ සීයට ආයෙත් ඔහොම කතා කරන්න ආවොත් කන පැලෙන්ඩ ගහනවා”

“ ඇයි ඇයි තමුසේ මහ ලොකු චණ්ඩියෙක් ද ? මට ඕනි තාලෙටයි මම කතා කරන්නේ . උබ කට වැහුවෙ නැත්තම් දත් ටික ගලෝල දානවා”

ටින්කර් රතු ඉර හොඳටෝ ම පැන ඇති බැවින් එසේ පැවසුවා පමනයි . එතකොට ම අත මිට මෙලවූ පිරිමි ළමයා ටින්කර්ට හිතා ගන්නවත් බැරි වෙන විදිහේ පහරක් ටින්කර්ගේ පපුවට එල්ල කලා . ඒ පහර මොන තරම් දරුණු ද කියන්ව නම් ටින්කර බිම පත බෑවී ගත්තේ පිටි මුට්ටයක් බිම වැටෙනවා වගේ . බිම වැදුනු නිසා වෙන් ඔහුගේ පිට ප්‍රදේශයෙන් නැගෙන්නේ පුදුමාකාර වේදනවක් . ඒ වගේ ම කොල්ලාගෙන් ගුටි කන්නට සිදු වීම ගැන ලැජ්ජාවකුත් හුට දැනෙනවා .. ඒ වගේ ම කෝපයත් එන්න එන්න ම වැඩි වෙනවා . ටින්කර් දනි පනි ගා නැගිට ගත්තේ කොලුවාට හොඳවයින් ගුටි සංග්‍රහ යක් දෙන බලාපොරොත්තුවෙන් .

වයසක මනුස්සයා ඉක්මනින් ම ටින්කර්ව අල්ලාගෙන මෙහෙම කිව්වා.



DO NOT COPY

sinhalaebooks.com



" ඒයි ඒයි නවත්තනවා දෙන්නම . මෝඩ ළමයි . මේ ඉන්නේ ටැපර් කෙනෙක් . කවදාවත් ටැපර් ලා කාගෙවත් අත පල්ලෙන් වැටෙන ජාතියක් නෙමෙයි .පොඩ්ඩක් මොලේ කල්පනා කරනවා ළමයෝ . දැං ඉතිං ඉක්මනට ගෙදර යනවා . ඔලුව උදුම්මා ගත්තු ඔහේ වගේ ළමයෙක් එක්ක පැටලෙන්න මගේ ඇති කැමැත්තක් නෑ .අවුරුදු සිය ගානක් තිස්සෙ කළා වගේ මගේ සර්කස් එක මේ අවුරුද්දෙත් මේ ඉඩමේ පවත්වන එක සක්කරයාටවත් නවත්වන්න බෑ"

මහළු මනුස්සයා තවත් වචනයකුදු නො කියා ආසන්නතම කැරවෑනය දෙසට ඇවිදගෙන ගියා .ඊට පස්සේ කැරවෑනයට බැඳ දමා සිටි අසුන් දෙදෙනා ශ මෙහෙයවා ගනිමින් ගේට්ටුවෙන් ඇතුළට ආවේ කිසි ම කලබගෑණියක් සිදු නො වුනු ගානට .තව තවත් කැරවෑන් මේ වන විට ටින්කර්ගේ ඉඩමට සේන්දු වෙමින් පැවතුණා . ඒ අතර ටින්කර්ට පහර දුන් පිරිමි ළමයා දිව දික්කරලා ටින්කර්ට සමච්චල් සිනාවක් පාන්නත් අමතක කළේ නෑ .

" දැං උඹේ ප්‍රශ්නෙ විසඳුනා ද ? දැක්කනේ . මගේ සීයා වගේ ම තමා මාත් . කාටවත් පරද්දන්න බෑ . හැබැයි ඉතිං උඹ සීයත් එක්ක එකටෙක කියන්න ගිය එකත් නිර්භීත කමක් . මාත් කැමතියි ඒ වඩේට"

කොල්ලා මොන තාලයෙන් කට මත දෙඩෙව්වත් ඔහු සමග හයි අල්ලන්න තමන්ට ශක්තියක් නැති බව දැන් නම් ටින්කරට වැටෙහැනවා . තමාට හැඩෙයි කියන බයත් ටින්කර්ට ඇති වෙන පටන් ගත්තේ මේ වෙලාවෙදියි . හැඬුම් බර ස්වරය සගවා ගන්නට උත්සහ කරමනියි ඔහු ඊ ළගට මෙහෙම කියන්න පටන් ගත්තේ .



Scanned with CamScanner

sinhalaebooks.com



" නිකන් කයිවාරු ගහන් නැතිව ඉන්නවා . මම මේක තාත්තට කිව්වා ම එයා පොලීසියට කියයි . ඊට පස්සෙ උබලට වෙන්නේ ආවට වඩා ඉක්මනින් අකුලගෙන යන්න තමයි"

තවත් තත්පරයක්වත් පමා නොවුනු ටින්කර් ආපහු ගේට්ටුව දිහාට දුවගෙන ගියා .තාත්තා නිවස පසුපස පිට්ටනියේ අයිතිය පවතින්නේ තමට බව නිතරම කියනු ඔහුට මතකය . ඉතින් තාත්තාට අයිතිය තියෙන පිට්ටනියට පැමිණීමට කොහේ වත් යන සර්කස් කණ්ඩායමකට ඇති හයිය මොකක් ද ?

ටින්කර් ඈන් මුන ගැසුනු පසු සිදු වූ සියල්ල ම ඇයට කිව්වා . ඊටත් ඈන් ටින්කර ලමයා සමග ඔට්ටු අල්ලන හැටි ඒ වන විටත් හොඳින් දැක තිබුණා . ආරංචිය ජෝජ් දක්වා පැතිරෙන්නටත් වැඩි වෙලාවක් ගත වුනේ නෑ . ටින්කර් මොනවා කිව්වත් සර්කස් කණ්ඩායමක් ඔවුන්ගේ කූඩාරම අසල කඳවුරු ගහන එක ගැන නම් ජෝර්ජ්ටත් ඈන් ට ත් දැණුනේ කිසියම් වූ උද්වේගකර හැඟීමක් බව නම් කිව යුතු යි .

" අනේ ටින්කර් වත්තේ පල්ලෙ සර්කස් එකක් තියෙන කොට නියමයිනේ"

ටින්කර්ගේ කතාව අහපු ජෝර්ජ් ඒ විදිහට කිව්වා . ඒ වුනත් ටින්කර්ට නම් එහෙම අපූරු හැඟීමක් යන්තමින් වත් දැනෙන්නේ නෑ .ඔහු ඉක්මනින් ම තම පියා හමුවෙන්නට ගියා .හේලින් මහාචාර්‍ය තුමා ඒ වන විට හිටියේ පුංචි පහේ විවේකයක් ලබා ගන්න ගමන් . ටින්කර් වහා ම ඉඩමේ අයිතිය සම්බන්දයෙන් තාත්තාගෙන් ප්‍රශ්න කිහිපයක් ඇහුවා . මොන තරම් කෝපයක් හිතට දැනුනත් හොස්ස අගින් මැස්සා යෑමත්

DO NOT COPY

sinhalaebooks.com



නුරුස්සන තාත්තට සර්කස් කණ්ඩායමේ සම්ප්‍රාප්තිය ගැන නම් එක පාරට ම කියන්න ටින්කර් ගියේ නෑ . ටින්කර්ගේ ඉඩම් ගැටලුව නිරාකරණය කර දීමට සිතූ තාත්තා ඉඩමේ අයිතිය ගැන ලිය වුනු කහ පාට පරන ලියැවිල්ලක් හොයා ගෙන ආවා .





Scanned with CamScanner

sinhalaebooks.com



" මේ තියෙන්නේ ..මේක ගොඩාක් පරන ඒ නිසා ම ගොඩාක් වටින කෞතුක වස්තුවක් වගේ ලේඛනයක් ..සියවස් ගාණක් පරණයි"

" ඉතිං මොනව ද ඒකෙ ලියල තියෙන්නේ ?" ඇන් ඇසුවේ පුදුමාකාර උනන්දුවකින් .

" මේකෙන් කියවෙන්නේ කොන්වෝල් කෝනර් කියන ඒ ඉඩම අතීතයේ ඉඳන් හේළින් පවුලට අයිතියක් තියෙන ඉඩමක් බවයි . ලොකු යුද්දයක් තිබිල තියෙනවා . කොම්වෙල් සාමිවරයට සහය දීල තියෙන්නේ හේලින් පවුල තමයි . යුද්දෙන් පස්සෙ අපේ පවුලෙ අයට ඒ ඉඩමෙ කදවුරු ගහන්න දීල තියෙන්නෙ කොම්වෙල් සාමිවරය ම තමයි ."

DO NOT COPY

තාත්තා ඒ විදිහට කියන කොට ටින්කර්ට නම් දැනෙන්නේ නිකන් ඉහේ මලක් පිපුණා වගේ . ඒකෙන් කියවෙන්නේ ඉඩමේ අයිතිය හේලින් පවුලට තියෙන විත්තිය බව ඔහු දන්නවා .

" ඉතිං ඉඩම අයිති අපිට නම් කාටවත් ඒකෙ කදවුරු බදින්නවත් සත්තු ගෙනත් දාන්නවත් අපෙන් අහන් නැතුව බෑ නේද ?"

" ඔව් අනිවාරෙන් ම"

හේලින් මහාචාර්‍ය තුමා කිව්වා . ඒ කතාවට ටින්කර් පුදුමාකාර විදිහට අතුටු වුනා . ඇත්ත වශයෙන් ම පොලීසිය ගෙන්වලා කයිවාරුකාර සර්කස් කාරයෙන් එළවා දමන ආකාරය පවා ඔහුට මැවි මැවී පෙනෙන්න පටන් ගත්තා . ඒ වුනත් ටින්කර්ගේ ඒ සතුට වැඩි



Scanned with CamScanner

sinhalaebooks.com



වෙලාවක් පැවතුනේ නෑ . ඊ ළගට මහාචායීතුමා කීව කතවෙන් ටින්කර්ගේ මුලු හීන ලෝකය ම එකපාරට ම කඩාගෙන වැටුණා .

" මිනිත්තුවක් ඉන්න ටින්කර් . මට මතකයි මේකෙ තිබුණු මහ අමුතු නීතියක් .. සංචාරක සර්කස් කණ්ඩායමක් ගැන .ඔව් මොකක්ද සර්කස් එකකට මේ පිට්ටනියේ කඳවුරු ගහන්න අයිතියක් තියෙනවා . 1066 ඉදන් ඒ අයිතිය පැවතගෙන එන එකක් . ඒක වෙනස් කරන්න බලයන් කොම්වෙල්ලාටtවත් හිබ්බෙ නෑ . මොකද ඔවුන්ට මේ ඉඩම අයිති වෙන්නත් කළින් ඉදන් ඒ සර්කස් කණ්ඩායමට ඒ අයිතිය තිබිලා තියෙනවා .ඉන්න පොඩ්ඩක් බලන්න . මේකෙ අන්තිම හරියෙ එහෙම දෙයක් තිබුනු බව මට මතකයි"

ටින්කර් සහ ගැහැණු ළමුන් දෙදෙනාට කල්පයක් වගේ දැනුනු තත්පර කිහිපයක් බලාගෙන ඉන්න සිද්ද වුනා . හේලින් මහාචායීතුමා පැරණි ලියවිල්ලේ පේළි අතරින් ඔහුගේ ඇගිල්ල අරගෙන ගියා . ලියවිල්ල අවසානයේ තිබූ පේළි තුනකට ඔහුගේ අවධානය යොමුවැ තිබුණා .

" මේ තියෙන්නෙ . මම කියවන්නම් ඔයාලා අහන් ඉන්න ..ආ ඒ සර්කස් කණ්ඩායමේ නම් ටැපර්ගේ රඟමඩල . **' ග්‍රාමීය සංචාරයෙහි යෙදෙන විට වසර දහයකට වරක් භූමියට පැමිණ රගමඩල පැවැත්වීමේ අයිතිය සර්කස් කණ්ඩායමට ඇත .. මගේ පාලනය යටතේ ......"** එතනින් එහාට වැඩක් නෑ . හරි හරි මේ ලේඛනයෙ ඔහොම තිබ්බට ඒ හැටි හිත් කරදර කරගන්න එපා ටින්කර් . මොකද මම හිතන්නේ නෑ ඔය නම තියෙන අර්කස් එකක් දැං නම් තියෙනව වත් කියල . මේ ලියවිල්ල ලියවෙලා තියෙන්නෙ 1648 දී . මේ බලන්න ඒ කාලෙ

DO NOT COPY

sinhalaebooks.com



අක්ෂර විනායාසය. ආ මේ තියෙන්නෙ අවුරුද්ද මේකෙ ලියලා . බලන්න ඔයාලටත් මේ පරණ අකුරු කියව ගන්න පුළුවන් ද කියලා''

ගැහැනු ළමුන් දෙදෙනා අවුරුද්ද කියවා ගන්න සමත් වුනා . ඔවුන් ටින් කර් දිහාට හෙලුවේ '' අයියෝ ටින්කර් උබත් අනිවාරතේ ප්‍රශ්න දාගන්නවානේ'' වගේ බැල්මක් . මේ වෙද්දි ටින්කර්ගේ කෝපය ලැජ්ජාවක් බවට පරිවර්තනය වෙලා මුහුණත් රතු වෙන්න පටන් අරන් තිබෙන හැටි ඔවුන්ට පෙනෙනවා . අන්තිමට ඔහු තාත්තා දිහට හැරිලා මෙහෙම කිව්වේ කර කියා ගන්න ම අතක් නැති නිසයි .

'' ඔයාට මට ඔය වගක් කලින් කියන්ඩ තිබ්බනෙ තාත්තේ''

' එයි මෙ හදිස්සියෙ මේ ඉඩම් ගැන හාරන්නේ ? මොකක් ද කාරණාව ?'' අන්තිමට මුලින් ම ඇසිය යුතු ප්‍රශ්නය මහාචායී තුමා ඇහුවා .

'' ටැපර්ගේ රගමඩල කියලා නම තියෙන සර්කස් එකක් එතනට ඇවිල්ලා හින්දයි සර් .එතන ඉන්නවා ටැපර් කියලා වයසක කෙනෙක් . එයා කීව එයාට මෙතන කඳවුරු ගහන්න අයිතියක් තියෙනවා කියල. ඒ වගේ ම ..''

ඇන් මහාචායීතුමාට තවත් යමක් කියන්න ගියත් ටින්කර්ගෙන් නම් ඒකට ඉඩක් ලැබුනේ නැහැ . ඔහු වහා ම කතා ව මැද්දට පැනලා ඔහුගේ කෝපය මුදා හැරියා .

'' ඒ මිනිහ මාත් එක්ක ආරෝවට ආවා . මට ඕනි තාත්තා ඔයා ගිහින් ඒ මිනිහා කොහොම හරි එලෝලා දාන්න යි''



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



ඒ වුනත් මහචාර්යතුමා යක්ෂාවේශ වෙලා ටැපර් හා ගැටෙන්න ගියේ නම් නෑ . ඒ වෙනුවට ඔහු මෙහෙම කියන්න වුනේ සාන්ත දාන්ත ස්වරයෙන්

' ඔය ළමයි ගිහින් කූඩාරමක් ගැහුවා කියලා මම නම් හිතන්නේ නෑ ටැපර්ට පාඩුවක් ප්‍රශ්නයක් වෙයි කියලා .ඔයා ඔය කියන්නේ ඇත්ත ම ද ටින්කර් ? ඔයා සර්කස් කට්ටිය එක්ක ආරෝවට ගියේ නෑ කියලා හොදට ම විශ්වාස ද ? ඔවුන් නිස්කාරණේ ඔයා එක්ක පැටලෙන්න ආවා එතකොට ?"

ටින්කර්ට කට උත්තර නැති වුන . තවත් කාමරයේ රැදී සිටීමේ හැකියාවක් ඔහුට තිබුනෙ නෑ . ඔහු රතු වූ මුහුණුඉන් යුතුව කාමරයෙන් එලියට ඇවිදින්න පටන් ගත්තා . ඒ අතර මිස් චීෆ් ටින්කර්ගේ පපුවට වාරු වුනේ තමන්ගෙ අයිතිකාරයාගේ සිත් තැවුල වටහා ගත් ලෙසින් . ඌ හෙමීට කොල්ලාගෙන් පහර වෙදුනු ටින්කර්ගේ රිදුම් දෙන පපු ප්‍රදේශ්සය අත ගාන්නට වුනා .

" ටිකක් ඉදපන්කෝ කයිවාරුකාරයෝ . මම උඹට හොද පාඩමක් උගන්වන්නම්කෝ ඉක්මනට ම"

ටින්කර් අවසාන වශයෙන් මුනු මුනු ගෑවා .

ඇත්තට ම ටින්කර්ගේ කතා බහ ක්‍රියා කලාපය ගැන හේලින් මහාචාර්‍ය තුමා සිටියේ අන්තෝ ජටා බහි ජටා මට්ටමේ ගැටලුවක් ඇති කරගෙනයි . මොකක් හරි දෙයක් සිද්ද වෙලා ඇති බව නම් ඔහුට හොදාකාරව ම පැහැදිලියි . ඔහු පුංචි ඈන් දිහාවට හැරිලා මේ විදිහේ ප්‍රශ්නයක් ඇහුවේ සේර ම විස්තර දැන කියා ගැනීමේ අදහසින් .



DO NOT COPY

sinhalaebooks.com



" ඈන් ඔයාලට ඒ ගොල්ලො මොකද කිව්වෙ ? කූඩාරම් ගහන්න දෙන්න බෑ කිව්ව ද ? එහෙම මොනව හරි කිව්ව නම් කියන්න . මං ගිහින් එයාලට තේරුම් බේරුම් කරලා දෙන්නම්"

" අනේ නෑ සර් . එයාලා එහෙම කිව්වේ නෑ . එයා කිව්වා අපි කූඩාරම් ගැහුවා කියලා එයාලට කරදරයක් වෙන් නෑ කියලා . ආ අන්න පිරිමි ළමයි දෙන්න ඇවිල්ලා . මම ගිහින් බලන්නම් එයාලා අපේ බයිසිකලුත් අරන් ඇවිද්ද කියලා . සර් මේ වටිනා ලේඛනය අපිට පෙන්නුවට ගොඩාක් ස්තූතියි'

එහෙම කිව්ව ඈන් එක පාරට ම මහාචාර්ය තුමා අර තරම් හොඳින් තමාට කතා කිරීම ගැන ත් , ඔහු හා තනියෙන් කතා කරන්න සිදු වීම ගැනත් ආඩම්බරය හා ලැජ්ජාව පිරුනු මුහුණින් සුළඟක් වාගෙ වේගෙන් කාමරෙන් එළියට දිව්වා .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 06

# කූඩාරම් ගැසීමට සියල්ල සූදානම්

DO NOT COPY

" අයියෝ ටින්කර් ඔයා බබෙක් වගේ නේ හැසිරිලා තියෙන්නේ"

ජූලියන් කිව්වේ ටින්කර්ගේ අඩව් ඇල්ලීමත් පැරණි ලේඛනයත් පිළිබඳ කතාව ගොඩාක් උනන්දුවෙන් අසා සිටීමෙන් අනතුරුව යි . " ඕන නැති විදිහේ සණ්ඩුවක්නේ ඇතිකරගෙන තියෙන්නේ . ඊටත් මම නම් ආසයි සර්කස් එකක් ගාව පොඩ්ඩක් ජීවත් වෙන්න ලැබෙන එකටත් . ඒක අපට නවමු ද්දැකීමක් වෙනවා සහතිකයි . ඒ ගොල්ලො කොහොමද සර්කස් එකක් සැලසුම් කරන්නෙ වගේ දේවල් දැක බලා



Scanned with CamScanner

sinhalaebooks.com



ගන්න ලැබෙන එක පූරුවේ වාසනාවක් . එයාල සර්කස් එකකට අවශ්‍ය කරන සේරම බඩු ගෙනල්ලා ඇති''

'' ඔව් ඔව්ව් කැරවෑන් ගොඩාක් එතන තිබුණා' ඈන් උත්තර දුන්නා . '' මම පැය බාගෙකට විතර කලින් පොඩ්ඩක් ඔලුව දාලා බලද්දි මුලු ඉඩමම එයාලගෙන් පිරිලයි තිබුණේ . ආ එයාලා මේ පැත්තෙ වැට ගාවට වෙන්න ටිකක් ඉඩ ඉතුරු කරලා තිබුනා . අපිට කූඩාරම් අටව ගන්න වෙන්න ඇති මගෙ හිතේ එහෙම ඉඩක් ඉතුරු කරන්න නම් ඇත්තේ''

'' අපි බයිසිකල් පැදගෙන එද්දි මම ලොකු සර්කස් පෝස්ටර් වගයක් දැක්කා .'' ඩික් ද කතාවට හවුල් වෙමින් කිව්වා . '' බුදු අම්මෝ ඒවගෙ තීබ ජාති . වෙඩි කන ඩික් , ක්‍රිකට් ගහන චිම්පන්සියා , ඇට නැති මිනිසා , මැඩ්ලන් හා ඇගේ සුන්දර අශ්වයෝ, මොන්ටි සහ වින්ක්ස් කවටයෝ , නර්ථනාචායී වදුරා , වූ නම් වූ පුදුමාකාර මායාකාරයා , මට නම් පෙන්නේ ඒක නියම ම සර්කස් එකක් වගේ . මට නම් සතුටුයි සර්කස් එකක් තියෙන ඉඩමක ම කූඩාරම් අටවගන්න ලැබෙන එක ගැන ඇත්තට ම . අපිට ඒ ගොල්ලො පුරුදු පුහුණු වෙන හැටි වුනත් බලා කියා ගන්න පුලුවන් වෙයි'

' චාලි කියන චිම්පන්සියා ගැන මතක ද ? මෙයාලගේ චිම්පන්සියත් බැරිවෙලා අත් කූඩුවෙන් එලියට ඇවිල්ලා අපේ කුස්සියෙන් එබිලා බලලා ජෙනීට මල් හිනාවක් හෙම දැම්මොත් කොහොමට තියේවිද ?''

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" අනේ අනේ ජුලියන් .. ඒක නම් ඔයා ඔය කියන තරම් විනෝදයක් එන එකක් නෑ . අසරණ ජෙනී හැතැම්ම ගනනක් දුවල තමයි නවතින්න්නේ"

ජුලියන්ගේ කතාවට ඒ විදිහට විරුද්දත්වය ප්‍රකාශ කළේ ඈන් .

" හරි හරි දැන් කතාව නවත්තලා කූඩාරම් අටවන වැඩේ ගැන හිතමුද ? අපි තේ වෙලාවෙන් පස්සේ වත් වැඩේට බැස්සොත් නරක ද ? ජෙෆ් කිව්වා තේ වෙලාවෙන් පස්සෙ තමා බඩු ටික ගේන්න වෙන්නේ කියලා .එහේ කවුරුවත් නෑ ලු එවන්න .අද මහ උණුසුම් දවසක් නේ. මට නම් මෙලෝ දෙයක් කරන්න පටන් ගන්න හිතක් නෑ දැම්ම'

"වූෆ්"

ඩික්ගේ කතාවට වහා ම එකගත්වය පළ කළ හිටියේ ටිමී විසින් . හිස ත් දෙපයත් දිගා කරගෙන දිවත් එලියට දාගෙන ඌ හති හෙලන්නත් පටන් ගත්තේ ඒ කතාව තහවුරු කරනවා වගෙයි . ඒ අතර ජුලියන් කකුලෙන් ටිමියාට හෙමින් තට්ටුවක් දාන ගමන් මෙන්න මෙහෙම කිවා .

" අනේ බං ටිමී .. උබටත් නිකන් ඩික්ට වගේ ම පාන් කියාගන්න බෑ වගේ නේ . එක අතකින් පයින් ම කිරින්වලට දුවලා පයින් ම කිරින් වල ඉදන් ආපහු මෙහෙට ඇවිල්ලා උබටත් හොඳ ගණන් ඇත"

" ඔව් .. පාරත් හොදට ම දූවිලි පිරිලනේ තිබ්බෙ . අපි ව කාර් එකක් පහු කරන ගානේ ටිමීට කිවිසුම් ගියෙත් ඒකයි . පව් .. උබට හුගාක් මහන්සි ඇති ටිමී ඔච්චර දුරක් දුවලා"

sinhalaebooks.com



" වුෆ්"

ඩික්ගේ කතාවට ටිමී යළිත් වරක් එකඟ වුනා . ඊට පස්සේ ඌ ජෝර්ජ් දිහාවට අතක් දිගු කරලා මොනවදෝ කියන්න ට පටන් ගත්තා . ඩික් කවුරු කවුරුත් සිනස්සවමින් බලු බාෂාව තේරුම් බේරුමk් අරන්නට පටන් ගත්තා .

" ජෝර්ජ් ඌ කියන්නේ කොහේ හරි ඇවිදින්න යනව නම් මහන්සි නෑ කියලයි."

" හරි හරි ඌට මහන්සි නැති වුනාට මට නම් මහන්සියි . කිරින් වලට ගිහින් එහේ ඉඳන් මෙහේට බයිසිකල් දෙකක් පදින එකත් ලේසි පාසු වැඩක් නෙමේනේ . නෑ නෑ ටිමී මට නම් බෑ උඹත් එක්ක රස්තියාදු ගහන්න එන්න"

ජුලියන් එහෙම කියන කොට නම් ටිමී කළේ පුංචි ගෙරවුම් හඬක් නිකුත් කරන එක යි . ඒත් සමගම මිස්චීෆ් එක පාරට ම ටින්කර්ගේ උරහිසින් බිමට පැනලා ටිමීගේ කර වටා අත් දෙකත් දමාගෙන මොන මොනවදෝ මුමුණන්නට පටන් ගත්තේ කතාවට ඌවත් හවුල් කරගන්න කියනවා වගේ .

ඒත් සමග ම කිසියම් වූ සංගීත රාවයක් ළමුන්ට ඇසෙන්නට වූවෙන් බලු වදුරු හුරතලය අවදානයෙන් ගිලිහී ගොස් සංගීතය ඔවුන්ගේ මාතෘකාව බවට පත් වුනා .

" මම හිතන්නේ ටැපර්ගේ සංචාරක සර්කස් කණ්ඩායම ඕපනින් නයිට් එකට පුරුදු පුහුණු වෙනවා ඇති"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ඈන් කල්පනාකාරී අඩින් කිව්වා . ඒ අතර ජෝර්ජ් විශාල ඇණුමක් හරිමින් කිව්වේ මේ වගේ දෙයක්

" ඒක ඇත්තේ හෙටනේ . ඔව් ඔව් මොකක් හරි කණ්ඩායම් සංගීතයක් වගේ තමා .තේ වලින් පස්සේ අපි කූඩාරම් හයි කරද්දි සමහර විට බෑන්ඩ් කණ්ඩායමෙ අය අපට දකින්නත් ලැබෙයි . අර ඇට නැති මිනිහා මොනවගේ ද කියලා තමයි මට නම් බලාගන්න ආස ම . ඔයාලට එහෙම වුවමනාවක් නැද්ද ?"

" අම්මෝ නෑ . මම නම් යන්නේ නෑ එයාව බලන්න . ඇට කටු නැත්තම් එයා නිකන් පණුවෙක් වගේ ඉන්නවා ඇත්තේ . ඒ මේ අතාට නැවි නැවී ඇඹරි ඇඹරී . හැබැයි මං ආසයි ඩාන්ස් දාන අශ්වයයි බූරුවයි බලන්න නම් .දැනුත් අර බෑන්ඩ් එක වාදනය කරන කොට එයාලා නටනවා ඇති නේද ?"

පුංචි ඈන් ඒ වගේ දෙයක් කියන කොට ඩික් තවත් සතුටු හිතෙන කතාවක් පුංචි ඈන්ට කිව්වා .

" හරි හරි ඉතිං අපි තව ටිකෙන් එළි පහළියට ගියා ම ඔයාට බලාගන්න පුළුවන්නේ . අනික මිස්ටර් ටැපර් අපිට සර්කස් එක පුරාම ඇවිදින්න කැමැත්ත දෙයි . අයියෝ ඉතිං මේ ටින්කර් මනුස්සයා එක්ක වලියට ගිය නිසා අපිත් එක්ක අමනාපෙන් හිටියොත් නම් එහෙම ඉඩක් දෙන එකක් නෑ"

" අනේ මේ මේ .. උඹලට ඕන නම් ඒ මනුස්සයා එක්ක ඕන දෙයක් කරගනිල්ලා . මට නම් ඔය අවිනීත මිනිහා පේන්න බෑ . මං එන්නෙත්

DO NOT COPY

sinhalaebooks.com



නෑ . ඌ මට හොඳට ම බැන්නා . අර නපුරු කොල්ලා මට හොඳට ම තඩි බෑවත් එක්ක''

ටින්කර් කෝපයෙන් යුතුව එහෙම කිව්වා . ජූලියන් ඇනුමක් පිට කරන අතර ම ටින්කර් හැරිලා පුංචි පහේ අවවාදයක් දෙන්නත් අමතක කරේ නෑ .

'' අනේ අනේ ටින්කර් . ඔය තරහ මරහා දැං වත් අමතක කරලා දානවකෝ . අනික මම වුනත් මගේ සීයත් එක්ක කවුරු හරි බැණ අඩගහ ගන්න ආවොත් නිකන් බකන් නිලා ඉන්නේ නැනේ . දැං ඒක ඉවරයි . ප්‍රශ්න කියන ඒවා හැම දාම හිතේ තියාගෙන ඉන්න ඕන නැනේ . අපි තේ වලින් පස්සේ කූඩාරම් ගහන්න යමු . අර සර්කස් කට්ටිය අපිට ඉතුරු කරල තියෙන හොඳට හෙවන තියෙන තැන කූඩාරම් ගහනවට ඔයාලා කැමතියිනේ ?''

'' ඔව් ..'' ළමයි හැමෝම එකගත්වය පළ කර හිටියේ එක හඩින් . ඩික් තණ කොළ කැබැල්ලක් ගෙන මිස් හීෆ්ගේ නහයට දමා එහාටත් මෙහාටත් කරකවා පුංචි කිතියක් ඇති කළේ ඒ අතර යි . මනුස්සයෙක්ට සිදුවන ආකාරයෙන් ම මිස් චීෆ්ටත් කිවිසුමක් පිටවුනේ ළමුන් තුළ දැවැන්ත සිනා යායක් ම ඇති කරමින් . ඊ ළගට නහය පිස දැමූ මිස් චීෆ් ඩික් දිහා වට රවා බලා වදුරු බාෂාවෙන් ලුනු ඇඹුල් ඇතිව යමක් කියන්නට ත් අමතක කළේ නෑ .

'' අයියෝ මිස් චීෆ් ලේන්සුවක් පාවිච්චි කරන්ඩෝ'' ජූලියන් සිනා සෙමින් ම මිස් චීෆ්ට පැවසුවා . මිස් චීෆ් නාසය අතින් පිරි මදින එක නවත්තලා කිවිසුම් යායක් ම පිට වෙද්දී ඩික්ගේ සාක්කුවට අත දමා

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ලේන්සුවක් පිතටට් ඇද ගත්තේ හරියට ජුලියන් කිව්ව දේ තේරුම් ගත්ත වගේ . ඊ ළඟට ඌ ඒක නාසය දිහාවට දිගු කරලා කිවිසුම් යන කොට ම නාසයට තියන්න පටන් ගත්ත .

ළමුන් පස් දෙනාම බඩ අල්ලාගෙන සිනා වෙනවා . ඇත්තට ම ලමයි හිනා වෙන කොට මිස් වීෆ් දගයාටත් පුදුම විදිහේ සතුටක් දැනෙනවා .

“ ඔයා ඕවා නම් මිමොකක් හරි සර්කස් එකකින් ම තමා පුරුදු වෙන්න ඇත්තේ .’’ ඩික් කීවේ නැවතත් ඔහුගේ ලේන්සුව උදුරා ගන්න ගමන් . “| අනේ අනේ උඹට පික් පොකට් ගහන්න වුනත් පුලුවන් වෙයි’’

“ එයාව සර්කස් එකකට වුනත් ගැලපෙනවා’’ ඈන් වුනත් ප්‍රශංසනීය හඩකින් මිස් වීෆ්ට කිව්වා . හැබැයි ඈන්ගේ ඒ කතාව ඇතුළේ මිස්වීෆ්ව සර්කස් එකකට බාර දෙන්න ඕන වගේ අදසහ ක් නම් ගැව්ලා වත් තිබුණේ නෑ . ඒ වුනත් මිස් වීෆ්ගේ අයිති කාරයා එක පාරට ම මෙහෙම කීවේ ඈන්ගේ කතාව වුනත් වැරදියට වටහා ගනිමින් .

“ මම නම් එයාව කවදා වත් සර්කස් එකකට දෙන්නේ නෑ. එයාගෙ ජීවිතේ එපා වෙයි . මම අහල තියෙනවා සර්කස්වලට බාර වෙන සත්තුන්ට ගොඩාක් වද හින්සා වලට ලක් වෙන්න සිද්ද වෙනව කියලා’’

“ මං නම් හිතන්නේ නෑ මිස්වීෆ්ට ඒ වගේ දෙයක් වෙයි කියලා . සර්කස්වල අය එයාලගෙ සත්තුන්ට හරි ආදරෙයි . ඒ වගේ ම එයා ල ගොඩාක් ආරම්බර වෙනවා එයාලගේ සත්තු ගැන . බැරිවෙලාවත් ස් අර්කස් එකේ අය ඒ සත්තුන්ට හොදට සලකන්නේ නැත්තනම් ඔයාල හිතනව ද එයාලා එයාලගේ ශෝව් එක හරියට කරයි කියලා ? ඒ නිසා



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



ම ගොඩක් සර්කස්වල සත්තුන්ට සලකන්නේ තමන්ගෙම පවුලෙ අයට වගේ''

"චිම්පන්සින්ටත් සලකන්නේ ඒ විදිහට ම ද ?"

ඈන් ඇසුවේ බියපත් හඬින් . ඒ අතර ජුලියන් ඈන්ට මෙහෙම කිව්වා .

"නැතුව ඉතිං . චිම්පන්සියා හරිම හිත හොඳ සතෙක් . ඒ වගේ ම හරි ම දක්ෂ සතෙක් .මිස්චීෆ් හා හා උඹ මගේ ලේංසුවටත් විදින්න නම් ලෑස්ති වෙන්න එපා .ආං බලපල්ලා . ඒ ගමන උං ටිමීගෙ කොළරය ගලවගන්න හදනවා''

"මං ගාවට ඇවිත් පාඩුවේ ඉඳපන්කෝ මිස්චීෆ් විකාර කරන් නැතිව ."

ටින්කර් ටිකක් සැරෙන් මිස් චීෆ්ට කිව්වා . ඉතිං ඊට පස්සේ මිස්චීෆ් ටින්කර් ගාවට ඇවිත් ඔහුගේ දණහිස බදා ගත්තේ හරි ම කීකරු විදිහට . මුදු හඬින් මොනවදො කියවන්නත් ඒ අතර මිස්චීෆ් පටන් ගත්තා .

"හොර ගෙඩියා මම උඹව සර්කස් එකකට දීලා අලියෙක් ගන්නවා හිතුණොත්''

ටින්කර් එහෙම කියද්දී ළමුන් හැමෝ ම හිනා වුනා . ඇත්තට ම ටින්කර් මිස්චීෆ් වෙනුවට අලියෙක් ලබා ගන්නවා කී විට සිනා නොවී ඉන්න පුලුවන් කාට ද ? ඔහු අලියෙක් සමග මොනවා කරන්න ද ?

"මෝඩයා'' ටින්කර් දිහා බලන ගමන් ඩික්ට කියවුනේ ඒ නිසයි .

DO NOT COPY

sinhalaebooks.com



ඒ අතර ම කුස්සිය දිහාවෙන් කට හඬක් ඇහෙන්නට පටන් ගත්තා . ඒ ඇහෙන්නේ ජෙනීගේ කට හඬ බව කාටත් හඳුනා ගන්න පුළුවන් .

" ටින්කර් .. කුරියර් කාරයා ඔයලගෙ බඩු අරන් ඇවිල්ලා . එයා ඒවා ගෙයි ගේ මැද්දේ තියලා ගිහින්ලා . අනේ ඉක්මනට ඇවිල්ලා ඒ ටික් අස් කර ගන්නකෝ . නැත්තම් ඔයාගේ තාත්තා ඒවයේ පැටලිලා කරණම් ගහයි"

' හරි හරි ජෙනී .. ටිකෙන් එන්නම් . අපි මේ වෙලාවේ ටිකක් බිසී"

" අප්ෆා උඹ නම් හෙන ම හෙන බොරු කාරයෙක් ටින්කර්" ඩික් කියන්නට වූයේ අමනාපයෙන් . ' අපි බිසී නෑනේ චුට්ටක්වත් . අපි පොඩ්ඩක් ගිහින් බලමු ඔක්කොම බඩු ගෙනල්ල ද කියලා"

" අනෙ අපි තව විනාඩි විස්සක් විතර ඉඳලා යමු" දිග ම දිග ඇණුමක් හරින ගමන් ඈන් කීවේ ඉතා ම අලස විදිහට යි . " ටින්කර්ගේ තාත්තා තාමත් පොඩි නින්දක් දාගෙන ඇත්තේ . මේ හදිස්සියේ එයා ඕවයේ පැටලෙන එකක් නෑ"

ඒ වුනත් ඒ වුනත් පුංචි ඈන් එවර නම් හොඳටෝ ම වරද්දාගෙන තිබුණා . මහචායීතුමා බඩුමුට්ටු සේරම මහා හඬක් නැගෙන සේ පෙරළාගෙන ඒ වන විටත් පත බැවිලා ඉවරයි .

ජෙනී වහ වහා සාලය දිහාවට දුවන්නට පටන් ගත්තෙ පුදුමාකාර විදිහට බියට පත් වෙලා . මහචායීතුමාගේ ඔලුව තිබුනෙ බිමට එලන රෙද්දකට



DO NOT COPY

sinhalaebooks.com



යට වෙලා . ඒ වගේ ම කූඩාරමකට සවිකරන උස දණ්ඩක් ඔහුගේ පිට



Scanned with CamScanner

sinhalaebooks.com



මත දක්නට ලැබුණා .

" මේ මොන විකාරයක් ද ජෙනී . මේ වගේ බඩු ගේ මැද්දෙ ගොඩ ගහන සිරිතක් ඉගෙන ගත්තේ මොන ලෝකෙන්ද ? ජෙනී ජෙනී ... වහා ම මේ මල උලව් පල්ලෙහාට රන් ගිහින් ගිහින් ගිනි තියනවා"

' විනාසයි . අපේ කැම්පින්ග් බඩුටික' ජෝර්ජ් භීතියෙන් කෑ ගහුවා . " ඕවා ගිනි තිබ්බොත් ආයෙ මලාට කූඩාරම් ගහලා ඉවරයි . ඉක්මන් කරල ඒ ටික අයින් කරගමු . කම්මැලියෝ නැගිටපල්ලා'

දෙපාරක් කියන්නට අවශ්‍ය වුනේ නෑ . අධිබල දුම්රිය එන්ජින් පහක් ඉක්මණින් ම සාලයට සේන්දු වෙලා පිරිමි එන්ජින් තුන ඉක්මණින් ම මහාචාර්‍ය තුම් පෙරළා දැමූ ලට්ට ලොට්ට සියල්ල මිදුලට රැගෙන ආවා . ඒ අතර ඈන් සහ ජෝර්ජ් දෙන්දෙනා බිම පත බෑවී සිටි මහා මහාචාර්‍යවරයා දෙපයින් නැගිට්ටවලා පුටුවක් මත හිදුවා ඔහුගේ හිත හැදෙන දේවල් කියන්නටත් අමතක කරේ නෑ . ගැහැණු ළමයින් දෙදෙනා ගේ සාතු සප්පායම් හොස්ස ළගින් මැස්සා යනවාටත් විරුද්ද මනුස්සයාගේ කෝපය මුළුවනි න් ම අතුරු දහන් කරන්නට සමත් වුන .

" කොල්ලනේ ඕවා ගිනි තියද්දී වත්ත පල්ලෙහාට ම අරන් යන්න ඕන හරි ද ?"

ගේ ඇතුලේ ඉදන් ම මහා චාර්‍ය තුමා කෑ ගැව්වේ ගේ කිට්ටුවෙන් ම ළමයින් තිදෙනා ගින්නක් අවුලවාවී යි හදිසියේ ඇති වූ සැකයෙන් .

sinhalaebooks.com



“ හරි හරි තාත්තේ . අපි ඔන්න පල්ලට ම ගෙනව . දැන් තියෙන්නෙ ගින්න අවුලවන්න විතරයි”

ඒ අතර ටින් කර් තමාගේ බොරු කීමේ හැකියාව පෙන්වා සිටින්නත් අමතක කළේ නෑ .

“ ඉන්නවා ළමයි . හෙට උදේට මම ම ඇවිල්ලා ඔය කහල ගොඩට ගිනි තියන්නම්”

තාත්තා එහෙම කියන කොට ටින්කර්ට නම් හෙලුනේ ඉතා ම සැනසිලි දායක සුසුමක් . ඇත්තට ම කෑවද බීවද වත් මතක නැති තාත්තාට හෙට උදේ වෙන්කොට කහල ගොඩකට ගිනි තබන්නට තියෙන බව මතක තිබෙන්නේ කොහොම ද ? අනිත් එක තේ වෙලාවෙන් පස්සේ සේර ම බඩු ටික කූඩාරම් බවට පත් වෙලා වත්තේ නගා සිටවෙන්නටත් නියමිතයි.

ඒ අතර ජෙනී ඉක්මනින් ම මහා චායි තුමට උනුසුම් තේ කෝප්පයක් පිළි ගැන්නුවා . ඒ අතර එතුමාගේ හිත හැදෙන දේවල් රැසක් ම කියන්නත් ඇය ඉදිරිපත් වුනා . ඒ වුනත් ඇය ටින්කර්ට නම් කතා කරන්නට පටන් ගත්තේ තරමක නෝක්කාඩු ස්වරයකින් .

“ මම ඔයාට මේ විදිහේ දෙයක් වෙයි කියලා කලින් ම කිව්වේ නැද්ද ? පව් අර අහින්සක් මනුස්සයා . අතක් පයක් එහෙම කැඩුණා නම් කාට කියන්න ද ? මම ඔයාලගෙ තේ තව ටිකකින් ලෑස්ති කරන්නම් . . එය කෑම කාමරේට වෙලා පාඩුවේ තේ එක බීපුවාවේ”

DO NOT COPY

sinhalaebooks.com



“ මාත් ඔයාට උදව් කරන්නම් ජෙනී’. ඊළඟට අපි ඉක්මනට ම පිට්ටනියේ කූඩාරම් හයි කරන වැඩේ පටන් ගන්න ඕන . ටින්කර් . ඔයා ආයෙ නම් අර සර්කස් කට්ටිය එක්ක ඇවිලෙන්න යන්න එපා”

ඈන් ඒ වගේ කතාවක් කියන කොට ජෝර්ජ් ද ඇයට එකග වෙලා මෙහෙම කිව්වා

“ නෑ නෑ ඈන් . ටින්කර් ආයේ ඒ වගේ ගොන්කමක් කරන එකක් නෑ . ඈන් තේ ගේන කන් අපි මේ දේවල් තව ටිකක් එහාට අරන් යමු”

ඒ අනුව වත්තේ කෙලවර පිට්ටනිය දෙසට වෙන්නට කූඩාරම් බඩු සියල්ල ඉක්මනින් ම ගොඩ ගැසුනා . සේරම දේවල් තේරුම් ගත්ත නිසාදෝ ටිමීට වුනත් පුදුම තරමේ උද්දාමයක් ඇනෙනවා . බඩු මුට්ටු සියල්ල උඩින් පනිමින් ටිමී එහාටත් මෙහාටත් දුවන්නට පටන් ගත්තේ ඒ උපන් උද්යෝගය නිසා ම යි .ඒ අතර මිස් වීප් පවා පුලු පුලුවන් විදිහට ළමුන්ට උදව් වුනා . එයාට ඔසවගත හැකි පුංචි පුංචි බඩු වත්ත පහළට අත් දෙකෙන් අරන් ආවේ හරියට ම මනුස්සයෙක් වගෙයි . මේ දේවල් සිදු කරන අතරේ ටිමීගෙ පිට උඩට නැග ගෙල වටා දෑත් යොමා අසරුවෙක් වී පුංචි පගේ සවාරියක් ගහන අවස්ථාවකුත් මිස් වීප්ට ලැබුනා

DO NOT COPY

මේ දේවල් සිද්ද වෙන අතරම කුස්සිය දෙසින් ඇසුනු සීනු හඬ ළමුන්ගෙ තේ සූදානම් බව කියා පෑවා .

sinhalaebooks.com



" අම්මෝ ඇති යන්තම් ." ඒ ඩික් . ' මට තේ එකක් හොදට ම ඕන වෙලයි තිබුණේ . මට ජෝගුව ම වුනත් බොන්න පුළුවන් වෙයි . ඉක්මනට තේ බීලා අපි වැඩේ පටන් ගමු . දැං නම් මට පාං කියා ගන්න බෑ . උඹටත් එහෙමයි නේද ටිමී ?"

" වුෆ්" ටිමී ඇත්ත වශයෙන් ම එකග වුනා . ඊට පස්සේ ඌට හැකි උපරිම වේගයෙන් වත්ත පහළ සිට කුස්සිය හෙසට දුවන්නට වුනා . මිස්චිෆ් ටිමී පස්සෙන් දුවන්නට පටන් ගත්තේ අශ්වයා අල්ල ගන්නට දුවන කව්බෝයි කෙනෙක්ගේ සෙයියාවෙන් .

" උබලා දන්නව ද උන් දෙන්නා ඔය යන්නේ මොකට ද කියලා . සර්කස් එකට ජොයින් වෙනවද නැද්ද කියන එක ගැන කත බතා කර ගන්න . හරි ඈන් ඔහොම බෙරිහන් දෙන්න එපා . මෙන්න අපි එනවා .."

ඒ විදිහේ කතාවක් කිව්වේ ඩික් .

DO NOT COPY

sinhalaebooks.com



# 07

## රඟ මඩල පවත්වන භූමියේදී

DO NOT COPY

තේ පානයේ නියැලෙමින් බොහෝ වේලාවක් වැය කිරීමේ කැමැත්තක් ළමුන්ට තිබුණේ නැත .හැකි තාක් ඉක්මණින් කූඩාරම් ගැසීමට යාමේ නො ඉවසිල්ල ළමුන් සියලු හෙනාට ම දැනෙන්නට විය .

“ අපිට සර්කස් එක පැත්තේ පොඩ්ඩක් ඔලුව දාලා බලන්ට තියෙනවා නම් නියමයි” යි ඩික් තමන්ගේ කටහඩ අවදි කළේ ඒ නොයිවසිල්ල නිසාම යි “ අපි ඉන්න යන්නේ සර්කස් කාරයෝ ටිකක් එක්ක නිසා ම මම කැමතියි මිස් වීෆ් වැඩිය ඒ පැත්තේ නොයනවා නම් . මොකද පස්සෙ කාලෙක මූත් ඒ ගොල්ලො ක්ක යන්ට ගියොත් එහෙම අපිට මිස් වීෆ් නැති වෙනවා”



Scanned with CamScanner

sinhalaebooks.com



" නෑ නෑ මගේ මිස්චීෆ් සර්කස් කාරයොත් එක්ක වැඩිය හජනෙට යන්නේ නෑ" බියත් කේන්තියත්e කට කැටි අරගත් හඬින් ඒ කතාව කීවේ ටින්කර් .

" හරි හරි අපි අලමුකෝ මොකද වෙන්නේ කියලා . දැන් ඉක්මනට ඔය තේ එක බොන්නකෝ"

තවත් වල්ප වේලාවකින් තේ පානය අවසන් කළ ළමුන් වැට අයිනට පැමින සර්කස් නඩයේ කූඩාරම් දෙස පුදුමයට පත් දෑසින් බලා සිටියා . පිට්ටනිය පුරා ම තැනින් තැන කැරවෑන් විශාල ප්‍රමානයක් නවතා තිබුනා . ඒ සෑම කැරවෑනයක ම බඳ මත දිලිසෙන අකුරින් සිත්තම් කර තිබුණේ ටැපර් මහතාගේ නමයි . ඒ විශල කැරවෑන් අතර මැද නවතා ඇති පුංචි කැරවෑන් වල අලංකාර තිර රෙදිවලින් සමන්විත ජනේල පවා තියෙනවා . අනිවාරෙයෙන් ම සර්කස් කණ්ඩායමේ නිවාස වශයෙන් භාවිතා කරන්නේ ඒ පුංචි කැරවෑන් බව ළමයින්ට විශ්වාසයි . තමාටත් කැරවෑන් ගෙයක් තිබුනා නම් මොන තරම් අපූරුදැයි ජෝර්ජ්ට සිතෙනවා . සෙලවීමටවත් නො හැකි නිවහනක ජීවත් වෙනවාට වඩා එහෙට මෙහෙට අරගෙන යා හැකි නිවසක් තිබීම මොන තරම් වාසනාවක් ද කියලත් ඇයට හිතුණා .

" ආන් බලන්න අශ්වයෝ"

එක පාරට ම ඩික් කෑ ගාන්නට වුනා . ඔහුගේ බැලම එල්ලේ නෙත් හෙලන ළමුන්ට පෙණුනේ දිගු අලංකාර වලිග හා සිනිඳු කේශරවලින් යුතු සුංදර විශාල අශ්වයන් කිහිපදෙනෙක් . ඔවුන් මෙහෙයවමින් අශ්වයන් අතර උරුවම් හාමින් සිටින පිරිමි ළමයා වෙනින් කවුරුත්



Scanned with CamScanner

sinhalaebooks.com



නොව ටින්කර් අමග හයි ඇල්ලූ පිරිමි ළමයා බව හඳුනා ගන්නටත් ළමයින්ට වැඩි වේලාවක් ගත වූවේ නෑ . කොල පැහැති තණ කොල දැකීමෙන් ප්‍රීතියට පත් බවක් ද අශ්වයින්ගෙන් දක්නට ලැබුණා .

" ගේට්ටුව හරියට වැහුව ද ?"

ඉතා ඈතින් කවුදෝ සන හඬක් ඔවුන්ට ඇසුනා .

" ඔව් සීයේ' උරුවම් බාමින් හුන් පිරිමි ලමයා පිලිතුරු දුන්නා . " මම ඒවා හරියට වැහුවා . අශ්වයින්ට ඒකෙන් පැනල පාරට යන්න බෑ .''

වැටට උඩින් හිස් දමාගෙන බලා සිටින ළමුන් පිරිස පිරිමි ළමයාගේ ඇස ගැසුණේ ඒ වෙලාවෙදියි . ඔහු ඔවුන්ට අතක් වනලා මෙහෙම කීවේ කිසිම ආරෝවක් ඇති නොවුනු ගානට යි .

" අපේ අශ්වයෝ දිහා ද බැලුවේ ? එන්න ඇවිල්ල ම බලන්න . උන් හරි ලස්සනයි නේද ?"

එසේ පවසමින් ම පිරිමි ළමයා තම හැකියාවන් පෙන්වීමට මෙන් අසෙකු පිට නැගී පිට්ටනිය වටා රවුමක් යන්නට පටන් ගත්තා . ඇත්තට ම මේ අපූරු වාසනාවන්ත පිරිමි ළමයා සම්බන්දයෙන් ජෝර්ට නම් දැන් දැන් පුංචි පහේ ඉරිශියාවකුත් ඇනෙන්නට පටන් අරන් . ඇයටත් අශ්වයෙකු පිට නැගී මේ වගේ වටයක් ගසන්නට ලැබෙනවා නම් මොන තරම් අපූරු ද කියලා ජෝර්ජ්ට හිතුනා .

ඒ අතර ටින්කර්ගේ සර්කසය සම්බන්දයෙන් පෙර පැවති නොරිස්සනසුලු ගතියත් හෙමින් හෙමින් පහව ගොස් ඇති බවක් දැක

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ගන්න පුළුවන් . ඔහු මෙහෙම කිව්වේ ඒ බව කාට කාටත් ඒත්තු ගන්වමින්.

" හරි ඉක්මනට අපේ කූඩාරම් බඩු ටික එහාට ගෙනියමු . ඇත්තට ම සර්කස් එකක් මේ තරම් ළඟ පාතක තියෙන එකත් හොඳයි"

එසේ කියමින් ම ඔහු වැට උඩින් පැන ඉඩමේ අනික් පැත්තට ගොඩ බැස්සා . ඩික් ද ඊට පස්සේ ටින්කර් සමග එහා පැත්තට පැන්නා . ජූලියන් ඔවුන් දෙදෙනාට අපූරු අදහසක් ඉදිරිපත් කළේ ඒ වෙලා වේදී යි

" මම මේ පැත්තේ ඉඳන් මේ බඩු ටික උඹලාට එවන්නම් . උඹලා දෙන්නා බඩු ටික පරිස්සමට ඔය පැත්තෙන් අරන් තියාපල්ලා. මට උදව් කරන්න ජෝර්ජ් ඉන්නවානේ . එයා කවදත් ඕන ම කොල්ලෙක්ට වඩා දක්ෂයි"

ඒ කතාවට නම් ජෝර්ජ්ගේ ඉහේ මලක් නොපිපුනා පමණයි . ජූලියන් අයියාගෙන් ඒ වගේ කතාවක් අහන්නට ලැබෙන එක ඇයට දැනෙන්නේ එසේ මෙසේ වාසනාවක් හැටියිට නෙමෙයි . කොහොමින් කොහොම වුනත් කූඩාරම් උපකරණ වැටට උඩින් එහා පැත්තට යවන එකත් ලේසි පහසු කටයුත්තක් නෙමෙයි . ඒ කටයුතු අවසන් වෙන කොට ළමුනd ෙහෙදෙනාට හොඳ පණ ගිහින් තිබුණේ ඒ නිසා ම යි . බඩුමුට්ටු එහා පැත්තට දමන කටයුත්ත අවසන් කළාට පස්සේ ඈන් ජෝර්ජ් ජූලියන් තුන්කට්ටුවත් වැට උඩින් එහා පැත්තට පැන්නා . ඊට පස්සේ පස් කට්ටුව ම එක් වී කූඩාරම ඉදි කරන්නට සුදුසු තැනක් සොයමින් තමා වටා බිම පරික්ෂා කරන්නට වුනා .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" මෙන්න මේ පඳුර ගාව කූඩාරම් ගැහුවොත් නරක ද ? අපිට පිටිපස්සෙන් තියෙන මේ ලොකු ගහ නිසා හුලගෙනුත් කූඩාරම් ආරක්ෂිතයිනේ . අනික් එක අපි සර්කස් කට්ටියට ඕනෑවට වඩා කිට්ටු වෙන්නෙත් නෑනේ . මොනව වුනත් අපි එයාලගේ කරේ නැගගන වගේ ඉන්නවට ඒ ගොල්ලෝ කැමති වෙන එකක් නෑ . ඒ නිසා මෙතන තමයි අපිට හරියට ම ගැලපෙන්නේ . ඔයාලා මොකද හිතන්නේ ?"

" ඇත්තට ම නියමයි"

පුංචි ඈන් ගොඩාක් සතුටින් එකග වුනා . සතුට වැඩි නිසා ම ඇගේ නිල් පාට දෑස් ලස්සනට දිදුලන හැටිත් ජූලියන්ට පේනවා . ඒ අතර ජූලියන් තවත් අපූරු යෝජනාවක් කරා . ඒක නම් හැබැයි ටින්කර් ට ඒ තරම් හිතවත් යෝජනාවක් නෙමෙයි .

" මම ගිහින් වයසක ටැපර් උන්නැහේ හම්බෙලා මෙතන කූඩාරමක් ගැහුවට කමක් නැද්ද කියල අහල බලන්නම් . එයා තීරණය කරයිනේ අපි මෙතන කූඩාරම් ගහන එකෙන් එයාට බාදාවක් වෙනව ද නැද්ද කියලා"

" අනේ අනේ මේ නිකා හිටින් ජූලියන් .උබ මොකට ද නිකන් එයාට බාල්දු වෙන්න යන්නේ . මේක මගේ ඉඩම'

ටින්කර් එක පාරට එහෙම කියන කොට ඒකටත් හොද උත්තරයක් ජූලියන් ළඟ තිබුනා .

DO NOT COPY

sinhalaebooks.com



" ඔය විදිහට නම් ප්‍රශ්න විසඳන්න බෑ ටින්කර් . මේ ලෝකෙ මැනර්ස් කියල ජාතියකුත් තියෙනවානේ .අපි මේ වැඩේ රංඩු සරුවල් නැතුව පටන් ගමු ටින්කර්'

" හරි හරි . උඹලාට ඕනෑ දෙයක් කර ගනිල්ලා . ඒ වුනාට මේක මගේ ඉඩම . උඹලා ඊ ලගට මට කියයි අර සර්කස් කොල්ලා එක්ක යාලු වෙන්නත් . ඒක නම් මේ කපේට වෙන දෙයක් නම් නෙමේ''

" ඒත් ඔයා ඌ එක්ක යාලු වෙන එක ඔයාගේ මූනට හොඳයි . සමතලා කර ගන්නේ නැතිව ඉන්න පුලුවන්නේ. මතක තියා ගන්න ටින්කර් . මේක කාටවත් නො ලැබෙන අවස්තාවක් . ඔයා නිකන් හිතන්න ඔයාගෙ ඉස්කෝලේ ඉන්න කොයි යාලුවට ද වැට පැනපු ගමන් කතා බහ කරන්න සර්කස් කණ්ඩායමක් තියෙන්නේ ?"

ජෝර්ජ් ටින්කර් ව අවුස්සන අදහසින් ඇගට පතට නොදැනී කියා දැම්මේ සමච්චල් සහගත සිනාවකුත් සමගයි . ඒ අතර ජුලියන් ළග පාත ම තිබූ කැරවෑනය දෙසට ඇවිදගෙන ගියා . කැරවෑනයට තට්ටු කළත් කවුරුවත් පිළිතුරු දුන්නේ නෑ . ඇත්තට ම ඒක හිස් කැරවෑනයක් බව වටහා ගත් ජූලියන් ඊ ළගට පොඩ්ඩක් එහාට ගමන් කළා .

DO NOT COPY

" ඔයාට මොනව ද ඕන මහත්තයා"

එක පාරට ම සිහින් ඒත් උච්ඡස්වරයෙන් කතා කරන ගැහැනු කටහඩක් ජුලියන්ට ඇහුණා . එතැන සිටියේ ටිකක් අපිරිසිදු පෙණුමක් තියෙන කැරළි කොණ්ඩයක් ඇති පුංචි ගෑණු ළමයෙක් .



Scanned with CamScanner

sinhalaebooks.com



" මම මේ ටැපර් මහත්තයා ඉන්නේ කොහේද කියලා බැලුවේ' සුන්දර හිනාවක් මුහුනට නගා ගෙන හිතවත් බවක් ආරූඪ කර ගනිමින් ජූලියන් කිව්වා .

" එයා අශ්වයෙක්ට සාත්තු කර කර හිටියේ . ඔයා කවුද ?'

" අපි ඔයාලගේ අසල්වැසියෝ කියලා හිතන්නකෝ . මාව ටැපර් මහත්තයා ගාවට එක්ක යන්න ඔයාට පුළුවන් නේ ද ?"

" සීයා මේ පැත්තෙ හිටියේ . එන්නකෝ මම ඔයාට එයාව පෙන්වන්නම් . ඔයා ගොඩක් ගොඩාක් හොඳයි වගේ"

එහම කියපු පුංචි ගෑණු ලමයා ජූලියන්ගේ අතකින් අල්ලා ගෙන ටැපර් මහත්තයා සිටින දිශාවට ඇවිදින්න පටන් ගත්තා . ඇය දැන් ජූලියන් ව රැගෙන යන්නේ කදවුරේ මැද කොටසටයි .

ඒ සමග ම ඈතින් ඇහුණු උඩු බුරලෑමක් නිසා ජෝර්ජ් තිගැස්සිලා ගියා . ඇත්තට ම ඒ හඩ ඇයට ඇහුණේ වේදනාබර ශෝකාලාපයක් වගේ .

DO NOT COPY

" දෙවියනේ ටිමී . එයාට තේරිලා වගේ අපි ඌ එක්ක නෑ කියලා . අපි ව හොයාගෙන මෙහාටත් එයිද දන්නෙ නෑ . මං පොඩ්ඩක් ටිමී බලලා එන්නම්'

ඒ වුනත් එක පාරට ම ඒ ඉරුම් හඩ නැවතුණු නිසා ජෝර්ජ් ආපිට ටිමී කරා ගියේ නෑ . ඒ අතර ගැහැණු ළමයා නම් ජූලියන්ගේ අත අතාරින්නත් ලෝභ කමෙන් වගේ ඉදිරියට ඉදිරියට ඉදිරියට ඇදෙනවා .



Scanned with CamScanner

sinhalaebooks.com



" අර කැරවෑන් පඩිය උඩ වාඩි වෙලා ඉන්නේ . ඒ තමා අපේ සීයා" පුංචි ගැහැණු ළමයා ජූලියන්ගේ මුහුන දිහා බලලා ඉතා ම සුන්දර සිනාවක් පාන අතරේ කිව්වා . ඊ ළගට ඇය තව දුරත් මේ වගේ කතාවකුත් කිව්වා .

" මම ඔයාට හරිම කැමතියි මහත්තයා . මොකද දන්නව ද ඔයාගේ අතෙන් හරී ම ශෝක් සුවදක් එනවා"

ගැහැණු ළමයාගේ කතාවට ජූලියන්ට සිනාවක් නැගෙන්නත් එනවා . හිතවත් සිනවක් මුහුණට නගා ගත් ජූලියන් පුංචි ගැහැණු ළමයාට අවවාදයක් දෙන්නත් අමතක කළේ නෑ .

" එහෙම වෙන්නේ මම දවසට පස් වතාවක් විතර මගේ අත් සබන් දලා හොදට හෝදන නිසා . ඉතින් ඔයාත් එහෙම කරන්න පුරුදු වුනොත් ඔයාගේ අතත් මගෙ වගේ ම සුවදට තියෙයි"

එක පාරට ම වට පිටා ව හදිස්සියෙන් බලලා ජූලියන්ගේ අත සිප ගත්ත පුංචි ගැහැණු ළමයා වේගයෙන් ඈතට දුවගෙන ගියා . ඒ දුවන අතර ම " සීයේ ඔයාව හම්බෙන්න කෙනෙක් ඇවිත්" කියලා කෑ ගහන්නත් අමතක කළේ නෑ . මේ වන විට අනෙක් ළමයින් සිව් දෙනා ද ජූලියන් අසලට කිට්ටු කර හමාරයි . අස්වයෙකුගේ කුරයේ ඇනී තුබූ ගලක් ඉවත් කරමින් හුන් සීයා ආපසු හැරී ළමුන් දෙස බැලුවත් ජූලියන් අපේක්ෂා කරපු විදිහේ හිතවත්කමක් සුහද බවක් නම් ඒ බැල්මේ පැවතියේ නැහැ .

ඒ අතර ජූලියන් කතාව අරඹන්නට ක්‍රමයක් කල්පනා කළා . ඔහු මෙන්න මේ විදිහටයි කතාව පටන් ගත්තේ .



Scanned with CamScanner

sinhalaebooks.com



" ටැපර් මහත්තයා අපි ආවේ වැටෙන් එහා පැත්තේ තියෙන ගෙදර ඉඳලයි . ඔබතුමා දන්නවා ඇතිනේ මේ ටින්කර්ගේ තාත්තට තමයිනේ මේ ඉඩම අයිති .."

ඇත්තට ම තමා කතාව ආරම්බ කල විදිහ ඒ තරම් හොඳ නෑ කියන එක ජූලියන්ට තේරුම් ගියේ ටැපර් උන්නැහේ එක පාරට ම කතාවට හරස් වෙලා උස් හඬින් මෙහෙම කියන කොටයි .

" ඔව් ඔව් ඒක මම දන්නවා නොවැ .ඒත් ඔය ළමයි දැන ගන්නවා අපිටත් මෙතනට ඇවිත් කඳවුරු ගහන්න අයිතියක් තියෙනවා . දැන් නිකන් නිස්කාරණේ මා එක්ක තර්ක කරන්න එන්නේ ….."

එහෙත් එතකොට ම ජූලියනුත් වයසක මිනුස්සයාගේ කතාවට හරස් වුනා . නමුත් ඒ හඬේ තිබුනේ ඕනෑම වැඩිහිටි හිතක් පැහැදෙන ඉතා ම සුහද ආචාරශීලී බවක් .

" මම ආවේ තර්ක කරන්න නෙමෙයි සර් ..මම ආවේ මායි මෙතන ඉන්න මගේ යාලුවෝ ටිකයි මේ ඉඩමේ අන්න අර හරියේ කූඩාරමක් ගැහුවොත් ඒකෙන් ඔයාට කරදරයක් …."

" අහා අන්න ඒ විදිහට එන්නකෝ ළමයෝ .එතකොට අපි ඔයාව ගොඩාක් සතුටින් පිළි ගන්නවානේ" මහලු මිනුස්සයා එයාගෙ නපුරු සලුව එක පාරට ම උනා දමා ගොඩාක් හිතවත් විදිහට කිව්වා . " මම හිතුවේ ඔයත් අර ඔයාගේ මල්ලී කලා වගේ අපිව එලවන්න ආවා කියලයි"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ඇත්ත වශයෙන් ම ඒ වෙලාවේ නම් ටින්කර්ට ඇති වුනේ පොළව පළාගෙන යන්න තරමේ හැඟීමක් . ඔහුගේ මුහුන ලජ්ජාවෙන් රතු වෙලා තියෙන්නෙත් ඒ නිසයි . වචන ගලපා ගන්න බැරි ව කට දිව වාරු නැති තත්වයකට පත් වෙලා තියෙන්නෙත් ඒ නිසාමයි . අනික් අතට ජෝර්ජ් කාරණ කාරනා තේරුම් කල පසුව නම් සර්කස් කණ්ඩාය ම පිටව යන ආකාරය දැකීමේ බලා පොරොත්තුවකුත් ටින්කර්ට නෑ . ටින්කර්ගේ හැඟීම තේරුම් ගත් නිසාවෙන්දෝ ටැපර් උන්නැහේ සිනා පිරි මුවින් මෙන්න මෙහෙම කිව්වා ..

" හරි හරි දැං ඒක ඔවරයි නොවැ . කොහොමත් මයේ බුණුබුරා ඔය ළමයට අත පය උස්සපු එක නම් මට ඒ තරම් අනුමත කරන්න බෑ . මිනිහාත් ඔය ළමයා වගේ ම කුකුල් කේන්ති කාරයෙක් .සේරට ම වඩා වටින්නේ ඉවසිල්ලෙන් අනික් මනුස්සයා තැරුම් අරන් කටයුතු කරන එක . හෙබැයි දවසක ඔයාටත් මගේ මුනුබුරාට පාඩමක් උගන්වන්ට ලැබෙයි .එහෙම නේද ?'

"අනිවාරෙන් ම මම කණ පලනවා එයාගෙ"

ටින්කර කෝපයෙන් යුතු ව එක පාරට එහෙම කිව්වා . වුනත් ටැපර් උනැහේ කෝපයට පත් වුනේ නම් නෑ . ඔහු සිනා මුහුණින් යුතු ව දිගට ම සුහද බවින් යුතු ව ටින්කර්ට කාරණා තේරුම් කරන්න වුනා .

" හරි ඒත් ඔයාල දෙන්නට පුළුවන් වගකීමක් තියෙන බුද්දිමත් මිනිස්සු දෙන්නෙක් විගේ කටයුතු කරන්න . නිකන් තොත්ත බබාලා වගේ රණ්ඩු සරුවල් කර ගන්නවා වෙනුවට තලතුණා පිරිමි දෙන්නෙක් වගේ හොද යාලුවෝ වෙන්නේ . හරි දැන් ඔය ළමයි ඔයාලගේ බඩු

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



මුට්ටු මේ වත්තට අරන් ඇවිල්ල ද තියෙන්නේ ? මම කූඩාරම් අටවගන්න උදව්වට ගන්න අපේ චාලි ව එවන්නම් . චාලි කියන්නේ චිම්පන්සියෙක් වුනාට මිනිස්සු දහදෙනෙක් ට වඩා ශක්තිමත්''

ඇන්ගේ මුහුණ පුරා ගලා ගියේ විශ්මයක් . ඇත්තට ම ඇන් විතරක් නෙමේ ළමුන් සැම දෙනෙක් ගේ ම මුහුණුවල ඒ පුදුමය මේ වෙලාවේ ගලාගෙන යනවා . ඇත්තට ම කූඩාරම් අටවන්නට උදව් කරන්නට චිම්පන්සියෙක්ට පුළුවන් වෙන්නේ කොහොමද ?

" චිම්පන්සියෙක් ට අපේ කූඩාරම් ගහන්න උදව් කරන්න පුලුවන්ද?''

ටැපර් උන්නැහේ සිනා මුහුණින් යුතු ව චලි ගැන විස්තර කරන්නට පටන් ගත්තේ ඊට පස්සෙයි .

" ඇත්තට ම ඔව් .. එයාට පුලුවන් . ඔයාලා ඔක්කෝම එකට එකතු වෙලා කරන වැඩ ප්‍රමානෙට වඩා වැඩ කන්දරාවක් එයාට කරන්න පුලුවන් . ඒ වගේ ම තමා එයා හරි ම හීලෑයි . ඒ වගේ ම ඔය කොල්ලො තුනෙදෙනාව වුනත් චාලි ක්‍රිකට් වලින් පරද්දයි . දවසක බැට් අරන් ඇවිල්ලා චාලි එක්ක ක්‍රිකට් ගහලා බලන්නකෝ .ඉන්න මම එයාට කතා කරන්නම් . මිනිහා මේ වෙලාවෙ නම් කූඩුවට වෙලා පුංචි නින්දක් දානවා ඇති .. චාලී … චාලී …''

ඇත්තට ම ටැපර් උන්නැහේ කියන කතාව විශ්වාස කරන්න පුළුවන් ද ? ක්‍රිකට් ගහන චිම්පන්සියෙක් ..මේ විස්මිත ක්‍රිකට් ක්‍රීඩකයා දැක බලා ගැනීමේ වුවමනාවෙන් ළමුන් කොයි තරම් බලා හිටියත් චාලි නම් ආවේ නෑ .



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



" ඔයාල ම ගිහින් එයාව අඩ ගහගෙන එන්නකෝ .. හැබැයි නිතර ම මිනිහා මුරුංගා අත්තේ තියින්න ඕන . එතකොටයි ඌ සතුටු වෙන්න්නේ"

එහෙම කිව්ව මහලු මනුස්සයා ළමුන්ට චාලිගේ කූඩුව පෙන්නුවා .වත්තේ කොනක තිබූ ශක්තිමත් විශාල කූඩුව දෙසට ලමුන් පිරිස ගමන් කරන්නට පටන් ගත්තේ ඊට පස්සෙයි .

" දෙයියන්ට ඔප්පු වෙච්චාවේ . මිනිස්සුන්ට උදව් කරන ක්‍රිකට් ගහන චිම්පන්සිත් ඉන්න ලෝකයක් එහනම් මේ . ඉක්මනට එනවා ජූ .. අපි ඌව එළියට ගමු ..."

ඒ උද්දෝගී කට හඬේ අයිතිය ඩික්ට .

ඉතින් ළමුන් පිරිස අඩියට දෙකට චිම්පංචි කූඩුවට කිට්ටු වුනා . චාලි චාලී චාලී .. නැගිටින්න ..,

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



DO NOT COPY

# 08

# චාලී හෙවත් චිම්පන්සි උදව්කාරයා

චිම්පන්සියාගේ විශාල කූඩුව අසළට මුලින් ම පැමිණියේ ටින්කර් ය. කූඩුවේ පසුපසට හේත්තුවක් දමාගෙන චාලී හෙවත් යෝධ චිම්පන්සියා ළමයා දිහා බලාගන හිටියේ උගේ දුඹුරු පෑ දෑස් කුතුහලයෙන් පුරවාගෙනයි. ඊ ළඟට ඌ කූඩුවේ ටින්කර්ගේ නාසය අසළ ම නාසය තබා ඉව කර බැලුවේ සිහින් ගෙරවුමක් ද නිකුත් කරමින්.



Scanned with CamScanner

sinhalaebooks.com



චිම්පන්සියාගේ හැසිරීම ටින්කර්ගෙ හිතේ කිසියම් බියක් වගේ ම කෝපයකුත් ඇති කරන්නට සමත් වුනා. ඔහු පසු පසට වුනේ ඒ නිසයි.

" ඒකා මට බනිනව ද මන්දා . ගඳ ම ගඳ යි අප්පා "

ටින්කර් පිළිකුලෙන්නැහැයහකුලවමින් කියන්නට පටන් ගත්තේ කාට කාටත් සිනාවක් ඇති කරමින්.ඒ අතර මිස් චීෆ් ද අලුත් මිත්‍රයා දැන හඳුනා ගැනීමේ බලා පොරොත්තුවෙන් කූඩාය්ව අසළට කිට්ටු වුනා. කවුද ටින්කර්ට සද්ද දැම්මේ වගේ අදහසක් තමයි මිස්චීෆ්ගේ බැල්මේ ඒ මොහොතේ නම් තියෙන්නේ. මිස්චීෆ් දැක්කාට පස්සේ චිම්පන්සියා තුල ඇති වුනේ පුදුම විදිහේ උද්දාමයක්. ඌ කූඩුව ඇතුලේ අමුතු සද්ද බද්දනගමින් පෙරළි කරන්නටපටන්ගත්තේ ඒ නිසයි.

" ඒයි ඔයාලා අපේ චිම් එක්ක මොකද කරන්නේ"

අසමින් එක පාරට ම එතනට දුවගෙන ආවේ ටින්කර් ට පහර දුන් පිරිමි ළමයා මිස අන් කිසිවෙකුත් නො වෙයි. ඔහු එක්වර ම ටින්කර්ව හඳුනා ගත්තා.

" අහා උඹ නේද මගේ සීයා එක්ක පැටලෙන්න ආවේ. මම ඔයාට ගැහුවනේ "

" ඔව් . උබට ආයෙත් මා එක්ක ගුටි ඇන ගන්න ඕනි නම් කියපන්. මේ පාර නම් වැඩේ ලේසි වෙන්නේ නෑ"

ටින්කර් අත පය උරුක් කරමින් එහෙම කියද්දී ජුලියන් වහා ම ඔහු දෙස රවා බැලුවා. ඊ ළඟට ජූලියන් ටින්කර්ට නිහඬ වෙන ලෙස අනක්

DO NOT COPY

sinhalaebooks.com



නිකුත් කොට පිරිමි ළමයා දෙසට හැරුණේ මුහුණට සිනාවක් නගා ගනිමින්.

" ඔයානේද ජෙරමි ? ඔයාගේ සීයා අපිට කිව්වා අපේ කූඩාරම ගහගන්නඔයාලගෙ චිම්පන්සියා උදව් කරගන්න කියලා. මිනිහා කූඩුවෙන් එළියට ගත්තට කමක් නැති වෙයි නේද ?"

" අයියෝ ඒකට කමක් නෑ. මමත් සාමාන්‍යෙයන් දවසකට දෙපාරක් විතර මූව එළියට ගන්නවා. ඌ හරි කැමතියි ක්වට හරි උදව් කරන්න. ඒ වගේ මකූඩුවේ ඉන්න ආස නෑ. අනික අපේ චිම් සිංහයෙක් වගේ හොඳට හයිය හක්තිය තියෙන කොල්ලෙක්"

ළමයා ගොඩාක් සතුටෙන් එහෙම කියද්දී ටින්කර් නම්සමච්චල් සිනාහාවක් මුහුණට නගා ගත්තා.

" ඇත්තට ම එයාගෙන් අණතුරක් නැද්ද ?"

" ඒ ගැන නම් බයවෙන්න එපා. ඕන නම් චිම්ප්ට කූඩුව ඇරගෙන එළියට එන්න වුනත් පුලුවන්. ඒත් එයා එහෙමවත් කරන්නේ නෑනේ.චිම්ප්. ඔයාට කූඩුව ඇරගන්න පුලුවන් නේද ? එන්න එළියට දැං."

හාස්‍යජනක සිනාවක් නගා ගත් චිම්පන්සියා අත කම්බි අතරෙන් පිතටට දමා සොයිබය ඇද්දේ හරියට ම මනුස්සයෙක් වගේ. ඊට පස්සේ අත නැවතත් ඇතුළට අරන් කූඩුවේ දොර තල්ලු කරගෙන එළියට ආවා.

sinhalaebooks.com







Scanned with CamScanner

sinhalaebooks.com



ඊට පස්සේ චිම්ප් අත් දෙක පොළව මත තබමින් ළමයිනුත් සමගින් කූඩාරම් බඩු තිබුණු තැනට ඇවිදගෙන යන්න පටන් ගත්තා. ගමන් ගන්නා අතර විකාර ශබ්ද වගයකුත් නිතරම උගේ මුවෙන් නැගෙනවා. ආත්තට ම මුලදි නම් අලුත් අමුත්තා සම්බන්දයෙන් මිස්චීෆ් තුළ තිබුණේ කිසියම් වූ ආකාරය බියපත් ස්වභාවයක්. ඒ වුනත් චිම්ප් එක පාරට ම මිස් චීෆ් ඔසවලා උගේ උරයෙන්තියා ගත්තා.මිස් චීෆ් චිම්ප්ගේ උරයට වෙලා බලා සිටියේ බියපත් වෙනවද සතුටුවෙනවද හරියට තෝරා බේරා ගන්නත් නොහැකි අයුරෙන්.

" අයියෝ මට කැමරාව අරන් එන්නයි තිබුනේ. දැං නම් මිස් චීෆ් කරේ යන වැඩේට කැමතියි වගේ"

ඈන් ජෝර්ජ් දිහාට හැරිලා කිව්වේ හරිම සතුටෙන්. ඒ වන ඉටත් ඔවුන් කූඩාරම් බඩු තිබුණු තැනට පැමිණී තිබුනා. අවසානයේ ජෙරමි චිම්පන්සියා දෙසට හැරිලා අණ දෙන්නට පටන් ගත්තා.

" හරි චාලී. ඔයා මේ බඩු ටිකත් අරන් අපේ පස්සෙන් එන්න"

ඉතින් සිංහල භාෂාවත් තේරෙන චාලි චිම්පන්සියා උගේ විශාල දෑත්වලින් එක පාරට බඩු කිහිපයක් ම ඔසවාගෙන ළමුන් පිටුපසින් ඔවුන් කූඩාරම ඉදිකිරීමට බලාපොරොත්තු වූ ඉසව්වට ගමන් කරන්න වුනා. ඇත්තට ම ඔවුන් තෝරාගෙන තිබුණේ ඉතා උස ගසක් එහෙමත් තියෙන හොඳින් සෙවන ඇති තැනක්. සුළඟින් වුනත් ගස නිසා ඔවුනට ලැබුණේ ඉතාම ආරක්ෂාවක්.

DO NOT COPY

sinhalaebooks.com



" හරි දැං ඔය බඩු ටික බිමින් තියලා ඉතුරු ටික අරන් එන්න චාලී. හා හා බලාගෙන ඉන්න එපා . උබට ගොඩක් වැඩ තියෙනවා කොල්ලෝ"

ඒ වුනත් චාලි අඩියක් වත් හෙල්ලුනේ නෑ.ඌ මිස්චීෆ් දිහා බලාගෙනහිටියේ මොකක්දෝ කියන්න උත්සහ කරනවා වගේ. ඒ වතාවේ චිම්පන්සි බස තේරුම් බේරුම් කොටගත්තේ ජෝර්ජ්.

" අහා ඌට මිස්චීෆ් එක්ක යන්න ඕනි වෙලා. මිස් චීෆ් ඔයත් යන්න"

මිස් චීෆ් වහා ම චාලිගේ උරයට පැන්නා

දැංමිස්චීෆ් අසරුවෙක් වගේ චාලී එක්ක ගමන් කරනවා. යාලුවෝ දෙන්නා ඉක්මනින්ම කූඩාරම් බඩු ටික අරගෙන ආවා. එහෙත් එක් වර ම කූඩාරම් රෙද්දක් චාලිගේ ඔලුවට උඩින් වැටුණා. ඊට පස්සෙ නම් අර පෙර පැවති සන්සුන් සාන්ත දාන්ත චිම්පන්සියා තව දුරත් එතැන හිටියේ නෑ. ඌ භයානක සද්ද බද්ද රැසක් දමමින් එතැන ඇති කරේ එක ම පෙරළියක්. ළමුන් පිරිස සත්තකින් ම ඒ සිදුවීමෙන් නම් සෑහෙන්න බිය පත් වුනා. ඒ උනත් ජෙරමි පුංචි සැරයක් දැම්මාවිතරයිඌ නැවතත් ඉක්මනින්ම යතා තත්වයට පත් වුනා.

බඩු බාහිරාදය අවශ්‍ය තැනට පැමිණිආට පසුව කූඩාරම් ඇටවීමේ කටයුත්ත ජුලියන් සහ ඩික් ආරම්භ කළේ කිසිදු පමාවක් නැතිවයි. ළමුන් දෙදෙනාගේ කටයුත්ත මද වේලාවක් හොඳින් නිරීක්ෂනය කල චාලි පුදුමාකාර තරම් නුවණක්කාර විදිහට කූඩාරම් අටවන්නත් පටන් ගත්තේ කවුරු කවුරුත් පුදුමයට පත් කරමින්.



DO NOT COPY

sinhalaebooks.com



" චාලි හරි දක්ෂයි නේද ? බලන්නකෝ ඌ කූඩාරමේ යකඩ පොල්ලත් හරිමතැනට හයි කරනවනේ. කොල්ලා මොළ කාරයා. ඔයාලා දකින්න තියෙන්නේ මෙයා අශ්වයින්ට වතුර බාල්දිත් අරන් එනවා වෙලාවකට. බාල්දි දෙකක් ම එක පාර උස්සගෙන එන හැටි බලන්න ආස හිතෙනවා"

ජෙරමි ඉතා ම ආඩම්බරයෙන් පැවසුවා. ඒ අතර තරහ මරහා සේර ම අමතක ගියනිසාදෝ ටින්කර් ජෙරමිගෙන් මෙහෙම ඇහුවා.

" ඉතින් මෙයාට පඩි ගෙවන්නේ කොහොමද ?"

" කෙහෙල් ගෙඩි දහයකුයි දොඩම් ගෙඩියකුයි තමා උගෙ පඩිය. ආ තව පැනි රහ කන්න තියෙනව නම් වෙන මොකවත් ඕනි නෑ ඌට"

" ආ මං ගාව ටිකක් තියෙනවා"

ඒ කතාවත් කිව්වේ ටින්කර් ම තමයි. ඔහු සාක්කුවෙන් එළියටගත්තු සීනි බෝල මල්ලක් ම චාලි ට දුන්නේ කිසි ම ලෝභ කමක් නැතුව. ඒ වගේ ම ජෙරමි සම්බන්දයෙන් ඉතා මහිතවත් ආකල්පයක් මේ මොහොතේ ටින්කර්ගේ හිත පුරා පැතිරෙනවා. කවරය පිටින් සීනි බෝල මල්ලක් චාලිට දීම නමඇන් තුළ ඇති කළේ බියක්. කවරය පිටින් ගිල දැමීම නිසා චාලී අමාරුවක වැටේ යැයි ඇයට සැකයක් ඇති වුනා. ඒ වුනත් චාලි ඉතා ම බුද්ධිමත් විදිහට මල්ලෙන් සීනි බෝල එළියට අරන් කන්න පටන් ගත්තා. ඌ ඉතුරු සීනි බෝලත් රැගෙන කූඩුවට ගියේ පාඩුවේ රසකැවිලි භුක්ති විඳීමේ කටයුත්ත කර ගැනීමේ අපේක්ෂාවෙන්.

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" ඇත්තට ම සේරම අමාරු වැඩ ටික කලේ චාලි නිසා ඌ තෑග්ගක් ලබා ගන්න වටිනවා. එන්න අපි දැං කූඩාරම් ටික අස්බස් කරලා ගමු. අම්මෝ මේවයේ රෑට මෙතන නිදාගන්න එක නම් හරිම විනෝදනජක වෙයි. අපි රෑ කෑම කන්නත් ලැහැස්ති වුනොත් හොඳයි."

ජෝර්ජ් එහෙම කියන කොට ජෙරමි කළේ කවුරුවත්බලා පොරොත්තු නොවුනු විදිහේ යෝජනාවක්.

" ඉතින් රෑ කෑමට ඔයාලත් එන්න අපිත් එක්ක එකතු වෙන්න. හැබැයි අපේ කෑම නම් ඔයැලෑ තරම් වැඩිය හොඳ නැතුවැති. ඒත් ආච්චි අම්මා එයාගේ හැලියේ උයන කෑම හරිම රහයි. ආ ඔයාලා දන්නව ද දැංඑයාට වයස අවුරුදු දෙසීයක් වෙනවා"

එවර නම් ළමුන් සියල්ලන්ට ම බක්ස් ගා හිනා යන එක නවත්තන්නට පුලුවන් වුනේ නෑ.

" කාටවත් අවුරුදු දෙසීයක් ජීවත් වෙන්න බෑනෙ ජෙරමි" ජෝර්ජ් සිනාව අතරින් බොහෝම අමාරුවෙන්කියා ගත්තා.

" ඒක ඇත්ත. ඒ වුනාට අපි එයාගෙන් වයසාහපුවා ම එයා කියන්නේ එයාට අවුරුදු දෙසීයයි කියලනේ. එයාගෙ පෙළමත් නිකන් ඒ වගේ. හැබැයි කොච්චර නාකි වුනත් එයාගෙ ඇස් පෙණීම ම නම් හරිම දියුණුයි. උකුසු ඇස් එයාට තියෙන්නේ.එහෙනම්වැඩේ තීන්දුයිනේ. මම එයාට ගිහින් කියන්නද ඔයාලා රෑ කෑමට එනවා කියලා ?"

DO NOT COPY

sinhalaebooks.com



" අපි මෙහෙම කරමුද ජෙරමි. ආච්චි අම්මා වැඩිපුර කෑම උයන්න මහන්සි කරවන්න ඕනත් නෑනෙ. අපිට ජෙනී දැනටමත් රෑ කෑම හදලා ඇති. මට ඇහුණා එයා මීට් පායි එකක් . කූල් සොසේජස් වගයක් එහෙම හරි ගස්සනවා. ඇපලුයි කෙසෙලුයිත් තියෙනවා. අපි ඒවත් අරන් ඔයාලා කෑම කන වෙලාවට එන්නම්. කට්ටිය ම බෙදාගෙන කමුකෝ"

ජුලියන් ඒ වගේ කතාවක් කියද්දී ජෙරමිගේ මුහුණ පුරා දෝරෙ ගලන්න පටන් ගත්තේ පුදුමාකාර තරම් හිතවත් බවක්. තරහ කාරයෙක් එක්ක වුනත් ගොඩාක් හොඳට හිතවර්හ් වෙන්න ජුලියන්ට තියෙන මේ හැකියාව නම් ඇත්තට ම අගය කළ යුතු එකක්.ඒ අතර ජෙරමි මෙහෙම කිව්වා.

" අම්මෝ බං. කෙසෙල් ගැන නම් චාලි ඉස්සරහ කෙළ බිඳක් හෙලන්න එපා. ඌට ඇහුනොත් විසුමක් වෙන්නෙ නෑ. හරි එහෙනම් එහෙම කරමු. ඔයාලා ඔයාලගේ කෑමත් අරන් අපේ ගිනිමැලේ ගාවට සෙට් වෙන්න. මම ආත්තම්මට ඔයා ගැන කියන්නම්. අපි අද රෑට සින්දු කියන්නයි හදන්නේ. අපිට ෆ්‍රෙඩ් කියලා හොඳ වයලීන් කාරයෙක් ඉන්නවා. එයාගෙ වයලීන් සද්දෙට ඔයාලට නටන්න හිතෙයි. "

ඇත්තට ම මේ හැම දෙයක් ම ළමුන් කාට කාටත් ගෙනෙන්නේ පුදුම විදිහේ උද්දාමයක්. කොහොම වුනත් ආපහු ගෙදරට ගිහින් මේ හැම දෙයක් ගැන ම ජෙනීව දැනුවත් කළ යුතු බවට ජුලියන් තීරණයක් ගත්තා. නැත්තම් ළමුන් පෙනෙන්නට නොවීම සම්බන්දයෙන් ඇය බිය ගන්නවාට ජුලියන්ට සැකයක් නෑ. ඒ වගේ ම රෑ කෑමත් රැගෙන සර්කස් නඩයට එකතු වීමේ බලාපොරොත්තු වත් ඔහුගේ සිතේ තෙරපෙනවා.



DO NOT COPY
Scanned with CamScanner

sinhalaebooks.com



" ඉතින් ජෙරමි එහෙනම් අපි ඉක්මනින් ම ගිහින් ආපහු එන්නම්. ඔයාලගෙ උදව් වලට ගොඩක් ස්තූතියි. ඔයාල නැත්තම්මෙච්චර ඉක්මනට අපිට කූඩාරම් හයි කරගන්න හම්බෙන්නෙර් නෑ කොහොමටවත්. ආ මිස්චීෆ් චාලිට ඉන්න දීලා දැන් ඉතින් වරෙන්..දුක් වෙන්න එපා මිස්චීෆ්. අපි ඉක්මනට ආපහු එනවා බං"

ඒ අනුව ළමුන් පස් දෙනා නැවතත් වැටෙන් පැන නිවස දෙසට ඇවිදින්නට වුනා. ඒ අතරෙ ටින්කර් උද්දාමය තැවරුණු හඬකින් නැවතත් කතාව පටන් ගත්තා.

" ඒක නම් නියම්ම සර්කස් එකක්වගේ. මං හරිම කැමතියි ගිනි මැලේ වටේ භෝජන සංග්‍රහයට සම්බන්ද වෙන්න. ආත්තම්මගෙ කලු සුප් හැලියෙන් සුප් බොන්නත් මට ආසයි. රෑ කෑම නම්නියමෙට තියෙයි.අපි අද රෑ සර්කස් කට්ටිය එක්ක ඉන්නයන එක ගැන තාත්තා වුනත් මොකුත් කියන එකක් නෑ"

" එතුමා ගැන නම් බයවෙන්ට හේතුවක් නෑ. මොකද එයාට දැනෙන එකක් නෑ. මගේ තාත්තාත් එහෙමයි. සමහර වෙලාවට එයා ඉස්සරහ ඉන්න මිනිස්සු ගැනවත් තාත්තට ගානක් නෑ. කොටින් ම නාහෙ යටින් මිනිහෙක් හිටියත් එයා දන්නෙ නෑ"

ජෝර්ජ් කිව්වේ ටින්කර්ගේ පපුව සැහැල්ලු වෙන්නත් එක්ක. ළමුන් ජෙනී හමුවෙලා සිද්ද වුනු හැම දෙයක් ම අකුරක් නෑර ඇසමග කියුවා. ජෙනී ඒසියල්ලම අසා සිටියේ පුදුමයෙන් උඩ ඉන්දවා ගත් ඇසින්.

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" හරි හරි ළමයි. මට නම් අදහ ගන්නත් බෑ. ටිකකට කළින් ඔයාලා හිටියේ ඒ ගොල්ලන්ව පෙන්වන්න බැරි ව. දැං ඔයාලා සර්කස් කාරයෝ එක්ක කූඩාරම් ගහනවා. අනේ මන්දා මේ ළමයි ඔයාලගේ අම්මලා තාත්තලා මේව ගැන දැන ගත්තොත් මොනවා කියයි ද කියලා මට නම් හිතා ගන්න බෑ. ඔයා මොකද ඒ ගැන හිතන්නේ ජුලියන් ?"

" සර්කස්කාරයෝ කියන්නේ ඉතින් නරක මිනිස්සු නෙමේනේ. හරි හරි අපි අම්මලා හම්බුනා ම එයාලගෙන් ම අහලා දැන ගමුකෝ එයාලා මොනවද හිතන්නෙ කියලා ඉතින්" ජුලියන් සිනා වෙමින් කීවා. ඊ ළඟට ඔහු ජෙනීගෙන් රෑ කෑමට ඇති කෑම ජාති ගැනත් විමසා සිටියා.

" ඔක්කෝම සීතල ජාති තියේන්නේ. සීත කළ සොසේජස්. සීත කළ මීට් පායි. පිපින්නා. සලාද , තක්කලි. අල , රෝල්ස්.ඇපල් , කෙසෙල්. ඒ ඇති වෙයි නේද ?"

ජෙනී කියන්නට වුනේ ප්‍රීතිමත් හඬකින්. ටින්කර් වුනත් කෑම ජාති ලැයිස්තුවෙන් පස්වනක් ප්‍රීතියට පත් වුනා.

"දෙවියනේ නියමයි ජෙනී. ඉතිං අපිට බොන්න මොනව ද දෙන්නෙ ඔයා ?"

" ඔයාලා කැමති නම් ලෙමනේඩ් හරි ඔරේන්ජ් ජූස් හරි අරන් යන්න පුලුවන්. ඒත් මේ අනේ කවුරුවත් මහාචාර්ය තුමාගේ කාමරේ පැත්තෙන් නම් යන්න එපා හරිද ? දවස තිස්සෙ ම මහන්සි වෙලා එයාට හොඳට ම නින්ද ගිහින් ආයෙ"

DO NOT COPY

sinhalaebooks.com





" අනෙ අම්මෝ එහෙනම් හොස්ස ගාවින් මැස්ස යන්ඩ බැරි තත්වෙකින් ඇත්තෙ. ඇහැරුණොත් එහෙම විසුමක් හම්බෙන්නෙ නෑ. ඇත්තට ම ජෙනී ලෝකෙ ඉන්න ගොඩක් මිනිස්සුන්ට මහන්සි වෙලා වැඩ කරා ම චුට්ට ඇත්නම් අසූ හාරදාහට තද වෙනවා. ඔයාට විතරයි එහෙම නොවෙන්නේ"

ටින්කර් ගොඩාක් ආදරෙන් චාටු හඩින් ජෙනීට කියද්දී ජෙනී ඇහැක් එහෙමත් අනික් අයට පේන්න වහලා මෙන්න මෙහෙම කිව්වා.



Scanned with CamScanner

sinhalaebooks.com



" අනේ ඇත්ත ද ටින්කර්. මං එච්චර හොද ද ? එහෙනම් ගිහින් කබඩ් එකෙන් මොනව හරි කෑම ජාතියක් හොරකම් කරලා බලන්නකෝ මොකද වෙන්නේ කියලා."

"ජෙනී .මට පැණි රහ කෑම ටිකක් ගන්න පුලුවන් වෙයි ද ? අනේ ජෙනී සර්කස් එකේ ශෝක් අශ්වයෝ ටිකක් ඉන්නවා. මට උන්ට දෙන්න සීනි කෑම ටිකක් දෙන්නකෝ"

" ආ ළමයි දැක්කද ටින්කර්ගෙ කපටිකම. මෙයා මෙච්චර මට බටර් ගාලා තියෙන්නේ ඔන්න ඕකට තමා. අනික ඔයාලා හිතනව ද එයා ඔය සීනි කෑම ඉල්ලන්නේ අශ්වයින්ට විතරය කියලා.. හරි හරි.මං සේරම ටික ලෑස්තිකරලා තියන්නම්කෝ. මම ඔයාලට පිගන් ටිකක් පිහි ටිකක් කෝප්ප ටිකක් එහෙමත් දෙන්නම්. ටිමීට මොකද වෙන්නේ එතකොට. එයාටත් විශේෂ කෑම මොනව හරි ඕන ද ?"

" වූෆ්" ජෙනීගේ කතාවටටිමීගෙන් ලැබුණු ප්‍රතිචාරය හරියට ම " ඔව් ඔව් මටත් ඕනෑ" කියනවා වගේ එකක්. ජෙනී ටිමියාගේ ඔලුව ටිකක් අත ගාලා මෙහෙම කිව්වා.

" හරි හරී. උඹ වෙනුවෙනුත් හැම දෙයක් ම ලෑහැස්තියි.ජෝර්ජ් කුස්සියට ගිහින් ටිමීගේ කෑම එකත් අර ගන්නකෝ"

ඉතින් හැම දෙයක් ම ඉතා ඉක්මනින් සූදානම් වුනා. ජෙනීට සුබ රාත්‍රියක් පැතූ ඔවුන් තවත් ස්වල්ප වේලාවකින් කෑම බීමත් ඔසවාගෙන කූඩාරම් දෙසට ඇවිද යන්නට පටන් ගත්තා. ඉතා අපහසුවෙන් වැටෙන් පැන ක්‍රීඩා පිටියට ඇවිදයන කොට ඔවුන්ට දක්නට ලැබුනේ පුදුමාකාර

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



තරම් සුන්දර දර්ශනයක්. ඒ වන විටත් සූර්යයා හෙමින් හෙමින් බැහැගෙන යන්න පටන් අරන්. තවත් සුලු වෙලාවකින් වට පිටාව ම අඳුරට ගොදුරු වෙන බව සහතිකයි. කරුණාවන්ත සර්කස් කාරයින්ගේ ගිනි මැලයෙන් ඒ අඳුර තුළ නොයෙක් රූ රටා මැවෙනු ඇත. ඔවුන් සමඟ හිඳ ගිනි මැලයේ ආලෝකයෙන් ඔවුන්ට රාත්‍රී ආහාරය අනුභව කිරීමේ වාසනා මහිමය උදා වෙනු ඇත. ඇතැම් විට ඔවුන් සමග එක් වී පරණ සින්දුවක් දෙකක් කියන්නටත් ඔවුන්ට හැකියාව ලැබෙනු ඇත. පරණ වයලින් වාදකයාගේ පරණ වයලින් වාදනයේ නැලවෙන්නත් ඔවුන්ට අවස්ථාව ලැබෙනවා. ඒ සෑම දෙයක් ම අවසානයේ බකමූණු හඬ හාත්පස පැතිරෙද්දී ඔවුන්ට නිදා ගන්නට ලැබෙන්නේත් ඔවුන් විසින් ම සකසා ගත් කූඩාරම් නිවෙස් තුළ ය. කූඩාරමේ විවර තැනකින් දහස් ගණනක් තාරකා කැට දැක බලා ගැනීමටත් ළමයින්ට අවස්ථාව හිමි වෙන බවට සැකයක් නෑ.

මේ සෑම බලාපොරොත්තුවක් ම සිත් තුල තෙර පෙද්දී වැට අසළ දී රැගෙන ආ භාණ්ඩ අතින් අත හුවමාරු කරන්නත් ළමයින්ට සිද්ද වුනා. ඒ අතර ටිමීටත් මිස් වීෆ්ටත් අවවාද කිහිපයක් ලබා දීමටත් ඔවුන්ට සිදු වූ බව කිව යුතු වැ තිබෙන කාරණාවක්.

" අත ගන්නවා මිස්වීෆ්.ඔය කූඩෙට අත දාන්න එපා මෝඩ වඳුරු පැටියෝ. හරි හරි ටිමී. මිස් වීෆ් නමේ හැටියටත් වඩා දඟයි නම් පොඩ්ඩක් විතර කණ හැපුවාට කමක් නෑ. උඹලා අපි ඔක්කොම අද රෑට හිතේ හැටියට විනෝද වෙන්නයි යන්නේ"



Scanned with CamScanner

sinhalaebooks.com



# 09

## චමත්කාර ජනක සැඳෑවක්

DO NOT COPY

ළමුන් පිරිස ඇස ගැසුණු සැණින් ජෙරමි වහා අමුත්තන් පිළිගැනීමට දුවගෙන ආවා. ඇත්ත වශයෙන් ම ඔහු සිටියේ පුදුම තරම් උද්දාමයකින්. ඒ වන විටත් ජෙරමි සීයා පමණක් නෙමෙයි. මුලු මහත් කඳ වුරම රාත්‍රී සාදයට පැමිණෙන අමුත්තන් ගැන දැණුවත් කරලා ඉවරයි. කූඩාරමට පැමිණි ළමුන් ව ඔහු ප්‍රථමයෙන් ම ආදරණීය සීයා ළඟට රැගෙන ගියා.

" කොහොමද ළමයිනේ. මං හිතන්නේ ඔයාලා සර්කස් එක වටේ ටිකක් ඇවිදලා බලන්න කැමති වෙයි. ආ චාලි ඔයාලව හැම තැනක් ම පෙන්වන්න එක්ක යයි. අද රෑට අපි පොඩි පෙර සූදානමක් කරනවා. ඔයාලට ඒකෙන් සර්කස් එකේ වැඩ කෑලි ටිකක් එහෙමත් බලා ගන්න පුලුවන්."



Scanned with CamScanner

sinhalaebooks.com





විවිධ වර්ණ ගන්වන ලද වෘතාකාර ලී තබා සකසන ලද විශාල කවයක් ළමුන්ට දක්නට ලැබුණේ ඔවුන් පිටිය වටා ඇවිදින අතරතුර යි. ඒ වන විටත් අශවයෝ කිහිප දෙනෙක් කවය මැදට පැමිණෙමින් තිබුනා. සංගීත නාදයට අනුව නැටුම් නටන අශ්වයන් ඔවුන් බව ළමුන්ට වටහා ගැනීමට අපහසු වුනේ නෑ. කවය මැද පෙරමුණේ ම ගමන් ගන්නා අසු අරා සිටියේ ළමුන් දන්නා හඳුනන මැඩලන් . ඇය ද්දුලන ස්වර්ණමය පෑ ඇති ගවුමකින් සැරසී සිටියේ දකින ඕනෑ ම කෙනෙකුගේ නෙත් සිත් වසග කර ගනිමින්

" මොන තරම් ලස්සනයි ද එයාලා. උන්ගෙ ඔලුවල තියෙන පිහාටු හිස් පළඳනාවක් මටත් ගන්න තිබුණනම්"

sinhalaebooks.com



දර්ශනය බලාගෙන සිටින අතරේ පුංචි ඈන්ට හිතුණා. බොන්සෝ සංගීත කණ්ඩායමත් එතකොට ම වගේ ඔවුන්ගේ වාදනය පටන් ගත්තා. අද නම් ඔවුන් සැරසී සිටියේ සාමාන්‍ය ඇඳුම් පැළැඳුම් වලින්. පාට පාට නිළ ඇඳුම නොමැති නිසාදෝ ඔවුන් කෙරෙන් පළවෙන්නේ ඒ තරම් ම ගැලපෙන බවක් නම් නෙමෙයි. ඒත් ඉතින් ඒ වුනත් ආරම්භක දවසේදී ඔවුන් කොයි තරම්කැපීපෙනෙන පිරිසක් වෙච්ච කියලත් ළමුන්ට හිතුණා.

වට කිහිපයක් කවය තුළ ගත කළ අශ්වයෝ මැඩිලන් ද පෙරටු කොට ගනිමින් කවයෙනෙළියට ආවා. ඒ තවත් අපූරු පිරිසකට අවස්ථාව ලබා දීමට යි. ඊ ළඟට කවයට ඇතුළු වුනේ ෆ්‍රෙඩ්.ෆ්‍රෙඩ් එයාගේ වයලීනය මොන තරම් අපූරු ලෙස වාදනය කරාද කීවොත් ජෙරමි කීවා වගේ ළමුන්ගේ දෙපා ඉබේට ම නැට වෙන්න පටන් ගත්තා.

" අප්පච්චියේ මට මේක නවත්ත ගන්න බෑ. මාව නැටවෙන්නේ ඉබේට ම " උඩ පනිමින් කැරකෙමින් නටන ඈන් හතිලමින් කියනු ඇසුනා.

ඊ ළඟට කවය ඇතුළට ආවේ වෙන කවුරුත් නෙමෙයි. ළමයින්ගේ හිතාදර චාලි චිම්පන්සියා යි. සාමාන්‍යෙන් අත් දෙකත් බිමින් තිය තිය ඇවිද යන චාලි මෙවර කවය ඇතුළට පැමිණියේ මනුස්සයෙක්ගේ සෙයියාවෙන් දෙපයින් ඇවිදිමින්.ඇත්ත වශයෙන් ම සාමානයෙම් පෙනෙනවාට වැඩි උසක්මේ මොහොතේ චිම්ගෙන් දකින්නට පුලුවන්. උඩ පනිමින් කැරකෙමින් හිනා යන තාලයේ රංගනයක් ඉදිරිපත් චාලී අනතුරුව ෆ්‍රෙඩ්ගේ දෙපා වැළඳ ගත්තා.

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" චාලි ෆ්‍රෙඩ්ට හරි ආදරෙයි. දැං තියෙන්නේ එයාගෙ ක්‍රිකට් ඇක්ට් එක රියසල් කරන්න. ඉන්න. මම මිනිහට බෝලයක් දෙකක් දාලා එන්නම්"

එහෙම කියපු ජෙරම් එක පාරට ම ළමුන් සිටි තැනින් ඉවත් වී කවය තුළට ඇවිදගෙන ගියා. ඔහු කවයට ප්‍රවිශ්ඨ වීමත් සමග ම චාලිගෙන් ඔහුට ලැබුනේ ඉතාම ආදරණීය පිළි ගැනීමක්. ඇත්තට ම චාලි ජෙරම් ව හරීම ආදරයෙන් බදා ගත්තා. ඒ අතර කොහේදෝ සිට ක්‍රිකට් පිත්තක් චාලි දිහාවට පියාබා ආවා. වහා පැන එය අතට ගත් චාලි දෙතුන් වතාවක් ම පිත්ත ඉහළට ඔසවා ප්‍රදර්ශනය කරමින් සිටියේ සුපැරුදු ලෙසින් උගේ ප්‍රීතිමත් චිම්පන්සි ගීතය මුමුණමින් සිටින අතර ම යි.

ඊ ළඟට බෝලයක් ජෙරම් දිහාවට ඉගිල්ලා ආවා. ඔහුත් ශූර ක්‍රිකට් ක්‍රීඩකයෙකු මෙන් බෝලය කිසිම අපහසුතාවයක් නැතුව අල්ලා ගත්තා. එතකොට ම තමයි විකට් පොලු තුනකුත් රැගෙන පුංචි ගැහැනු ලමයෙක් වේදිකාවට ගොඩ වුනේ. දැං රඟමඩල එක ම ක්‍රිකට් පිටියක්. ඇය ජෙරම් දිහාට හැරිලා මෙහෙම අහනවා ළමුන්ට ඇසුනා.

" ජෙරම්. විකට් පොලුවලටතියන බේල්ස් දෙක ඔයා ගාවද ? බලන්න පොඩ්ඩක් සාක්කුවෙ තියෙද කියලා"

" නෑ" සාක්කුවට අත දමමින් ජෙරම් පිළිතුර දුන්නා." ඒත් බය වෙන්න එපා . මම මෙයාව අවුට් කරන්නම්. කෙලින්ම ගන්නම් විකට් එක"

දැං ක්‍රිකට් තරඟයට සියල්ල සූදානම්. චිම්පන්සි චාලී දවා ගැනීම කටයුත්ත මොන තරම් හොඳින් උත්සහ කළත් සත්තකින් ම ජෙරම්ට

DO NOT COPY

sinhalaebooks.com





Scanned with CamScanner

sinhalaebooks.com



පහසු කටයුත්තක් වුනේ නෑ.ඇත්ත වශයෙන්ම ඉතා ම හොඳ ක්‍රිකට් ක්‍රීඩයෙක් මෙන් චාලි ජෙරමිගේ පන්දුවලට පහර පිට පහර එල්ල කරා.

නව පන්දු වාරයක ආරම්භය. ජෙරමි. දිව එනවා පන්දු යැවීමට . ප්‍රතිකරුවා සූදානම්.පිට ඉන්න දෙසින් වැටෙන පන්දුවට වේගවත් පහරක් එල්ල කරනවා.. ඔව් පන්දුව ප්‍රේක්ෂකයන්ගේ හිස් වලටත් ඉහළින් ඇදී යනවා.. ඉතා ම විශිෂ්ට පහරක්. රැක ගැනීමට කිසිදු හැකියාවක්නෑ. ලකූ හයයි..

ඒ වුනත් එතකොට ම චාලිගේ සමබරතාවය ගිලිහී ගියා. ඌ එක පාරට ම කඩුල්ල මත ඉන්ද වුනේ ප්‍රේක්ෂකාගාරය පුරා එක ම ඔල්වරසන් හඬක් නංවමින්.

" අවුට් යේ..." ජෙරමි බෙරිහන් දුන්නා.

ජෙරමි මොනවා කීවත් ප්‍රතිකරුවා තමා ඇවී ගිය බව නම් පිළි ගත්තේ නෑ. ඇත්ත වශයෙන් ම චිම්පන්සි ප්‍රතිකරුවා ඉතා ම දක්ෂ ලෙස ක්‍රීඩා කරා. ළමයින්ට නම් හිතුනේ ඔවුන් මෙතුවක් දැක තිබූ හාසයජනක ම ක්‍රිකට් තරගය එය බව යි. පිත්ත අතට අරගෙන සිටින චාලි කවය පුරා පහරවල් එල්ල කරනවා. ඒ අතර ජෙරමි පන්දුව රැක ගන්නට සෑහෙන වෙහෙසක් මහන්සියක් ගන්නවා. කොහොමින් කොහොම හරි පිත්ත අවසානයේ ඉහළට ඔසවාගත් චාලි ජෙරමි පසු පස පන්නන්නට පටන් ගත්තේ කවුරුත් නොසිතූ විදිහට. දැං නම් ළමුන්ට හිතෙන්නේ චාලි කෝපයට පත් ව සිටින බවක්.. ඔවුන්ගේ සිත් පුරා කිසියම් ආකාරයක් බියපත් සිතුවිල්ලකුත් මෝදු වෙන බව නම් නොකියා ම බෑ.

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



කොහොමින් කොහොම හරි අන්තිමේ චාලි ජෙරමි ව අල්ලා ගත්තා. දැං සූදානම් වෙන්නේ අසරණ ජෙරමි ඔසවා පොළොවේ ගැසීමට නම් නො වෙයි. චාලි පිත්ත ජෙරමි අතට දීල අතක් ඔසවා ආචාර සමාචාර දක්වා කවයෙන් එළියට යන්නට ගියේ ළමුන් කවුරුත්සිනා සයුරක ගිල්වමින්.

" අම්මෝ චාලිට ඕනෑම කවටයෙක් පරාදයි ජෙරමී. සර්කස් එක පවත්වන හැමදාම එයා මේ ක්‍රිකට් රංගනය ඉදිරිපත් කරනව ද ? හැමදාම ඒක ඉවර කරද්දී ඌ ඔහොම උඹ පස්සේ බැට් එක උස්සන් පන්නවා ද ?"

ඩික් සැහෙන උනන්දුවෙන් ජෙරමිගෙන් ප්‍රශ්න කරද්දී ජෙරමි කීවේ මෙවැන්නක්.

" අම්මෝ ඔව්. ඕක පුරුදු පුහුණු කරපු දෙයකුත් නෙමෙයි හැබැයි. ගොඩක් වෙලාවට චාලි මම දාන බෝල වලට ප්‍රේක්ෂකාගාරයට ම ගහනවා. එතකොට මරු. හැමෝම ප්‍රීති ඝෝෂා නගනවා. එතකොට අපි ඕඩියන්ස් එකෙන් කවුරු හරි කොල්ලෙක්ට එන්න කියලා චාන්ස් එකක් දෙනවා. බැරි වෙලා හරි චාලි එක පාර ම අවුට් වුනොත් ඌ බෝලර් පස්සේ ජ්න්නන්න පටන් ගන්නවා. බුදු අම්මේ එතකොට බෝලෙ දාපු කෙනා බය් වෙලා මර හඩ දෙන හැටි බලන්න වටිනවා"

ජෙරමි එවැන්නක් කියන කොට ළමුන් කඳුලු එන තුරු සිනා වෙන්න පටන් ගත්තා. එතකොට වගේ චාලිත් හෙමි හෙමින් ඔවුන් හිටිදිසාවට කිට්ටු කළා. ඊට පස්ස්සේ ජෙරමිගේ කරවටා දැත් යවා ඔහුව ඔවුනතරින් ඈතට ඇදගෙන යන්න උත්සහ කළා.



Scanned with CamScanner

sinhalaebooks.com



" නවත්වපන් චාලී. අන්න බලන්න නටන බූරුවා එනවා. දෙයියනේ කියල ස්ටේජ් එක කිට්ටුවට වත් යන්න එපා. කවුද දන්නෙ ඌ අද මොන විදිහේ නැටුමක් නටයි ද කියලා"

ඇත්ත වශයෙන් ම තද ම තද අලුපාට සිරුරකට හිමි කම් කී බූරුවෙක් තමයි ඒ වෙද්දි කවයට ඇවිල්ලා හිටියේ. ඌ කවය වටා රැස් කන පිරිස දිහා ඉතා වුවමනාවෙන් බලන්නට පටන් ගත්තා. පරික්ෂා කිරීමේ කටයුත්ත නිමා කළ නර්තනාචාර්ය බූරුවා ඊට පස්සේ බිම වාඩිගෙන උගේ එක කකුලක් නාසය දිහාවට දිගු කළේ ළමයින් පුදුමයෙන් පුදුමයට පත් කරමින්. ඇත්තට ම ජීවිත කාලය පුරාවට බූරුවන් කොච්චර දැකල තිබුනත් පාදයෙන් නාසය කසන බූරුවෙක් ඔවුන් දුටුවේ ජීවිතේ පළවෙනිවතාවට යි. අදහා ගත නොහැකි බැල්මක් ඔවුන්ගේ මූනු පුරා පැතිරී යන්නට වැඩි වෙලාවක් ගත නො වුනේ ඒ නිසා ම යි. සංගීත කණ්ඩායමත් ඒත් සමග ම කවයට ප්‍රවිශ්ඨ වුනා. සංගීත කණ්ඩායම ගායන වාදන පටන් ගන්නවාත් සමග ම බූරුවා ඔලුව උස්සලා ඉතා වුවමනාවෙන් සවන් දෙන බවකුයි පෙනෙන්නට තිබුනේ. සංගීත තාලයට දෙකන් පද්දවමින් හිසත් පද්දවමින් රංගනය ආරම්භ කළ බූරු නැට්ටුවා ඊ ළඟට නැගිටලා මුළු සිරුරම දෙපැත්තට පද්දන්න පටන්ගත්තේ රිද්මයට අනුකූල ලෙසට යි.

සංගීතය එකවරම නාදරටාව වෙනස් කළා. එය වේගවත් වුනා. බූරුවා එවර ඉදිරිපත් කළ නර්ථනය නම් ඉතාම වේගවත් . ඒත් ඒත්... ඌ ඒ නැටුම ඉදිරිපත් කරන්නේ ඉතා අපහසුවෙන් බවයි පුංචි ඇන්ට නම් හිතෙන්නේ. උගේ කකුලක් ඇඹරී පෙරළී යාවි යන බිය හැම වෙලේම

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ඇයට දැනෙනවා. ඈ බියපත් හඬින් එක පාරට ම කෑ ගහන්නට වුනේ එන්න එන්න ම සංගීතයේ රිද්මය වැඩි වෙන නිසා මයි.

" අනේ දෙවියනේ වේගෙ වැඩියි වේගෙ වැඩියි. උගේ කකුලක් කැඩෙයි "

" ඔයා බූරුවෙක් වෙන් නැතුව ඉන්න ඈන්..." යටි ගිරියෙන් බෙරිහන් දෙන බූරු කරුණාවන්තිය ඈන් දෙස බලමින් ඩික් කීවේ සිනා වෙමින්. " උඹ හිතුව්වෙ ඔය බූරුවා ඇත්ත එකෙක් කියල ද ?"

" ඇයි ඇත්ත එකෙක් නෙමේ ද ?"

ඈන්ගේ ප්‍රශ්නයට පිළිතුර දැසින් ම බලා ගැනීමේ හැකියාව ඈන්ට ලැබෙන්නට වැඩි වේලාවක් ගත වුනේ නෑ. එක්වර ම බූරුවා දෙකට මැදින් පැලෙන්නට පටන් ගත්තේ ඈන්ගේ බිය දහස් ගුණයකින් වැඩි කරමින්. ඒ පැලුනු බූරුවාගේ සිරුර අතරින් කුඩා මිනිස්සු දෙන්නෙක් ඊ ළඟට එළියට ආවා. ඔවුන් බූරුවාගේ කකුල් තමන්ගේ කකුල්වලින් ගලවා ඉවත් කිරීමත් සමඟ ම බූරු හම බිම ඇද වැටුණේ බූරුවා විශ්වයෙන් ම අතුරු දන් කරමින්. ඒ අතර ටින්කර් දිලිසෙන දැසින් යුතුව කිවේ හරි ම අපූරු කතාවක්.

" මටත් ඔය ජාතියේ බූරු හමක් තිබ්බ ඇති තරම් විනෝද වෙන්ට තිබ්බා. ඉස්කෝලෙදි තවත් යාලුවෙක් අල්ලගෙන මිනිහට පිටිපස්සෙ කකුල් දෙක දීලා මං ඉස්සරහ කකුල් දෙක වෙලා මාර බූරු නැටුම් ටිකක් නටන්න තිබ්බා"

sinhalaebooks.com



" උඹ ඉතින් කොහොමත් වෙලාවක ඇත්තට ම බූරුවෙක් වගේ නේ වැඩ කරන්නේ. අන්න බලන්න. අර එන්නේ වෙඩික්කාර ඩික් වෙන්න ඕනි"

ජෝර්ජ් එහෙම කිව්වේ ඒ වන විට කවය දෙසට පැමිණෙමින් සිටින මිනිසෙක්ව පෙන්වමින්. ඒ වුනත් ඔහුගේ සරඹ ආරම්භ වෙන්නට තවත් සුලු වෙලාවක් ගත වුනා. ඒකට හේතු වුනේ බූරු මිනිස්සු දෙන්නා ඒ වන විටත් සංගීත කණ්ඩාය ම සමග මොකක්දෝ ආරෝවක් , කලබගෑනියක් පටන් අරන් තිබුනු නිසයි.

" මොන මගුලකට ද අයිසේ වේගෙන් ප්ලේ කරේ. තමුසෙලා හොදට ම දන්නවානේ. අපිට වැඩිය වේගෙන් නටන්ට බෑ කියලා. අයියෝ අපේ ශෝ එක උඹලා විනාශ කරන්නයි හදන්නේ"

සංගීත කණ්ඩායමේ නායකයා යැයි සිතිය හැකි මනුස්සයා බූරු මිනිසාගේ කතාව අසාගෙන කරබාගෙන සිටින්නට ගියේ නැත. ඔහු ද අතක් පයක් දිගු කරමින් බූරු මිනිසාට හොදවයින් දෙකක් කියන්නට පටන් ගත්තේ කවය තුළ එක ම ගාල ගෝට්ටියක් ඇති කරමින්.

" ඕක නවත්තනවා පැට්. ජිම් වේදිකාවෙන් එනව එළියට. පොඩ්ඩ ඇත්නම් මරා ගන්නවා. ඇයි මොකක්ද කියන්නේ. යකෝ මේකෙ අයිතිකාරය මම. නවත්තපියව් ඕක"

ටැපර් මහත්තයා.. ඒ කියන්නේ සීයා .. රඟමඩලේ අයිති කාරයා ඉක්මනට පිරිස අතරට ඇවිත් මහා සද්දෙන් කෑ ගැහුවා. ඔහු නො වෙන්නට ඒ මොහොතේ කවය තුළ විශාල ගැටුමක් ඇති වන්නට ඉඩ

DO NOT COPY

sinhalaebooks.com





තිබු බව නම් සහතිකයි. ටැපර් මහත්තයාට නපුරු බැල්මකින් පමණක් සංග්‍රහ කළ බූරු මිනිස්සු දෙන්නා කිසිම කතාවක් බතාවක් නොමැතිව කවයෙන් එළියට ආවේ බූරු හමත් අකුලාගෙන යි. මේ හැම දේකට ම පස්සේ අපිරිසිදු ෆැනල් කමිසයක් ඇඳගත්තු වෙඩික්කාර ඩික් කවය තුළට පැමිණියා. වෙඩික්කාර ඩික් වැඩ කිඩ පෙන්වන්නට ලක ලෑස්ති වෙන මේ අවස්ථවේ ඔහු සම්බන්ද ව ලොකු විස්‍යතරයක් කියන්නත් ජෙරමි අමතක කළේ නෑ.

" එයා හරි දක්ෂයි. ඒත් අද නම් එයාගේ හැම හැකියාවක් ම ඔයාලට බලාගන්න ලැබෙන්නේ නෑ. කොහොමත් එයා රෑකට පෙන්වන්නේ



Scanned with CamScanner

sinhalaebooks.com



එයාගෙ දක්ෂතා කඹුහිපයක් විතරයි. එයා ඕන ම දේකට වෙඩි තියන්ඩ සූරයා. නූලක ගැට ගහපු ෆැන්සයේ කෑඉයක් එල්ලලා වැනි වැනී තියෙද්දිත් එයා වෙඩි තියනවා. කවදාවත් වරදින්නෙ නෑ. ශෝ එක තියෙන දවසට මිනිහා අඳින්නෙ රිදීපාට දිලිසෙන බොත්තම් අල්ලපු කමිසෙකුයි කලිසමකුයි. ඩික්ගෙ පුංචි අශ්වයා දිහා බලන්නකෝ. ඌත් මරු . කවදාවත් වෙඩි සද්දෙට බය වෙන්නෙ නෑ. "

සුදු පාට කුඩා අශ්වයෙක් කවයට මෙහායින් ළමින්ට දක්නට ලැබුනා. සත්තකින් ම ඌ නම් ඉතා ම සුන්දර අශ්වයෙක්. උගේ බැල්ම යොමුව තිබ්බේ වෙඩික්කාර ඩික් දිහාවට ම යි. " තමුසේ එනව ද නැද්ද ? මට මෙතන අනිවාරතේ බකන් නිලන් ඉන්න බෑ මනුස්සයෝ" කියන්නාක් මෙන් අශ්වයා පාදයක් පොළවට ගසමින් ඩික්ට මොන මොනවාදෝ කියන්න උත්සාහ කරනවා.

" ඩික්. ඔයා යන්න. අශ්වයගෙ කකුලක් තුවාලයි නේද? අද විවේකයක් දීලා හෙට වෙද්දි ඌව සනීප කරගන්න බලන්න"

වයසක ටැපර් උන්නැහේ කිව්වේ කාරුණික සවරයෙන්. ඉතින් ඒ නිසා ඩික් අශ්වයා සමග පිටවෙල ගියේ ටැපර් මහතාට ස්තූතියත් ප්‍රකාශ කරමින්. මේ වන විටත් ජෝර්ජ් ඉන්නේ නොසෑහෙන්න සතුටින් උද්දාමයෙන්. ඉතින් ඇය ජෙරමි දිහාවට හැරිලා හරිම නොයිවසිල්ලෙන් හැම වෙලාවෙම මෙහෙම අහනවා.

" ඊ ළඟට මොකක්ද තියෙන්නේ ජෙරමි?"



Scanned with CamScanner

sinhalaebooks.com



" හරියට ම කියන්න බෑ. ආං බලන්න ඇට නැති මිනිහා.කිසිම ලෝභකමක් නැතිව සල්ලි වියදම් කරන මනුස්සයෙක්. බලන්නකෝ ඇට නැති මිනිහාගේ වැඩ කිඩ කොහොමද කියලා"

ඈන් නම් මෙච්චරවෙලා හිතාගෙන හිටියේ ඇට නැති මනුස්සයා පණුවෙක් හරි ජෙලිෆිෂ් කෙනෙක් හරි වගේ අඑති කියලයි. ඒත් ඉතින් ඒත් ඉතින් ඔවුන්ට දක්නට ලැබුණේ නම් හොඳට ඇට කටු පෑදුනු කෙට්ටු උසමනුස්සයෙක්. ඒ අතර ඩික් ඒඅමුතු පෙණුමක් වගේ ම අමුතු නමක් තියෙන මනුස්සයා දෙස බලා විද්‍යා පාඩමක කාරණා මතක් කරන්න පටන් ගත්තා.

" ඇට පෙනි පෙනී තියෙද්දිත් නෑ කියනවනෙ. අනික ඇට නැත්තම් කොහොමද ඇවිදින්නේ.බඩගාගෙනනේ එන්න තිබ්බේ"

කොහොම වුනත් වේදිකාවට ආවට පස්සෙ නම් ඇට නැති මනුස්සයා හැසිරුණේ එක ම ඇටයවක් වත් ඇඟේ කොහේවත් නොමැති ගානටයි. ඔහු නැවෙන්න දිග ඇරෙන්න පටන් ගත්තේ සාමාන්‍ය මනුස්සයෙකුට කරන්න තබා හිතන්නවත් පුලුවන් කමක් නොමැති තැන්වලින්. කකුල පවාඕනෑම තැනකින් දෙකට නවන්න ඔහුට පුලුවන්.වළලුකර ගාවින් කකුල ඕනෑම අතකට නවන්නත් ඔහුට පුලුවන්. අත් දෙකවුනත් ඒ වගේ.ඔහු එක පාරට ම හිස ගෙල වටා කරකවන්න පටන් ගත්තේ කොයි කවුරුත් තුෂ්නිම්භූත කරමින්. ඒ හැම දේකට ම පස්සේ ඔහු කවයෙන් එළියට පැමිණියේත් ශර්පයෙකු පරිද්දෙන් බඩ ගාමින්.

DO NOT COPY

sinhalaebooks.com



" ශෝ එකට එයා අදින්නේ නයි හැවක් වගේ පාට තියෙන ඇඳුමක්. නියමයි නේද ?"

"ඔව්".. ජූලියන් ටින්කර්ට උත්තර දුන්නේ පුදුමයෙන් තාමත් විශාල ව තිබුණු ඇස්වලින් ම යි. " කොහොම කරනව ද මන්දා. අපි එහෙම ඔහොම නො පිටට නවන්න ගියොත් අත පය කඩාගෙන ඉස්පිරිතාලෙ තමයි යන්න වෙන්නේ"

මේ සැම දෙයක් ම ඈන් තදින් කල්පනා කරන්න පටන් ගත්තා. ඇත්තට ම ඇගේ සිතිවිලි බොහෝ දුර ඈත.. බොහෝම ඈත ගමන් කළා.සර්කස් කණ්ඩායමක් කියන්නේ මහා පුදුමාකාර මායා ලෝකයක් වගේ එකක් නේද කියත් පුංචි ඈන්ට හිතෙනවා.ඒත් සමඟ ම මහා විශාල හොරණෑ හඬක් ඇහෙන්නට පටන් ගත්තා. ඈන් උඩ ගොස් බිම වැටුණේ ආපසු පියවි ලෝකයට එමින්. ඒ අතර ජෙරමි සතුට උතුරා යන හ්ඬකින් මෙහෙම කියනවාත් ඇයට ඇසුනා.

" රෑ කෑම වෙලාව යේ. ඉක්මනට යමු. අපි ගිහින්ලා අපේ ආත්තම්මයි එයාගෙ ලොකූ කල්දේරමයි හොයා ගමු. යමු යමු. ඉක්මන් කරන්න..."

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 10

# ගිනි මැලය වටේ කතාන්දර

DO NOT COPY

ඉතින් ඉක්මනින් ම ජේරමි ළමුන් පස්දෙනා ද රැගෙන රගමඩලේ පෙර පුහුණු වීම් පැවැත්වූ ස්ථානයෙන් එළියට ආවා. රගමඩල පවත්වන ස්ථානය හොඳින් ආලෝකමත් කොට තිබූ නිසාදෝ හාත්පස නම් දක්නට ලැබුණේ විශාල අන්දකාරයක්. වත්තේ තැනක විශාල ගිනි මැලයක් ඒ වන විටත් ඇවිලෙමින් තිබුණා. ඒ වටා තබා තිබූ විශාල ගල් මත විශාල කල්දේරමක් තිබෙන හැටි දැං දැං ළමුන්ට දැක ගත හැකියි.



Scanned with CamScanner

sinhalaebooks.com



කෑම පිසෙන අපූරු සුවඳක් ඒ තුළින් ළමුන්ගේ නාස් වෙත ගමන් කරනවා.

ජෙරමි මේ තරම් වෙලාවක් කථා කළ ඔහුගේ ආත්තම්මා ඔවුන්ට දක්නට ලැබුණේ මේ අවස්ථාවේයි. ඇය සිටියේ විශාල කල්දේරම කාල් ගාමින්. ළමුන් ව දැකීමෙන් පසු සුන්දර හිනාවක් මුහුණට නගා ගනිමින් මෙහෙම දෙයක් කියන්නත් ඇය අමතක කළේ නෑ.

" කොහොමද ළමයි. මං හුගක් වෙලාවක ඉඳන් බලා හිටියා. ඔයාලා ගොඩාක් වෙලා එතන හිටියා"

ඊ ළඟට ඇය සීයා දිහාට හැරුණා.

" මොකක් හරි ප්‍රශ්නයක් වුනා ද ?"

" නෑ නෑ.මට දැං හොඳට ම බඩගිනියි හාමිනේ. සුවඳ නම් හරි ම අපූරුයි. ආත්තම්මට පොඩි උදව්වක්ක් දෙන්න ජෙරමි"

" හරි සීයේ"

ජෙරමි වහා ම එකඟ වුනා. ඔහු පිගන් විශාල ප්‍රමාණයක් හරි ම පරිස්සමින් ඔසවාගෙන එතනට පැමිණියා. ඒ අතර වාරයේ සීයා ජූලියන් ව කතාවට අල්ලා ගන්න උත්සාහයක් ගත්තා.

" ඉතින් කොහොමද ළමයා අපේ පෙර පුහුණුවීම ?"



Scanned with CamScanner

sinhalaebooks.com



" නියමයි.. ඒත් ඔයා සේරම අය පුහුණුවීම්වලට සම්බන්ද කර ගත්තේ නෑ නේ ද ? මම ආසාවෙන් හිටියේ ජිම්නස්ටික් අයව යි කවටයොයි බලන්න . ඒ ගොල්ලො මෙතන ඉන්නව ද ?"

ජුලියන් ගොඩාක් වුවමනාවෙන් සීයා ගෙන් ප්‍රශ්න කෙරුවා . සීයා සිනා මුහුණින් යුතුව මෙහෙම කියන්නට පටන් ගත්තා .

" ඔව් . අර බලන්න. අර අතන මේඩ්ලන් එක්ක කතා කර කර ඉන්නේ කවටයින්ගේ කෙනෙක්"

ළමුන් කවටයා බලා ගන්නා අදහසින් සීයාගේ බැල්ම ඔස්සසේ නෙත් හෙලුවා . විනෝද කාමී මනුස්සයෙක් දැකීමේ බලා පොරොත්තුවක් ඔවුන් තුළ තිබ්බත් ඔවුන්ට දක්නට ලැබුනේ බලා පොරොත්තු කඩ වූ මුහුනකින් පසුවෙන දාහෙට අරන් සීයට දුන්නා වැනි පෙනුමකින් යුතු මනුස්සයෙක් . ඒ නිසයි ඩික් මේ විදිහට කිව්වේ .

" එයා කවටයෙක් ද ? එයා නිකන් දුකින් ඉන්නවා වගේනේ පේන්නේ . කවටයෙක් වගේ නම් පේන්නේ නෑ"

" මොන්ටි හැම තිස්සෙ ම එහෙම තමයි . වේදිකාවෙන් එලියෙ ඉන්නකොට එයාගේ මූන හැම වෙලේ ම ඔහොම තමයි . හැබැයි එයා සර්කස් එකේ වැඩ පෙන්වන කොට නම් ඔයාලට හිනා ගිහින් පණ යයි .මම දන්න ගොඩක් කවටයෝ ඔහොමයි . සර්කස් එකේ ඉන්න කොට යෝද හිනාකාරයෝ . පිට ඉන්න කොට මහා මුස් පේන්තුවෝ . අර බලන්ට ළමයි අර මේඩ්ලන් ගේ කොන්ඩෙ එක්ක පයිරුපාසානම් පවත්වන හාදයා . මිනිහාගේ නම වින්ක්ස් . එයා මොන්ටි වගේ

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



නෙමෙයි . විහිලුවෙන් තහලුවෙන් හැම වෙලේම ඉන්නයි කැමති . ඔය යන විදිහට වින්ක්ස් මේඩ්ලන්ගෙන් ඉක්මනින් ම කන රත් කර ගන්නවා''




සීයාගෙ කීම ඇත්තක් වෙන්නට වැඩි වෙලාවක් ගත වුනේ නෑ . මේඩ්ලන්ගෙන් පහර ලත් වින්ක්ස් ළමුන් දෙසට දිව ආවේ භූත හඬක් ද නගමින් විහිලුවකට මග පාදමිනි .



Scanned with CamScanner

sinhalaebooks.com



" අම්මෝ ඕ ඕ ඕඔ ... එයා ලස්සන කොන්ඩ කාරියක් වුනත් මගේ කනට ගැහුවා"

සිනා නොවී සිටීමේ හැකියාවක් නම් ළමුන්ට තිබුනේ නෑ . ඇත්තට ම වින්ක්ස්ගේ හැසිරීම සිනා සාගරයක් ඇති කරනවා . මිස්වීෆ් පවා ප්‍රීතියට පත් වූ ලෙසින් වහා දිව ගොස් වින්ක්ස්ගේ උරහිසට නැගී මොනවදෝ දොඩවන්නට පටන් ගත්තා .ඒ අතරම කූඩුවෙන් එළියට පැමිණි චාලි චිම්පන්සියා උගේ විශාල අතක් වින්ක්ස් ගේ අත මත තියා ඔහු සම්බන්දයෙන් ඌ තුළ පවත්නා ඇල්ම බැල්ම ද කියාපාන්නට උත්සාහයක් ගත්තා .

" ඔය මදෑ වින්ක්ස් . මුන් දෙන්නා හිතාගෙන ඉන්නේ උඹ මහා අමාරුවෙන් අසාධ්‍ය තත්වයෙන් ඉන්නවා කියල යි . ඔහොම ගියොත් ඔහේව සනසවන්න හිතාගෙන අශ්වයෝ ටිකත් මෙතනට කඩා පාත් වෙයි . ඇවිල්ලා ගෙදරත් එක්කගෙන යයි . ඒ නිසා දැං වාඩි වෙලා කෑම ටික කාල ඉන්න'

සීයාගේ කතාවෙන් පස්සේ නම් වින්ක්ස් එයාගේ රංගනය නවත්වන්නට උත්සාහ කළා . ජුලියන් නැවතත් තම හඬ අවදි කළා .

" ටැපර් මහත්තයා . අපි ඔයාගේ සර්කස් එකේ ඉන්න තව කෙනෙක්ව දැක්කෙ නෑ නේ පුහුණු වීමෙදි . ඇත්තට ම කෝ වූ නම් වු මහා මායාකාරයා ? ඇයි එයා පුහුණුවීම් වලට ආවෙ නැත්තෙ ?"

" මිනිහා ඉතිං කවදාවත් පුහුණුවීම්වලට එන්නේ නෑනේ . සාමාන්යෙන් බොහොම පාඩුවේ ඉන්න තනියෙම පුරුදු පුහුණු වෙන හාදයෙක් . හිතුනොත් රෑ කෑමට අපිත් එක්ක එකතු වෙයි . නැත්තම්



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



තනියම කෑම කයි . සමහර විට හෙට අපේ සර්කස් එකේ පළවෙනි රෑ වැඩේ ඉවර වුනා ම නම් කෑමට අපි එක්ක එකතු වෙන්න ඉඩ තියෙනවා . ඒත් ඉතිං මිනිහගේ ගති පැවතුම් ඉන්තේරුවෙන් ම කියන්න පුලුවන් ඒවා නෙමෙයි . ඔය ළමයින්ට කිව්වා ම මොකද මිනිහගේ වැඩ පිළිවෙල දැක්කම මට වුනත් මිනිහා ගැන බියක් සැකක් ඇති වෙනවා”

“ මට ඇත්තට ම කියන්න සීයේ එයා ඇත්තට ම මායා කාරයෙක් ද ?”

ටින්කර්ගේ කතාවට නම් මහළු මනුස්සයාට කොක් හඬලා සිනා වෙන්නට හිතුනා . ඒ වුනත් ඔහු ටින්කර අපහසුතාවයට ලක් වෙන අන්දමේ සමච්චල් සහගත සිනාවක් නම් පාන්නට ගියේ නෑ . මේ හිතුවක්කාර කොලු ගැටයා වූ සම්බන්දයෙන් සිතාගෙන සිටින්නේ සුරංගනා කතාවල එන හදිසියේ අතුරුදන් වෙන , මායා ගිනිදලු යවන විදිහේ හාදයෙක් බව නම් සීයාට සහතිකයි . උන්නැහේ හැකි තරම් නැගෙන සිනාව යටපත් කර ගනිමින් ටින්කරට උත්තර දෙන්න සිතුවා .

“ මිස්ටර් වූ එක්ක කතා බහ කරන කොට ඕනම කෙනෙක් ට එහෙම හිතෙනවා . මට වුනත් එහෙමයි . ඒත් ඉලක්කම් වලින් වැඩ දාන එක ඇරුනම වෙන නම් කිසිම විදිහේ මායා කර්මයක් කරන්න වූ ට බෑ . මිස්ට වූ ඇවිල්ලා ඉලක්කම් වලින් ඉපදිලා ඉලක්කම් වලින් ජීවත් වෙන තාලේ මනුස්සයෙක් . ඉලක්කම් වලින් කරන්න බැරි වැඩක් මිනිහාට නෑ . මිනිහට ඕනම ගාණක් එකතු කරන්න වැඩි කරන්න බෙදන්න අඩු කරන්න මහ පුදුම හැකියාවක් තියෙනවා . වෙලාවක කතාවට අල්ලගෙන බලන්න . ගණිත ගැටලුවක් දීලා බලන්න . තත්පරෙන්

DO NOT COPY

sinhalaebooks.com





Scanned with CamScanner

sinhalaebooks.com



උත්තරේ කියයි. එයා ඉන්න තිබ්බෙ සර්කස් එකක නෙමෙයි . පිටු ගනන් ඉලක්කම් තියෙන කොළ එක්ක ගණුදෙනු කරන විද්‍යාඥයෙක් වෙන්නයි මනුස්සයට තිබ්බෙ"

" කියන විදිහට නම් එයා මගේ තාත්තා වගේ කෙනෙක්" ටින්කර් කීවේ තම පියා ගැන් ආඩම්බර කාරී හැගීමකින් . තාත්තා ගැන කතාවක් පටන් ගැනීමට මෙය හොඳ වෙලාවක් බවත් ඔහුට හිතුනා . තාත්තා ගැන ආඩම්බර සිතුවිලි ටිකෙන් ටික මෝදු වෙන්නට පටන් ගත්තෙන් ටින්කර් තොරතෝංචියක් නැතිව දිගට ම කතා කරන්නට පටන් ගත්තා. " එයා නව සොයා ගැනීම් කරන විද්‍යාඥයෙක් . පරීක්ෂකයෙක් . කොටින් ම දක්ෂ ගනිතඥයෙක් .සමහර වෙලාවට මම හොරෙන් එයාගෙ කාමරේට ඇහැදාලා බලනවා . එතකොට මං දකිනේ මිලියන ගනන් ඉලක්කම් තියෙන එක එක සොයා ගැනීම්වල ආකෘති තියෙන පරීක්ෂණ සටහන් විතරයි "

" ෂා විශිෂ්ටයිනේ එහෙනම් ඔයාගේ තාත්තයි මිස්ටර් වූ යි දෙන්නා මුන ගස්වන්නයි තියෙන්නේ . දෙන්නත් එක්ක දවස පුරාම ඉලක්කම් ගැන කතා කර කර ඉදීවි . ආ .. මොනවද චූටි නෝනා ඔයා මේ හැමෝට ම බෙදන්නේ ?'

සීයා එක පාරට ම පුංචි ඇන් දිහාවට හැරිලා ඇසුවා . ඒ වන විටත් පුංචි ඇන් ජෙනීගෙන් ඉල්ලාගෙන ආව ආහාර සර්කස් නඩය සමගින් බෙදා හදා ගැනීමේ කටයුතු ආරම්බ කර තිබුනා . ඇත්තට ම ඇන් ඒ වගේ කටයුතුවලට දක්වන්නේ පුදුමාකාර කැමැත්තක් . ඇය සීයාට පිළිතුරු දෙන කොට ඇගේ ඇස් පවා සතුටින් දිලිසෙනවා .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" අපි ගෙනාව කෑම වගයක් සීයේ . සෝසේජස් එකක් දෙකක් සීයාටත් දෙන්නම් .. ආ රෝල්ස් තියෙනවා ..තක්කාලිත් තියෙනවා"

" හොද ළමයෙක්නේ .." සීයා කියන්නේ සතුටිනි . " ඔයා හරි කරුනාවන්ත පුංචි ගෑණු ලමයෙක් . ඇත්තට ම මට හරි සන්තෝසයි ළමයි ඔයාලාව දැන හදුනා ගන්න ලැබුණු එක ගැන . ඔයාලට පුලුවන් වෙයි අපේ ජෙරමිටත් හොද සිරිත් විරිත් ටිකක් කියලා දීලා හදලා ගන්න"

" සීයා . අන්න වූ මහත්තයා එනවා මෙතනට . මේක නම් පුදුමයක්"

ජෙරමි හදිසියේ ම කියන කොට ළමයි පුදුම තරම් උනන්දුවෙන් ඔහු දක්වන දිහාවට නෙත් යොමු කෙරුවා . කාටවත් යටත් නොවෙන ප්‍රථාපවත් පෙනුමක් තිබෙන මදෑ සිනාවකින් මුව සරසා ගත් මනුස්සයෙක් ඔවුනට දක්නට ලැබුනා . ඔහුට තිබෙන්නේ ගන ඇහි බැමක් . ඒ ඇහි බැම යටින් තිබෙන තීක්ෂණ දෑස් ගිනි මැලයේ ආලෝකයෙන් දිලිසෙනවා . පහතින් තියෙන කුඩා උල් රැවුල ඔහුගේ අබිමානය තව තවත් වැඩි කරනවා . ඇත්ත වශයෙන් ම මේ උස මිනිසාට තියෙන්නේ ළමුන් පොත පතින් කියවා මායා කාරයෙක්ට උරුම යැයි මවා ගත් කඩවසම් හැඩතලයක් .

" ඉතින් අද රාත්‍රියේ අපට අමුත්තන් පිරිසකගේ සහභගීත්වයත් ලැබෙනවා එහෙනම්" මිනිසා ළමුන් පිරිසට මද සිනාවකින් සංග්‍රහ කරමින් කියන විට මිනිසාට තිබෙන්නේ විදේශික ච්චාරණයැකැයි ළමයින්ට සිතුනා . " මමත් මෙතනට සම්බන්ද වුනාට කමක් නැද්ද ?"



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



" අනෙ ඔයත් එන්න මිස්ටර් වූ" ඇන් ගත් කටට ම කිව්වේ මායා කාරයාගේ හැසිරීම සම්බන්ද ව තුටු පහටු සිතකින් . " මම දෙන්නම් ඔයාට සොසේජස් එකකුයි තක්කලි ගෙඩියකුයි රෝල්ස් එකක්යි"

" මොන තරම් නම් ප්‍රණීත ද දරුවා .."

එසේ පවසමින් ම මහා මායා කරු ළමුන් පිරිස අතර එරමිණියා ගොතා ගනිමින් වාඩි වුනා . ඒ අතර ඩික් ප්‍රථම වතාවට මායාකාරයෙකු සමග කතා කිරීමේ වාසනාව උදා කර ගත්තේ මේ විදිහට යි .

" ඔබ තුමා පුහුණුවීමට සම්බන්ද වෙයි කියලා මම ගොඩාක් බලා පොරොත්තු වුනා . මම අහලා තියෙනවා ඔබ තුමාට ඉලක්කම් වලින් මහා විස්ජ්ඡ්වකර්ම වැඩ කරන්නට පුළුවන් කියලා"

ඒ අතර ටින්කර් ද දත කට පූට්ටු කරගෙන කරබාගෙන සිටියේ නැත . ඔහු පියාගේ අබිමානය සිහියට නගා ගත්තේ ය .

" සර් මගේ තාත්තත් ඔබ තුමා වගේ ම දක්ෂයෙක් .එයා නව සොයා ගැනීම් කරනවා .සේරම ඉලක්කම් එක්ක සම්බන්ද දේවල් තමයි ."

" ආ එයා නව සොයා ගැනීම් කරන කෙනෙක් ද ? අපූරුයි . එයා මොනවගේ දේවල් ද හොයා ගන්නේ ?"

රෝල්ස් එක කන අතරේ ඕනෑවට එපාවට මෙන් ඇසුවත් මායා කරු ප්‍රශ්න කරේ පුදුමාකාර වුවමනාවකින් කියලා නම් ළමයින්ට හිතුනා .තාත්තාගේ හැකියාවන් වක්කඩක් කැඩුවා සේ කියාගෙන කියාගෙන යන්නට හොඳ පොටක් පෑදුනු බවක් ටින්කර්ට දැනුනා .

DO NOT COPY

sinhalaebooks.com





" එයා ඕනම දෙයක් නිපදවන්න දක්ෂ කෙනෙක් . හරි ම දිශාවට පියාසර කරන ගුවන් යානා හදන්න එයාට පුළුවන් . ස්කෝ වීල් එක එයාගේ හොය ගැනීමක් . ඒ මොකක්ද කියලා ඔයා තාම දන්නෙ නැතුව ඇති . විදුලි ආවරණය ගැන නම් ඔයා දන්නවා ඇති . හැබැයි එයා ඒකෙන් හොය ගත්තා ...."

" පොඩ්ඩක් ඉන්න මගේ දරුවෝ ... මේ දේවල් ගැන මම වටින් ගොඩින් අහලා තියෙනවා .ඒ නමුත් ඒ සොයා ගැනීම් ඔබේ පියාගේ ද

sinhalaebooks.com



? කියන්න වැඩි විස්තරයක් මා දන්නේ නෑ . ඔබේ පියා ඉතාමත් ම දක්ෂ අයෙක් වෙන්ට ඕනිය කියල මා විශ්වාස කරනවා . සාමාන්‍යයෙන් මිනිසෙකුට නොපිහිටන විදිහේ තීක්ෂ්න බුද්ධියක් දැනුමක් ඔහුට ඇති බව මගේ හැඟීමයි”

වූ මහතා මේ සියලු දේවල් කීවේ විදේශීය උච්චාරණයෙන් වුවත් ටින්කර්ට දැනුනේ පුදුමාකාර සතුටක් . සතුටට වඩා පියා පිළිබඳ දරා ගත නොහැකි ආඩම්බරයක් . තාත්තාගේ දක්ෂතා මායා කරුගේ පැසසුමට භාජනය වීමත් ඔහු වුවමනාවෙන් ඔහුගේ කතාවට සවන් දීමත් ඊට හේතුවයි . ටින්කර් දැන් තාත්තාගේ තොරතුරු අකුරක් නෑර කතා කරන්නට සූදානම් .

“ ටික දවසකට කලින් එයාගෙ විස්තර වගයක් පත්තරේ වැටුනා . වාර්ථාකාරයෝ තාත්තා බලන්න ගෙදරට ම ආවා . ඒත් මගේ තාත්තා ඒවයින් ආඩම්බර වුනේ නෑ . එයා ඒ හැම දේකට ම විරුද්ද වුනා . හිතන්නකෝ තාත්තා හැම වෙලේ ම ලොකු කල්පනාවක ඉන්න කෙනෙක් .එහෙම වෙලාවට එයාගේ පරීක්ෂනවලට බාදා කරගෙන වාර්ථාකාරයෝ යන්න එන්න ගියා ම එයා ට කේන්ති යන එක සාදාරනයිනේ .සමහරු ජනේලෙන් ගෙට ත් එබිල බැලුවා . තවත් අයට එයා වැඩ කරන කුලුන බලන්න යන්නත් ඕනි වුනා .”

“ කුලුණ ? මොන කුළුණක් ද ?”

වූ මහතා ප්‍රශ්න කළේ ඉතා වුවමනාවෙන් . ටින්කර් ඒ ගැනත් වූ මහතාගේ දැනුම වර්ධනය කිරීමට පසු බට වුනේ නෑ . ඒ වුනත් ඊට කලින් ජුලියන් ටින්කර්ට ඇඟිල්ලෙන් ඇන්නා . වහා හැරී බලන



DO NOT COPY

sinhalaebooks.com



ටින්කර් දුටුවේ ජූලියන් තමා දෙස රෞද්‍ර බැල්මකින් බලා සිටින ආකාරය යි . ජෝර්ජ්ගෙන් පවා දක්නට ලැබෙන්නේ ගොදුරක් දුටු දිවියෙකුගේ කොටියෙකුගේ බැල්මක් . තාත්තාගේ රහසිගත තොරතුරු ඇත්තට ම ටින්කර් කා සමගවත් පම්පෝරි ගැසීමෙන් වැලකිය යුතුව තිබුනා . දැං දැං ටින්කර්ගේ මුහුණ ලජ්ජාවෙන් රතු වෙමින් තිබෙන්නේ වරද පිළි ගැනීමට සිත අකමැති වුනත් නොකළ යුතු දෙයක් කළ බවට උපන් ලැජ්ජාවක් හිතට දැනුනු නිසයි .

මස් කැබැල්ලක් උගුරේ හිරවුනු ආකාරයක් මවා පාමින් ටින්කර් කතාව නතර කෙරුවා . ඒ වුනත් ජූලියන් වහා ම මාතෘකාව කුලුනු කතාවෙන් බොහෝ දුර ඈත රැගෙන යන්නට උත්සාහ ගත්තා .

“ මම අහල තියෙනවා වූ මහත්තයා ඔයාට හරිම ඉක්මනට ඉලක්කම් එකතු කරන්න අඩු කරන්න වැඩි කරන්න බෙදන්න පුලුවන් කියලා . මම මොනව හරි ගානක් ඇහුවොත් මටත් උත්තර දීල පෙන්වන්න පුලුවන් ද ?”

“ ඒ කතාවේ පොඩි ඇත්තක් යම් හැකියාවක් තියෙනවා . ඒ වුනත් මා මේ දරුවාගේ පියා තරම් නම් යන්තමින් වත් දක්ෂ නෑ . හොදයි දරුවා . ඔබ අහනව නම් මට හැකි ඉක්මනින් මා ඔබට පිළිතුරු දෙන්නම්”

“ හරී” නැවත සැරයක් පැන්නේ ටින්කර් ය . “ වැඩි කරන්න හයදාස් තුන්සිය හතලිස් දෙක අටදාස් නවසිය පණස් තුනෙන් . හරි පුලුවන් ඉක්මනට දෙන්න බලන්න උත්තරේ එහෙනම්”

“ උත්තරය 5127724926” වූ මහත්තයා තත්පරයකුදු නොයවා එක් වරම උත්තරය දුන්නේ කවුරු කවුරුත් පුදුමයට පත් කරමින් . ඒ අතර

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



සංදර්ශනයක් පැවැත්තූවා සේ හිස නමා ආචාර කරමින් මෙහෙම කියන්න්ත් අමතක කළේ නෑ “ එය ඉතා පහසු සංඛ්‍යාවක් මාගේ දරුවා”

“ අප්පට සිරි .” ටින්කර්ට එක පාරට ම කියවුනේ එහෙමයි . “ ඒක හරිද බලපන් ජූ”

ජූලියන් කොලයක් ගෙන ගනන සාදන්නට මද වේලාවක් ගත කලේ ය .

“ හරියට ම හරිනේ . වාව් ඔයා නිකන් විදුලි කොටනවට වඩා වේගෙන් ගනන් හදනවනේ”

ඊ ළග අවස්ථාව උදා කර ගත්තේ ජෝර්ජ් ය . ඇත්තට ම වූ මහත්තයාගේ විස්මිත හැකියාව ළමුන් තුළ ඇති කළේ ඇදහිය නොහැකි බවකි .

“ මායා කරුවානෙනි . 602491 වැඩි කරන්න 352 න්”

“ උත්තරය 212076832 . ඔයාලත් උස්සහ කරල බලන්න දරුවෝ . මට විස්වාසයි මේ දරුවාගේ පියාට හැකිවෙයි විසදන්නට මේ ගැටලු ඉක්මනට මට වඩා”

වූ මහතා එසේ කියා නැවතත් ටින්කර් දෙසට බැල්මක් හෙලුවා . ඊ ළගට තවත් තොරතුරු  දැන ගන්නා අදහසින්දෝ දිගින් දිගට ම මේ විදිහට කිව්වා .

DO NOT COPY

sinhalaebooks.com



" අපිට තව බොහෝ දෑ එතුමා සම්බන්දයෙන් කතා බහ කිරීමට තිබේ වි. තමාගේ කටයුතු සදහා කුලුනක් නිර්මානය කිරීම පවා ඉතා බුද්ධිමත් අදහසක් . මා ඔබට කියන්නට සතුටුයි දරුවා ඔබේ පියා සම්බන්දයෙන් විදේශිකයන් පවා ගෞරවයෙන් කතා කරනවා . අනිවාරෙන් ම ඔහු ඔහුගේ රහස් පිටවේ යැයි බියෙන් පසුවෙනවා ඇත"

" මම නම් එහෙම හිතන්නේ නෑ ඉතින් . කුලුනෙනේ හැම පරීක්ෂනය ම කරන්නේ . එතන හරිම ආරක්ෂිතයි . ඒ වගේ ම .."

ඒ වුනත් එතනින් එහා විස්තරයක් කරගෙන යාමේ හැකියාවක් ටින්කර්ට ලැබුනේ නැත . ඔබ අසා සිටී නම් මම මෙසේ කීමට ටින්කර් සූදානම් බව ජූලියන් දනී . තාත්තාගේ රහසිගත පරීක්ෂන කටයුතු සිදු කරන කුලුන සම්බන්දයෙන් නන්නාදුනන මිනිසෙකුට විස්තර කීමට තරම් ටින්කර් මෝඩයෙකු වන්නේ ඇයි ? අන් කළ යුතු යමක් සිතා ගත නොහැකි ජූලියන් ... වූ මහතා තමා ගැන මොනවා සිතුවත් කමක් නෑ යැයි තීරණයකට එළඹී ජූලියන් .. මහාචාර්යතුමාගේ රහස් රහස් ම වියයුතුය යන ටින්කරයා වහා මැජික් කාරයා අසළින් ඉවතට රැගෙන යාමේ අදහසින් මෙහෙම කිව්වා .

" ඔයාල හිතන්නේ දැන් වෙලාව කීයයි කියල ද ? හොදටම රෑ වෙලා . අපි තවත් මේ විදිහට පරක්කු වුනොත් ජෙනී හොදට ම බය වෙලා පොලීසියටත් කියයි .ටින්කර් හා හා ඇති ඔය කතා කරා .එන්න දැං කට්ටිය ම යමු . අපිට රෑ කෑමට එන්න කිව්වට ගොඩාක් ස්තූතියි සීයේ"

DO NOT COPY

sinhalaebooks.com



" ඒ වුනාට ඔයාලා බොහොම ටිකයිනේ කෑවේ" සීයා කියන්නට වුනේ පුදුමයෙන් . " කතා කර කර හිටියා මිසක් කෑවේ නෑනේ . තව ටිකක් කන්න ළමයි"

" අපිට තවත් මොකවත් ම කන්න බෑ සීයා . බඩ හොඳට ම පිරිලා .හෙට හම්බෙමු සීයා . ආත්තම්මා දෙන්නට ම ගුඩ් නයිට් එහෙනම් . ඇත්තට ම මේ හැම දේකට ම ගොඩාක් ස්තූතියි"

ඩික් ද ජුලියන්ගේ කතාවේ අරුත වටහා ගත් ලෙසින් කිව්වා . ඒ වුනත් ටින්කර්ට නම් මේ කිසි දෙයක් තවමත් නොතේරෙන නොවැටහෙන ගානයි .

" අපිට තව කෙසෙල් කන්න යි ඇපල් කන්නයි බැරි වුනානේ"

" ආ අපි ඒව ගිහින් වාලිට දෙමූ ." ඩික් යළිත් වතා ව ක් කතා කරමින් දැන් වූවා . ඇත්තට ම ටින්කර්ගේ කන පලන්නට තරම් මේ මොහෙතේ ඩික්ට කේන්තියි .වූ මහත්තයා කපටි කමින් සියල්ල දැන ගන්නට දරන උත්සාහය ටින්කර්ට නොවැටහෙන හැටි .. ' ඉදපන්කෝ මම උඹ අල්ල ගන්නකන්" ඩික් ඒ කතාව නම් කිව්වේ කාටවත් ඇසෙන විදිහට නොව තමාට ම යි .

ළමුන් පිරිසගේ කෝපයට තමා පත් වී තිබෙන බව වටහා ගන්නට ටින්කර්ට වැඩි වේලාවක් නම් ගත වුනේ නෑ . වූ මහතාට නො ඇසෙන තැනකට , හරියට ම නිවසත් ක්‍රීඩා පිටියත් වෙන් කරන වැට අද්දරට ගමන් ගත් වහා ම ළමුන් පිරිස ටින්කර් වට කොට ගත්තේ කට ප්‍රවේශම් කරගැනීමේ පාඩම ඉගැන්වීමේ බලා පොරොත්තුවෙන් . ඒ

DO NOT COPY

sinhalaebooks.com



අතර දේශනයේ ආරම්භකයා බවට පත් වීමේ ගෞරවය හිමි කරගත්තේ ජූලියන් .

" තමුසෙට මොලේ හොද නැද්ද ටින්කර් . තමුසෙට තේරුන් නැද්ද අර මිනිහා තාත්තගෙ රහස් ඔක්කොම තමුසෙගෙ කටින් දැන ගන්න හදනව කියල ?"

ජූලියන්ගේත් , ජෝර්ජ්ගේත් ඩික්ගේත් මුහුණු මේ වන විට යක්ෂාරූඩ වෙස් ගෙන තිබෙන හැටි ටින්කර්ට පෙනේ . බියත් ලැජ්ජාවත් සමගින් ඇස් දෙකට කඳුලු පිරීගෙන එන ලෙසක් ද උගුර කට සිර වෙන ආකාරයක් ද දැන් දැන් කොලුවාට දැනේ .

" එහෙම නෑ" ටින්කර් කිව්වා නොව තෙපර බෑවා පමනි " මිස්ටර් වූගේ වරදක් මට පේන්නේ නැතේ"

" මම ඌට කැමතිත් නෑ ඌව විස්වාස කරන්නෙත් නෑ . හැබැයි තමුසෙට මොලේ කලදක් නෑ . තාමත් හැසිරෙන්නේ තොත්ත බබා ගානට .තමුසෙගෙ තාත්තට තමුසෙ වගේ දෙන්නෙක් හිටිය නම් සිද්ද වෙන්නෙ බෙල්ලෙ වැල දාගන්ඩ . තාත්තගෙ රහස් එක එකා එක්ක කියවන්න විලි ලැජ්ජාවක් කියලා එකක් නැද්ද / දැනට මත් තමුසෙ කියපු හරිය ඕනැවට වැඩියි . බූරුවා .මතක නැද්ද මිනිහෝ තාත්තගෙ තොරතුරු පත්තරේ දැම්ම ම ඒ මනුස්සයා විදපු කරදරේ වත් අඩුගානේ ?'

වක්කඩක් කැඩුවා සේ සැර පරුෂ හඩින් ජූලියන් කියවාගෙන කියවගෙන යන කොට ටින්කර්ට දැනුනේ තවත් ඔවුන් සමගින් සිටීමට නො හැකි බවක් . බියකරු ශබ්දයක් නැගූ ටින්කර් මිස්චීෆ්ගේද අතින්



DO NOT COPY

sinhalaebooks.com



ඇදගෙන කඩාගෙන බිදගෙන නිවස දෙසට හැල්මේ දුවන්නට තියා ගත්තේ ඒ නිසයි . සිදුවන්නේ කුමක්දැයි අන්දෝ සන්සාරයක් නො දැන මිස් චීෆ් ටින්කර් පසු පසින් දුවගෙන එනවා . ටින්කර් හඩන හඩ ඇසෙන විට නම් මිස්චීෆ්ට කොහොමටවත් උහුලා ගන්න බෑ. ඉකමනින් ම කොලුවාගේ උරයට පැන ගත් අසරණ මිස්චීෆ් ඔහුගේ ගෙළ වැලදගෙන වදුරු භාෂාවෙන් මොන මොනවදෝ දොඩවන්නට පටන් ගත්තේ ,

" ඔයා දුක් වෙන්න එපා ටින්කර් අයියේ . කවුරු නැතත් ඔයාට මං ඉන්නවානේ"

කියනවා වගෙයි .

" කමක් නෑ මිස්චීෆ් . ඔයා මා එක්ක තරහ නෑනේ . උන් කොහොමත් සේරම එක පැත්තක් .අනේ මං ඔය කියන තරම් මෝඩ වැඩක් කරාද ටින්කර් . මම කළේ මගේ තාත්තා ගැන ආඩම්බර වෙන එක විතරයිනෙ'

මිස් චීෆ් ටින්කර්ව බදාගන තව දුරටත් ඉදිරියට ඇදෙනවා . කොයි තරම් වැරදි වුනත් නිවැරදි වුනත් මේ සිටින්නේ මගේ ටින්කර් කියන හැගීම ඌට තියෙනවා . තාත්තාගේ පරීක්ෂන වැඩ කරන කුලුනේ ඉහලින් විහිදෙන ආලෝකයක් ටින්කර්ට දක්නට ලැබුනේ ඒ වෙලාවේදී යි . තාත්තා තාමත් කුලුනට වී පරික්ෂන කටයුතුවල නියැලෙන බව ඒ ආලෝකයෙන් ටින්කර්ට වැටහෙනවා .තාත්තාටත් ජෙනීටත් හමු නො වී කෙසේ හෝ මිස්චීෆ් සමග කාමරයට යාමටයි දැං නම් ටින්කර් බලාපොරොත්තු වෙන්නේ ." ජෙනීට නම් කොහොමවත්

DO NOT COPY

sinhalaebooks.com



මුලිච්චි වෙන්න හොද නෑ .එයා අහයි එයි මං කූඩාරමේ ඉන්නෙ නැතිව ගෙදර ආවේ කියලා .එතකොට මට සේරම කියන්න වෙනවා . එතකොට ජෙනීටත් හිතෙයි මම රහස් එළියට දාන්න හැදුව මෝඩයෙක් කියල"

ටින්කර් මේ දේවල් මේ කියා ගන්නේ තමාට ම ඇසෙන විදිහට යි . හොර රහසින් ම කාමරයට ගමන් කළ ඔහු ඇදට නැග ගත්තා . ආදරණීය මිස්චීෆ් තුරුලු කරගෙන තමාව වටහා ගන්නා එක ම ජීවියා මිස්චීෆ් පමණයි වගේ සිතකින් මිස්චීෆ් සමග මේ වගේ දෙයක් කිව්වා .

" උඹ විතරයි මිස්චිශීෆ් මට ඉන්නේ . ඒ ගොල්ලෝ මගේ හොදම යාලුවෝ ගානට යි මම මෙච්චර කාලයක් හිතුවේ .අපි අර ප්‍රදීපාගාරයේ ඉඳපු කාලයේ ඉදන් ඒක එහෙමයි ..( පන් පසිදුවන් සහ යක්ෂයාගේ නවාතැන කියවන්න) ඒත් දැං ඔයා විතරයි මගේ පැත්තේ ඉන්නේ . උඹ විතරයි මගේ යාලුවා . මේ ජර මර අස්සේ අද රෑට මට නින්ද යන එකකුත් නෑ"

ටින්කර් එහෙම කියද්දී මිස්චීෆ් ද මොන මොනවදෝ වඳුරු භාෂාවෙන් කියන්නට වුනා . කොහොම වුනත් රාත්‍රිය නිදි වර්ජිත එකක් වෙනු ඇතැයි ටින්කර් සිතා සිටියත් උස්සාගෙන ගියත් නො නැගිටින තරමේ නින්දකට ටින්කර ඉක්මනින් ම පිවිසුනා .

ඒත් ටින්කර් ඇත්තට ම අවදියෙන් සිටියා නම් ඔහුටත් උද්වේගකර රාත්‍රියක් ගත කිරීමට ඕනෑ තරම් ඉඩ කඩ තිබුනා

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 11

## ඒ අඳුරු රාත්‍රියේදී

DO NOT COPY

අමනාප වී පිටව ගිය ටින්කර් නැවත කැඳවාගෙන ඒම සඳහා ඔහු පසුපසින් යාමේ බලාපොරොත්තුවක් ජූලියන්ට තිබුනේ නෑ . සෙස්සන් දෙස බලමින් ඔහු මෙසේ කීවේ ඒ නිසයි .

" මෝඩයා තමන්ගේ වරද තේරුම් ගන්න තරම් ඔලුවක් නෑ . ටිකක් ඔහොම තනියෙන් ඉඳපුවාවේ . කරුණු කාරණා තේරිලා මහන්තත්ත කම අතෑරුනා ම ආපහු එයි . දැං කට්ටිය ම ඇඳුම් මාරු කරලා නිදා



Scanned with CamScanner

sinhalaebooks.com



ගන්න ලැස්ති වෙන්න . ආ ර්ට කලින් එක කූඩාරමකට ගිහින් පොඩ්ඩක් මේ ගැන කතා බහ කර ගන්න එක හොදයි''

'' පව් ටින්කර් . කූඩාරමේ ගත කරන පළවෙනි දවසම එයාට මග හැරෙනවානේ . හැබැයි එයා ඒක කියන්න නම් ඇත්තේ තාත්තගේ රහස් කාටවත් කියන්න හිතාගෙන නම් නෙමේ'

ජුලියන් අයියා මොනවා කීවත් පුංචි ඈන්ගේ සංවේදී හිතට ටින්කර් ගැන දැනෙන්නෙ කනගාටුවක් . එයා එවැන්නක් කීවේ ඒ නිසයි . ඒත් ජෝර්ජ් පවා ඈන්ට දුන්නේ මෙහෙම උත්තරයක් .

'' ඒ වුනාට සමාවක් දෙන්න බෑ ඒ කරපු වැඩේට . වෙලාවකට ටින්කර ඕනෑවට වැඩියි . කියන දෙයක් පිළිගන්නෙත් නෑනේ . මට මහන්සියි .අපි අපේ කූඩාරමට යමු .වරෙන් ටිමී'

එවිට ම ජෝර්ජ්ට විශාල ඈනුමක් පිට වුනා . ඩික් ද ඇයට ම එකතුවෙමින් ඈනුමක් පිට කළා . ජුලියන්ට වුනත් ඈනුමක් පිට වෙන්නට යන බව දැනෙන්නට පටන් ගත්තා .

'' ඈනුම් බෝවෙනවා කියන්නේ ඕකනේ .ඒහෙනම් හැමෝම නිදා ගමු . එළියේ තියෙන්නේ හරි ම ලස්සන කාලගුණයක් . බලන්නකෝ අඩ හඳ පායලා තියෙන අපූරුව . ගුඩ් නයිට් කෙල්ලනේ .හොදට ම නිද ගන්න . මොකද රෑට කූඩාරමෙන් ඇතුලට මකුළුවෙක් ඇවිල්ලා උබලා දෙන්නා බෙරිහන් දුන්නොත් ඒම මට ඇහැරලා ඒ ගැන බලන්න බැරි නිසා'



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



" අනේ අනේ ඇත්ත ද මගේ ලොකු අයියණ්ඩිය . ඒ මකුළුවා ඔයාගේ මූන පුරා දුවන්න ගත්තොත් තේරෙයි. ඌ ඔයාගේ නහයේ ඉඳල නිකට ගාවට මකුළුදැලක් වියලා මැස්සෝ අල්ලන්ට පටන් ගත්තම තේරෙයි මකුළුවාගේ රගේ"

පුංචි ඈන් බොරු අමනාපයක් මවා ගනිමින් කියා දැම්මේ කවුරුත් සිනා ගන්න්වමින් . ඒ සිනාව අතරින් ම ජෝර්ජ් මේ වගේ කතාවක් කියන්න්ත් පටන් ගත්තා .

" බිය නොවන්න ඈන් නැගෙණිය . මම ඔබ ව මකුලුවන්ගෙන් සුරකින්නම් .. අහා එ වුනාට උබ කීව කතාව නම් මහ හිරිකිත එකක් . බය වෙන්න එපා ටිමී ඉන්නවනේ .ඌ උඹ ගාවට මකුලුවෙක්ට තියා මැස්සෙක්ටවත් එන්න දෙන්නේ නෑ"

ඉතිං ඔන්න ඔය විදිහට පන් පසිදුවන් කට්ටිය එයාලගෙ නිවාඩුවට ගෙදර ආව දවස හමාර කරන්න සූදානම් වුනා . ඇත්තට ම ඒක සිදුවීම් ගොඩාක් සිදුවුනු ලේසි පහසු දවසක් නම් නො වුනු බව ඔයාලා වුනත් දන්නවා . හැමෝගෙම විදුලි පන්දම් මොහොතකින් නිවී ගියා . සාමකාමී නිස්කලන්ක බවක් හාත් පස පුරා පැතිරෙන්නට පටන් ගත්තා . තාමත් සර්කස් කඳවුරේ කූඩාරම් කිහිපයක ආලෝකය දැල්වෙමින් තිබුනත් එහි වුනත් පැතිර පැවැත්තේ හරි ම සංසුන් බවක් . ඒ අතර කඳවුරේ කවුදෝ වයලීනයක් වාදනය කරන හඩ හරී ම ලස්සනට ඇහෙන්නත් පටන් ගත්තා . ඇත්ත්ට ම හරි ම සිහින් කන්කලු හඩින් ඒ ඇසෙනවාදනය ලමුන්ට දැනුනේ නැලවිලි ගීතයක් වගේ .



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



පාවෙලා ආව වලා කුලු රැසක් සඳ මුවා කර ගනිමින් පරිසරය පුරා පැවති අන්දකාරය තවත් වර්දනය කළා . සර්කස් කඳවුරේ කූඩාරම් වල දක්නට ලැබුණු විදුලි ආලෝකය එකින් එක නිමී යන්න පටන් ගත්තා . නිහඬයාව බිඳින හඬකට තිබුණේ ඈත ගසක වාඩි වී සිටි බස්සෙක් ගොර හැඬි හඬින් පවත්වන සංගීත සංදර්ශනය පමණයි . සුලග පවා හමන්නේ ගතට සිසිලක් වගේ ම නිදිබර ගතිය තව තවත් වැඩි කරමින් .

කවුරු කවුරුත් නිදි දෙව්දුවගේ තුරුලේ හීන වලට මුල පුරමින් හිටියත් ඈන් නම් තාමත් හිටියේ අවදියෙන් . බකුසු සංගීත රාවයත් සුළගට සෙලවෙන ගස් වලින් නැගෙන හඬත් තාමත් ඇයට අසාගෙන ඉන්න හිතෙනවා . ඒත් ඉතිං පුංචි ඈන්ට වුනත් වැඩි වෙලාවක් දැස් ඇරගෙන ඉන්න පුලුවන්කමක් තිබුනේ නෑ .එයත් නොබෝ වේලාවකින් නින්දට වැටුනා . සර්කස් කඳවුරේ කිසියම් අයෙක් කඳවුර පුරා සක්මන් කරන හඬ ඇට නැසුනේ ඒ නිසා ම යි . සඳ වුනත් වලාකුලු සලුවෙන් වැසී සිටි නිසා , කඳවුරු දෙක ම ලෝකය පෙරලුනත් නො හන්න ගානට සිහිහන දකිමින් නිදා සිටි නිසා ඒ අමුත්තා ව දැක බලා ගැනීමේ හැකියාවක් කාටවත් ලැබුනේ නෑ .

ටිමී වුනත් මේ වන විට සුංදර බලු සිහිනයකට පෙරුම් පුරනවා . ඒ වුනත් පුංචි සද්දයකට වුනත් අවදි වීමේ පුදුමාකාර හැකියාව නම් ළමුන් පිරිසේ ආරක්ෂක නිලදාරියාට තියෙනවා . ටිමීට අමුත්තගේ හඬ ඇසුනා . ඌ කන් දෙක ම ඔසවා හොඳින් සවන් දෙන්නට පටන් ගත්තා . ජෝර්ජ් අවදි නොවෙන ගානට පුංචි සිහින් ගෙරැවුම් හඬකුත් නගා තමාට ම මොන මොනවාදෝ කියා ගත්ත ටිමී එළියට ගිහින් අමුත්තාව

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



බෙල්ලෙන් ල්ලා ගැනීමට සූදානම් වුනා . ඒත් .. ඒත් ඉතිං අමුත්තා ළමුන්ගේ කූඩාරම් දෙක අසළට නො එන්නේ නම් ඔහුගේ බෙල්ලෙන් අල්ලා ගැනීමට ටිමීට ඇති රුදාව කුමක් ද ? කොහොම වුනත් ටිමී සූදානම් ශරීරයෙන් වැතිර ගත් තැන ම වැතිරී බලා සිටියා .ඒත් සමග ම මේ දෙගොඩහරි ජාමේ කදවුරේ සක් මන් කරන අමුත්තාද සිහින් හඩින් මොනවදෝ තෙපලනු ටිමීට ඇසුණා . ඒ අමුත්තා තව දුරටත් එතැන් සිට ටිමීට නම් රහසක් වුනේ නෑ .

" ආ මේ චාලිනේ .එහෙනම් ප්‍රශ්නයක් නෑ . ටිකක් එලියේ ඇවිදලා පලයන්කෝ"

කියන්නාක් වැනි සිහින් එරුවුම් හඩක් පිට කළ ටිමී නැවතත් බලු සිහිනයේ ඉතිරි කොටසට සම්බන්ද වුනා .

DO NOT COPY

*************************************************
*

sinhalaebooks.com





peered out of the window again and gave a loud scream



Scanned with CamScanner

sinhalaebooks.com



ජෙනී එක පාරට ම පිපාසයෙන් අවදිවන තුරු වෙනත් කිසිම සද්ද බද්දයක් කාටවත් අහන්නට ලැබුනේ නෑ . ඇය ඇඳෙන් බිමට බැස වතුර වීදුරුවක් අර ගන්නට මේසය දෙසට ඇවිදගෙන ගියා . එතකොට ම තමයි ඇයටත් ටින්කරට අසන්නට ලැබුනු සද්ද බද්ද සේරම අසන්නට ලැබුනේ .

" ඒ නම් ලමයි ටික වෙන්න බෑ " ජෙනී කියා ගත්තේ තමාට ම යි . " මේ දෙගොඩහරි ජාමේ එයාලා ඇහැරලා ඉන්න විදිහක් නෑනේ . ඊටත් ඒ ගොල්ලෝ ඉන්නේ වත්තේ .. එතකොට කවුද මේ කතා කරනවා ඇහෙන්නේ"

කිසියම් වූ බියපත් සිතුවිලි සමුදායක් , ඇගේ ලේ වතුර කරවන පපුවේ ගැස්ම වේගවත් කරවන අදහස් සමූහයක් ඇගේ සිත පුරා ගලා යන්නට වැඩි වේලාවක් ගත වුනේ නෑ .

" දෙවියනේ හොරෙක් ද දන්නේ නෑ . කවුරු හරි මහාචාර්ය තුමාගේ රහසිගත ලිපිගොනු මොනවා හරි ගන්න හදනවද දන්නෙ නෑ . හැබැයි එයා ලිපි ගොනු තියන් ඉන්නේ කුලුණේ නිසා කාටවත් ඒව නම් හොයා ගන්න වෙන්නෙ නෑ මේ ගේ ඇතුලෙන්"

නැවතත් ඇඳ කරා ආ ජෙනී ඇඳේ දිගා වී ගත්තේ නිදා ගන්නා අදහසින් නම් නෙමෙයි . හිතේ මතුවන නිකම්ම නිකම් සැකයක් නිසා මහාචාර්ය තුමා සහ ගෙදර අය ඇහැරවා එකම ගාල ගෝට්ටියක් ඇති

DO NOT COPY

sinhalaebooks.com



කරවීමේ වුවමනාවක් නොතිබුනු ජෙනී එතැන් සිට ඉතාමත් ම හොඳින් සවන් දෙන්නට පටන් ගත්තා . නැවතත් සිහින් සද්ද බද්ද සමුදායක් ම ඇයට අසන්නට ලැබුනේ ඇය ව තව දුරටත් බියට පත් කරමින් .

“ ඒ සද්දේ නම් එන්නේ කුලුන දිහාවෙන් ම තමයි”

ඉන් අනතුරුව තව දුරටත් ඇඳේ වැතිරී බකන් නිලා සිටීමේ හැකියාවක් ඇයට තිබුනේ නෑ . ජනේලය දෙසට ඇවිදගෙන ගිය ජෙනී කුළුණ දිහාවට බැල්මක් හෙලුවත් ඇයට දක්නට ලැබුනෙ පරිසරය වසා පවතිණ තද අඳුර පමනයි . කුළුනෙන් පවා කිසිදු ආලෝකයක් දක්නට ලැබුණේ නෑ . මේ වන විට සඳ වසා ගත් වලා වියන නිසාවෙන් සඳ එලියත් මැකී ගිහින් . ඇය සඳ එළි බිඳක් බිම වැටෙන තුරු බලා සිටියා . ඒ ඉන්න අතරෙත් ඇහෙන සද්ද බද්ද ඇගේ සිතේ ඇති සැකයත් බියත් එන්න එන්නම වැඩි කරවනවා . ඇත්තට ම මේ ඇහෙන සද්ද බද්ද මොනවා විය හැකි ද ? සුළගේ හඬ විය නොහැකි ද ? ඒත් ඒ ඇහෙන්නේ ඇතිල්ලෙන පිරි මැදෙන හඬක් නම් නෙවෙයි . ජෙනීට ඒ ඇහෙමින් තිබෙන්නේ කවුරුන් හෝ මිදුලේ සිට රහස් හඬින් කතා බහ කරන හඬක් .

ජෙනී තව දුරටත් දත කට පියාගෙන සිටීමේ සූදානම නැත . බලාගෙන සිටියා හොඳටෝම ඇති ය . කරන දෙයක් ඉක්මණින් කළ යුතු ය . ඇය වහා දිව ගොස් මහාචාර්‍ය තුමා අවදි කළ යුතුමය . ඔහුගේ වටිනා රහසිගත ලිපි ගොණුවක් හෝ නව සොයා ගැනීමක් හෝ සොරාගැනීම වලකා ලිය යුතුම ය .



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



සඳ එළිය නැවතත් පරිසරය නාවමින් ඇද හැලෙන්නට වුනා . කවුලුවෙන් බලා සිටින ජෙනීට එක පාරට ම දක්නට ලැබුණේ තවත් තත්පරයකුදු බලා නොසිට යටි ගිරියෙන් බෙරිහන් දෙන්නට සිදුවෙන දෙයක් . ඇත්ත වශයෙන් ම අසරන ජෙනී බෙරිහන් දුන්නා ද බෙරිහන් දෙවුනා ද යන්න නම් අදටත් ඇයට හරි හැටි තේරුම් බේරුම් කොට ගත නො හැකි යි.

" හොරු … මෙන්න හොරෙක් ඇවිල්ලා … ෆ්රොෆෙසර් ….. මෙන්න හොරෙක් කුළුණට නගිනවා .. ඉක්මනට එන්න්නෝ … කවුරුත් නැද්දෝ …. පොලීසියට කතා කරන්න .. මෙන්න හොරේක් …."

නැවතත් සඳ වලාකුලකට මුවා වුනේ ජෙනීගේ දර්ශනය අවහිර කරමිනි . යමෙක් ලිස්සා යන සද්දයක් ඇයට අසුණා . ඒ ශබ්දයෙන් පසු ඇයට කිසිවක් අසන්නට ලැබුනේ නෑ . ශබ්දය කුමක් දැයි වටහා ගැනීමෙ හැකියාවක් ද බියපත් ජෙනීට තිබුනේ නෑ .තවත් මොහොතකුදු පමා නොවූ ඇ තරප්පු පෙළ බැස මහාචාර්‍ය තුමාගේ කාමරය දෙසට දුවන්නට පටන් ගත්තේ ඇගේ උච්චම ස්වරයෙන් කෑ ගහන අතරයි

" හොරු … මංකොල්ලකාරයෝ .. සර් ඉක්මනට නැගිටින්න"

ගැඹුරු නින්දක වැටී හුන් මහාචාර්‍ය තුමා උඩ ගොස් බිම වැටුණේ ඒ පාරයි . කොට්ට රෙදි සියල්ල සී සී කඩ විසි කළ එතුමා වහා ම තරප්පු පෙළ පහළට දුවන්නට පටන් ගත්තා . මේ මොහොත වෙන විටත් නිවස තුල කිසිම ආලෝකයක් දැල්වෙන්නේ නෑ . එක් වරම එතුමා සොරා අල්ලා ගන්නට සමත් වුනා . ඒ වුනත් ඒ සොරා නම් නොවන



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



බව වටහා ගන්නට එතුමාට ගත වුනේ තත්පර කිහිපයක් පමණයි . මහාචාර්‍ය තුමාගේ දරදඬු ග්‍රහනයට ලක් වී සිටින අහිංසක මහත දෙහෙත තරබාරු ජෙනී තව තවත් හයියෙන් බෙරිහන් දෙන්නට පටන් ගත්තා .

“ මොන විකාරයක් ද මේ ජෙනී . කෑ ගහලා මුලු ගේම පෙරළන්න ද හදන්නේ ?”

එහෙම අහන අතරම මහාචාර්‍ය තුම කොරිඩෝවේ විදුලි බුබුල දල්වා ගන්නට සමත් වුනා .

“ නරක හීනයක් වත් දැක්ක ද ජෙනී ?”

“ නෑ නෑ සර් එහෙම දෙයක් නෙමේ’ හුස්ම ගන්නට උත්සහ ගනිමින් ජෙනී උත්තර දුන්නා . “ මම දැක්කා කෙනෙක් කුළුණ දිගේ උඩට නගින්න හදනවා. තවත් අය යට ඉන්නවාත් දැක්කා . මිනිස්සු රහසෙන් කතා කරන සද්දෙත් මට ඇහුනා සර් . මට බයයි .අපි දැං මොකද කරන්නේ ? පොලීසියට වත් කතා කරමු ද ?”

“ මුලින් ම සන්සුන් වෙන්න ජෙනී” කරුණාභරිත හඬකින් එසේ කී මහා චාර්‍යතුමා ඊ ලගට සැක මුසු හඬින් මේ වගේ කතාවකුත් කිව්වා .

“ දැක්කේ හීනයක් නෙමේ කියල හොඳට ම විස්වාස ද ජෙනී ? ඇත්තට ම හොරු පැනල නම් අපි පොලීසියට කතා කරමු . ඒත් මෙහාට එන්න පොලීසිය ගොඩක් පරක්කු වෙයි . ඔයා දන්නවනේ ළඟ ම පොලීසිය තියෙන්නෙත් නො සෑහෙන්න දුරින් කියලා’

“ අනේ අනේ ඒත් සර් ඔබතුමා ටෝර්ච් එකකුත් අරන් මේ වෙලාවේ කුළුන පැත්තේ යන්න නම් හිතන්නවත් එපා . ඔබ තුමාගේ නව



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



සොයාගැනීමට අදාල රහසි ගත ලිපිගොනු තියෙන්නේ ඒකෙ බව මම දන්නවා සර් . ඒ නිසා මොනව හරි කරමු . අනේ සර් මම දන්නවා මම ඒවා ගැන දැනගන්න සුදුසු නෑ කියලා . ඒත් මම හැම තැන ම අස් බස් කරද්දී දූවිලි පිහිද්දී ඔය දේවල් දකිනවා .අනේ සර් මට සමා වෙන්න ඕන. ඉබේට ම ඒව දකින එක මට නවත්ත ගන්න බැනේ සර් . ඒත් මම කවදාවත් කාටවත් ඕව ගැන කෙල ඉදක් හෙලලා නෑ සර් . මම ඔබතුමාගේ විශ්වාසය කවදාවත්....''

'' ඇති ඇති ජෙනී . මට ඔයා ගැන කවදාවත් සැක හිතෙන්නේ නෑ .'' තොරතෝච්යක් නැතිව කියවන බියපත් ගැහැණිය දෙස අනුකම්පාවෙන් බලමින් හේලින් මහාචාර්යතුමා කීවේ ඇගේ කන්දොස් කිරියාවෙන බෙරෙන්නත් එක්ක ම යි . ' ඒත් හැම දේම හරිම සංසුන් පාටයිනේ .මම පොඩ්ඩක් එළිය පහළිය බලන්නම් . බය වෙන්න ඕන නෑ . මම හිතන්නේ නෑ එළියෙ කවුරුවත් ඇති කියලා . අනික ජෙනී කාටවත් කුළුණට යන්න බෑ . එහෙම ඇතුළට යනව නම් ඒ කෙනාට එකිනෙකට වෙනස් යතුරු තුනක් ම හොයා ගන්න වෙනවා ඇතුළෙ තියෙන දෝරවල් ටික අරින්න. පොඩ්ඩක් සංසුන් වෙන්න දැන් . බලන්න කවුරුවත් මගේ යතුරුකැරැල්ල අරගෙන ගිහින් නෑ . ඒවා මේසෙ උඩ එහෙමම තියෙනවා''

එවර නම් ජෙනී තරමක් දුරට සංසුන් වෙන්නට පටන් ගත්තා . සේවිකාවක් වුනත් ඇ හේලින් නිවසට දක්වන්නේ ඉතාමත් ලැදියාවක් බව මහාචාර්යතුමා දන්නවා . එතුමා මොනවා කීවත් ජෙනීගේ සැක සහිත බව නම් තාමත් එහෙමමයි .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" ඒත් සර් මට උන්ගේ කතා බහ ඇහුණානේ . අනික මම දැක්කනෙ ඇස් දෙකෙන් ම එකෙක් කුළුණෙ බිත්තිය දිගේ බාගයක් උඩට නැගල තියෙනවා .ඕන දෙයක් වෙන්න අපි දෙන්නම ගිහින්ලා පොඩ්ඩක් බලමු සර් .මට මේක හරියට දැන ගන්න කන් අද නින්ද යන්නෙත් නැති වෙයි'

" හරි ජෙනී" අන්තිමට මහාචාර්යතුමා ලොකු හුස්මක් ඉහළට ගනිමින් කිව්වා . " ඔයාගෙ ඩ්‍රෙසින්ග් ගවුම මාරු කරගන්න . අපි බලමු දොරවල් ඇරල ද කියලා . ඔයා කිව්වා වගේ ඉනිමගක් හරි මොකක් හරි ගෙනල්ලා කවුරු හරි ජනේලෙ ගාවට නැග්ගත් මං හිතන්නේ නෑ මනුස්සයෙක්ට නම් ඒ ජනේලෙන් ඇතුළට රින්ග ගන්න පුළුවන් වෙයි කියලා .හරි හරි කොයිකටත් ගිහින් ම බලන එක හොඳයිනේ ."

ඉතිං ඒ අනුව තවත් මිනිත්තු කිහිපයකින් මහාචාර්ය තුමා සහ ජෙනී සිටියේ කුළුන අසලයි . කුළුන වටේ පිරික්ෂා බලන ඔවුන්ට ඉනිමගක් තැබූ සලකුණක් හෝ යමෙක් කුළුනු බිත්තියේ බඩ ගෑ බවට හෝ කිසිදු සලකුනක් දක්නට ලැබුනේ නෑ . ඒ වගේ ම දොර වුනත් තිබුණේ මහාචාර්යතුමා අගුලු දමා තිබුණු විදිහට ම යි .

" සර් දොර ඇරලා පොඩ්ඩක් උඩට ගිහිඹන් බලන්න . උඩ ම දොරත් තාම ඒ විදිහට ම ලොක් කරල ද කියලා බලන්නකෝ"

දැං නම් මහාචාර්යතුමාගේ ඉවසීමේ සීමාව රතු කට්ට පැන යන්නටත් ආසන්නයි . ජෙනී දකින්නට ඇත්තේ සිහිනයක් බව දැන් දැන් ඔහුට හොඳටෝම විශ්වාසයි . මහාචාර්යතුමා කෝපය සඟවා ගන්නට උත්සහ කරමින් මෙහෙම කිව්වා .



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



“ දැං නම් ජෙනී මට හිතෙන්නේ මේක ඔයාගේ හිතලුවක් හැටියටම තමයි . හරි ඔච්චර ඕන නම් මෙන්න යතුර . මේ දොර ඇරගෙන උඩට ගිහින් මැද්දෙ තියෙන දොරත් ඇරගෙන ගිහින් උඩ ම දොරත් ඇරගෙන ගිහින් බලල එන්න . “

ජැනී මහාචාර්යතුමා අතින් යතුර ගත්තේ බිය නිසා ම තවමත් ගැහෙමින් තිබූ අතින් . ඊට පස්සේ ඇය දොරේ අගුල හැර සර්පිලාකාර හරප්පු පෙල නගින්නට පටන් ගත්තා . මැදි දොරට කිට්ටු වූ ඇයට දක්නට ලැබුණේ එයත් අගුලු ලා වසා ඇති බවක් . ඉතිං ඉහලම දොරත් අගුලු දා වසා ඇති බව ඇයට සහතිකයි . දැං දැං ජෙනීට දැනෙන්නේ වචනයෙන් විස්තර කරන්නට බැරි තරමේ අසරන කමක් . ඒ වගේ ම පොළොව පලාගෙන යන්නට තරම් හිතෙන ලැජ්ජාවකුත් ජෙනීට දැනෙනවා .ගැබුරු හුෂ්මක් හෙලා ලය සැහැල්ලු කොට ගත් ඕ වහා ම දොරවල් යළිත් අගුලු දාමින් තරප්පු පෙළ පහලට දිව ආවා . මහාචාර්යතුමාගේ මුහුණ බලන්න ත් ඇයට දැන් නම් නිකන් මොකක්ද වගෙයි .ඇය සීතලෙන් වෙව්ලන මහාචාරු තුමාට යතුර ආපසු දුන්නේ මෙහෙම කියමින් .

“ සේරම ලොක් කරලා තිබුණේ සර් . ඒත් මට තාම සැකයි සර් . ඇස් දෙක සහතිකේට මම දැක්කා සර් කවුද බිත්තිය දිගේ උඩට නගිනවා . රහසෙන් කතා කරනවත් මට ඇහුණා සර්”

“ ඔයා බොරුවට බය වෙලා තියෙන්නේ ජෙනී . සේර ම ඔයාගේ හිතේ ඇති වුනු සිතිවිලි . හිතන්නකෝ මේ බිත්ති සැහෙන්න උසයිනේ .කාටද මේවා දිගේ නගින්න පුළුවන් …අනික් එක කවුරු හරි ඔය තරම් උස

DO NOT COPY

sinhalaebooks.com



ඉණිමගක් ගෙනාව නම් ඒක උස්සන් එන්න බෑ . ඇදගෙන එන්න ඕන . එතකොට මට නෑහී තියෙන්ඩ විදිහක් නෑනේ''

මහාචාර්යතුමා කීවේ දත් තිස් දෙකම පෙනෙන විදිහේ ඇඹුමක් පිට කරමින් . ඒ අතර ජෙනී ඉතා ම කණගාටුවෙන් සමාව ඉල්ලන්නත් අමතක කළේ නෑ.

" මට සමාවෙන්න සර් . වාසනාවට මගේ සද්දෙන් ටින්කර් ඇහැරුණේ නැත්තේ . අනික මට පුදුම මෙච්චර සද්දයක් ඇහිලත් මිස්චීෆ් පහළට ආවෙ නැති එක''

" ඉතින් මිස්චීෆ් ඉන්නේ ළමයින්ගේ කූඩාරමේනේ''

" නෑ සර් ටින්කරුයි මිස්චීෆුයි දෙන්නා ආවා ගෙදර . මම දැක්කා එයාලා දෙන්නා ඇඳේ නිදාගෙන ඉන්නවා .මට පේන්නේ ටින්කර් ඒ ළමයි එක්කත් මොකක් හරි ප්‍රශ්නයක් ඇති කරගෙන වගේ .කොහොම වුනත් මිස්චීෆ් අපේ සද්දෙ ඇහිලා පල්ලට නාව එක නම් ඇත්තටම හිතා ගන්න බෑ . ඌට මේ වගේ සද්දයක් ඇහුන් නැති වුනේ කොහොමද ?''

" මිස්චීෆ් දක්ෂයි තමයි .ඒත් ටින්කර්ගේ කාමරේ දොර ඇර ගන්න තරම් නම් දක්ෂ නෑ''

මහාචාර්ය තුමා ආයෙත් වතවක් ඇනුමක් හැරියා . ඊ ළගට ඔහු ඉක්මනින් ම ජෙනීට සුබ රාත්‍රියක් පතන්නට වුනේ නැවතත් ඇදට යෑමේ බලාපොරොත්තුවෙන් .

DO NOT COPY

sinhalaebooks.com



නින්දෙන් ඇවිදින්නාක් මෙන් මහාචාර්යතුමා නිදන කාමරයට ගමන් කළා . නිදා ගන්නට සූදානම් වුනු මහාචාර්යතුමා ජනේලයෙන් පිතට බැල්මක් හෙලුවේ සිනාමුසු මුහුණින් . කුකුල් කේන්තිකාරයෙක් හැටියට කවුරුත් වටහාගෙන සිටියත් එතුමාට ජෙනීගේ හැසිරීම සම්බන්දයෙන් නම් ඒ මොහොතේ ඇති උනේ අනුකම්පාවක් මිසක් කෝපයක් නම් නෙමෙයි . උන්නැහේ මේ වගේ දෙයක් තමාට ම කියා ගත්තේ ඒ නිසයි .

" අහින්සක මෝඩ ගෑනි . බොරුවට බයවෙලා .ඉණිමගක්වත් නැතුව මෙච්චර උස බිත්තියක් දිගේ නගින්න පුලුවන් මිනිහෙක් මේ ලෝකෙ ඉන්නවයෑ .අනික ඔච්චර දිග ඉනිමගක් මෙතනට අහසින් කඩා වැටෙන්න යෑ . කාටවත් පේන්නේ නැතිව මේ කට්ට කරුවලේ කවුරුවත් ඔය කුළුනට නගින්න ඉනිමන් ගේනවයෑ"

මෙවන් අටෝරාශියක් සිතුවිලි අතරින් ම මහාචාර්යතුමාට තවත් විශාල ඇණුමක් පිට වුනා .ඊට පස්සේ ඔහු ඇද උඩට නැගුණේ අහස පොළවට කඩාගෙන වැටුණත් උදෑසන වන තුරු අවදි නොවන අදහසින් .

ඒ වුනත් ඇත්ත වශයෙන් ම ඒ රාත්‍රියේ කවුරුන් හෝ අයෙක් කුළුනේ උඩ කාමරයට නැග තිබූ බව නම් කිව යුතුයි .සිහින් මුදු ඇඟිලි ඇති අති දක්ෂ සොරෙකු විසින් මැදියම් රැයේදී මහාචාර්යතුමාගේ කුළුනේ රහසිගත බව බිඳ දමා තිබුණේ ය . ඊ ළඟ දිනයේ උදෑසන කුළුණට යෑමේ අදහසින් පැමිණි මහාචාර්යතුමා උඩු මහළේ දොර විවර කළ විට ඔහු තැනූ මුලු ලෝකය ම විනාශ වූ බව දැනගන්නට ලැබුණා . ඇත්ත වශයෙන් ම ඒ මොහොතේ එතුමාට ඇති වූ කම්පනය හරියට ම ලියන්නට භාෂාවේ වචනත් මදි තරම් .

DO NOT COPY

sinhalaebooks.com



මහාචාරයතුමා වචනයක වත් කතා කර ගත නොහැකිව බලා සිටියා . මුළු කාමරයම කණපිට හරවා පිස්සාගේ පලා මල්ල තත්වයට පත් කොට තිබෙන හැටි දැන් එතුමාට පේනවා . යන්තමින් සිහි එලවා ගත් එතුමාට තමාගේ සටහන් පොතේ පිටු කිහිපයක් ද ඉරාගෙන ගොස් ඇති හැටි දැක ගන්න ලැබුණා .ඒ වුනත් ඇතැම් වැදගත් පිටු තාමත් ඉතුරුවී තිබීමෙන් සොරා තමාගේ පරීක්ෂනය පිළිබඳ ඒ තරම් අවබෝදයක් නොමැති අයෙක් බව නම් ඔහුට වටහා ගන්න පුළුවන් වුනා . මහාචාර්යතුමා ලියන ලද ලියුම් කිහිපයක් ද සොරා විසින් රැගෙන ගොස් තිබුණා . ඒ වගේ ම කාමරය පුරා ම තැනින් තැන තීන්ත බෝතල් ද සොරා විසින් හලා තිබීම නම් ඔහුට වටහා ගන්න අපහසුයි . ගිනි උදුනට ඉහළින් තිබූ කුඩා ඔරලෝසු ව ද අතුරුදන් .සොරා මේ දේවල් මොන හේතුවෙන් සොරකම් කළත් අන්තිමේ ජෙනීගේ මැදියම් රෑ සොරාගේ පැමිණීම ඇගේ හුදු හිතලුවක් පමණක් නොවන බව නම් මේ වන විට තහවුරු වී හමාරයි .

“ දෙයියන්ගෙ නාමෙට දැං වත් මම පොලීසියට කතා කරන්න ඕන .” මහාචාර්ය තුමා හිත සන්සුන් කරගන්නට උත්සහයක් ගනිමින් හිතුවා . “ ඒත් මේක නම් මහ අබිරහසක් . ඇයි ටින්කර්ට රෑ කිසිම දෙයක් ඇහුන් නැත්තෙ ? නෑ ටින්කර්ට ඇහෙන්න නෑ .ඇහුන නම් කොල්ලා අනිවාරෙන් ම මාව ඇහැරවනවනේ . මේක අබිරහසක් ම තමයි . මිනිහෙක් දොරවල් වහල තියෙද්දි උඩට ආවෙ කොහොම ද ? ආව නම් මෙච්චර උස ඉනිමගක් අපේ ඇස් වහලා ගෙනාවෙ කොහොම ද ? අනේ දෙයියනේ .මේක නිකන් අබිරහසක් නෙමේ . මහ අන්තෝ ජටා බහිජටා අබිරහසක්”

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 12

# ටින්කර්ට තිගැස්මක්

DO NOT COPY

පසු දා උදෑසන ටින්කර්ට ඒ තරම් සුබ වාදී උදෑසනක් වුනේ නෑ . වෙනදා මෙන් සුබ උදෑසනක් පතනවා වෙනුවට ඔහුට අසන්නට ලැබුණේ මැදියම් රැයේදී ජෙනීගේ අත්දැකීම් සහ තාත්තාගේ අද උදෑසන කුලුන මත අද්දැකීම් .

" තාත්තා උදේ කුළුනට නගින කොට ම කවුරු හරි කුළුනට ඇතුළු වෙල කියලා දැන ගන්න ලැබුණා .ඇත්තට ම මුලු කුළුන ම අනික්



Scanned with CamScanner

sinhalaebooks.com



පැත්ත හරවලා වගේ ලු . එයා මුලු කාමරේ ම පරීක්ෂා කරලා . එයාගේ වැදගත් ම ලිපි ලේඛන වගයක් හොරු අරන් ගිහින් ලු"



" අනේ දෙවියනෙ .තාත්ත එතන තිබ්බ කොළ හරිම වටිනවා ජෙනී . එයා අර අලුතෙන් හදන්න යන විදුත් නිර්මානයට වුවමනා කරන ඉලක්කම් වගයකුත් ඒ කොල වල තිබ්බා . ඔයාට කියන්න ජෙනී එයා හදන්න ගියේ මහා පුදුම හිතෙන භාණ්ඩයක් .ඒක ඇවිල්ලා ......"

" ඒයි මෝඩ ළමයා . ඔයා ඔය කියවගෙන යන්නේ තාත්තගෙ රහසිගත සැලසුම් ගැන . රහස් කියන්නේ රහස්වලට . මට වත් ඒව ගැන කියන්න එපා ඒ නිසා . ඔයා ඕනවට වඩා වාචාල වෙලා . ඔයා මීට

sinhalaebooks.com



කළිනුත් ඕව ගැන එක එක අය ගැන කියවල තියෙනව ද කියන්න මම දන්නෙ නෑ . කතා කරන්න ගියා ම තැන නොතැන බලන් නෑ ඔයා . ඔයා කාත් එක්ක හරි මීට කළින් ඔය ගැන කතා කරල තියෙනවා නම් දැනටමත් ඒ කෙනා සේරම දන්නවා ඇති”

ටින්කර්ගේ කතාව මැදට පැන ජෙනී කෝපවත් හඩින් එහෙම කියන කොට නම් ටින්කර්ට දැනුනේ පොළොව පළාගෙන යන්නට තරම් හිතෙන ලැජ්ජාවක් . තාත්තාගේ පර්යේශන සටහන් පැහැර ගැනීමට හේතු වුනේ තමාගේ වාචාල කට ද යන සිතුවිල්ලත් ඒ සමගම ටින්කර්ගේ හිතට නැගෙනවා . ඊයේ සර්කස් කාරයින් සමග කල කතා බහත් ඔහුගේ මතකයට ආවා . එතකොට ම ජූලියන් ඔහුට බැන වැදුනු හැටිත් ටින්කර්ට අමතක කරන්න බෑ .දැං ජූලියන්ලා සියල්ල දැන ගනු ඇත . ඔවුන් එවිට ටින්කර්ගේ වාචාල කට ගැන චෝදනා කරනු ඇත . මේ වගේ අටෝරාශියක් සිතිවිලි හිතට එන කොට ටින්කර්ට දැනෙන්නේ කාත් කවුරුවත් නැති පළාතක සැගවෙන්න ඕනේ වගේ හැගීමක් . අනික් අතට තාත්තගේ පර්යේශ්සන සොරකම පුවත් පත් වල ද පළ වීමේ ඉඩකඩක් තිබේ .එවිට බොහෝ පිරිසක් තාත්තා ගේ යක්ෂයා යළිත් අවුස්සමින් කුලුණ නැරඹීම සදහා පැමිණෙනු ඇත .

ඉතා ඉක්මනින් හැද පැළදගෙන ටින්කර් පහත මාලයට දිවගෙන ගියේ මෙවන් සිතුවිලි සිත තුළ පෙරළි කරන අතරෙයි . ඒ අතර ජෙනී ටින්කර්ට මෙහෙම කිව්වා .

“ මට ඊයෙ රෑ කවුරු හරි රහසින් කතා කරන සද්දයක් ඇහුණා . මම තාත්තට කිව්වා කවුරු හරි ඉන්නවා කියලා . ඒත් තාත්ත කිව්වේ මේ කුලුනට කාටවත් නගින්න බෑ ය .. මේක නගින්න නම් ඉනිමගක් ඕන



DO NOT COPY

sinhalaebooks.com



ය .. ඉනිමග ගොඩාක් උස එකක් නිසා අරන් එනව නම් අපිට පේනව ය කියලනේ . ඒත් ටින්කර් ඔයා දැකල තියෙනව නේද අකුලන්න පුළුවන් ඉනිමන් තියෙනවා. අර ලනු දෙකකින් උඩට අදින්න පුලුවන් විදිහේ ඒවා'

" ඔව් ජනෙල් පිරිසිදු කරන කෙනා පාවිච්චි කරන විදිහේ ඒවනේ . ඈ ජෙනී . එහෙම ඉනිමගකුත් තියෙන එකේ මේ වැඩේ කරන්න ඇත්තේ එයා වෙන්න බැරිද ?"

' ඒක නම් වෙන්න බෑ ටින්කර් .එයා ඒ ජාතියේ කෙනෙක් නෙමෙයි . මම මනුස්සයව දන්නේ අවුරුදු විස්සක් තිස්සේ . ඒ නිසා ඔයා එයා දිහා නම් සැකෙන් බලන්න ඕන නෑ . හැබැයි ඉනිමග නම් ඒ ගොල්ලො පාවිච්චි කරන ජාතියේ එකක් බව විශ්වාසයි . මම මේ ටික හෝදලා ඉවර කරපු ගමන් අපි පොඩ්ඩක් එලියට ගිහින් බලමු . කවුරු හරි ඉනිමගක් ගෙනාවා නම් අනිවාරෙන් ම සලකුණු තියෙන්න පුළුවන් . ඒත් මට ඊයේ ඇහුණේ ඉනිමගක් ඇදගෙන එන සද්දෙ නෙමෙයි . කවුරු හරි රහසින් කතා බහ කරන සද්දයක්'

" ඔයාට අර ලිස්සනව වගේ ඇහුණු සද්දෙ ඉනිමගක් අදින සද්දෙ වෙන්න බැරිද ? අයිසේ මිස්චීෆ් මෙච්චර හදියක් වෙලා හැම දෙයක් ම දැනුම් තේරුම් තියෙන උබ මොන එහෙකට ද කිසිම හැල හොලමනක් නැතුව හිටියේ .යකෝ හයියෙන් කොළයක් වැටෙන සද්දෙ ඇහුනත් ඇහැරින උබ බකන් නිලාගෙන හිටිඅයනේ හොරෙක් ගෙට පැනලත්"

ටින්කර් මොනවා කිවත් මිස් චීෆ් නම් ඒ තරම් ගනනකට ගත්තේ නෑ . බුමා බුකවා ගනිමින් මං ආයෙ කතා කරන්නෙත් නෑ ටින්කර් කියා

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



කීවේත් නැත . ඌ වහා ටින්කර්ගේ තුරුලට දුව විත් හුරතල් වෙන්නට පටන් ගත්තා මිස ටින්කර් කිව්ව කිසිම දේකට අමනාපයක් හිත් නොහොඳ කමක් ඇති කර ගත්තේ නෑ .ඒ වුනත් ටින්කර් සිටින්නේ තමා සමග අමනාපයෙන් බව නම් ඌට වැටහෙනවා . ටින්කර්ගේ ස්වරයේ පවතින ස්වභාවය හොඳින් හඳුනන මිස්චීෆ් මොන මොනවදෝ පවසන්නට පටන් ගත්තේ ටින්කර්ගේ සිත සනසවන අදහසින් . ඒ අතර මිස්චීෆ් උගේ තෙත සහිත නාසය කොලුවාගේ නිකටේ අතුල්ලන්නටත් පටන් ගත්තා .

"ටින්කර් ඔයා පොඩ්ඩක් තාත්තා ගාවට ගිහින් එයාගේ හිත හදන්න උත්සාහ කළොත් නරක ද ? එයා කුලුනේ උඩම කාමරේට වෙලා . ගොඩාක් අවුලෙන් ඉන්නේ . අර අපාය වගේ කරලා තියෙන එයාගේ කොළ ටික තෝරනවා"

ටින්කර් තාත්තා හමුවීමට හිතා ගත්තා . ඒ වුනත් තම දෙප සැලෙන බවත් ඒවා වාරු නැති බවත් ඔහුට දැනුනා . ඇත්තට ම තාත්තා ඔහුගෙන් කා සමග හෝ ඔහු ගේ රහසි ගත කටයුතු ගැන කතා කරාද යන ප්‍රශ්නය ටින්කර්ගෙන් ඇසුවොත් ඔහු කුමක් කියන්න ද ? කවුරු නොදැන සිටියත් ඊයේ දවස පුරා ම තාත්තා ගැන කයිවාරු ගැසූ තරම ටින්කර් දන්නවා . ඉතිං ටින්කරට මේ වගේ තම දෙපා වෙව්ලන ගතියක් , අඩියක් ඕ සෙලවීමට නොහැකි අවක් දැනෙන එක පුදුමයක් ද ?

කොහොම වුනත් ටින්කර කුලුන මතට යනවිට තාත්තා සිටියේ ගොඩාක් කායී බහුලවයි . සත්තකින් ම යකා නැටූ පිටියක් වගේ තියෙන කාමරයක සටහන් හොයන එක ලේසි පහසු දෙයක් නෙමෙයි



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



. ඔහු ටින්කර් පැමිණි බවක් වත් දුටුවේ නැති තරම් . ටින්කරුත් වචනයක් වත් කතා කර ගන්න බැරිව තාත්තා දිහා බලා සිටියා .

" ආ ටින්කර්" කොහොමින් කොහොමහරි අන්තිමේදී මහාචාර්යතුමා ටින්කර දිහාවට හැරුනා . " මට පොඩ්ඩක් උදව් කරන්න පුලුවන් නේද ? බලන්නකෝ ඊයේ රෑ හොරු පැනලා සේරම අවුල් කරලනේ .පැනපු මිනිහා මුලින් ම මේසය පෙරලලා .ඒකෙන් ඌට මගේ වටිනාම සටහන් වගයක් නම් මග හැරිලා . ඒත් මට තේරුම් ගන්න බැරි සේරම සටහන් නැතිව හොරකම් කරපු ටිකෙන් ඌ වැඩක් ගන්නේ කොහොමද කියලා . දක්ෂ ම සයන්ටිස්ට් කෙනෙක්ට වුනත් සේරම සටහන් නැතිව ටිකක් චිත්‍රක් අරගෙන තේරුමක් නෑ . අනික වැදගත්ම ටික තමයි ඌ අරන් ගිහින් නැත්තේ"

" ඉතිං ඉතිරිවා ගන්න හොරා ආයෙත් පාරක් එයි ද ?"

" ඒක ම තමා මාත් මේ කල්පනා කලේ . හැබැයි මං ඌට ආය හොයා ගන්න බැරි තැනක මේවා හන්ගනවා . එහෙම මගේ සටහන් හංගලා තියන්න හොඳ තැනක් ඔයා දන්න්ව ද ?"

" ඒත් තාත්තා නිතර ම දේවල් අමතක වෙන ඔයාට ඔය සටහන් හන්ගන තැනත් අමතක වුනොත් මොකද කරන්නේ.අනිත් එක තාත්තේ හොරු අරන් ගිය සට හන් වල පිට පත් , ආකෘති , කටු සටහන් වත් ඔයා ළග නැද්ද ? දැන් ඒවා ආයෙ ගොඩ නගන්නේ කොහොමද ?"

" ඒක නම් ඒ හැටි ප්‍රශ්නයක් නෙමෙයි . මොකද ඒ සංඛ්‍යා සහ රූප සටහන් ලිපි ගොණුවල තිබ්බ වගේ ම මගේ ඔලුවෙත් තියෙනවා .ඒවා

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ආපහු ලියන්න අදින්න ගියාම ටිකක් කාලය ගත්‍ය වෙනව නම් තමයි . ඒත් ඉතින් මොනවා කරන්න ද ? මම සෑහෙන්න මහන්සි වුනා මේ දේවල්වලට . දැං ආපහු මට ඒ මහන්සිය ම යොදවන්න වෙනවා . ඉතිං ටින්කර් ඔයා දැන් මෙතනින් ගියොත් හොදයි . මොකද දැං මං ආපහු නැතිවුනු ලිපි ගොනු ස්කෑස් කරන වැඩේ පටන් ගන්න ඕන"

ටින්කර් වහා සර්පිලාකාර තරප්පු පෙළ බසින්නට පටන් ගත්තේ මහාචායී තුමා කුලුන තුළ හුදෙකලා කරමින් . ඒ අතර ටින්කර්ට කල්පනා වෙන්නේ තාත්තා ගේ ඉතුරු සටහන් ගැනයි .

" එයා ඒවා කොහේ හංගන්න ද දන්නේ නෑ හිතාගෙන ඉන්නේ . කොහොම හරි කමක් නෑ පරිස්සම් තැනක හන්ගනව නම් හොදයි . ගිය සැරේ පරීක්ෂන සටහන් වගයෙක් හැංගුවේ චිමිනියෙනේ . පහුවෙනි ද රෑ ජෙනී චිමිනිය පත්තු කරන්න ගියා සීතල නිසා . වෙලාවට ඒ වෙලාවෙ එයා කොල ටික දැක්කේ . නැත්තම් සේරම අලු වෙලානේ නවතින්නෙ. ඇයි අප්පා අපේ තාත්තා වගේ මහා බුද්ධිමත් මිනිස්සුන්ට මේ වගේ පුංචි දේවල් ගැන දෙයියෝ මොලයක් දීල නැත්තෙ . අනිවාරෙන් ම එයාට එයා සටහන් හන්ගපු තැන අමතක වෙයි . නැත්තම් ඕන කෙනෙන්ක්ට හොයා ගන්න පුලුවන් තැනක එයා සටහන් හන්ගයි'

මේ වගේ සිතිවිලි රැසක් හිත තුල තියාගෙන ටින්කර් ජෙනී සොයාගෙන කුස්සියට පැමිණියා .

" තාත්තා කියන්නේ හොරා අරන් ගිය දේවල් ඒ තරම් හොරාට ප්‍රයෝජනවත් නැති වෙයි කියලා . ඒත් ජෙනී එයා කිඅයනවා හොරාට

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



අරන් යන්න බැරිවුන වැදගත්ම සටහන් ටික අර ගන්න හොරා ආපිට එයි කියලා''

" ආ මේ පාර එන්ඩ කියන්ඩකෝ හොරාට'' ජෙනී කීවේ අත පය උරුක් කරමින් කේන්තියෙන් . " ඔයාගේ තාත්තා ඒ ලිපිගොනු මට හන්ගන්න දෙනවා නම් එහෙම හොරාට නෙමෙයි දෙයියන් වහන්සෙටවත් හොයා ගන්න බැරි තැන ක , මම ඒවා හන්ගනවා''

" මට තියෙන බය එයාට ඒවා හන්ගන තැන අමතක වෙයි කියලයි . අනික එයා අර එක පාරක් විමිනියේ හැන්ගුවා වගේ මෝඩ තැනක ඒවා හැන්ගුවොත් කාට කියන්නද ?

ජෙනී ටින්කර දිහා ශෝකයෙන් බලා සිටියා . ටින්කර් කියන කතාවේ ඇත්තක් තියෙන බව ඇයට පැහැදිලියි . සුළු වේලාවක් කල්පනා කරපු ජෙනී ඔහුට මේ විදිහට යෝජනා කෙරුවා .

" මම කියනd්න හ වැඩ්ක් . අපි දෙන්නා උඩට ගිහින් අර හොරා හලලා තියෙන් තීන්ත සුද්ද කරන්න තාත්තට උදව් කරමු . ඒ විදිහට තත්තා ජෙපර් හන්ගන්නේ කොළුද කියලා බලා ගන්න පුලුවන් . අපිට පුලුවන් එකෙන් තාත්තගේ ජෙපර් පරිස්සම් කර ගන්න. මම හිතන්නේ ඊයේ හොරා ඉනිමගක් ග්බ්නල්ලා උඩට නගින්න ඇති . ඊට පස්සේ උඩට නැගලා ජනේලෙන් ඇතුළට පැනලා ඒවා ගන්න ඇති . කාලකන්නියා . අතට අහුවෙන අහුවෙන ලියවිලි අරගෙන යන්න ඇති''

" එහෙනම් යමුකො කුළුනට . තාත්තා දැන් නම් ඒක ඇතුළේ නෑ වගේ'

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" එයා පොඩියක් වත්ත පිටිය බලන්නට යන්න ඇති . හොරා ගැන හෝඩුවාවක් දෙකක් හොයා ගන්න පුලුවන්ද බලන්න .ආ අර ඉන්නේ . ආන් බලන්න ටින්කර් එයා මොනවද මන්දා අරගෙන යනවා"

" ඒ උදේ පත්තරේ ජෙනී . එයා ඒක කියවන්නයි යන්නේ . මම බයේ ඉන්නේ ඊයෙ හොරකමත් පත්තර වල පලවෙලා ආයෙත් මිනිස්සු මෙහෙ එන්න යන්න පට ගනී කියලා . ඔයාට මතකනේ ගිය සැරේ තාත්තගේ කුලුන ගැන පත්තර වල පලවෙලා තාත්තට තද වෙච්ච තරමක් . ඒ ආව මිනිස්සු මල් ගස් උඩත් ඇවිද්දා"

" ඔව් ඔව් ඉතින් සමහර මිනිස්සු අනුන්ගේ දේවල් හොයන්න කැමතියිනේ . ඔයාට කීවම මොකද මම වලන් හෝදපු වතුර එකක් ජනේලෙන් එලියට දැම්මා . එතනත් මිනිස්සු වගයක් ඉදලා උන් ඔක්කෝම නෑ වුනා . මං දන්නවයේ ඉතිං කුස්සිය අස්සෙත් මිනිස්සු රිංගගෙන ඉන්නවා කියලා"

ටින්කරට බකස් ගා සිනා ගියා .

" අයියෝ මට ඒක දකින්න වාසනාවක් නැති වුන හැටි . අනේ අනේ ජෙනී ආයෙත් මිනිස්සු ඇවිල්ලා තාත්තගේ වැඩවලට ඇගිලි ගහන්න ගියොත් ඔයා හිතල ම ඒ වැඩේ කරන්න . එන්න ජෙනී අපි කුළුනට නැගල බලමු දැන්"

ජෙනී හනි හනික ටින්කර් සමග කුළුන දෙසට ඇවිදින්නට පටන් ගත්තා . එක පරට ම ඇය ගමන නතර කෙරුවේ යමක් හෝදිසි කරන්නට උත්සහ දරනවා වගෙ .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" ඔයා මොනවද බලන්නේ ?"

" ඉණිමගක් ඇදගෙන ආව සලකුණු තියෙද කියල . මට මොකක් හරි ලිස්සන සද්දයක් ඇහුණා කියලා මම ඔයාට කීවේ . හැබැයි ඉතිං ඒක ඉනිමගක් ඇදගෙන සද්දයක් නම් නොමෙයි තමයි ."

එතැන් සිට ටින්කර ද ඉනිමගක් ඇදගෙන ආ සලකුනු තිබේ දැයි විමසිලිමත් වුනා . ඒ වුනත් එවැනි ලකුණක් නම් ඔවුනට දැක බලා ගන්නට හැකියාවක් ලැබුණේ නෑ .

" මම තවමත් කල්පනා කරන්නේ අර ලිස්සන සද්දෙ ගැන"

කියමින් ජෙනී කුළුන බිත්තිය විපරම් කරන්නට පටන් ගත්තා . එය කිරින් සහ බිග් හොලෝවල හමුවන මට සිලුටු ගල් ජාතියකින් නිර්මාණය කොට තිබුණු උස් බිත්තියක් .

" අනේ මන්දා මේ බිතිය දිගේ පූසෙක්ට නම් නගින්න පුලුවන් වෙයි . ඒත් මිනිහෙක් කොහොමද මේ වගේ බිත්තියක නගින්නේ . පූසෙක්ට වුනත් මේක දිගේ නගින එක ලේසි වැඩක් වෙන්නේ නෑ"

" එහෙනම් ඔය කිව්වේ කවුරු හරි බිත්තිය දිගේ නගිනවාත් දැක්ක කියලා . මම හිතන්නෙ ඔයා නිකන් අන්දකාරේ දැක පු මායාවක් වෙන්න ඇති . කට්ට කරුවලේ මිනිහෙක් කොහොමද මේ වගේ බිත්තියක් දිගේ නගින්නේ ?"

" ඔයා හරි" අන්තිමේ ජෙනී ටින්කර්ට එකග වුනේ ඇයට මේ අන්තෝ ජටා බහිජටා ගැටලුව වටහා ගත නොහැකි නිසා ම යි . " මිනිහෙක්ට පිස්සු හැදිලා නැත්තම් ඌ කීයටවත් එ වගේ දෙයක් කරන්න හදන්නේ

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



නෑ .ඒ වුනාට මම ඇත්තට ම දැක්කා මිනිහෙක් නගිනවා කුලුන බිත්තිය දිගේ උඩට . සමහර විට ඔයා කියනවා වගේ කරුවලේ මට පෙනුන හැටි වෙන්න ඇති ඒ . අනිත් එක මට ඉනිමගක් තියෙනවා පෙනුනෙත් නෑ . ඒ නිසා ඇත්තට ම ඒ මගේ හිතලුවක් වෙන්න ඇති . ඉනිමගක් තිබුණා නම් මේ බිත්තිවල සලකුණු තියෙන්න එපා යෑ . හරි හරි අපි ඉකමනට තාත්තා එන්න කලින් කුලුණු කාමරේට නැගලා බලමු ."

ඒ අනුව ජෙනී සහ ටින්කර් වහ වහා සර්පිලාකාර පඩි පෙල නගින්නට පටන් ගත්තා . කුළුනේ දොරටු ඒ වන විට නම් අගුලු ලා තිබුණේ නෑ . ඒකෙන් කියවෙන්නේ මහාචාර්යතුමා ඉක්මනින් නැවතත් කුලුනට පැමිණෙන්නට බලා පොරොත්තු වෙන බවයි . ඒ අතර ජෙනී නෝක්කාඩු හඬකින් ටින්කර්ට කීවේ මෙහෙම කතාවක් .

" මේ සිද්ද වෙන දේවල් වල හැටියට නම් එයා මිනිත්තුවකට වත් මේක ලොක් කරනේ නැතුව එහේ මෙහේ යන එක වැරදියි . මේ බලන්නකෝ හැම තැන ම තීන්ත පැල්ලම් තියෙන විදිහ . අනික අර ලස්සන පුංචි ඔරලෝසුවත් අරගෙන ගිහින්ලනේ .මොන ජාතියේ හොරෙක් ද මන්දා ."

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com





Scanned with CamScanner

sinhalaebooks.com



මේ වන විටත් ඔවුන් සිටින්නේ තාත්තා වැඩ කටයුතු කරන කාමරය ඇතුළෙයි . ඒ අතර එක පාරට ම ජෙනී මහා හඩින් බෙරිහන් දෙන්නට පටන් ගත්තා .

" බලාන්න .. අර තියෙන්නේ තාත්තගේ කොළ නේද ? අර පුංචි ඉලක්කම් තියෙන පේපර්ස් නේද අර මේසෙ උඩ තියෙන්නේ ?"

ටින්කර් ජෙනී විසින් පෙන්වන ලද සටහන් නිරීක්ෂනය කරන්නට පටන් ගත්තා . ඇත්තට ම ඒව තාත්තාගේ වැඩ කටයුතු වලදී ඔහු භාවිතා අරන සටහන් බව හදුනා ගන්නට ටින්කර්ට පුලුවන් .

" ඔව්ව් ඒව තමා .එයා දවසක් මට මේවා පෙන්නලත් තියෙනවා . මට මේ ආකෘතිය හොදට මතකයි . අනේ ජෙනී මෙච්චර හොරකමක් වෙලා තියෙද්දිත් දොරවලුත් ඇරලා දාලා මේ කොලත් මේ විදිහට දාලා එයා ගිහින් පාඩුවේ පත්තරේ කියවන්නේ කොහොමද ? එයා මට කිව්වේ එයාට මේව හන්ගන්න ඕන කියල . අන්තිමට එයාට හොරෙක් ආව බව වත් මතක නෑ වගේ"

" අහන්න ටින්කර් .. එයාට මේව මෙතන දාල ගිය බවක් මතක නැත්තම් අපි ම මේවා කොහේ හරි හන්ගලා හොරාගෙන් බේර ගන්න එකයි කරන්න තියෙන්නේ . අපි මහාචායීතුමා මේවා ගැන අහනකන් ම එයාටවත් මේ ගැන කියන්න ඕන නෑ . මොකද හොරා එක එක විදිහෙන් එයාගෙන් මේ පේපර්ස් ගන්න උත්සහ කරන්න පුළුවන් . ඇත්තට ම මේ කොල හන්ගන්න පුලුවන් පරිස්සම් තැනක් ගැන හිතන්න ටින්කර්"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ඇත්තටම ජෙනී ගේ අදහස මොන තරම් අපූරුද කියලා ටින්කර්ට හිතෙනව . මද වේලාවක් කල්පනා කරපු ටින්කර් ඇයට දුන් පිළිතුරත් ඇත්තට ම අපූරු එකක් .

" මම දන්නවා . අපි ඒවා හන්ගන්න තියෙන හොදම තැන තමා කිරින් දූපත . ගරා වැටිනු බලකොටුව තමා හොද ම . කවුරුවත් අනුමාන කරන්නේ නෑ අපි මේ පේපර්ස් ඒ වගේ තැනක හන්ගයි කියලා"

" හොද අදහස ටින්කර් . මේවා මේ පැත්ත පලාතෙවත් නොතියෙන තරමට පරිස්සම්'

ටින්කර්ට එකග වෙමින් සතුටින් පැවසූ ජෙනී ඉක්මනින් ම මහාචාර්‍ය තුමාගේ සටහන් ටික එකතු කර ගත්තා .ඊ ලගට ඇය ඒ සියල්ලම් ප්‍රවේසම් සහගත අයුරෙන් ටින්කර්ට දුන්නා .

" ඔයා ඉක්මනට ගිහින් මේ ගැන ජූලියන්ට කියන්න . ඊට පස්සේ කට්ටිය ම එකතු වෙලා පුලුවන් තරම් ඉක්මනට කිරින් දූපත ට යන්න . මොන තරම් දෙයක් ද මේ වෙලාවේ ඒ ළමයි මෙහේ ඇවිල්ලා ඉන්න එක.දැං නම් මට රෑට සැන සිල්ලේ නිදා ගන්න පුළුවන් වෙයි .

ටින්කර් සටහන් සියල්ල ම රෝල් කොට කමිසය අස්සේ ඔබා ගත්තා . ඊට පස්සේ මොහොතක් වත් පමා නොවී ජෙනී ද සමගින් සර්පිලාකාර පඩිපෙළ බහින්නට පටන් ගත්තා . දොරටුව අසලට එන විට ම තමයි ඈත සිට කුළුනට පැමිණෙන මහාචාර්‍ය තුමා ඔවුන්ට දකින්නට ලැබුනේ . ඔහු දුර තබා ම ඔවුන් දෙදෙනාට කෑ මොර දෙන්නට පටන් ගත්තා .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" ටින්කර් ජෙනී .. ඔහොම ඉන්ට . ඔයාලා මාව හොයන්න ඇත්තේ අර පේපර්ස් ගැන අහන්නනේ . මම ඒවා හැන්ගුවා . පොඩ්ඩක් මෙහාට ආවොත් මම කියන්නම් හංගපු තැන"

ටින්කර් ජෙනී දිහා බැලුවේ කර කියා ගත දෙයක් නොමැතිවයි . තාත්තා මේ කියන අණ්ඩර දෙමලය ඇත්ත්ට ම ඔහුට තේරුම් ගන්න බෑ . කොහොම වුනත් මහාචාර්‍ය තුමා මයිකෆෝනයකින් තොරව විශාල රැස්වීමක් ආමන්ත්‍රණය කරන ආකාරයෙන් ඔහු සටහන් සැඟවූ තැන ජෙනීටත් ටින්කර්ටත් කියන්නට පටන් ගත්තා .

" මම මගේ සටහන් ලිපි ගොනු සේරම ගල් අඟුරු කාමරේ පිටිපස්සෙම තියෙන ගල් අඟුරු ටිකක් යට හැංගුවා .. මං හිතන්නේ නෑ කාටවත් ඒව නම් ආයෙ හොයා ගන්ට හම්බෙයි කියලා"

ජෙනී මහාචාර්‍යතුමා දිහා බැලුවේ " මූ නම් මහා මෝඩයෙක්" කියන්නාක් වැනි බැල්මක් මුවගට නගා ගනිමින් . ඊ ලගට ඇගේ ඇස් දැලි අඟුරු ගෑවීමෙන් කිලිටි වී ගිය මහාචාර්‍යතුමාගේ ඇඳුම් පැළඳුම් දෙසට මු වුනා .

" ඔයාගෙ කලිසම නම් ගන්න ම දෙයක් නෑ සර් . දෙයියෝ සාක්කි ඔබ තුමා ගිහින් ගල් අඟුරු උඩ වාඩි වෙලාත් හිටිය ද ? ඉන්න පොඩ්ඩක් මම ඔය දැලි ටික ටිකක් පිහදානකම් .නෑ ගේ ඇතුළට යන්න ඕන නෑ . මට බෑ ආයෙ ගේ සුද්ද කරන්න .මෙතනදි ම ඔය අඟුරු ටික පිහ දාගන්න එක හොඳයි"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



මහාචාර්යතුමා ජෙනී දිහාවට හෙලුවේ ප්‍රශ්නාර්ථයට පත් බැල්මක් . ඇත්තට ම මේ තරම් නුවණක්කාර කයුත්තක් කරලත් ජෙනීගෙන් ලැබෙන පිළි ගැනීම නම් මදි කියලයි එතුමාට හිතෙන්නේ .

" ඔයා හිතන්නේ නැද්ද එතන මගේ පේපර්ස් හන්ගන්න හොද තැනක් කියලා ? අහ ඔයාල හිතන්න ඇත්තේ මට මගේ පේපර්ස් හංගන්නත් අමතක වෙයි කියලනේ . බය වෙන්න එපා ළමයි . ඔන්න මං ඒ වැඩේ කරලත් ඉවරයි"

තමා ගැනම අභිමානයෙන් මොන මොනවදෝ තමාටම මුමුණමින් මහචාර්යතුමා එතනින් පිටවී ගියා . ජෙනී ටින්කර් දිහාට හැරුණේ සිනාවකුත් මුහුණෙ පුරෝගෙනයි .

" අනේ අසරණ වයසක මනුස්සයා . එයා ගිහින් ගල් අඟුරු කාමරේ එයාගේ පත්තර ටික හංගන්න ඇති . අර වටින කියන සටහන් එකක් වත් හන්ගන්න එයාට මතක නෑ . හැබැයි ඒකත් හොද වෙලාවට .නැත්තම් පේපර්ස් ටික එහෙම ගිහින් ගල් අඟුරු ගොඩක් අස්සෙ හැංගුව නම් කාට කියන්න ද ? ටින්කර් ඔයා ඉක්මනට ගිහින්ලා තව පත්තර ටිකක් අරන් ඇවිත් තියන්න . මගෙ දෙවියනේ . මොළේ තියෙන මිනිහෙක් ගෙදර ඉන්නකොට මොන තරම් පුදුම දේවල් ද සිද්ද වෙන්නේ . එයා ඊ ළගට මොන විදිහේ දෙයක් කරයිද කියල දන්නෙ දෙයියො තමයි"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 13

## සැලසුම් කිරීම් රැසක්

DO NOT COPY

පුවත් පත් කිහිපයක් යළිත් රැගෙන ඒමෙන් පසුව ටින්කර් ජුලියන්ලා හමුවීමට යාමට තීරණය කළා . පෙර දින රාත්‍රියේ ඔවුන් සමගින් ඇති කර ගත් හිත් නොහොඳකම පවා දැන් නම් ඔහුට මතකයක් නැති තරම් . තාත්තාගේ ලිපිගොණුවල ඉතිරි වී ඇති කොටස කිරින් දූපතේ සැගවීමේ සැලසුම වගේ ම ඊයේ රාත්‍රියේ සිදු වැ ඇති සොරකම සම්බන්දයෙන් ජුලියන්ලා දැනුවත් නොකර සිටීමක් ඇත්ත වශයෙන් ම ටින්කරට නෑ .

ටින්කර් කූඩාරම් දෙසට පැමිනෙන විටත් ළමුන් පිරිස එළි මහනට පැමින සිටිනු දක්නට ලැබුනා .සතුරන් මිතුරන බවට පත් වෙන්නට යන බව වැටහී ගිය නිසාදෝ මිස්චීෆ් වුනත් ටින්කර්ගේ උර මත වාඩි වී සිටියේ දරා නොහැකි තරම් සතුටින් . ළමුන් පිරිස ආහාර පාන රැගෙන ඒම සඳහා සාප්පු සවාරියක් ගොස් කූඩාරම් කරා යළිත් පැමිනෙන අතර වාරයෙයි ඔවුන්ට ටින්කර් සහ මිස් චීෆ් දක්නට ලැබුනේ . ඔවුන් අත



Scanned with CamScanner

sinhalaebooks.com



දක්නට ලැබෙන ආහාර වර්ග දෙස මිස් චීෆ් බලා සිටියේ කෑදරයෙන් පිරුණු දෑසින් .



ටින්කර් කෙරෙන් පළවෙන ප්‍රීතිමත් පෙනුම ජූලියන් තුළ ඇති කළේ සතුටක් . ටින්කර් තමාගේ වැරදි තේරුම් බේරුම් කොට ගෙන ඇතැයි මොහොතකට ඔහුට හිතුනා . ඒ අතර ටින්කර් ප්‍රථමයෙන් ම තම හඬ අවදි කළා .

"හායි .මං ගාව ගොඩාක් ආරංචි තියෙනවා"



Scanned with CamScanner

sinhalaebooks.com



එතැන් සිට ආරම්භ කළ ටින්කර්ගේ කතාව හේතුවෙන් ළමුන් පිරිස ඊ ලග මිනිත්තු කිහිපය ගෙවා දැම්මේ උද්දාමයෙන් හා පුදුමයෙන් විශල් කර ගත් දැස් ඇතිවයි .

" ඒත් ඇයි උඹ කීවෙ නැත්තේ එයා එයාගේ ලිපි ගොනු කියලා හන්ගලා තියෙන්නේ එයාගෙ පත්තර ටික කියලා ?"

ජෝර්ජ් එහෙම ඇහුවේ ටින්කර් යුතුකම් පැහැර හැරියාක් බදු බැල්මක් මුහුණට නගා ගනිමින් .

" එහෙම කළා නම් එයාට ඊට පස්සේ ආපහු එයාගෙ සටහන් ටික දෙන්න වෙනවා . එතකොට එයා ආයෙත් ඒවා හංගන්න ගිහින් කොහේ හරි දාලා එයාටත් අමතක වෙලා සේරම ගන්න දෙයක් නැති වෙයි"

" හොදයි දැං ඔයා ඒවට මොකක්ද කරන්න හිතාගෙන ඉන්නේ" ඒ ප්‍රශ්නය ඉදිරිපත් කළේ ඩික් .

' මට ඒ ටික අතට ගත්තට පස්සේ සර්ව ... පහළ වුනානේ . මම හිතුවා ඒ ටික අපිම හැංගුවොත් හොදයි කියලා .කාටවත් ඒක හොයා ගන්න බැරි තැනක අපි ඒවා හංගමු"

" ඉතිං දැං කොහේද ඒව හංගන්න හිතාගෙන ඉන්නේ ?"

" කිරින් දූපතේ ....." ටින්කර් බෙරිහන් දුන්නේ උතුරා යන තරමේ ප්‍රීතියකින් . " කාටද හිතන්න පුළුවන් තාත්තගේ පරීක්ෂන සටහන් තියෙන්නේ කිරින් දූපතේ කියලා ? අපිට අමතක වෙන්නෙත් නෑ . ආරක්ෂාව වුනත් සියයට එකසිය එකයි . තාත්තට ඒවා ඕනි වුනා ම අපිට ම ඒවා ගෙනල්ල දෙන්න පුළුවන්"

sinhalaebooks.com



"ඔයා මේ ගැන තාත්තට කිව්ව ද ?" ඒ ප්‍රශ්නය ඉදිරිපත් කළේ ජුලියන්

"අම්මෝ නෑ .ජෙනී හිතුවා මේ වැඩේ අපිට ම කරන්න පුලුවන් කියලා .එයා හිතන්නේ අනිවාරෙන් ම හොරු සටහන් වල ඉතිරි ටික හොයා ගන්න ආපහු සැරයක් ගෙට පනී කියල'

ටින්කර් එහෙම කියද්දී ඩික් ගෙනාවේ ඇත්තට ම අපූරු යෝජනාවක් .

"අපිත් හදමු පරීක්ෂන සටහන් ටිකක් . මට වුනත් පුළුවන් ඉලක්කම් ගොඩාක් තියෙන සටහන් ටිකක් හදන්න . මගේ පරීක්ෂන වල ආකෘති එහෙමත් දාලා අපි නියම වැඩක් කරමු . ඊට පස්සේ අපි ඒ ටික කුළුණෙනෙ තියනවා . හොරු ඇවිල්ලා ඒ ටික අරගෙන යනවා .."

"ඒක නම් නියම අදහස ඩික් . හොරු ඒවත් එක්ක ඔට්ටු වෙන වෙලාවේ ඇත්ත සටහන් ටික කිරින් දූපතේ පරිස්සමට තියේවි"

ජුලියන් ප්‍රශංසනීය හඩකින් එහෙම කියද්දී ඊ ළගට ජෝර්ජ් මෙහෙම කිව්වේ ඉතාම උනන්දුවකින් .

"ඉතිං අපි කවද්ද කිරින් දූපතට යන්නේ ? අවුරුදු ගානකින් යන්න බැරි වුනා වගෙයි මට දැනෙන්නේ ..මං අන්තිම වතාවේ දූපතට ගිය වෙලාවෙ මට එපා වුනා .සංචාරක කට්ටියක් ඇවිල්ලා පොලිතින් මලුයි අනම් මනම් දූපතේ හැමතැන ම දාලා ගිහින් .අන්තිමට මං ඒ ටික වෙරළේ වලලා දැම්මා .ඒ මිනිස්සුන්ගේ ගෙවල් වලත් ඒ විදිහට ඇත්තේ කියල මං හිත හදා ගත්තේ"



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



නොසැලකිලි මත් මිනිස්සුන් පිලිබඳව ඒ වෙලාවේ නම් ජෝර්ට වගේ ම අනික් අයටත් දැනුනේ කෝපයක් . කිරින් දූපත විනාශ කරනවට ඇත්ත වශයෙන් ම ළමුන් කවුරුවත් කැමති නෑ .

" ඩික් ජුලියන් දෙන්නා එකතු වෙලා එයාලගේ පරීක්ෂණ සටහන් හදන එක හොඳයි . ටින්කර්ට පුළුවන් එයාලගෙ සටහන් ටික හොරුන්ට ගන්න ලේසි තැනකින් කුලුනේ තියන වැඩේ කරන්න ."

" ඔයාට පුලුවන්නේ ටින්කර්ගේ තාත්තගේ ඇත්ත සටහන් කොල ටික ගිහින් කිරින් දූපතේ හංගන වැඩේ කරන්න"

ඇන් කිව්වේ ජෝර්ජ් දිහාට හැරෙමින් . ඒ අතර ඩික් තවත් අදහසක් එතනට එකතු කළා .

" හැබැයි ජෝර්ජ් ටිකක් කරුවල වැටෙනකන් ඉන්න . මොකද හොරු මේ ළග පාතක ම ඉන්නවා වෙන්න පුළුවන් . ඔයා හදිස්සියේ කිරින් දූපත පැත්තේ යනවා දැක්කොත් එයාලට සැක හිතෙයි . හේලින් මහාචාර්යතුමා ගැන අවධානෙන් ඉන්නවා කියන්නේ උන් ඔයාගෙ තාත්තා දිහාත් ඇහැ ගහගෙන ඉන්නවා වෙන්න පුලුවන් . ඒක නෙමෙයි ටින්කර් .. කෝ දැන් තාත්තගෙ ඇත්ත සටහන් කොල ටික ? ඔයා ඒ ටික කොහෙද තිබ්බේ ?"

" මගේ ජර්සිය අස්සේ" ටින්කර් තම බඩ දිහාවට තට්ටුවක් දැම්මා . ඒ තුළින් නැගුණු සද්දයෙන් ම පරීක්ෂණ සටහන් ඔහු ලග තියෙන බව ළමයින්ට වටහා ගත හැකි වුනා . " මට මේවා ගෙදර දාලා එන්නත් බය හිතුනා . කවුරු හරි මං දිහා බලා ඉන්නවා කියල ම යි මට හිතෙන්නේ"

DO NOT COPY



Scanned with CamScanner

“ අපි තවත් පරක්කු නොවී අපේ පරීක්ෂන සටහන් හදන්නට පටන් ගනිමු . අපි හිතනවට වඩා ඉක්මනට හොරා ආපසු එන්න පුළුවන් . ටින්කර් අපි මේවත් අරන් ඔයාගේ ගෙදරට යන එක හොදයි . අපි ජෝර්ජ්ලාගෙ ගෙදර ගියොත් එයාඅගේ තාත්තා බලයි හදිස්සියෙ ම අපි කඩා පාත් වුනේ ඇයි කියලා .ඊ ලගට අපිව එළවා ගනී . මොකද එයාලා තාම නිරෝදායනයේ නිසා”

“ හරි ඉතිං මගේ තාත්තට අපි මොකක්ද කියන්නේ එතකොට . එයත් බලයි ඇයි අපි මොනවද මේ කරන්නේ කියලා . හැබැයි එක අතකට එයාට අපි ගැන හොයන්න නිනව්වක් තියෙන එකකුත් නෑ . මොකද එයා එයාගේ අලුත් පරීක්ෂනේට යට වෙලානෙ ඉන්නේ . එයා මේ පාර නම් නියම පරීක්ෂනයක් කරන්නේ ....”

ටින්කර් තවත් බොහොමයක් දේ කියන්නට දතකට මැදගෙන හිටියත් ජුලියන් වහා ම හරස් වුනා .

“ කට කට ටින්කර් . උබ දන්නෙම නැතුව උබේ කටින් තාත්තගේ රහස් සේරම එළියට එනවා . හරි . අපි ටින්කර්ගේ ගෙදරට ගිහින් අපේ වැඩ පටන් ගන්න එක හොදයි”

“ එක්කෝ මම ගිහින්ලා තාත්තගේ ලොකු ඩ්‍රෝවින් බෝඩ් එකයි , එයා සිතියම් අදින කොලයි පෑනුයි තීන්තයි අනම් මනම් බඩු ටික කූඩාරමට අරන් එන්න ද ? මොකද දන්නවද සමහර වෙලාවට තාත්තට යන්නෙ එන්නේ කොහේද මතක නැතුව එයාගේ කාමරේ කියලා මගේ කාමරේටත් එනවා .අපි කට්ටිය එකතු වෙලා එයාගෙ බඩුත් එක්ක මොනවද කරන්නේ කියලා අනිවාරෙන් ම බලන්න ඉඩ තියෙනවා . මට

sinhalaebooks.com



මේ විදිහට ම ජර්සි එක අස්සේ දාගෙන ඒවා අරන් එන්න පුලුවන් . ඊට පස්සේ අපි නියමම අනුරූ ටිකක් හදමු''

ටින්කර්ගේ කතාවේ ගත යුත්තක් තිබෙන බව ජුලියන්ට දැනෙනව . ඒ නිසා ඔහු ටින්කර්ගේ අදහසට එකගත්වය පළ කළා .

'' හරි එහෙනම් ඉක්මනට අරගෙන එන්න ටින්කර් . ජෝර්ජ් ඔයත් මෙයා එක්ක යන්න''

ඒ අනුව ජෝර්ජ් ටින්කර් සමග ටින්කර්ගේ නිවස දක්වා ඇවිද යන්නට වුනා . තත්තාට නොපෙනී නිවස දක්වා යාමට ටින්කරට අපහසු වුනේ නෑ . ඔවුන්ගේ කටයුතු අදහා වුවමනා කරන අමුද්‍රව්‍ය සොයා ගැනීමත් ඔහුට අපහසු වුනේ නෑ . පෑන් , කොළ ආදිය තාත්තා අමතක වීමෙන් තැනින් තැන දමා යාමට පුරුදු වී තිබීම ටින්කර්ට දැනුනේ ආශිර්වාදයක් වගේ . ඒ වගේ ම අනුරුවක් නිර්මාණය කිරීමට උපකාරී වන පරණ පොතකුත් සොයා ගන්නට ටින්කර්ට පුළුවන් වුනා . නොයෙක් ජාතියේ රූප සටහන් හා සැකිලි ඒ පොතේ මුද්‍රණය කර තිබෙනවා . ජෝර්ගේ සහයෝගය ද ඇතිව ටින්කර් කලමනා සියල්ල රැගෙන වැට අසළට පැමිණෙන විටත් ජුලියන්ලා නොඉවසිල්ලෙන් එතනට ම වී බලා සිටියා .

'' නියමයි . දැං අපිට හිතේ හැටියට ඉලක්කම් එහෙම දාලා ලිපි ගොනුවක් හදන්නට පුලුවන් .හැබැයි හැම අනුරුවක් ම ඇත්තම ඒවා විදිහට අදින්න ඕන''

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" මොනවා කරන්නත් කලින් අපි කූඩාරමට ගියොත් හොඳයි . නැත්තම් සර්කස් එකේ කවුරු හරි මේ පැත්තේ ඇවිදින්න එහෙම ආවොත් අපි මොකද කරන්නේ කියලා අහයි"

ජෝර්ජ්ගේ කතාවේ ඇත්තක් තිබෙන බව කාට කාටත් වැටහුණා . ඔවුන් කූඩාරම් අතරින් තුබූ විශාල ම කූඩාරම කරා පැමිණියේ ඒ නිසයි . ටිමී නැවතත් දක්නට ලැබීමෙන් මිස්චීෆ් අතිශයින් ම සතුටට පත් වුනා . එ අතර ජූලියන් ඉක්මනින් ම වැඩේ ආරම්භ කලා . දැං ඔහු ඉතා අපූරුවට සංක්හ්‍යා සහ රූ සටහන් කොල වල අඳිනවා . මේ කටයුත්තේ ඔහු නියැලෙන්නෙ ඉතා ම දක්ෂ විදිහට . කවුරු කවුරුත් ඒ නිසා ම ඔහු ඉහා බලාගෙන සිටින්නේ සම්පූර්ණ අවදානය එදෙසට යොමු කරමිනුයි . ඒ අතර ටිමී උගුර යටින් කිසියම් හඩක් නැගුවා .. ටිමී එවැනි හඩක් නගන්නේ කවුරුන් හෝ අමුත්තෙක් ඔවුන් සමීපයේ සිටින බව දැනුම් දෙන්නට බව ළමුන් සිව් දෙනා ම දන්නවා . ටින්කර් වුනත් ඒ ගැන දැන් දැන් යම්කිසි අවබෝදයක් තියෙනව . ටිමීගේ ගොර ගොර හඩින් ඔවුන් ඇත්ත වශයෙන් ම තිගැස්මට ලක් වුනා .ජූලියන් වහා ම ඩ්‍රෝවින් බෝඩ් එක බිම දමා ඒ මත වාඩි වුනා . කූඩරමෙ කැන්වස් දොර විවර කර්ගෙන අමුත්තා එක වරට ම කූඩාරමට ඇතුළු වුනේ ලමුන් පිරිස තක්කු මුක්කු කරමින් . ඒ වුනත් ඒ සිටින්නේ දන්න කියන අමුත්තෙක් .

" ඔහ් ඔහ් ඔ යා නෙ චා ලි" ජූලියන් අමාරුවෙන් වචන ගැට ගැහුවා . මෙතුවක් ළමුන් පුරා පැවති බිය අඥශ්‍යමාන බලවේගයකින් මෙන් අතුරු දන් වුනේ ඒ සමග යි .ඉතිං ඉතිං කොල්ලා කොහොමද අද දවස ?"

sinhalaebooks.com



දත් තිස් දෙකම පෙන්වා මල් සිනාවක් පෑ චිම්පන්සියා ජූලියන්ට අත දුගු කරමින් ආචාර සමාචාර කිරීමේ චාරිත්‍රය පැවැත්තුවා . ජූලියන් උගේ අත සොලවා ප්‍රතිචාර දැක් වීමත් සමග චිම්පන්සියාගෙන් පළ වූවේ පෙර නොවූ විරූ ප්‍රීතිමත් බවක් . ඌ කූඩාරම වටේ ම බලා ළමුන් පස් දෙනාට ම අතට අත දුන්නා .

" වාඩි වෙන්න චාලි . උබ මං හිතන්නේ වෙනදා වගේ ම කූඩුවෙන් එළියට ඇවිත් වටයක් ගහන ගමන් වෙන්න ඇති මේ තක හනියක් අපේ කෑම ගැන බලන්න මේ පැත්තට ගාටන්න ඇත්තේ . අපි කැමතියි උබ මෙහේ ආව එක ගැන . කට්ටිය ම දැන් ඉතින් තියෙන දෙයක් කාලා එහෙම ඉමු"

ඒ අතර ජූලියන් නැවතත් තමන්ගේ කටයුත්ත පටන් ගත්තා . ඩික්ගේ කතාව තේරුම් ගත් ලෙසින් චාලි ටිමී හා මිස් චීෆ් අතර වාඩි වුනා . දැං උගේ දෑස් යොමු වී තිබෙන්නේ ජූලියන් කරන මේ අපූරු කටයුත්ත කුමක්දැයි නිරීක්ෂනය කරන්නට යි .

" චාලිටත් පැන්සලකුයි කඩදාසි කෑල්ලකුයි දුන්නොත් ඌටත් අදින්න පුලුවන් වෙයි "

ඈන් එක පාරට ම අදහසක් ඉදිරිපත් කෙරුවා . ඉතිං ඒ අනුව චිම්පන්සියා ට ත් පැන්සලකුයි කොල කැබැල්ලකුයි ලැබුනා . එතකොට තමයි ළමයින්ට තේරුම් ගත හැකි වුනේ චාලිත් එසේ මෙසේ අයෙක් නොවන බව .

" දෙයියනේ ජූ .. මෙයාත් මාර ගණන් කාරයෙක්නේ . එයා ඔයාව කොපි කරනවා වගේ . ලියන්නෙම ගනන්"



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



පුංචි ඈන් එහෙම කියන කොට ජූලියන් වැඩේ නවතා වාලි එස බැලුවා . ඇත්තට , ම ඈන් නිවැරදියි . වාලීත් ඉතා දක්ෂ අයුරෙන් ජූලියන් ව අනුකරණය කරනවා .

" මිනිහා පරිස්සම් වුනේ නැත්තම් මට මං කරන වැඩේ සම්පූර්ණෙන් ම මිනිහට පවරන්න හිතෙයි . ජෝර්ජ් අපේ ඊ වැඩේ ගැන දැන් කතා කරමු . ඔයා අරවා හංගන්න කිරින් දූපතට යනව නම් තනියෙම යන්න එපා . අනිවාරෙන් ම ටිමීත් අරගෙන යන්න"

ටිමී ව අරන් යන එක නම් ඇත්ත්ට ම ජෝර්ජ්ට අමුතුවෙන් කියන්නට වුව්මනා කාරණයක් නොවෙයි . ඊ ළඟට ඇය උද්දාමයෙන් යුතුව මෙන්න මෙහෙම කිව්වා .

" අනිවාරෙන් ම මම ටිමී අරගෙන යනවා තමයි ජූලියන් . දූපතේ කවුරුත් නෑ කියල මට විශ්වාසයි . ඒ වුනත් තනි නොතනියටත් එක්ක ටිමියා ඉන්න එක වටිනවා . මම කෙලින් ම පෙපර්ස් දූපතට අරන් යන්නම් . ඊට පස්සේ ඒවා හන්ගන්නම්"

" ඔයා කොහේද ඒවා හංගන්න හිතාගෙන ඉන්නේ ?"

ජූලියන් උනන්දුවෙන් ඇහුවත් ජෝර්ජ් නම් ඔහුට දුන්නේ මේ වගේ උත්තරයක් .

" ඒක මම එහාට ගිහින්ල ම තීරණය කරන්නම්කෝ .. අපහු දූපතට බෝට්ටු පදින්න හම්බෙන එක නම් නියමයි . ඊටත් ඊ . ටිමීත් එක්ක . දූපතේ මොනව හරි හන්ගනව නම් ඕන තරම් තැන් තියෙනවා . පේපර්ස් ටිකට කිසිදෙයක් වෙන එකක් නෑ . මහාචාර්යතුමා හිතාගෙන ඉන්නේ



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



එයා ඒවා හැංගුවා කියලනේ . තව ටික දවසක් යන කොට ඒ හංගපු තැන එයාට අමතක වෙයි . අන්න එතකොට එයා පණ කඩගෙන ඒවා හොයන්න පටන් ගත්තා ම අපි එයාට පේපර්ස් ටික ආපහු බාර දෙමු පරිස්සමට"

" ඔව් ඔව් එහෙම තමයි වෙන්න ඕන . එතකන් හොරුන්ට පුළුවන් මගේ ගණිත හා සැලසුම් කටයුතු එක්ක ඔට්ටු වෙන්න. බලන්න . මේවා ඇත්ත ම ඒවා වගේ පේනවා නේද ?"

ඇත්තට ම ජුලියන්ගේ නිර්මානය ඉතා ම සාර්ථක එකක් බව කාටත් පේනවා . ඔවුන් ප්‍රසන්සනීය ඇසින් ඒවා දෙස බලා සිටින විට ජුලියන්ට වුනත් තමා ගැන්බ ඇති වෙන්නේ ආඩම්බරයක් . එතකොට ම ටිමී නැවතත් ගොර ගොර සබ්දයක් නගන්නට පටන් ගත්තා . හැබැයි මේ වතාවේ නම් උගේ හඩ චාලිගේ සම්ප්‍රාප්තියට නැගුණු හඩට වඩා සැර හඩක් .

" මොකක්ද ප්‍රශ්නේ කොල්ලෝ" කියන්නට වගේ චාලි ටිමියාට ආදර බර තට්ටුවක් දැම්මත් ටිමියා නම් සන්සුන් වන පාටක් නෑ. එක් වර ම ලොම් විලිස්සා දත් විලිස්සා සිංහ සෙයියාවෙන් නැගිට ගත් ටිමී මහා හඩක් නගමින් කූඩාරමෙන් එලියට පැන්නා . කවුදෝ මනුස්සයෙක් ඉයපත් හඩින් ,

" අයින් වියං මගේ ඇගෙන් අයින් වියන්"

කියනවා ළමුන්ට ඇහුණා .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



තවත් තත්පරයක් හෝ ළමුන් පිරිස කූඩාරම තුල පමා වුනේ නෑ . ඒ අතරින් ප්‍රථමයෙන් ම එළියට බැස්සේ ජෝර්ජ් . මිස්ට වූ නම් වූ මායාකාරයා ඇයට දක්නට ලැබුණේ ඒ සමගයි . ටිමී ඔහුගේ වලලු කර වටා කැරකෙමින් හපා කන්නට වෑයම් කරනවා .

චාලිගේ හැසිරීම වෙනස් වෙන්නට පටන් ගත්තේ ඒ මොහොතේ නම් හරි ම බයානක විදිහට . මෙච්චර වෙලා කිරියි පැණියි මෙන් හිටියත් වූ මහතාට ටිමී විසින් ඇති කරන තර්ජනය නම් චාලිගේ සංතෝශයට හේතු වුනේ නෑ . දතකට විලිස්සාගෙන ගිරිය පුප්පාගෙන අඩි හප්පාගෙන චිම්පන්සියා ගෝරිල්ලා සෙයියාවෙන් ටිමී දෙසට පැන්නා . චාලි ටිමී කීතු කීතු කරනු ඇතැයි සිතුවිල්ලක් ජෝර්ජ් තුළ හට ගන්නට ඒ පැනපු ආකාරය ම ප්‍රමාණවත් .

" උන් දෙන්නට පැටලෙන්න දෙන්න එපා"

ජෝර්ජ් බෙරිහන් දුන්නේ ඒ නිසයි . වූ මහත්තයා එතකොට ම මුදු හඬින් චාලිට කතා කරන්න පටන් ගත්තා .

" චාලි ඔය ඇති ."

චාලි මෙල්ල කරන්නට වූ මහත්තයාට තවත් එක වචනයක් වත් වුවමනා වුනේ නෑ . ඌ වූ මහත්තයා පසු පසින් විත් ඔහුගේ උරහිස බදා ගත්තේ උතුරා යන තරමේ ආදරයකින් .

හිස නමා ආචාර කළ වූ මහත්තයා ඊ ළගට තම කටහඬ අවදි කරන්නට වුනා . " කොහොමද යාලුවනේ .. මම ඔයාලගේ වැඩවලට මොකුත් බාධාවක් එහෙම කළා ද /"

DO NOT COPY

sinhalaebooks.com





ඊ ළඟට ළමුන් කිසිවක් කියන්නටත් මත්තෙන් ඔහු විදේශික



Scanned with CamScanner

sinhalaebooks.com



උච්ඡාරණය තැවරුණු ඔහුගේ හඬින් තවත් යමක් කියන්නට වුනා .

"මම ආවේ මගේ යාලුවා වාලි එක්ක පොඩ්ඩක් ඇවිදින්න කියලයි . ඉතිං ඔබ අද හවස අපේ සංදර්ශනය නරඹන්නට පැමිණේවී යැයි මා විශ්වාශ කරනවා . එනවනේ ?'

"සමහර විට"

ඩික් ඕනෑවට එපාවට කියා දැම්මා . ඒ වන විටත් ඩික් සිටියේ වෙනත් දෙයක් දකිමින් . ඒ තමයි වූ හෙවත් මැජික් මහත්තයා ජුලියන්ගේ සංඛ්‍යා සහ රූ සටහන් දෙස උනන්දුවෙන් බලා සිටින බව . ඇත්තට ම ටිමියාගේත් වාලිගේත් කලබගෑනිය අස්සේ තම කටයුත්ත සැගවීමේ මතකයක් ජුලියන් තුළ තිබුනේ නෑ .ජුලියන් සටහන් සියල්ල සගවන්නට උත්සාහයක් ගත්තත් ඒ වන විටත් වූ මහත්තයා දැකිය යුතු සියල්ල දැක අවසන් . මායාකරුගේ දෑස් මත කුමක්දෝ සටහන් වනු පැහැදිලිව ම දැං නම් ජුලියන්ට පේනවා . මේ සියල්ල ම ඔහුට ඇති කළේ ප්‍රහේලිකාවක් . ඊයේ රාත්‍රියේ සිදු වූ සොරකම සම්බන්දයෙන් වූ ගේ කිසියම් සම්බන්දතාවක් තිබේ දැයි ජුලියන් හිතන්නට පටන් ගත්තේ එතැන් සිටයි .

"මිස්ට වූ ත් ඉලක්කම් සම්බන්ද මායාකාරයෙක් . අනිවාරෙන් ම මිනිහාට මහාචාර්යතුමාගේ පරීක්ෂන සටහන් වුනත් කියවලා තේරුම් ගන්න බැරි කමක් නෑ ."

කෙසේ වෙතත් වූ මේ මොහොතේ දුටුවේ මහාචාර්ය තුමාගේ ලිපි ගොණු නො වී ම නම ජුලියන්ගේ හිතට කිසියම් සහනයක් සැනසිල්ලක් ලබාදුන්නා .



Scanned with CamScanner

sinhalaebooks.com



" මම ඇවිල්ලා ඔයාලට කරදර කරා නම් සමාවෙන්න ඕන" කැඩී බිදෙන ඉංග්‍රීසියෙන් කියා දැමූ මිස්ටර් වූ ආචාරසම්පන්න ලෙසින් හිස නමා චිම්පන්සියාද සමගින් කූඩාරමෙන් එළියට ගමන් කරන්නට පටන් ගත්තා.වලි තමා යන අතර වාරයේ ඉගි බිගි පාමින් මිස්චීෆ්ටත් තමා සමගින් පැමිණෙන ලෙස යෝජනා කළා . ඒ වුනත් මිස්චීෆ් ටිම්යා අසලට වී බලා සිටියා මිසක වාලී සමග හජනයට යාමට උත්සාහ දැරුවේ නෑ .

" ශික් . මට නිකන් වත් හිතුන් නැනේ සර්කස් එකේ කවුරු හරි මේ පැත්තේ එයි කියලා .ඇවිල්ලා අපි කතාවෙන දේවල් අහගෙනත් හිටියද දන්නෙ නෑ . මම මිනිහ බලාගෙන හිටපු විදිහට කැමති නෑ . ඩික් ඔයා හිතන්නේ අපි කතා වුනු දේවල් මිනිහාට ඇහුනා කියල ද ?"

ජුලියන් ගොඩාක් කණගටුවෙන් එහෙම කියද්දී ඩික් තව දුරටත් මිසටර් වූගේ හැසිරීම සම්බන්දයෙන් ජුලියන්ට ඇති සැකය ගැන තොරතුරු අසන්නට පටන් ගත්තා .

" වූ මහත්තයාට ඇහුන නම් එහෙම ජෝර්ජ් කිරින් දූපතට යන්ව කීව කතාව අපේ දේවල් තව දුරත් රහසක් වෙන්නේ නැනේ .මට දැං නම් ජෝර්ජ් ව තනියම කිරින් දූපතට යවන්න බයයි . අපිට මේකෙදි කාවවත් විශ්වාස කරන්න බැනේ .හොරුන්ට ඇනගන්න ලැබුනොත් ජෝර්ජ් ලියවිලිත් අරගෙන කිරින් දූපතට එනවා කියලා එයා ලොකු අනතුරක වැටෙන්න පුලුවන්'

ඒ වුනත් ජෝර්ජ්ගේ හිතේ නම් දූපතට යන ගමන අවලංගු වෙනවාට ඒ තරම් මනාපයක් නෑ . ඇය ඒ නිසා ජුලියන්ට මෙහෙම කිව්වා .



DO NOT COPY

sinhalaebooks.com



" මෝඩ වෙන්න එපා ජූ . අනික මම තනියම නෙමෙයි යන්නේ . ටිමීත් යනවා මා එක්ක"

" නෑ ජෝර්ජ් මං කියන දේ අහන්න . මම යන්නම් ජේපර්ස් අරගෙන දූපතට . මම දන්නවා ඔයා බෝට්ටුව නවත්තලා තියෙන තැන . ඒ නිසා මට මේ වැඩේ බාර දෙන්න'

ජූලියන්ගේ කතාවට ජෝර්ජ් හයි අල්ලන්න නම් ඉදිරිපත් වුනේ නෑ . සාමාන්යෙන් මුරණ්ඩු හිතුවක්කාර තැනැත්තියක් ලෙස කවුරු කවුරුත් හඳුනන ඇ මේ වතාවේ නම් ජූලියන් සමග තර්ක කර ගන්නට ඉදිරිපත් නො වීම පුදුමයක් .

" හරි අරි ජූලියන් ඔයා කැමති විදිහක් . අපි දැන්වත් කමු ද ?"

" හරි කමු ."

ජූලියන් කිව්වේ සතුටින් . ඇත්තට ම හිතුවක්කාර ජෝර්ජ් වැඩි කතා බහකින් තොරව මෙල්ල කර ගැනීමේ සතුට ඔහුට දැනෙනවා . ජෝර්ජ්ගේ බෝට්ටුව රැගෙන කිරින් දූපතට ගොස් ලිපි ගොනු සැගවීමේ රාජකාරිය තමාට මැනවින් ඉටු කර ගත හැකි බව ජූලියන් දන්නවා . ඒ වගේ ම ප්‍රශ්නයක් ඇති වුනොත් ජෝර්ජ්ට වඩා හොඳින් ඊට මුහුණ දීමට තමාට හැකි බවත් ඔහුට විශ්වාසයි .කොල්ලෙක් වගේ හැසිරුණත් ජෝර්ජ් කියන්නේ ජූලියන් අයියාට තාමත් පුංචි ගැහැණු ළමයෙක් ම පමණයි .

ඉතිං ජූලියන් ඇත්තට ම ඔයා කියනවා වගේ ජෝර්ජ් කියන්නේ ගැහැණු ළමයෙක් ම තමයි . ඒ වුනත් ඇ ඕනෑම කොල්ලෙක්ට වඩා



Scanned with CamScanner

sinhalaebooks.com



නිර්භීත බවත් ඔයා ම කියල තියෙන බව අමතක කරන්න එපා . අනිත් එක .. අනිත් එක ජුලියන් අද රාත්‍රිය ගැන ඕනෑවට වඩා විශ්වාස තබා ගන්නත් එපා …

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 14

## ඉණිමන් සමග විනෝද සිදුවීම් රැසක්

DO NOT COPY

වූහ් හා චිම්පන්සියා පිටව යන ආකාරය ළමුන් බලා සිටියෙ ඉතා වුවමනාවෙන් . චාලි හිස් බාල්දි දෙකක් රැගෙන එන ආකාරය ද ළමයින්ට දක්නට ලැබුනා .උගේ දැතින් ම බාල්දි දෙක ඔසවා ගත් චාලී වතුර ගෙනෙන්න්ට යන මනුස්සයෙකු ලෙසින් වූ මහත්තයා පසු පසින් ඉතා වේගයෙන් ඉදිරියට ගමන් ගන්නට වුනා .



Scanned with CamScanner

sinhalaebooks.com





" අර බාල්දි දෙකකුත් උස්සගෙන මේ හදිස්සියේ චාලි කොහේ යනව ද මන්දා ." ඈන් පුදුමයට පත් හඬින් කිව්වා .

" කොහේ යන්න ද ඉතින් දිය ඇල්ලෙන් වතුර අරන් එන්න යනවා මිසක්. ඔය වතුර ගේනව ඇත්තෙත් වෙන කාටවත් නෙවේ අශ්වයින්ට" ජෝර්ජ් ඈන් නංගීට දැනුම් තේරුම් කොට කියා දුන්නා . ඇත්තට ම ඈ නිවැරදි බව ඉතා ඉක්මනින් ම ඈන්ට ඔප්පු වුනා . ස්වල්ප වේලාවකින් කඳවුර කරා පැමිණෙන චාලිගේ බාල්දි දෙකම ජලයෙන් පිරී තිබුණා .

sinhalaebooks.com



" ඇත්තට ම ඒ ජාතියේ චිම්පන්සියෙක් ඉන්නව නම් වටිනාකම කියල නිම කරන්න බෑ ." ඒ කතාව කිව්වේ ඔවුන් අතරට පැමිණෙමින් සිටි ඩික් විසින් . " ඊයෙ රෑ අශ්වයින්ගෙන් වැඩ පෙන්නපු මේඩ්ලන් ව මතක ද ? මම අද උදේ එයාව දැක්කා . පරණ කලිසමක් එහෙම ඇඳගෙන නිකන් තෙහෙට්ටු පෙනුමෙන් හිටියේ . අර බලන්න චාලි යන්නේ එයා ඉන්න දිහාවට . අශ්වයින්ට තව වතුර ඕනෑ නිසා අනිවාරෙන් ම තව සැරයක් දෙකක් දිය ඇල්ලට යයි"

" මම ඇත්තට ම දැන් නම් චාලිට හුගාක් කැමතියි . ඉස්සරලා මගේ ඒ හැටි මනාපයක් තිබුනේ නෑ . ඒත් දැන් නම් හරි ආස හිතෙනවා මිනිහගේ වැඩ වලට . චාලි ගේ අයිති කාරයා කවුද ? වූ මහත්තයා නෙමෙයිනේ නේද ?"

ඈන්ගේ කටහඬ එහෙම කිව්වා . ඒ අතර ජුලියන් තම කටයුත්ත සම්පූර්ණයෙන් ම අවසන් කළා .

" මම හිතනවා මගෙ වැඩේ හරියට ම මම කලා කියලා . ඒත් ඉතින් වූ මහත්තයා නම් දැං මේක බොරු එකක් කියලා දන්නවා . හැබැයි එයා මේක දැකපු ගමන් නිකන් තක්කු මුක්කු වුනා . හරියට මේ වගේ එකක් ළඟදී දැක්කා වගේ"

" ඌ මගේ තාත්තගේ කුලුන උඩට කවුරු හරි යැව්ව නම් මගේ තාත්තගේ පේපර්ස් ගන්න , ඌ මේ වගේ එකක් දකින්න ඇති තමා . ඒක නෙමේ අපි කට්ටිය සර්කස් එක පැත්තේ රවුමක් දාලා ඉනිමගක් තියෙද කියලා පොඩ්ඩක් හොයල බලමු ද ? හැබැයි අපි හොයන්න ඕන කුලුනෙ ජනේලෙ ගාවට උස තියෙන ඉනිමගක්"



Scanned with CamScanner

sinhalaebooks.com



කෝපයෙන් වගේ කතාව කරගෙන ගියත් ටින්කර් අවසානයේ කළේ හොඳ යෝජනාවක් බව ළමුන්ට හිතුණා . ඩික් නම් ඔහුගේ අදහසට වහා ම එකගත්වය පළ කොට සිටියා

" හොඳ අදහස . අපි යමු එහෙනම් . ඒ ගමන් ම ඔය ඩ්‍රෝවින් බෝඩ් එකයි ඉතුරු ටිකයි වැටෙන් එහාට දාන්න අරන් යමු ජූ . වෙලාවට උඹ වැඩේ ඉවරයක් කළේ"

ඒ අනුව පන් පසිඳුවන් ලා මිස් චීෆ් ද සමගින් සර්කස් කඳවුර දෙසට පල්ලම් බැස්සා . වැඩි දුරක් යන්නට මත්තෙන් තණකොළ වැසී ගත් පොළොව මත දමා තුබූ ඉනිමගක් ඩික්ට දක්නට ලැබුණා .

" ජූලියන් ඒක දැක්කද ? ඒක කුලුනට තරම් උස ඇද්ද කියලා බලන්න"

ඇත්තට ම ජූලියනුත් ඩික් විසින් දුටු ඉනිමග ඒ වන විටත් නිරීක්ෂණය කොට අවසන් . වඩාත් හොඳින් විපරම් කරන අදහසින් ඔහු ඒ දිහාවට ගමන් කළා . ඉණිමග නම් සෑහෙන උසක් සහිත එකක් . ඒ වුනත් එය කුළුනේ ජනේලය අසළට නම් උස නැති ව ඔහුට සහතිකයි . ඊ ළගට ජූලියන් බලාපොරොත්තු වූවේ ඉනිමගේ අයිතිකරු සොයා ගැනීමයි . එයත් ඔහුට අපහසු කරුණක් වුනේ නෑ . මොකද ඒ වන විටත් ඇට කටු නැති මිනිසා ඉනිමග තිබුණු දිහාවට ඇවිදගෙන එමින් සිටියා . දැං නම් ඔහු ඇවිදින්නේ ඇට කටු සියල්ල ම තිබෙන නියම මනුස්සයෙක් ලෙසින්.ඊ ලගට ළමුන් පස් දෙනා හට මද සිනහවකින් සංග්‍රහ කළ මිනිසා ඔවුන් වෙනුවෙන් එක පාරට ම ඇට කටු නැති මෑන් රංගනය ඉදිරිපත් කරන්නට පටන් ගත්තා .



Scanned with CamScanner

sinhalaebooks.com



" නවත්තන්න නවත්තන්න" ඇන් බෙරිහන් දුන්නේ තව දුරටත් ඒ රංගනය බලා ඉවීමේ හැකියාවක් ඇයට නොමැති වූ නිසාවෙන් . " ඔයා ඔහොම රගපානකොට ඇත්තට ම බය හිතෙනවා . ඔයාට මං හිතන්නේ සංදි දෙක තුන ඇති"

ඒ වුනත් ඇට කටු නැති මෑන් වචනයක් වත් කතා කළේ නෑ . සියල් සංදීන් , සියල් ඇට කටු ශරීරයෙන් ඉවත් වුනාක් මෙන් ඔහු බිම ඇද වැටුනා . දං ඔහුගෙන් පළ වෙන්නේ නිකම්ම නිකම් මස් ගොඩක් වන් පෙනුමක් . තව දුරටත් සිනාව නවතා ගත නොහැකි බවක් ළමුන්ට දැනුනේ ඒ නිසා ම යි . ඒ සිනාව අතරින් ජූලියන් බොහොම අමාරුවෙන් ඒ වුනත් කලබලයෙන් වගේ මේ වගේ ප්‍රශ්නයකුත් ඇහුවා .

" අර් .. ඔය වගේ ඇට කටු නැති තාලෙට ඔයාට ඉනිමගක් දිගේ නගින්න පුළුවන් ද ?"

" ඇත්තට ම . ඒක මට ඒ හැටි දෙයක් නෙවෙයි . ඉනිමගක නැගලා ඉනිමග පිටින් ඇවිදින්න වුනත් පුලුවන් . ඉස්සරහට ද පිටිපස්සට ද ? ඇවිදින්න ඕන ?"

" ඒ කියන්නේ මේ ඉනිමගත් ඔයාගෙ ද ?"

" මම ඒක පාවිච්චි කරනව . හැබැයි ඉනිමග මගේ නම් නෙමෙයි ." ඩික්ගේ ප්‍රශ්නයට ඇට කටු නැති මිනිසා දුන්නේ ඒ වගේ උත්තරයක් . ඒ කියන අතරත් ඔහු ඔහුගේ හිස ගෙල වටේ කරකවනවා . ඔහු දිහා බලන විට ළමුන්ට ඇති වෙන්නේ තිගැස්මක් . ඔහුගේ මුහුණ දිහා

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



බලාගෙන පටන් ගත් කතාව මේ වන විට සිද්ද වෙන්නේ ඔහුගේ හිසේ පසුපස දෙස බලාගෙනයි .

" අනේ ඔයා ආයෙ ඔය වැඩේ කරන්න එපා' බියපත් ඈන් වෙව්ලන සුලු හඬකින් කිව්වා . මගේ ඔලුවත් නිකන් කැරකෙනවා වගේ"

" ඔයාට මේකෙන් සර්කස් එකේ වහලට නැගලා කොඩිය එල්ලන්න වුනත් පුලුවන් ඇති නේද ?"

ඩික් ඇගට පතට නො දැනෙන අයුරින් තවත් ප්‍රශ්නයක් යොමු කළා . නමුත් එයටත් ලැබුනේ බලාපොරොත්තු කඩ වෙන උත්තරයක් .

" නෑ . මේක එච්චර උස නෑ . වහලෙ ගොඩාක් උසයි" කතාව අතරෙම ඇට කටු නැති හාදයා මුහුන නිසි ආකාරයට හරවා ගත්තා . ඈන් ගේ ඇගට ලේ පොදක් උනන්නට පටන් ගත්තේ ඊට පස්සෙයි . " වහලේ ගොඩාක් උසයි . මේ ඉනිමගට වඩා උස ඉනිමගක් සර්කස් එකේ තියෙනවා . හැබැයි ඒක නම් තුන් දෙනෙක්ට වුනත් ලේසියෙන් උස්සන්න බැරි එකක් ."

ළමුන් එකිනෙකාගේ මුහුනු දෙස බලා සිටියේ වචනයක් හෝ කතා කර ගත නොහැකිව යි . ඇහෙනම් තවත් ඉනිමගක් සර්කස් කඳවුරේ තිබේ . ඒ වුනත් ඒ සා බර ඉනිමගක් ඊයේ රාත්‍රී කටයුත්තට යොදා ගත්තා යැයි සිතන්නේ කොහොම ද ? මිනිසුන් තුන් දෙනෙකු ඉනිමගක් ඔසවාගෙන හේලින් ඉඩමට ඇතුළු වූවා නම් ජෙනීට තවත් බොහොමයක් ශබ්ද ඇසිය යුතුමය .

" වෙන ඉනිමගවල් නැද්ද ?"



DO NOT COPY

sinhalaebooks.com



එවර නම් ඇටකටු නැති මිනිසා ළමුන් දෙස හෙලුවේ අදහා ගත නොහැකි වූවාක් වැනි බැල්මකි .

" වෙන නෑ . ඇයි හදිස්සියේ ඉනිම්ගක් ගැන අහන්නේ ? ම්ම් .. මම දැං යන්න ඕන . ලොක්කා හම්බෙන්ඩත් තියෙනවා ."

එසේ පැවසූ ඇටකටු නැති මිනිහා ළමුන් හැර දමා එක පාරට ම එතනින් tයන්න ගියා . ඒ යන අතරත් ඔහුගේ අසාමාන්‍ය ගමන් ලතාවක් දැක බලා ගැනීමේ අවිස්ථාවක් ළමුන්ට තිලිණ කරන්නට ඇට කටු නැති හාදයා පසු බට වුනේ නෑ .

" ජිම්නාස්ටික් කාරයෝ ගැන සැක කරන්න බැරි ද ? එයලට නම් එහෙ මෙහෙ නගින එක ඒ තරම් කජ්ජක් නෙමෙයි . මට ආසයි දැන ගන්න එතන බිත්තියක් දිගේ නගින්න පුළුවන් කෙනෙක් ඉන්නව ද කියලා'

ජුලියන් කල්පනාකාරී අයුරින් අදහසක් පළ කරත් ටින්කර් නම් කීවේ මේ වගේ කතාවක් .

" මම නම් හිතන්නේ නෑ ඒ ගොල්ලෝ මේ වැඩේ කරා කියලා . මම උදේ හොඳට බැලුවා .බිත්ත්යේ පොඩ්ඩක් දුරට යනකන් වැලක් තියෙනවා . ඒත් අතර මග දි ඒක ඉවර වෙනවා . එතන ඉදන් තියෙන්නේ ගල් බිත්තිය විතරයි .කොච්චර දක්ෂ ජිම්නාස්ටික් කාරයෙකුට වුනත් කඹයක් වත් නැතිව ඒ බිත්තිය දිගේ නම් උඩට නගින්න බැරි වෙයි"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" එහෙනම් විකටයෝ ගැන පොඩ්ඩක් බලමු ද ? හැබැයි ජිම්නාස්ටික් කාරයෙක්ට නගින්නත් බැරි නම් කවටයන්ට කොහොමත් ඒ වැඩේ කරන්න පුලුවන් වෙයි කියලා හිතන්න බෑ . දැං නම් මට හිතෙනවා හොරා ආවේ සර්කස් එකෙන් නෙමෙයි කියාල .ඒයි අර බලන්න . මොකක් ද අර තියෙන්නේ කියලා"

ජෝර්ජ් එක පාරට ම කිව්වේ තමා ඉදිරියේ බිම තුබූ යමක් දක්වමින්.තද අලු පැහැති ලොම් ගොඩක් වැනි යමක් එහි තිබුණි .ජෝර්ජ් එයට පයින් ඇන බැලුවා ය .

" අහා, මම දන්නවා මේ මොකක්ද කියලා . මේක තමා බූරුවාගෙ හම"

" නියමයිනේ ..." ජෝර්ජ් එහෙම කියන කොට ම ටින්කර් ද සතුටින් බෙරිහන් දුන්නා . ඊ ළගට එය අතට ගත්ත ටින්කර්ට තිබුනේ බූරු හම ඇද බැලීමේ ආසාවක් .. ඒ වුනාට එය අසාමාන්‍ය තරම් බර සමක් බව ඔහුට තේරුණේ එවිට යි .

බූරු චරිතය රඟපෑමේ ආසාවෙන් ගැලවීමේ හැකියාවක් ඩික් ජෝර්ජ් දෙදෙනාට තිබුනේත් නැත . ඩික් වහා රිංගා හිස ප්‍රදේශයේ රංගනය ඉදිරිපත් කිරීමේ වගකීම බාර ගත්තේ එහෙයිනි . ජෝර්ජ් බූරුවාගේ පසුපස කොටස බවට පත් වුනා . බූරු ඔලු ගෙඩිය වූ ඩික්ට නම් අවට සියලුම දේ පැහැදිලිව පේනවා . ඔහුට ඒ දේවල් පෙනෙන්නේ බූරුවාගේ ගෙල ප්‍රදේශයේ ඇති සිදුරු දෙකකින් . ජෝර්ජ් ඇවිදීමේ කටයුත්ත පටන් ගත්තා . එයා ගමන ආරම්භ කරා විතරයි ඔවුන්ගේ ගමන ඇත්තම ඇත්ත බූරු ගමනක් වගේ දිස් වුනා . මේ සියළුදේ ම

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



දිහා බලා ඉන්න අනික් අයට නම් බිම පෙරළිලා වත් සිනාව නවතා ගත නොහැකි වුනා .

ළමුන්ගේ විනෝදයට බාදා වුනේ කවුරු හරි කෑ ගසන හඩකින් .

“ හේ .. උඹලා මොනවද ඔය බූරු හමත් එක්ක කරන්නේ ?”

ඒ කටහඬේ අයිති කාරයා වුනේ වෙනින් කවුරුවත් නොව ජෙරමියි . ඔහු එතනට දුවගෙන ආවේ හරියට ම කුලප්පු වුනු බූරුවෙක් වගේ . ජෙරමිගෙ මුහුණ පුරා ඉතිරෙනෙ දරා ගත නොහැකි තරමේ කෝපයක් .අතේ තිබුණු කෝටුවකින් බූරුවාගෙ පිටිපස්ස කොටසට වැරෙන් පහරක් එල්ල කරන්න තරම් ජෙරමි ඒ මොහොතේ කෝපයට පත්ව තිබුණා . කෝටු පාරෙන් ජෝර්ජ්ට කොර ගැස්සුනා .

“ ඕක නවත්තපන් යකෝ . ගහන්න එපා රිදෙයි’

කෝපවත් හඩකින් එහෙම කෑගැහුනේ ටින්කර් . යාලුවන්ට කවුරුවත් පහර දෙන කොට නම් ටින්කර්ගේ අත පය පවා සටන් වදින්න දඟලනවා .

“ තමුසෙට පිස්සුද ඕයි ? ඒ ඇතුලේ ඉන්නේ ඩිකුයි ජෝර්ජුයි”

ටින්කර් එහෙම කිව්වත් ජෝර්ජ්ගේ පස්ස පැත්තට තවත් කෝටු පාරක් දෙන්න ජෙරමි යන්තමින් අත් පසුබට වුනේ නෑ . ජෝර්ජ්ට එවර නම් වේදනාවෙන් කෑ ගැස්සුනා . තව දුරටත් ජෙරමිගේ මේ හැසිරීම ටින්කර්ට බලා සිටීමේ හැකියාවක් තිබුණේ නෑ .ජෙරමිගෙන් ගුටි වැදුනත් කමක් නෑ වගේ අදහසින් ඔහු කොල්ලාගේ ඇගට පැන්නේ ඒ නිසාම යි . හැම කෝපයක් ම එකතු කොට ගත් ටින්කර් ජෙරමිගේ පපු

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ප්‍රදේශයට පහර පිට පහර එල්ල කලා . එවර නම් ටින්කර් හමුවේ ජෙරමි පරාජයට පත් ් බිම පත බැවී ගත්තා මිස ටින්කර්ට එක පහරක් වත් එල්ල කිරීමේ හැකියාවක් ජෙරමිට ලැබුණේ නෑ .

“ නැගිටපන් . මම උඹට කිව්වනේ දවසක දෙනවා කියල . වරෙන් තව ඕන නම් ගහ ගමු . මම උඹට කියල දෙන්නම් කෙල්ලෙක්ට පහර දෙන එක මොන තරම් ගෑණු වැඩක් ද කියලා”

ටින්කර් ඉහ වහා ගිය කෝපයෙන් , යකා නැටුවා . ඒ අතර ජුලියන් නම් සියල්ල සමථයට පත් කරන්නට උත්සාහයක් ගත්තා .

“ ඔය ඇති ටින්කර් . සීයා මේ පැත්තට එනවා වගේ . ඕක නවත්තමු”

ජෙරමි දෑත් මිට මොළවාගෙන ටින්කර් වටා කැරකෙනවා .ටින්කරුත් මේ වතාවේ නම් ජෙරමි අත හැරීමේ සූදානමක් තිබුනේ ම නැති හැඩයි .ඒ වුනත් කොල්ලන් දෙදෙනගෙන් කාටවත් ක්‍රියාත්මක වීමේ හැකියාවක් නම් ලැබුණේ නෑ . ටැපර් න්නැහේගේ යක්ෂාරූඩ කටහඩ කණ ගාවින් ම මෙන් ඔවුන් දෙදෙනාට ඇසුණා .

“ නවත්තපියව් . රණ්ඩු වෙන එක නවත්තපියව්”

ජෙරමි වැලමිටින් ටින්කරට පහරක් දුන්නේ සීයා එහෙම කියනවාත් සමගමයි . ටින්කර් ඉවතට පැන ඒ පහරින් බේරී ගත්තා . ් ළගට ඔහු ජෙරමිට පහර දීමට සූදානම් වුනා පමණයි . ජෙරමි කඩාගෙන බිදගෙන සීයා දෙසට දුවන්නට පටන් ගත්තා . සීයා ඔහුව අල්ලා ගත්තේ තව දුරටත් සටන පැවතීමේ අවකාශය සම්පූර්ණයෙන් ම නවතා දමමින් .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com






Scanned with CamScanner

sinhalaebooks.com



ඒ අතර ඩික් සහ ජෝර්ජ් දෙදෙනා ද නැවතත් බූරු සමෙන් පිතටට පැමිණීමට සමත් වී තිබුණා . ඔවුන් දෙදෙනාව දකින කොට නම් මහළු මිනිසාටත් ඇති වුනේ සිනාවක් . කෝපවත් බැල්මක් වත් ඒ මුහුනේ තිබුනේ නෑ .කෝපවත් ජෙරමි සෙලවීමටවත් නොහැකි වන සේ අල්ලා ගත් මහලු මනුස්සයා මෙහෙම කියන්නට පටන් ගත්තා .

“ දැන් බොලාලා ඔය ගහ මරා ගන්න එක නවත්තන්න ඕන . දෙන්නගෙන් කාට හරි ගහගන්න ඕන නම් , වන්ඩි නම් මාත් එක්ක ගහගෙන බලමු”

ටින්කර්ටත් ජෙරමිටත් තව දුරටත් ගුස්ති ඇල්ලීමට වුවමනාවක් තිබුණත් නැතත් සීයා සමග නම් පැටලෙන්නට ඔවුන් කාටවත් වුවමනා වුනේ නෑ . හැරත් සීයා වයසට ගියත් තාමත් තමාව මේච්චල් කරන එක ඔහුට පහසු කටයුත්තක් බව ජෙරමි වුනත් දන්නවා .

“ හරි දෙන්නත් එක්කම අතට අත දීලා සමාදාන වෙනවා. මොකෝ අදිමදි කරන්නේ . එක්කො අතට අත දෙනවලා . නැත්තම් මාත් එක්ක ගුස්ති අල්ලන්න එනවලා”

මහළු මිනිසා සමග ගුස්ති ඇල්ලීමේ නොහොබිනා බලාපොරොත්තුවක් නම් සැබැවින් ම ටින්කර්ට නැත . ජෙරමි දෙස විරිත්තා සිනාවක් පළ කළ හෙතෙම ඔහුගේ අත අල්ලා සෙලෙව්වේ අන්න ඒ නිසා ම ය .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" අන්න හොඳයි . ආයෙ දෙන්න පැටලෙන්නෙ නෑ . ඇට කටු කඩ ගන්න හදන්නෙ නෑ .දැං සේරම සංඩු සරුවල් ඉවරයි . අද ඉඳන් ආපහු යාලුයි"

ජෙරමි සීයා දිහාට හැරිලා වහාම එකගත්වය පළ කොට සිටියා . කෝපය වෙනුවට සුපුරුදු සිනා බැලුම් දැන් ඔහුගේ මුවට නැගී තිබේ .

" හරි සීයා ."

ඒ අතර ජෝර්ජ් සහ ඩික් දිහාවට හැරුණු ටැපර් උන්නැහේ පුංචි පහේ අවවාදයක් දෙන්නත් පටන් ගත්තා .

" ඔය දෙන්නා . ආයෙත් බූරු හම ඇඳගෙන නාඩගම් නටන්න හිතුනොත් ඒක කරාට කමක් නෑ . ඒත් ඉතිං අයිතිකාරයාගෙන් අවසර ඇතිව අහලා බලලා ඒ වගේ දෙයක් කරනවා නම් හොඳ යි"

" හරි සර් , සොරි සර්"

සිනා මුහුණින් නැවත වතාවක් ළමුන්ට සංග්‍රහ කළ සීයා තවත් සුලු වෙළාවකින් ඔවුන් තනි කොට තමන්ගේ වැඩකට පිට ව ගියා .ඒ අතර ජුලියන් ජෙරමි දෙසට පැමිණියා . තාමත් ජෙරමිගේ හදිසි ක්‍රියාකලාපය සම්බන්දයෙන් නම් ඔහු තුළ පැහැදීමක් නොතිබුනු හැඩයි . ඒ වුනත් ජෙරමි ළමුන් පස් දෙනා හැර දමා යෑමේ අදහසකින් ද පසු නොවන බව ඔහුට පෙනුනා .

" අපි දැක්කා චාලි අශ්වයින්ට විතුර අදිනවා" ජුලියන් ඔහු සමග වෙනත් කතාවක් පටන් ගත්තේ සිදු වූ සියල්ල ම අකා මකා කර දමමින් . " එයා සෑහෙන්ඩ සවි ශක්තිය තියෙන කෙනෙක් වගේ යි"



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



ජෙරමි ප්‍රීතිමත් සිනාවක් පෑවේ නැවතත් ජූලියන් ලා සමග මිතුරු වීමට ලැබීම සම්බන්දයෙන් සතුටු වූ සිතිනි . ළමුන් සය දෙනා මිස් වීෆ් සහ ටිමියා ද සමගින් සර්කසය පුරා නැවතත් මිතුරු සිතින් ඇවිද යනු කාටත් දක්නට ලැබුනි . ඒ ගමන අතර තුර සුංදර අසුන් සමූහයක් ද පුහුනු වීමක නියැලෙන වෙඩික්කාර ඩික් ද ඔවුන්ට හමු විය . කුඩා ජිම්නාස්ටික් කාරියක ද ළමුන්ට පෙනෙන සේ පිනුම් රැසක් ඉදිරිපත් කළා ය .

මේ වන විට සර්කස් කදවුරේ සෑම සතෙක් ම , සාමාජිකයෙක් ම මිස්වීෆ්ට ලබාදෙන්නේ පුදුමාකාර පිළි ගැනීමකි . ඔවුන් කවුරුත් ඌ දිහා බලන්නේ රඟමඩලට ම අයත් සතෙකු දෙස බලන්නාක් වැනි බැල්මකිනි.මිස් වීෆ් අශ්වයෙකු පිට නැගුනත් අශ්වයා එය මායිම් කළේ නැත .වතුර අරගෙන ඒමේ කටයුත්තේ නියැලෙන චාලිට උදව් කරන සෙයියාවක් මවා පා චාලි පසුපසින් යද්දී ද චිම්පන්සියා පවා මිස්වීෆ්ට අවැඩක් නපුරක් නම් සිදු කලේ නැත . වෙඩික්කාර ඩික්ගේ තොප්පිය රැගෙන පළා යද්දී ද සීයාට අයත් ලෙමනේඩ් බෝතලයක් සොරකම් කොට ගැනීමේ දී ද මිස් වීෆ් දෙස කිසිවෙකුත් කෝපවත් දෑසින් බැල්මකුදු නොහෙලූ බව කිව යුතුවැ තිබේ .

" දන්නෙම නැතුව දවල් කෑම වෙලාවත් ඇවිල්ලා' එක පාරට ම ටින්කර් කියන්නට පටන් ගත්තේ ඔරලෝසුව දිහා බලමින් . " අපි ඉක්මනට යමු . ජෙනී අපි පරක්කු වෙලා කෑමට එනවට ඒ තරම් කැමති නෑ . කොහොමත් අද මෙතනින් ඉක්මනට යන එක හොදයි . චාලි ටිකක් කේන්තියෙන් ඉන්නේ . කොහෙද මේ මිස්වීෆ් මිනිහව අවුස්සනවනේ"

" ඒ මොකෝ ?"



DO NOT COPY
Scanned with CamScanner

sinhalaebooks.com



" ඇයි මතක නැද්ද ? මිස් හොරකම් කරගෙන ආව ලෙමනේඩ් බෝතලයෙ මූඩුව මිස් චීෆ්ට ගලව ගන්න බැරි වුනා ම චාලි ඒක ඇරගෙන ඔක්කොම ලෙමනේඩ් ටික බිව්වා ?"

" ඔව් .."

" ඒකට තද වෙලා මිස් චීෆ් ගිහින් මිනිහගෙ කූඩුව ඇවිස්සුවා ම චාලි මිස් චීෆ් දිහා බලපු විදිහ මට අල්ලන්නේ නෑ . මට හිතෙන්නෙම චාලි අද මොකක් දෝ කේන්තියක් හිතේ තියාගෙන ඉන්නවා වගේ . කොයි එකටත් අපි ඉක්මනට යමු . දැං නම් ජෙනී පුපුරනව ඇති"

ඉතිං ඒ අනුව ටින්කර් ද මිස් චීෆ් ද සමගෙන් පස් පසිඳු පිරිස උණු උණු දිවා ආහාර මේසය සිහියට නගා ගනිමින් වැටෙන් පැන නිවස දෙසට ඉගිලුනා කීවොත් නිවැරදියි . සත්තකින් ම උණු දිවා ආහාරයකටත් , ඒ ආහාර සූදානම් කරන ජෙනීටත් නිකරුනේ බලා සිටීමට ඉඩ තැබීමට නම් කවුරුවත් ම සූදානම් නෑ .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 15

# ප්‍රීතිමත් දවසක් -ජූලියන්ට තිගැස්මක්

DO NOT COPY

ටින්කර් ද සමගින් පස් දෙනා දිවා ආහාරයට යන විට එදා නම් ඕනෑවටත් වඩාපමා වී තිබුණා. ළමුන්ගේ පැමිණීම ප්‍රමාද වීම සම්බන්දයෙන් ජෙනී නම් ඒ තරම් යහපත් සිතින් පසු නොවූ බව නම් කිව යුතු ම යි.

" ආ ඇති යන්තම් කන්න ඕන කියල කට්ටියට මතක් වෙලා. තව විනාඩි පාහක් බලලා කෑම මේසෙ අස් කරල දාන්නයි මං හිතාගෙන හිටියෙ"

ජෙනී සිටින්නේ ඒ තරම් හොඳ හිතින් නොවෙන බව ටින්කර්ට වැටහෙනවා. ඔහු ඇයවා වැළඳගෙන ඇගේ සිරුරට හැකි තාක් බර කරන්නටපටන් ගත්තේ යාප්පුවෙන් ජෙනීගේ හිත හදන බලාපොරොතුවෙන්. වැළඳ ගැනීමේ ආදරේ තරම කොයි තරම් ද කිව්වොත්



Scanned with CamScanner

sinhalaebooks.com



දැං නම් ජෙනීට හීල්ලෙනවා. ඒ අතර ම ටින්කර් මෙහෙම දෙයකුත් කියන්නට අමතක කළේ නෑ.

" අනේ අපේ ජෙනී.. ඔයා කවදාවත් අපිට කෑම නැති කරන්නේ නෑ... අම්මෝ මේවගෙ සුවඳ.. ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම!"

" අනේ අනේ ටින්කර් උබයි උඹේ ම්ම්ම්ම්ම්ම්ම යි" ජෙනී අමනාප මුහුණක් මවා ගෙන ටින්කර්ව එහාට තල්ලු කරමින් කීවත් ඇගේ මුහුණ පුරා ගලා යන සිනාව නම් ළමයින්ට පැහැදිලිව ම දකින්නට ලැබුනා. " ඔක්කොම වැරදි වැඩ්ඩ කරලා එනවා මෙතන හුරතල් වෙන්න. මම අහුවෙයි කියල හිතේ. යනව අහ්කට මෝඩ ටින්කරයා. ආයෙත් මාව බදා ගත්තොත් මම දෙහි ගෙඩියක් වගේ පුපුරයි"

ඒ වගේ අමුතු හිනා යන කතා කියන එක නම් ජෙනීට අමුතු දෙයක් නෙමේ. මෙච්චර මහත ජෙනී දෙහි ගෙඩියක් වගේ වෙයි කියල හිතෙන කොටත් ළමයින්ට හිනා යනවා. ආහාර පිසීම සඳාහා ඇටෞදව් වෙන්නට තමාට අමතක වීම ගැන නම් ඈන්ගේ හිතට හරිම කනගාටුයි. කොහොම වුනත් ඔවුන් එක්ව සිටින විට වෙලාව ගත වෙන්නේ ඕනෑවටත් වඩා ඉක්මනින්.

මිස් චීෆ් සමග එක් වී ආහාර ගැනීමත් ලේසි පහසු කටයුත්තක් නො වෙයි. කෑම මේසයේදී උගේ වඳුරු ගති සේරම එළියට එනවා. සෑම පිගානකට ම අත දමා කෑම ගැනීමේ කැත පුරුද්ද හැමදාමත් ඌට තියෙනවා.ඒ වුනත් ඒ කැත පුරුද්දේ හරිම ලස්සන කාරණාවකුත් තිබෙන බව නම් නොකියා ම බෑ. කෑම් පිගන්වලින් ඌ ලබා ගන්නා ආහ්හාර මේසය යට සිටින ටිමීට දෙන්නත් මිස් චීෆ් යන්තමින් වත් මැලිකමක් දැක්වූවේ නෑ.ඒ අතර ජෝර්ජ් නැවතත් ඔවුන්ගේ අබිරහස නැවතත් එළියට ගත්තා.



DO NOT COPY

sinhalaebooks.com



"මම සර්කස් එකේ කොතනකවත් කුලුනට නගින්න තරම් උස ඉනිමගක් නම් දැක්කෙ නෑ"

" එහෙම එකක් තිබ්බත් ඒක හංගලා ඇත්තේ. ඔය අබ එක මෙහාට එවන්න"

ඩික් කිව්වා. ඒ අතර ජූලියන් ද කතාවටඑක් වෙමින් මේ විදිහට කිව්වා.

" අනේ අනේ ඩික්. උබ වගේ මෝඩයෙක්. ඇස් දෙක ඉස්සරහ තියෙන අබ භාජනේ මූට පේන්නේ නැති හැටි. මට වෙලාවකට හිතෙනවා අපි මේ යන්නේ වැරදි පාරක ද කියලත්. තාත්තගෙ ලියවිලි හම්බුනා ම යි කියමු. ඒව හොරකම් කලත් මිස්ට වූ ඒවයින් මොනව කරන්න ද? අනික ඔය මනුස්සයා අච්චර උස ඉනිමගක් තිබ්බත් ඕක දිගේ නගී කියලත් හිතන්න බෑ"

" ඔව්. ඒ වගේ ම එයා ගොඩක් ආචාරශීලියි. මට නම් හිතා ගන්නවත් බෑ සර්කස් කාරයෙක් ඔය තරම් ආචාරශීලී වෙන්නෙ කොහොම ද කියලා. ඒත් ඉතින් ඒ වගේ මනුස්සයෙක් ඔය පේපර්ස් හොරකම් කරාවි කියලා හිතන්නවත් බෑ"

ඒ අදහස ඉදිරිපත් වුනේ ඈන්ගෙන්. ඒ අතර ජූලියන් ඊට මෙහෙම කියන්නට පටන් ගත්තා.

" ඒත් ඉතින් වෙන කාට ද ඔය අංක වල තේරුම තේරුම් ගන්න පුලුවන් ? මට ඒකයි මිනිහ ගැන සැක හිතෙන්නෙත්. ඒත් එහෙමයි කියලත් මට හිතෙනවා මං වැරදියි කියලත්. කුලුන ගාවට උස ඉනිමගක් සර්කස් එකේ නෑ. තිබ්බත් වූ මහත්තයට එච්චර උසක් නගින්නත් බෑ. ඊටත් බයක් හැකක් නැතිව කරුවල වැටුනට්ට පස්සෙ වත්තෙ ඉනිමගකුත් උස්සන් එයි කියලත් මිනිහ දිහා බැලුවම හිතන්ට අමාරුයි. එහෙම ආව නම් අනිවාරෙන් ම එයා ව අහුවෙනවා"



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



" හරි. කාටවත් දොරවල් අරින් නැතුව පඩි පෙළ දිගේ නම් කුලුනටයන්න බෑ. ඉනිමගක් පාවිච්චි කරපු බවට සලකුණුත් නෑ. එතකොට කොහෝමද ජේපර්ස් අතුරුදන් වුනේ?"

ටින්කර් කල්පනා කාරී හඩින් කියන කොට ඈන්ට තවත් අදහසක් පහල වුනා.

" සමහර විට හුළගට ගහගෙන ගියා දන්නෙ නෑ." ඈය කිව්වා. " ඒ වගේ දෙයක් වෙන්න බැරිද ?"

" ඉතින් හුළගට ගහගෙන ගියා නම් ඒවා වත්තේ තියෙන්න එපායැ. අනික අර වගේ පුංචි ජනේලෙකින් කොහොමද එහෙම දෙයක් වෙන්නේ. ඊයෙ රෑ මහ ලොකු හුළඟක් තිබුනෙත් නෑනෙ."

ජුලියන්ගේ පැහැදිලි කිරීම සත්තකින් ම තර්කාණුකූල පැහැදිලිකිරීමක්.

" ජනේලෙන් කවුරු හරි ආවෙත් නැත්තම් , දොරවල් වලින් කවුරුත් ගියෙත් නැත්තම් ලියවිලි අතුරුදන් වුනේ කොහොම ද ? මායාකර්මයකින් අතුරුදන් වුනා වෙන්ට බෑ නොවැ. එහෙම දේවල් මේ ලෝකෙ නෑ"

ජෝර්ජ්ගේ කතාවෙන් පස්සේ ළමුන් අතර ඇති වුනේ මද නිහැඩියාවක්. ඒ අතර ඈන්ට නම් තවත් අදහසක් හිතට ආවා. මහාචාර්යවරයා නින්දෙන් ආඇවිදින පුද්ගලයෙක් දැයි ඈ විමසා සිටියේ ඒ නිසා.

" මම නම් හිතන්නෙ නෑ නින්දෙන් ඇවිදින මිනිහෙක් වුනත් දොරවල් ඇරගෙන පඩිපෙළ නැගලා කුලුන උඩට ගිහින් තමන්ගෙම ජේපර්ස් බිම පෙරලලා , වැඩිය වටිනාකමක් නැති ටික හොරකම් කරලා ආයෙත් දොරවල් වහගෙන පඩි පෙළ බැහැලා ජේපර්ස් ටික කොහේ හරි හංගලා ආයෙත්



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



පහුවෙනිදා උදේ පේපර්ස් නෑ කියලා කෑ ගහාවි කියලා. ඒ ජාතියේ නින්දෙන් ඇවිදින මිනිස්සු ගැන මං අහලා නෑ. "

ජුලියන් නැවතත් තර්කාණුකූල අදහස් දැක් වීමක් සිදු කළා. ඩික් ද ඒ අදහසට එකඟ වුනා.

" ඔව් ඔව් කීයටවත් එහෙම දෙයක් වෙන්න බෑ. ටින්කර් තාත්තා නින්දෙන් ඇවිදින කෙනෙක් ද ?"

" එයාට වැඩිය තදින් නින්දයන් නෑ කොහොමත්. එයා නින්දෙන් කවදාවතඇවිදලා නෑ."

" එහෙනම් මේ වැඩේ කරල තියෙන්නෙ හරිම අසාමාන්‍යය මිනිහේක්. මිනිහා මොන විදිහේ කෙනෙක් වුනත් ඔය පේපර්ස් ගන්න ලොකු වුවමනාවක් තිබ්බ කෙනෙක් "

" ඒක ඇත්ත " ජුලියන් එකඟ වුනා. " ගොඩාක් වුවමනාව තියෙන මිනිහෙක් නම් ඉතුරු සටහන් ටික ගන්න ආයෙත් වතාවක් නො වැරදීම උත්සාහ කරනවා. හොදම දේ තමා තාමත් අපි ගාව හොඳ ම පේපර්ස් ටික තියෙනවා කියන එක."

" ඔව් අපි අද ඒවා මගේ දූපතේ හැංගුවට පස්සෙ ඒවා ගොඩක් ප්‍රවේශම් වෙයි. "

" මටත් ඒ ගැන විස්වාසයි ජෝර්ජ්. මොකද කාටවත් හිතන්න බෑ ලියවිලි තියෙන්නෙ දූපතේ කියලා. මම හිතන් ඉන්නෙ ඒවා බලකොටුවේ කොහේ හරි තැනක හංගන්න. ටින්කර් . කෝ ඒ ලියවිලි ටික. ඔයාගේ ජර්සිය නම් පිම්බිලා නෑ. ඒ කියන්නේ ඒවා ඔයා අතේ නෑ කියන එකනේ"



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



" ජෝර්ජ් ඒ ටික ඉල්ල ගත්තනෙ. එයා කිව්වෙ මගෙ අතින් ඒවා නැති වෙන්න පුලුවන් කියලා. ජර්සිය අස්සෙ දා ගෙන ඉන්න එකෙන්. ඒවා කොහෙද ජෝර්ජ්. ?"

කවුරුත් ජෝර්ජ් දිහා බලාගෙන හිටියේ ඇගේ පිළිතුර අපේක්ෂාවෙන්.ඒඒ වුනත් ඇ ලියවිලි සැග වූ ස්ථානය පැවසීමට නම් ජෝර්ජ් කිසිදු කැමැත්තක් දැක් වුවේ නෑ.

" මේ වෙලාවේ මගෙන් ඒ ගැන අහන්න එපා"

" ඇයි බැරි" ටින්කර් ඇසුවා." මෙතන ඉන්නේ අපි විතරනේ. හොරා අපි ව අහගෙන නැති නිසා ඔයාට පුලුවන් කියන්න. "

" බෑ කිව්වනේ"

" ආ හරි හරි මට තේරෙනවා. ඔයා ඉන්නේ තරහෙන්. ජුලියන් ඔයාට ලියවිලි ගෙනියන්න නො දී එයා ඒවත් අරන් දූපතට යන එක ගැන ඔයා අවුලෙන් ඉන්නේ"

ටින්කර්ගේ ඒ කතාවට නම් ජෝර්ට ටින්කර්ගේ අම්මා මුත්තා මතක් කරන්න හිතෙනවා. ඇය කෝපවත් හඩකින් මෙහෙම කිව්වා.

" කට වහනවා ටින්කරයා. මිස් චීෆ් මගේ ලෙමනේඩ් එකට අත දාන එක නැවැත්තුවෙ නැත්තන් ටින්කර් මම ඒක ඊ ළඟට උඹේ ඔලුවට එවනවා. බලනවා මූගෙ කැත වැඩ"

" අනේ ඉතිං මිස්චීෆ්ට ඕවා තේරෙන්නේ නෑනේ. ඔයා ඉන්නේ ජුලියන් ලියවිලි ගෙනි යන එක ගැන අවුලෙන් නිසයි ඔහොම කේන්ති ගන්නේ"

DO NOT COPY



Scanned with CamScanner



ටින්කර් නැවත වතාවක් කිව්වා. ඒ වතාවේ නම් ජූලියන් මේසයට යටින් ටින්කර්ගේ කකුලට පා පහරක් එල්ල කෙරුවා. ඇත්තට ම මේ ටින්කර් ට ජෝර්ජ් අවුස්සන්නේ නැතුව ඉන්න බැරි හැටි. ටින්කර් ජූලියන්ට ප්පහරක් එල්ල කිරීමට සැරසී ගත්තත් ඊ ළඟට තමාට වඩාත් සැර පහරක් ජූලියන්ගෙන් එල්ල වෙනු ඇතැයි සැකයක් ඔහුට ඇති වුනා. ඒ නිසා ම පාඩුවේ සිටීම යහපත් කටයුත්තකැයි වහා ම ටින්කර් තේරුම් ගත්තා. ඔහු නිශ්ශබ්දව ම මිස්වීෆ් ජෝර්ජ් අසළින් ඉවත් කර ගත්තා. ටිමීගේ කරවටා දැවිත් යැවූ මිස් වීෆ් ජෝර්ජ්ගේ ලෙමනේඩ් එකට ආයුබෝවන් කියා ටිමියා සමග විනෝද වන්නට

sinhalaebooks.com



පටන් ගත්තේ එයින් අනතුරුව යි. ටිමී කිහිප වතාවක් ම මිස් චීෆ් ව ලෙව කමින් මිත්‍රත්වය තහවුරු කර ගත්තා.

කෑමෙන් පසුව ළමුන් පිරිස මුලින් ම කළේ ආහාර පිගන් අස් පස් කිරීම සඳහා ජෙනීට උපකාර කිරීමයි. එයින් අනතුරුව මුහුදේ නෑමටයෑමේ අදහසක් ඉදිරිපත් කරන ලද්දේ ඈන් විසින්. ජෙනීටත් ඔවුන් සමග පැමිණෙන ලෙසින් ළමුන් ඇවිටිලි කළත් ජෙනී නම් මුහුදේ විනෝද වීමට ඒ තරම් කැමැත්තක් දැක් වුනේ නෑ. නමුත් ඇය මුහුදේ දිය නෑම සඳහා ළමුන්ට අවශ්‍ය කරන සියලුම කලමනා ලබා දුන්නා. ජූලියන් සමඟ කිරින් දූපතට යෑමේ කැමැත්තක් ටින්කර්ගේ හිතට ඇති වුනේ ඔය අතර වාරයේදීයි. නමුත් ජූලියන් ඒ අදහසට නම් එකහෙලා ම විරුද්ද වුනා. ඔහු කියා සිටියේ තනිව ම දූපතට යෑම ටින්කර් සමග යෑමට වඩා ආරක්ෂා සහිත බවයි.

ඉතින් ඒ හවස් යාමය ළමුන්ට සැබැවින් මෙතාමත් ම ප්‍රීතිමත් සැඳෑ යාමයක් වූ බව නම් නො කියා ම බෑ.මුහුදේ දිය නෑමෙන් අනතුරුව ඉතා ප්‍රනීත තේ මේසයක් ඔවුන්ට ලබා දෙන්නටත් ජෙනී කටයුතු කොට තිබුනා.ටිමීගේ හිත සුව පිනිස නෑමෙන් අනතුරුව වෙරළ තීරය ඔස්සේ ටික දුරක් ඇවිදින්නට යන්නත් ළමුන් අමතක කළේ නෑ.ඒ අතර වාරයේ ජූලියන් ඉදිරි සැලසුම් ඉදිරිපත් කරන්නන්නට පටන් ගත්තා.

" තව ටිකක් කරුවල වැටුනට පස්සේ මම බයිසිකලෙන් කිරින් වලටයන්නම්. ඔයාගේ බෝට්ටුව වෙනද තැන ම ගැට ගහල ඇති නේද ජෝර්ජ්. අයියෝ මටත් දුකයි මේ ගමන ඔයාව එක්කගෙන යන්න බැරි වෙන එක්ක ගැන. මට ඔයාව කරදරේ දාලා මෙහාට වෙලා ඉන්න බෑ. මම යන්න කලින් ඔයා මට අර ලියවිලි ටික ආපහු දෙන්න. මම හිතන්නෙ ඒවා ඔයා කොහේ හරි හංගල ඇති කාටවත් හොයා ගන්න බැරි වෙන්න"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ජෝර්ජ් ලියවිලි තියෙන තැනක් කියන්නට උත්සහ කළේ නෑ. ඒත් සමග ම ඈන්ට විශාල ඇනුමක් පිට වුනා. මාර්තෘකාවෙන් පිට පැනපු ඈන් ඇගේ ඇනුම ගැන අලුත් කතාවක් පටන් ගත්තා.

" ඉක්මනට ගිහින් එන්නකෝ ජූලියන්. අද මට කලින් ම නිදා ගන්න ඕන වගේ. අද කලින් ම කරුවලත් වැටීගෙන එන්නේ. දවස ම පීනලා මට හොඳට ම මහන්සියි"

ඩික්ට ද ඒ අතර ඈන්ගේ ඈණුම බෝ වෙලා තිබුනා.

" මටත් අද නම් ඉක්මනට ම නිදා ගන්න ඕනි වගේ. ඔයා ගිය ගමන් ම අපිත් කූඩාරම්වලට ගිහින් නිදා ගන්නවා. ජූ.. සේරට ම කලින් ඔයා යනවා බලන්න ඕනි මට. එහෙනම් කෙල්ලනේ දැං අපි යමු"

ඒ අනුව ගැහැනු ළමයින් දෙන්නා ටිංකර් ද සමගින් කූඩාරම් දෙසට ගියා. ජූලියන් ඩික් සමග මද වේලාවක් ප්‍රමාද වුනේඑ ජෙනීට නිවසේ ජනෙල් දොරවල් වැසීම සඳහා උදව් කිරීමේ බලාපොරොත්තුවෙන් .

" ගුඩ් නයිට් ජෙනී. අපි ගියා ම ඉස්සරහ දොර වහගන්න විතරයි දැං ඔයාට තියෙන්නේ. අද නම් ඔයාට හොඳට නිදා ගන්න ලැබේවා කියල මං ප්‍රාර්ථනා කරනවා"

ඩික් ගොඩාක් කරුණාවෙන් කිව්වා. ඒ අතර ජේනී ඔහුට පිළිතුරු දුන්නා.

" මම ඉතිං කොහොමත් හොඳාට නිදා ගන්න මනුස්සායනේ.. ඔයාලා ගොඩාක් පරිස්සම් වෙන්න ඕනී. හරි ද ? අර කොළ ටිකත් කාටවත් ම හොයා ගන්න බැරි තැනක හංගන්න ඕනී"

ඒ අතර ජූලියන් ඩික් සමඟ කඳවුර දෙසට ඇවිදින්න පටන් ගත්තා.

DO NOT COPY

sinhalaebooks.com



" මම ඉක්මනට ටිමී එක්ක රවුමක් දාලා එන්නම්"

ඇන්ට ඇසෙන සේ පැවසූ ජෝර්ජ් ඇන් කූඩාරමට යන තුරු බලා හිඳ හනි හනික ටිමියා ද සමගින් එහා පැත්තට ගියා. මේ කොයි යන්නේ වගේ අදහසකින් ටිමී බලාගෙන සිටියේ ජෝර්ජ් මේ තකහනියක් සූදානම් වන්නේ කුමක් කරන්නට දැයි වටහා ගත නොහැකිව යි.

ඩික් සහ ජූලියන් අයියලා කූඩාරමට පැමිණෙන විටත් ටින්කර් සිටියේ ඇණුම් යවමින්. මිස් වීෆ් ඔහුගේ දෙපා අසළ පැටලෙමින් ලබා දෙන උණුසුම වුනත් ටින්කර්ට සුව නින්දකට කරන ආරාධනයක් වගේ.විටින් විට ඔරලෝසුවත් , කූඩාරමෙන් පිතටත් නිරීක්ෂනය කරමින්න් ජූලියන් තම ගමනට කල් යල් බලන්නට වුනා.

" හොඳට ම කරුවලයිනේ" ජූලියන් කිව්වා. " ඒත් කමක් නෑ හඳ එළියත් තියෙනවනේ. අයියෝ මට ජෝර්ජ්ගෙන් ලිපි ගොණුව ගන්න බැරි වුනානෙ. ඔක්කොට ම කළින් එයාගෙන් ඒක ඉල්ලගෙන මම කිරින්වලට බයිස්සිකලෙන් යන්නම්"

" හරී. " උද්දාමයෙන් පිරී තිබුණත් ඩික්ගේ කටහඩ නම් නිදිමත බේරෙන හඩක්. " උඹ දන්නවනෙ ජෝර්ජ්ගේ බෝට්ටුව තියෙන තැන ? ඒක හොයා ගන්න එක අමාරුවක් වෙන එකක් නෑ . ගත්ත ද ටෝර්ච් එක ?"

" ඔව්.අලුත් බැටරියකුත් සමඟ. බලනව එලිය"

ජූලියන් විදුලි පන්දම දල්වා කිහිප විටක් ම ඩික්ට පෙන්නුවේ ය. ඇත්තට ම එයින් විහිදුනේ ප්‍රබල ආලෝකයකි. සියල් කටයුතු සම්බන්ද සුබවාදී සිතින් අවසානයේ ජූලියන් ගැහැණු ළමුන් දෙදෙනා ගේ කූඩාරම දෙසට පිය නැගුවේ මෙවැන්නක් සඳහන් කරමින් .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" මම දැං පේපර්ස් ටික ගන්න එනවා ජෝර්ජ්"

ජුලියන් ගැහැණු ළමුන්ගේ කූඩාරමට ගියා. අනපේක්ෂිත යමක් සිදුවෙමින් පවත්නා බවට හැඟීමක් යන්තමින්වත් ඔහු තුළ තිබුණේ නෑ. ජුලියන්ගේ ටෝර්ච් එළියටඅඩ නින්දේ සිටි ඈන්ගේ දෑස් නම් අන්ද වුනා වාගේ. ඒ වුනත් ජෝර්ජ් නම් කූඩාරාම තුළ ඔහුට දක්නට ලැබුනේ නෑ.

" කෝ ඈන් ජෝර්ජ් ? මම පේපර්ස් ටික ගන්න ආවේ"

ඈන් කූඩාරම වටේට ම දෑස් යැව්වත් ජෝර්ජ් හෝ ටිමියාගේ සලකුණක් වත් කූඩාරම තුළ තිබුණේ නැත. ජෝර්ජ්ගේ පොරෝනය හා කොට්ටය ද ඔහේ එක පොදියට ගුලි කොට දමා ඇත. දැං දැං ඈන්ට කරුණු කාරණා පැහැදිලි වෙමින් තිබෙන්නේ ය. ඒ හා සමඟ උපන් බියකරු සිතුවිලි දාමයක් ඇගේ නෙතට කඳුලු ගෙනෙන්නේ ය.

" අනේ ජූ. ඔයාට හිතාගන්න බැරිද ජෝර්ජ් කරල තියෙන දේ? එයා අර වටින ලියවිලිත් අරගෙන්න ම ගිහින්ලා. ටිමීත් අරන් ගිහින්ලා. බයිසිකලෙත් අරගෙන කිරින් වලට යන්න ඇති ජුලියන්. අයියෝ එයාව අල්ලගන්න දූපතේ කවුරු හරි හිටියොත් මොකද කරන්නේ?"

පුංචි ඈන් බියපත් හැඟීමෙන් එහෙම කිව්වත් ජුලියන්ට නම් මේ මොහොතේ ජෝර්ජ් සමගින් හට ගන්නේ පුදුමතරමේ කේන්තියකි.

" නාහෙට නාහන එකී ඉහළ ගියත් එකයි මට පහළ හියත් එකයි. චුට්ටක් කියන දේ අහන්න මේ ජෝර්ජ්ට බැනෙ. ඇත්ත ම යි දැං මට අහු වුනොත් ඇට කටු ටික ගැලවිලා යනකන් හොල්ලන්න හිතෙනව. කරල තියෙන්නෙ

DO NOT COPY

sinhalaebooks.com



සම්පූර්ණයෙන් ම මෝඩ වැඩක්. මිස්ටර් වූ එයා එනකන් ඉන්න පුලුවන් බව දැන දැනත් මේ වාගේ අවධානමක් ගත්තු එකටයි මට කේන්ත"

" අනේ ජුලියන්. ඔයයි ඩිකුයි ඉක්මනට බයිසිකල්වලින් ගිහින් ජෝර්ජ් අල්ල ගන්න බලන්නකෝ. මෝඩ අහින්සක ජෝර්ජ් .මොකක් හරි අනතුරකට ලක් වෙන්න කලින් එයාව අල්ල ගන්න බලන්නකෝ. වෙලාවට ටිමීව අරන් ගිහින් තියෙන්නෙ. දෙයියන්ට ස්තූතිවන්ත වෙන්න ඕනි ජෝර්ජ් එක්ක ටිමී ව හරි යවපු එක ගැන"

" ඔව් ඒක හරි ඈන්. ටිමී ඌට කරන්න පුලුවන් උපරිමයෙන් ජෝර්ජ් ගැන බලා ගනී. ඒක සහතිකයි. ඒත් ජෝර්ජ්ට චුට්ටක් හිතන්න තිබුනනෙ. ඒක තමා මේකි වැඩි සද්දායක් බද්දයක් නැතුව පාඩුවෙ හිටියෙ. හැමදේම ප්ලෑන් කර කර ඉන්න ඇති"

තව දුරටත් පමා නො වූ ජුලියන් වහ වහා ඩික් සහ ටින්කර් ද සමගින් නිවස දෙසට දුවන්නට පටන් ගත්තා. ඇත්තට ම බයිසිකල් රැගෙන ජෝර්ජ් සොයන්නට යෑමට පෙරාතුව ජෙනී දැනුවත් කිරීම යුතුකමක් ලෙසයි ඔවුන්ට සිතෙන්නේ. ජෝර්ජ්ගේ කතාව ඇසීමෙන් පසුව ජෙනීටත් තත්පරයක් වත් නිදා ගන්නට පුලුවන් වුනේම නෑ. සත්තකින් ම ඇය හොඳට ම බියපත් වුනා. මග රැකගෙන සිට ජෝර්ජ් එන තුරු බලා සිටින හොරු සිටින ගණදුරු රැයක ජෝර්ජ් මෙසේ තනි පංගලමේ ම පිට වී යාම භයානක නො වන්නේද ?

ජුලියන් හා ඩික් සමගින් ජෝර්ජ් සෙවීම සඳහා යෑමට ටින්කර් ද අවසර ඉල්ලා හිටියා. ඒ වුනත් එවැන්නකට නම් ජෙනීගෙන් ඔහුට අවසර ලැබුනේ නෑ.

" මේ ටින්කර් නටන් නැතුව ඉන්නවා.ඔයයි මිස්චීෆුයි ගිහින් මේ දෙන්නටත් වදයක් වෙනවා . අනේ අම්මපා මේ ජෝර්ජ් මොන ජාතියේ කෙල්ලෙක් ද



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



මන්දා. මට අතට අහුවෙනව නම් උස්සල පොලේ ගහන්න තරම් කේන්තියි. දෙයියන්ට පින්සිද්ද වෙන්න අර ටිමී ඉන්නෙ එයා එක්ක. ඇති යන්තම් ඒකටවත් මොලේ තිබ්බ.පොලිස් කාරයෝ දූසිම් භාගයකට වඩා ඒ බල්ලා හොඳයි"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 16

# කිරින් දූපතේ රාත්‍රියක්

DO NOT COPY

පායා තිබුනේ අඩ සඳ පමණක් වුවත් එයද වලාකුලු වලින් සැගවී ගොස් තිබුනේ අන්දකාරයට සිත් සේ පරිසරය තුල රජ කිරීමේ අවස්ථාව ලබා දෙමින් . ජෝර්ගේ බයිසිකලයේ විදුලි බල්බය මේ අඳුරින් වැසී තිබුණු පරිසරය මැනවින් ආලෝකවත් කරන කොට ජෝර්ජ්ට දැනුනේ සතුටක්. පාර දෙපැත්තේ තියෙන හැම දෙයක් ම ඇයට හොඳින් පේනවා . ඒ වුනත් දෙපැත්තේ ඇති බඩ වැටි ස්සේ සැග වී කවුරුන් හෝ තමා දෙස බලා හිදින්නේ ය යන සැකය නම් ජෝර්ජ්ගේ සිත තුළ හැම තිස්සේ ම පැවතුණා .



Scanned with CamScanner

sinhalaebooks.com





" කවුරු හරි අපි දිහා බලාගෙන ඉන්නවා නම් ඔයා දෙපාරක් හිතන්නෙ නැතුව උන්ට පනිනවා කියලා මම දන්නවා ටිමී"

ටිමී එකගත්වය පාන බිරුම් හඩක් නැගුවා . ඒ වුනත් පයින් දිව යන නිසා දැනෙන මහන්සිය හේතුවෙන් ඒ නැගූ බිරුම් හඩ වෙහෙස පිරී ගත් බිරුමක් . ජෝර්ජ් ,ඔන තරම් වේගයෙන් බයිසිකලය පැද්දත් ඈ තමාගේ දර්ශනයෙන් නොපෙනී යාමට දීමට නම් ටිමීගෙ කැමැත්තක් තිබුනේ නෑ . මේ මුරණ්ඩු හිතුවක්කාර ගැහැණු ළමයාගේ ආරක්ෂාව සම්පූර්ණයෙන් ම තමා අත තිබෙන බව ටිමී දන්නවා .අනික් තුන් දෙනාට රහසින් මේ වගේ රාත්‍රියක බයිසිකල් පැදීමේ අදහසක්

sinhalaebooks.com



ජෝර්ජ්ගේ ඔලුවට මොන ලෝකයෙන් කඩා පාත් වුනාද කියන එක ගැන නම් අන්දෝ සන්සාරයක් ටිමී දන්නෙත් නෑ . කොයි තරම් හති වැටුණත් , කොයි තරම් වෙහෙස දැණුනත් ජෝර්ජ් තමාගේ ඇස් මානයෙන් ඉවතට යෑමට ඉඩදීමටත් මේ ආරක්ෂක නිළධාරියා කොහොමටවත් සූදානමුත් නෑ .

විටින් විට සැර විදුලි ලාම්පු දල්වා ගත් මෝටර් රථ මේ ගමනේදී ඔවුන්ට මුන ගැසුනා . ඒ සෑම විටක ම බයිසිකලය ඒවයින් අයින් කරගෙන ප්‍රවේශමෙන් ජෝර්ජ් ඉදිරියට ඉදිරියට ඉදිරියට ම පැදගෙන ගියා . ඒ වුනත් වාහනයක් එන සෑම අවස්ථාවක ම ටිමී ගැන නම් ඇගේ සිතට බයක් දැනෙන එක වලකා ගත හැකි වුනේ නෑ .

“ අනේ ටිමී උඹ ඕවයෙන් අයින් වෙලා වරෙන් . උබ වාහනේකට හැප්පුනොත් නම් මට ජීවත් වෙලා වැඩක් නෑ . එහෙම දෙයක් වුනොත් මේක සම්පූර්ණෙන් ම මගේ වරද්ද .මට වෙලාවකට හිතෙනවා මම මේ ආවෙ මෝඩ ගමනක් කියලත් . ඒ වුනත් ජුලියන් තනියම ගිහින් මගේ දූපතේ ලිපි ගොණු හංගනකන් බකන් නිලාගෙන ඉන්න මට බෑනෙ ටිමී .මේක මං කරන්න ඕන වැඩක් . අනේ ටිමී . හොද ළමයා වගේ පරිස්සමින් වම් පැත්තෙන් ම එන්න”

කොහොමින් කොහොම හරි අන්තිමේ ඔවුන් කිරින් ගම්මානයට සේන්දු වුනා . කිරින් ගම්මානයේ ගෙවල්වල ජනෙල් තුළින් වැටෙන ආලෝකය තාමත් නිවැසියන් අවදියෙන් බව ඔවුන්ට ඉගි කළා .අවසානයේ දිගු ගමනකට පසුව කිරින් මුහුදු බොක්කත් කිරින් වෙරළ තීරයත් ඇයට දැක ගන්නට ලැබුණා . වලාකුලු සලු අතරින් එබී

sinhalaebooks.com



බලමින් චන්ද්‍රයා මුහුදු රැළි මත ඇති කරන සුන්දරත්වය ජෝර්ගේ සිත තුළ ඇතිකළේ වශී වන්නට හිතෙන සුලු චමත්කාරයක් .

" අන්න මගේ දූපත .මගේ ම මගේ ම මගේම දූපත . එයා නිකන් මං එනව කියල දැනිල මං දිහා බලා ඉන්නවා වගේ"

මුහුදේ තරමක් නුදුරින් තිබෙන අඳුරු ඡායා මාත්‍රය දෙස බලමින් ජෝර් කියා ගත්තේ තමාට ම යි . මේ මොහොතේ දූපත තමා සංතක වීමේ අභිමානය වඩාත් තදින් ඇගේ සිතට දැනෙන්නට වුනා .

" වූෆ්" ටිමී සිහින් හඬක් නැගුවේ උස් බුරලෑමකට ශක්තිය අපතේ නොයැවිය යුතුය යන තීරණයට එළඹියාක් වගේ . ජෝර්ජ් මේ රෑ ජාමේ තනි පංගලමේ දූපතට යන්නේ මොන මළ උලව්වකට ද ? අනික් අයට රහසින් මේ දේවල් සිදු කිරීමට ඇයට ඇති හේතුව කුමක් ද ? වැනි ගැටලු රැසක් ඒ සිහින් බුරලෑමේ තියෙනවා .

බයිසිකලයෙන් බැස ගත් ජෝර්ජ් බෝට්ටුව නවතා තිබූ ස්ථානයට හනි හනික දුවන්නට පටන් ගත්තා .නාන කුටියක් සොයා ගත් ඇ බයිසිකලය එහි සඟවා තබා වෙරළ තීරය ප්‍රික්ෂන්නට පටන් ගත්තා . ඊ ලඟට ඇගේ බැල්ම යොමු වුනේ දූපත දිහාවට යි . නමුත් ඒ වෙලාවේ ඇයට දක්නට ලැබුණේ යන්තමින් හෝ බලාපොරොත්තු නො වූ දෙයක් .

" දෙයියනේ ටිමී අර බලන්න දූපතේ එළියක් පේනවා" ජෝර්ජ් තැති ගත් හඬින් කෑ ගාන්නට වුනේ ටිමීගේ කරපටිය අල්ලාගනිමින් . " ඔයාට පේනව ද ඒක ? ටිමී කවුරු හරි දූපතේ ඉන්නවා . මගෙන් අහන් නැතුව එහෙම කවුරුවත් කොහොමද මගේ දූපතට යන්නේ ?"

DO NOT COPY

sinhalaebooks.com



DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com





Scanned with CamScanner

ටිමී ජෝර්ජ් දෙස බැලුවේ ජෝර්ජ්ගේ කෝපය සාදාරණීය කරන ආකාරයටයි . මේ වන විට ජෝර්ජ් දැක තිබූ ආලෝකය ටිමීටත් පෙනේ .එසේ වූවත් ජෝර්ජ් තනිවම දූපතට යෑම නම් ඌට වුනත් අනුමත කිරීමේ හැකියාවක් නැත . ඇතැම් විට ඇයට මේ පෙනෙන්නේ අභිගුංටකයින් විසින් අටවන ලද කූඩාරමක ලන්තෑරුම් එළිය ද විය හැකි ය . එසේ නැත්තම් තරුණ කිහිප දෙනෙක් විසින් රාත්‍රී සවාරියක් පැමිණියා ද විය හැකි ය . එබෙදු විටක ජෝර්ජ් හොස්ස පුම්බාගෙන දූපතට කඩා පැනීමෙන් සිදුවන්නේ අහක යන කරදරයක පැටලීමකි . අනිවාරතේ අනතුරකට අත පෙවීමකි . මේ සියල්ල ම දැනුම් තේරුම් ගත් නිසා දෝ ටිමී ජෝර්ජ්ගේ දූපත් ගමන වලකා ලීමේ උත්සාහයක් ගත්තේ ය . ඌ උගේ අතක් දිගු කර කියා සිටියේ " ජෝර්ජ් දැන් ගෙදර ගිහින් අපි හෙට එමු" යි කියා ය .

"නෑ ටිමී නෑ . මම දූපතේ ඉන්නේ මොකා ද කියලා හොයා ගන්නකන් ආපහු යන්නේ නෑ . එතන කී දෙනැක් හිටියත් මට කමක් නෑ . මං එනකන් බලාගෙන ඉන්න ලියවිලි හොරු උනත් මට කමක් නෑ . උන් සේරට ම මගේ දූපතට ගියාට වන්දි ගෙවන්න වෙයි . මම මේ ලිපි ගොණු ව මම ගාව තියා ගන්නේ නෑ . මම ගාව තිබ්බොත් එතන ඉන්නේ හොරු නම් උන් මාව අල්ලා ගත්තොත් ලිපි ගොණු ටිකත් උන්ට අහුවෙනවා . අනික කවුරු හරි දූපතේ ඉන්නවා නම් ලිපි ගොණු කොහොමටත් දූපතේ හංගන එක හරියන වැඩක් නෙමේ . ටිමී හොඳට මතක තියා ගන්න . මම දැනට මේ ලිපි ගොණු ටික මෙන්න මේ බෝට්ටුවේ යට තියෙන ඉටි රෙද්ද යට හංගනවා . බලන්න කාගෙද මේ බෝට්ටුව කියලා'

sinhalaebooks.com



ජෝර්ජ් තමා අසළ තිබූ බෝට්ටුවක පතුලට එලා තිබූ ඉටි කවරය ඔසවා ලිපි ගොණු අඩංගු පාර්සලය ඒ තුළ සැඟෙව්වා ය . ඉනික්බිති ව බෝට්ටුවේ නම කියවා සිත තුළ ධාරනය කොට ගත්තා ය .

“ මේක කොනොලිගේ බෝට්ටුව . මම කොනොලි කියන මාලුකාරයව දන්නවා . මම ටික වෙලාවකට එයාගේ බෝට්ටුවේ මේ වගේ වැදගත් පාර්ශලයක් හැංගුවා කියලා එයා මා එක්ක කවදාවත් අහිතක් හිතන්නේ නෑ”

පාර්ශලය සැඟවීමේ කටයුත්ත අවසන් කළ පසුව ජෝර්ජ් යළිත් වරක් දූපත දෙසට බැල්මක් හෙලුවා . තාමත් ආලෝකය දූපතේ තියෙනවා . කෝපයෙන් දැවෙමින් ඕ ඉක්මනින් ම ඇගේ බෝට්ටුව වෙත ගමන් කළා.

ඒ වන විටත් සඳ එළිය පොළොවට වැටෙන්නේ යාන්තමිනි . වලා රැසක් ඉහළ අහසේ සඳ වටා යළිත් රැස් වන්නට පටන් ගෙන තිබේ . ජෝර්ජ් කුඩා බෝට්ටුව පහළට අදින්නට පටන් ගත්තා ය .. කුඩා බෝට්ටුවක් වූ එය මුහුදට ඇද ගැනීම ඒ තරම්ම අපහසු කරුණක් වූවේ නැත .ටිමීගේ නො මසුරු සහයෝගය ද ඇයට ලැබුණි . ඌ දත් වලින් කඹ ය අල්ලාගෙන ඌට හැකි ආකාරයෙන් උදව් කළේ ය .

හබලක් සොය ගත් ජෝර්ජ් බෝට්ටුවට නැග දූපත කරා බෝට්ටුව පැදවීමේ කටයුත්ත පටන් ගත්තා . මුහුදු දිය ඔස්සේ වේගයෙන් දිව ආ ටිමී වහා බෝට්ටුවට ගොඩ වුනා .” වඩ දිය එනවා . ඒ නිසා බෝට්ටුව පදින්න ලේසියි . අපි ඉක්මනට දූපතේ ඉන්නේ කවුද කියල හොයා ගමු . ඊට පස්සෙ මම මට ඕන දේ කියන්නම් .අපි ගියාට පස්සේ උඹ උඹේ

sinhalaebooks.com



හොඳම විදිහට බුරලා උන් ඔක්කෝම බය කරන්න ඕනි . තව එකක් ටිමී . උඹට උන්ව පන්නන්න ඕනි නම් බෝට්ටුවට යනකන් ම උන්ව පන්නපන් . මම නෙමේ අද උඹ මොනවා කරත් උඹට සැර දාන්නේ”



කුඩා බිරුම් හඬක් නගා ටිමී ජෝර්ගේ යෝජනාවට එකග වුනා .ඒ වුනත් මේ මොහොතේ නම් ජෝර්ජ්ට වුවමනා තමාගේ නිහඬ බව බව ටිමී දන්නවා . කුඩා ගොර ගොරයක් මිස වැඩි සද්දයක් බද්දයක් නො දමා ඌ බලා සිටියේ එබැවිනි .



Scanned with CamScanner

sinhalaebooks.com



" හරි ටිමී දැන් නිකන් කෙඳිරි ගාන්නවත් එපා ..' ජෝර්ජ් මිමිණුවා ය . " අපි දැං දූපතට ළඟයි . ඒ වුනාට අද මම අර ගස් තියෙන දිහාට ම බෝට්ටුව අරන් යනවා . මොකද දන්නව ද ටිමී . මට මගේ බෝට්ටුව හංගන්න ඕනනේ"

ගස්වලින් හොඳින් වැසී ගත් ස්ථානයක් දක්වා ජෝර්ජ් බෝට්ටුව පදවාගෙන ගියා . ඊට පස්සේ බෝට්ටුවෙන් බිමට බැස ගත් ඈ ළඟම තිබුණු ගසේ බෝට්ටුව ගැට ගැහුවා . බෝට්ටුව කාටවත් නොපෙනෙන බව තහවුරු කර ගත් ජෝර්ජ් ආලෝකය සොයා ගෙන යන්නට සූදානම් වුනත් හදිසියේ ම පහළ වුනු අලුත් අදහසක් නිසා හිටිවන ම නතර වුනා . ඒ අතර ඈ ටිමී දිහා උද්දාමයෙන් බලලා තමාට ඇතිවුනු අදහස ඌට කියා දැම්මා .

" අර මිනිස්සුන්ගේ බෝට්ටුව කොහෙද කියලා හොයල බලමු . කොහේ හරි ඒක තියෙන්න ඕනනේ"

වෙරළ තීරයේ වැලි සහිත පොළව මත ගල් කුලක ගසා ඇති බෝට්ටුවක් සොයා ගන්නට ජෝර්ජ්ට ගත වූවේ තවත් සුලු වෙලාවක් පමනයි . ඊ ලගට ටිමී පවා පුදුමයට පත් කරමින් ඇය බෝට්ටුව බැඳ තිබූ කඹය ලිහා දැම්මා .පුංචි තල්ලුවක් දැම්මත් බෝට්ටුව හොඳින් වැල්ලේ සිරවී තිබූ නිසාදෝ එය මුහුදට තල්ලු කර දැමීමට තරම් ඇගේ ශක්තිය ප්‍රමානවත් වුනේ නෑ . ඒ වුනත් ටිකෙන් ටික වර්ධනය වන වඩ දිය ඉතා ඉක්මනින් ම බෝට්ටුව මුහුද දක්වා රැගෙන යන බව නම් ඇයට සහතිකයි .

" කෝ දැං අර එළිය පේන්නේ නෑනේ ටිමී ."

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ජෝර්ජ් හදිසියේ ම ආලෝකය දක්නට නො වීම නිසා බිඳුනු හඬින් කිව්වා . ඒ වුනත් ඇයට යළිත් ඒත් සමගම ආලෝකය දකින්න ලැබුනා .

“ අහා ඒක කූඩාරමක් ඉස්සරහ අවුලලා තියෙන ගිනි මැලයකින් එන එලියක් නෙමේ . ඒක ටෝර්ච් එලියක් .නැත්තම ලන්තෑරුම් එලියක් . අපි දැං ගොඩාක් පරිස්සම් වෙන්න ඕන . බලමු හෙමින් සීරුවේ උන්ට පස්සෙන් යන්න පුලුවන් ද කියලා”

ටිමීට ඒ විදිහට තමන්ගේ අදහස් හෙළි කළ ජෝර්ජ් බල්ලා ද කැටුව ආලෝකය ඇති දිසාවට ගමන් ගත්තා . නොබෝ වේලාවකින් ඔවුන් සිටියේ දූපතේ මැද තියෙන ගරා වැටුණු බලකොටුව ආසන්නයේ යි . කිසිවෙකුගේත් බලපෑමක් නොමැති නිසාවෙන් මන්දිරය ආසන්න්යේ පොළොව දැන් නම් එක ම තණ බිමක් බවට පත් වෙලා . සරුව වැවී ගත් තණ පඳුරු මත වාඩි වී ගත් මිනිසුන් දෙදෙනා හදිසියේ ම දක්නට ලැබුනු විට නම් ජෝර්ජ්ගේ ගත බියත් උද්දාමයත් සමගින් කිළි පොළා ගියා .

“ ටිමී දැන් නම් ඔයා කිසිම සද්දයක් කරන්න එපා” යි කියන්නට මෙන් ඈ ටිම්ගේ කර පටිය මුදුව අල්ලා ගත්තා . ජෝර්ජ් වචනයෙන් නොකීවත් මේ ගමන සද්ද බද්ද නැතිව යා යුතු ගමනක් බව මේ අපූරු බල්ලා දන්නව.ටිමී ගේ කර වටා තියෙන ලෝම කලාපය පවා ඉහලට එස වී තිබුනේ නුදුරේ හට ගැනෙන සිද්දි දාමය සම්බන්ද අවබෝධයක් ටිමියාට පැවතුණු නිසා වෙන් .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



මිනිසුන් දෙදෙනා සිටියේ කාඩ් ක්‍රීඩාවක නියැලෙමිනි . ගරා වැටී ගිය ගල් බිත්තියක තබා ඇති ලන්තෑරුමෙන් ලැබෙන මලානික ආලෝකය ඔවුන්ට ඒ සඳහා ප්‍රමාණවත් වූ ලෙසකි . දන්නා හඳුනන අයෙකු ඒ අතර සිටීමෙන් දෝ ටිමියාට ගොර ගොර හඬක් නැගුණේ ය . එහෙත් ජෝර්ජ් මුවට අත තබා කියා සිටියේ ටිමියා මේ මොහොතේ නිහඬව සිටිය යුතු බවයි .

ටිමී හඳුනා ගත් ඒ අමුත්තා සර්කස් එකේ හුන් මහා මායාකරු වූ වූ මහත්තයා මිස අන් කිසිවෙකුත් නොවේ .අනික් මිනිසගේ වත ගොත නම් ජෝර්ජ් දැනගෙන හිටියේ නෑ .හොඳින් හැද පැළඳ ගෙන සිටි ඒ අමුත්තා නම් කාඩ් ක්‍රීඩාවේ නිරත වුනත් මුහුණේ තිබෙන්නේ බකන් නිලා සිටීමෙන් එපා වූ පෙනුමක් . අසාමාන්‍ය ගැඹුරු හඬක් නගා ගනිමින් ඒ මනුස්සයා වූ මහත්තයා සමග මොනවදෝ කියනවා . ඔහු කාඩ් අත වුනත් ක්‍රීඩා කරන්නේ ඕනෑවට වඩා එපාවට බවත් ජෝර්ජ්ට මේ මොහොතේ පෙනෙනවා . ගරා වැටුණු බලකොටුවේ අඳුරු මුල්ලක නැවටී ටිමී සහ ජෝර්ජ් දෙන්නා දැං සූදානම් වෙන්නේ ඔවුන්ගේ කතාවට සවන් දෙන්නයි .

" හරි හරි වූ . ඒ වුනත් බලනවාකෝ . තමුසෙ කිව්වට ලිපි ගොනුවෙ ඉතුරු ටිකත් අරන් එනවා කිව්ව කොල්ලා අද එන්නෙ නම් නැති හැඩයි .මට ඔහේ දීපු සටහන් වටින්නේ නෑ කියල ම නෙමෙයි මම මේ කියන්නේ. ඒවාත් වටිනවා . ඒත් අර ඉතුරු ටික නැතිව ඒවයෙන් වැඩක් ගන්න බෑ .තමුසේ ඒවා හොරකන් කරගන තියෙන්නේ නම් බොහොම බුද්දිමත් විද්‍යාඥයෙක් .ලිපි ගොණුව සම්පූර්ණෙන් ම ලැබුනට පස්සේ ඔහේට ලැබෙන ගාන ගැන නම් සැකයක් තියා ගන්න එපා .ඒත් ඉතුරු

sinhalaebooks.com



ටික නැතිව නම් සල්ලි ගැන හිතන්නවත් එපා . මොකද මුලින් දුන්න ලියවිලිවලින් ප්‍රයොජණයක් ගන්න බෑ''

"හරි හරි කලබල නොවී ඉන්නවකෝ . කෙනෙක් එයි අනිවාරෙන් ම ඉතුරු ලිපි ගොණු ටික අරගෙන . මට ඇහුණා උන් එහෙම කතා වෙනවා'' වූ මහතා ද කිව්වා .

"කවුද ඒව හොරකම් කරේ ? තමුසෙද ?'' කාඩ් අත වේගයෙන් කළවම් කරන අතර ම අනික් මිනිසා තවත් ප්‍රශ්නයක් නැගුවා .

"පිස්සුද ? මම බලලුන් ලවා කොස් ඇට බාවන මිනිහෙක් විතරයි. කවදාවත් මම මගේ අත්වල කුණු ගා ගන්නේ නෑ''

දෙවෙනි මිනිසා ඒ කතවට නැගුවේ අප්‍රසන්න සිනාවක් . ඒ අතර ම ඔහු නැවතත් කතාව පටන් ගත්තා

"ඒ වුනාට අනික් මිනිස්සු කරන්නේ තමුසෙගේ අභිමතය නම් ඒ කුණු තමුන්ගේ අත්වලත් තියෙනවා . මිස්ට වූ . මහා ලොකු ශ්‍රේශ්ඨ මායා කාරයා . තමන්ගේ අතේ දැලි ගාවා ගන්නේ නැතුව අනුන් ලවා වැඩේ කර ගන්න තියෙන හැකියාව නිසා ම යි තමුසෙ මායා කාරයෙක් වෙන්නේ .තමුසෙ බොහොම කපටියි . වූ මහත්තය .මම තමුසෙව හතුරෙක් කර ගන්න කැමති නෑ . මොකද තමුසේ මොන විදිහේ ගිනි ගෙඩියක් මං වෙනුවෙන් සැලසුම් කරයිද කියලා හිතන්නවත් බෑ . දැං කොහොමද ඔය පේපර්ස් තමුන්ට ලැබෙන විදිහට වැඩ සිද්ද කර ගත්තේ ?''

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ඉතිං ඒ ළඟට වූ මහත්තයා කියන්නට පටන් ගත්තේ හීනයකින් වත් ජෝර්ජ් නොසිතූ විදිහේ කතාවක් . ළමුන්ගේ බොහෝ ගැටලු සඳහා පිළිතුරු ඒ කතාවේ තිබුනා .

" මගේ ඇස් දෙකයි , කන් දෙකයි , කපටිකමයි පාවිච්චි කලා . ගොඩක් මිනිස්සු මෝඩයි මගේ මිත්‍රයා . ඔය කිව්ව තුන හතර අනික් අයට වඩා මගේ හොඳයි . අන්න ඒකයි රහස"

" මම කවදාවත් ඔහේගෙ මිත්‍රයෙක් කියල නම් හිතන්න එපා .සතුරෙක් වෙන්න අකමැතියි වගේ ම ඔහේගේ මිත්‍රයෙක් වෙන්නත් මම කැමති නෑ . මොකද ඔහේගෙ මිත්‍රයාටත් සතුරාටත් ඔහේ බෙදන්නේ එක ම හැන්දෙන් බව මම දන්නවා . දෙගොල්ලම ඔහේ වෙනුවෙන් පාවිච්චි වෙනවා . අපි නිකන් ව්‍යාපාර කටයුත්තක් කරනවා විතරයි මේ. හැබැයි මම ඔහේගේ අර චිම්පන්සියාට නම් බොහොම කැමතියි . තාමත් ඇයි දන්නෙ නෑ අර ලිපි ගොණුත් අරන් එනවා කිව්ව කොල්ලා පරක්කු ?"

DO NOT COPY

දැන් දැං තමාගේ කොටස ඉටු කළ යුතු යැයි ජෝර්ජ්ට සිතේ . ඇ ටිමීගේ කණට මුව ලං කොට ඇගේ සැලසුම කියන්නට පටන් ගත්තා ය .

" ටිමී ඔයා මෙතන ම ඉන්න . මම කතා කරනකන් එන්න එපා . මම යන්නම් . මාව කරදරේ වැටෙනවා වගේ පෙණුනොත් මහා නපුරු යක්ෂ බල්ලෙක් මට ඕන වෙනවා . හොරුන්ටයි තක්කඩින්ටයි මගේ දූපතේ ඉන්ඩ ඉඩක් නෑ කියලා මුන්ට තේරුම් කරන්න මේක තමයි වෙලාව"



Scanned with CamScanner

sinhalaebooks.com



උද්දාමය හේතුවෙන් සැලෙන දෙපයින් , ජෝර්ජ් සියල්ල තේරුම් ගන්නා ටිමියා හුන් තැන ම නවතා එක් වරම මිනිසුන් දෙදෙනාට පෙනෙන අයුරින් ඔවුන් අතරට පැමිණියේ ඇගේ නිර්භීත හදවත මනාව විශද කරවමිනි . කොයි තරම් බලා පොරොත්තුවෙන් හිටියත් ලන්තෑරුම් එලියෙන් හදිසියේ ජෝර්ජ් මතු වූ ආකාරය මිනිසුන් දෙදෙනාගේ තිගැස්මට හේතු විය . ඔවුන් දෙදෙනා වහා දෙපයින් සිට ගත්තේ ඒ නිසා ය .

" කෙල්ලනේ ඇවිත් තියෙන්නේ . කවුද හිතුවේ කොල්ලො දෙන්නෙක් ඉදලත් කෙල්ලව එවන්න තරම් උන් බය ගුල්ලො කියලා" වූ අහතාට කියවුනේ ඉබේට ම යි . ඒ අතර කටහඬට යක්ෂාරූඪ කර ගත් ජෝර්ජ් මිනිසුන් දෙදෙනාට කෝපයෙන් කියන්නට තියෙන සියලු දෑ මූනට ම කියා දැමීමට පටන් ගත්තා ය .

" ආවෙ කෙල්ල ද කොල්ලද නෙමෙයි වැදගත් . තමුසෙලා මගේ දූපතේ මොන බම්බුවක් ද මේ කරන්නේ .? තමුසෙලා ආව අතක් බලාගෙන වහාම මෙතනින් නොගියොත් මගේ බල්ලා තමුසෙලාව බලා ගනී . ඒ අතරේ පොලිසිය ඇවිල්ලා උබලා දෙන්නට මහ උලු ගෙදර තපින්න වැඩේ සිද්ද වෙයි"

අසාමාන්‍ය තරම් උසින් යුත් වූ මහතා නැගී සිටියා . ඊ ළගට ඔහුගේ සුපුරුදු ආචාරශීලී සංසුන් කටහඬ ජෝර්ජ්ට ඇසෙන්නට පටන් ගත්තා

' මුලින් ම සංසුන් වෙලා අහගන්න ළමයා . ඔය තරම් කළබල වෙන්න හේතුවක් නෑ .කොල්ලො දෙන්නා ඔයා අතේ අර පේපර්ස් එවන්න ඇති කියල මම දන්නවා . අයියෝ උන් දෙන්න නම් මහා බය

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ගුල්ලෝ දෙන්නෙක් . ඒකට ඔයා හරි ම නිර්භීත කෙල්ලෙක් .හැමදාමත් මගේ හිතේ ඒ ගෞරවය ඔයා වෙනුවෙන් තියේවි .දැං ඒ පේපර්ස් මගේ අතට දෙන්න"

" මම මෝඩයෙක් කියල හිතුව ද / තමුසෙලෑ ලන්තෑරුම් එළිය දැකපු ගමන් මම ඒ ලිපි ගොනු හැංගුවා .මේ වෙරලේ හොඳ තැනක ඒ ලිපිගොණුව මේ වෙලාවේ බොහොම පරිස්සමට ඇති . දැං මගේ යකා අවුස්සන්නෙ නැතුව දෙන්න ම හොඳ හිතින් එළියට බැහැල පලයව්"

" ඔයා හරි ම නිර්භීත ගෑනු ළමයෙක් . ඔබ කතා කරන ආකාරයට වුනත් මගේ හිතේ ඇතිවෙන්නේ පුදුමකාර ගෞරවයක්"

තව දුරටත් ජෝර්ජ් යාප්පුවෙන් නම්මා ගත හැකිය යන අදහසින් වූ මහතා දිගින් දිගට ම කියවගෙන ගියා . ඊට පස්සේ හිස පවා නවා ආචාරශීලී කටයුතු සිදු කළා . වූ මහතාගේ යාප්පුව පවා ජෝර්ජ්ගේ කෝපය වැඩි කරවනවා . ඒ අතර වූ සමග හුන් අනෙකා ජෝර්ජ් දිහාත් වූ දිහාත් පුදුමයෙන් බලා මෙහෙම කිව්වා

" ඇස් පේන්නේ නැද්ද වූ ? මේ කෙල්ලෙක් වෙන්නේ කොහොමද ? හරි කෙල්ල හෝ කොල්ලා .දැං සෙල්ලම් කරා ඇති . කොල ටික ගනින් මෙහාට .මම ඔහේටත් සල්ලි දෙන්නම් . ඊට පස්සේ උඹ කැමති නම් ඒ සල්ලි හේලින් මහාචාර්යතුමාට ගිහින් දුන්නත් මට කමක් නෑ ."

" ඔය මගුලේ ලිපි ගොණුව ඔය තරම් වැදගත් නම් එනවා ඇවිල්ලා ගන්නවා"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



සැලසුමේ ඊ ළඟ අදියර ක්‍රියාත්මක කිරීමට කාලය එළඹී බව වටහා ගත් ජෝර්ජ් කිව්වා . එයින් අණතුරුව ඈ ගමන් කරන්නට පටන් ගත්තේ මිනිසුන් දෙදෙනාට තමා පසු පස ඇවිද ඒමට සන් කරමින් . මේ මොහොතේ ශාන්ත දාන්ත තීන්ත කූඩු ලෙසින් පැමිණියත් ඉඩ ලැබුණු හැටියේ ම ලියවිලිත් රැගෙන තමා පෙරළා දමා මිනිසුන් දෙදෙන පළා යන බව නම් ඇයට අමුතුවෙන් තේරුම් කරන්නට වුවමනා නෑ . හැඩි දැඩි මංකොල්ල කරුවන් දෙදෙනෙකු සමගින් ඔට්ටු වීමේ හැකියාවක් තමා සතුව නැති බවත් ගැහැනු ළමයා දන්නවා .ඒ වුනත් මිනිසුන් දෙදෙනා බිය වන එක ම කාරණයකුත් තියෙන බව ජෝර්ජ්ට සහතිකයි . ඒ ඇගේ ටිමියා මිස වෙනත් කිසිවක් නොවන බව ඇය දන්නවා .

ජෝර්ජ් ඉදිරියෙන් ඉද්ජිරියට ඇදෙද්දී ටිමී ඈ සහ මිනිසුන් දෙදෙනා අතර ට පැමිණියා . ජෝර්ජ්ගේ අන පරිදි එක පාරට ම මිනිසුන් දෙදෙනාට කඩාගෙන නො පැන්නත් විටින් විට ගොර ගොර හඬ නගමින් ඌ ඉදිරියට ගමන් ගත්තේ ,

" පුලුවන් නම් උබලා දෙන්නාගෙන් එකෙක් හරි මගේ ජෝර්ජ්ට අත තියල බල පල්ලා . එහෙම වුනොත් උබේ ඇඟිල්ල මම ගලවලා ගන්නවා" යැයි කියන්නට වගේ .

එතැන් සිට හට ගත් සියලු සිදුවීම් ඉතා ම ඉක්මනින් සිදු වුනා . ජෝර්ජ් වෙරළට ගමන් කරනවා හා සමග වූටත් වූගේ සහයක තක්කඩියාටත් දකින්නට ලැබුණේ තමන් පැමිණි බෝට්ටුව වෙරළේ දක්නට නොමැති වයි . එක පාරට ම වූ මහත්තයාට මෙසේ කෑ ගැසුනේ ඒ නිසයි



DO NOT COPY

Scanned with CamScanner

sinhalaebooks.com



" කෝ අපේ බෝට්ටුව ? ඒක අර ගල් කුලේ බැඳල තිබුණේ"

" උස තැනකට නැගලා බලමු . එතනට හොඳට පෙනෙයි"

මිනිසුන්ට අභයෝගය දක්වන හඬින් පැවසූ ජෝර්ජ් මුහුදට නැඹුරු වූ විශාල පර්වතයක් උඩට නැග්ගා . මිනිසුන් දෙදෙනා ද ඇගේ පසු පසින් එය මතට නැගුණේ ඊ ළඟට ජෝර්ජ් කරන්නට සූදානම් වන දේ සම්බන්දයෙන් අබමල් රේණුවක තරම් වත් සැකයක් නැතිව යි . මේ වන විට වඩ දිය ගලා ඒම නිසා පර්වතයේ අනික් පැත්තේ පහළට දක්නට ලැබෙන ප්‍රපාතය සම්පූර්ණයෙන් ම ජලයෙන් පිරී තිබේ . මිනිසුන් දෙදෙනාගේ මුලු ජීවිත කාලයට ම අමතක නොවෙන පාඩමක් කියා පාමින් එක් වරම ජෝර්ජ් වූ මහත්තයා දියෙන් වැසී ගත් ප්‍රපාතය පහළට තල්ලු කළා .

විශාල දිය බිඳෙන හඬක් ද සමගින් මැජික් කාරයා ඉහළින් පියාඹා ගොස්

ප්‍රපාතය පහළට වැටුණා . ඒ හාත් සමග ම ටිමියා මෙතෙක් බලා පොරොත්තුවෙන් බලා හුන් අණ ජෝර්ගෙන් නිකුත් වුනා . ජෝර්ජ් තරමට ම උද්දාමයෙන් හුන් ටිමීගේ බිරුසන් වරුශාවේ ප්‍රතිඵලයක් වශයෙන් අනෙක් මිනිසාද ප්‍රපාතය පහළට වැටුණා ..

" උබලා දෙන්නට පැනල යන්න එහෙම අදහසක් තියෙනවා නම් කරන්න තියෙන හොදම දේ ඔතන ඉදන් ම ගොඩ බිමට පීනන එක තමයි." ජෝර්ජ් මහ හඩින් බෙරිහන් දුන්නේ දියට වැටී හුන් මිනිසුන් දෙදෙනාට ඇසෙන ආකාරයෙන් . " බෝට්ටුවට වුනේ මොකක්ද කියලත් දැනගන්න කියන්නම් . මම කඹේ ලිහුවා . වඩදියට පාවෙලා

sinhalaebooks.com





Scanned with CamScanner

sinhalaebooks.com



පාවෙලා ගියා . උබලා මගේ දූපතට ආවොත් ටිමී දෙන්න ගැන ම බලා ගනී . එක අඩියක් හරි මගෙ දූපතට තිබ්බොත් ඌ උඹලාව කීතු කීතු කරයි"

මිනිසුන් දෙදෙනාම පිහිණුම් සූරයන් වූවත් කෝපයත් , බිහිසුනු බවත් කයිරාටික බවෙනුත් කෙළ පැමින සිටියත් ගොඩ බිම දක්වා වන සුවිශල් දුර ප්‍රමාණය පිහිණා යාමේ හැකියාවක් නම් ඔවුන්ට නොවන බව ජෝර්ජ් දනී . විශාල බිහිසුනු ටිම් නැමැති දූපතේ මුර කරයාව සිටින තාක් කල් දූපතට ගොඩ වන්නට ද ඔවුනට හැකියාවක් නැත . ඔවුන්ගේ බෝට්ටුව ද බොහෝ දුර ඈත පාවී ගොස් තිබේ . කළ යුත්තේ කුමක්දැයි සිතා ගත නොහැකි ව කවාකාරව පිහිණමින් සිටියා මිසක මිනිසුන් දෙදෙනාට වෙනත් කළ හැකි යමක් ඉතිරි වී තිබුණේ නැත .

" මම ආපහු ගොඩ බිමට යනවා ." ජෝර්ජ් කෑ ගැවේ ඈගේ බෝට්ටුවට නගිමින් . " මම උදේ පාන්දර ම තමුසෙලා බේරගන්න පොලීසියෙන් එවන්නම් . හරි කමක් නෑ . සීතලේ ඉන්න බෑ වගේ නම් දැනට මගේ දූපතට ඇවිල්ලා හිටියට කමක් නෑ . ගුඩ් බායි ..... අපි යමු ටිමී"

ඉතින් බෝට්ටුව ජෝර්ජ් ද සමගින් ගොඩ බිම කරා යන ගමන පටන් ගත්තා . දුවගෙන ආ ටිමී බෝට්ටුවට ගොඩ වුනත් ඌ සිටියේ පිටුපස දෙස මනා අවදානයෙන් . තක්කඩියන් දෙදෙනා බෝට්ටුව පසු පසින් පිහිනා ආවොතින් ඔවුන් බලා කියා ගැනීමේ වග කීම ස්වේඡ්ඡාවෙන් ම ටිමී බාර ගත්තා . ඒ අතර ජෝර්ජ්ගේ සිරුර ලෙව කා ආදර ගෞරවය දක්වන්නටත් ටිමී අමතක කළේ නෑ . ඇත්තට ම මේ ලෝකයේ තමා දන්නා නිර්භීතම ළමයා ජෝර්ජ් යැයි ඌට සිතෙන්නට ඇති . ඒ වාගේ

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ම ලෝකයේ ඕනෑම කෙනෙකුට වඩා තමා ජෝර්ජ් හට අයිති වීම , ජෝර්ජ් තමාගේ ස්වාමි දුව වීම ගැන දැඩි කැමැත්තකුත් ටිමීට දැනෙන්නට ඇති. " වුෆ් වුෆ් වූ ……..ෆ්"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



# 17

# අවසානයේ සියලුම අබිරහස් විසඳුනු වගයි

DO NOT COPY

ඉතිං වීර වික්‍රම ක්‍රියාංවිතය අවසාන කල ජෝර්ජ් මේවන විට ක්‍රමයෙන් ගොඩ බිමේ වෙරළ තීරයට ළගා වී තිබුණා . ඇයට සිතේ ඇති සතුට කියා නිම කරන්නට බැරි තරම් . ටිමීට වුනත් ඒ සතුට ඒ විදිහට ම දැනෙනවා . ජෝර්ජ්ගේ නො නවතින ගීත ගායනයට වූෆ් හඩින් අත්වැල් ගායනා ඉදිරිපත් කරන්නට ටිමී ඉදිරිපත් වූවේ ඒ ප්‍රීතිය නිසා ම යි .රාත්‍රී අන්ධකාරය නිසා ම දෝ කොයි තරම් දුර බෝට්ටුව පැද්දත් තව බොහෝ දුරක් ඇති බවක් ජෝර්ජ්ට දැනෙනවා . මේ රාත්‍රිය නො වුනි නම් ගොඩාක් අපූරුයි කියලා ටිමීට වුනත් හිතෙනවා . ඉර එළිය තිබුනා නම් සිදුවන්නේ කුමක් දැයි , පා වෙන්නේ කොහේදැයි ටිමීට හොදින් බලා ගැනීමට හැකි වෙන නිසයි බල්ලාට එහෙම හිතෙන්නේ .ඈතින් පෙනන ආලෝකය නැගෙන්නේ තාමත් අවදියෙන් සිටින නිවෙස්



Scanned with CamScanner

sinhalaebooks.com



කිහිපයකින් බව ජෝර්ජ් දන්නවා . ඒ ආලෝක සමගින් තමා වඩ වඩාත් වෙරළට කිට්ටු වී තිබෙන බව ඇයට විශ්වාසයි .

ඒ වුනත් හදිසියේ ම ඇතින් දක්නට ලැබෙන සැර ආලෝකයක් ජෝර්ජ්ගේ සිත තුළ භීතියක් ඇති කරවන්නට සමත් වුනා .තක්කඩියන්ගේ ගොඩ බිම සිටි අයෙක් බෝට්ටුව රැගෙන පැමිනෙන්නේද යන සිතිවිල්ල හදිසියේ ම ඇති වීම සමගින් පුංචි දැරියගේ උගුර කට පවා වියලුනා .ටිමී බුරන්නට පටන් ගත්තා . ජෝර්ජ් ඕනෑම දෙයකට සූදනම් සිතින් බෝට්ටුව වෙරළට කිට්ටු කළා .

" කවුද එතන ඉන්නේ ? සමහර විට පරක්කු වෙලා යන මාලු කාරයෙක් ද දන්නෙ නෑ . එහෙම වුනොත් නම් හොඳයි . මට බෝට්ටුව උඩට ඇද ගන්න උදව්වක් ගන්න පුළුවන් වෙයි"

ඒ වුනත් ඒ මාලු කාරයා ජූලියන් හා ඩික් බව ජෝර්ට දැක ගන්නට ලැබුනේ එතකොටමයි . ජෝර්ජ් සොයා මිනිත්තු පහකට පමන පෙර වෙරළට පැමිණි ඔවුන් හදිසියේ ම පෙරළා පැමිනෙන ජෝර්ගේ බෝට්ටුව දැක තිබුණේ දූපතට යෑමට සූදානම් වෙනවාත් සමගයි .

යන්තමින් පමණක් වැටෙන චන්ද්‍රාලෝකයෙන් ඩික් සහ ජූලියන් දෙදෙනා හදුනා ගත් ටිමීගෙ බුරලෑම ඉක්මනින් ම ප්‍රීතිමත් හා සැනසිලි සහගත එකක් බවට පත් වුනා .

" ජෝර්ජ්" තම ඥාති සොහොයුරිය සුරක්ෂිර්තව සිටින බව දුටු ජූලියන් කෑ ගැහුවේ තරහකින් නොව ප්‍රීතියෙන් .එක් වර ම ඉදිරියට පැන ගත් ජූලියන් අයියා ජෝර්ජ් නංගී ව ආදරයෙන් වැළඳ ගත්තේ

DO NOT COPY

පුදුමාකාර සතුටින් . ඒත් ඉතින් ඊ ළඟට ජුලියන් අයියාගේ සාන්ත දාන්ත පැවැත් ම බිඳී ගිය බව නම් කිව යුතුවැ තිබේ .

" උබ නම් මහා ඔලමොට්ටල හිතුවක්කාර කෙල්ලෙක් . මම කට කැඩෙනකන් එපා කියල තියෙද්දිත් හැමෝව ම ගොනට අන්දලා දූපතට ගියානේ .දූපතේදි හොරු එහෙම හිටිය නම් මොකද වෙන්නෙ කියල නිකමටවත් හිතුව ද ? හිටිය නම් එහෙම ලොකු තඩ මාරුවක වැටෙන්නේ'

ඉතිං ඊ ළඟට උදා වූවේ ජෝර්ගේ වාරයයි . තමාගේ අද්දැකීම් අකුරක් නැර සෙස්සන්ට විස්තර කිරීමේ අවස්ථාව ඇත්තට ම ඊ ළඟට ජෝර්ජ් පැහැර හැරියේ නැත . දැස් උඩ හින්දුවාගෙන , කටවල් බලියවාගෙන ජෝර්ගේ විස්තරය අසා සිටින අයියලා දෙදෙනාගේ පෙනුම පවා ජෝර්ජ් තුල ඇති කරවන්නේ උද්දාමයකි . ආඩම්භරයකි . ලොමු දැහැගැන් වෙන සිරුරින් , ඇඟ කිලිපොලා යවමින් ජෝර්ගේ කතාව උද්දාමයෙන් අසා සිටින ජුලියන් ඩික් අයියලා දෙදෙනාට ද ජෝර්ජ් පිළිබඳව දැනෙන්නේ ආඩම්භරයකි . කිරින් දූපත වටා කරකැවෙමින් සිටින තක්කඩියන් දෙදෙනාගේ කතාව පවා ඔවුන් අසා සිටියෙ ත්‍රාසයෙන් යුතුව ය .කතාවේ ඒ කොටසට සිනා වීමට පවා ඔවුනට මතක් වූවේ බොහෝ වේලවක් ගත වූ පසුව ය .

" අනේ ජෝර්ජ් . උබේ ඔය ඔලු ගෙඩියට මේ වගේ අදහස් කොහෙන් එනව ද කියල මන් දන්නෙ නෑ . ඒ වුනත් දැං නම් උන් ඇත්තේ භූමි තෙල් වැටුණු නයි වගේ කේන්තියෙන්. අනේ ඇත්තමයි ජෝර්ජ් දැං නම් මට මං ගියාට වඩා ඔයා ගිය එක හොඳයි කියලත් හිතෙනවා .මට කවදවත් ඔය තරම් සාර්ථක විදිහට ඔය වැඩේ කරන්න පුලුවන් වෙයි

sinhalaebooks.com



කියලා මම හිතන්නේ නෑ . මුලින් ම උන්ගේ බෝට්ටුව ගහගෙන යන්න සැලැස්සුවා . ඊට පස්සේ උබ අර වූ කාරයාව මුහුදට තල්ලු කළා . ඊට පස්සෙ ටිමී අනිත් මිනිහව මුහුදට වැටෙන කල් බිරුවා. අපි දැන් මේක පොලීසියට කියමු ද ?'

" මේ මහ රෑ පොලීසියට කරදර කරන්න ඕන ද ? අර මිනිස්සු දෙන්නා අද ඔන්න ඔහේ ආසාවටත් එක්ක මගේ දූපතේ ගත කරපුවාවේ . හෙට උදේට පොලීසියට දන්වපුවා ම මදෑ"

ඒ අනුව ළමුන් තිදෙනා හොරුන් පොලීසියට හසු කොට දීමේ කටයුත්ත පසු දිනට කල් දැම්මා . ඇත්තටම මේ සෑම වීර ක්‍රියාවකට ම පසුව පුදුමාකාර වෙහෙසක් ජෝර්ජ්ට දැනෙනවා . ළමුන් තිදෙනා හනි හනික පා පැදිවලට නැගුනේ පෙරලා කඳවුර බලා පැමිනෙන බලාපොරොත්තුවෙන් . ටිමී වුනත් ආපහු ඒමේ ගමනට සූදානම් වෙලා ඉවරයි . මොන තරම් වෙහෙස මහන්සිය දැනුනත් උද්දාමයෙන් ප්‍රීතියෙන් සිටියත් මහාචාර්යතුමාගේ රහසි ගත ලිපි ගොනුව කොනොලිගේ බෝට්ටුවෙන් පිටතට ගන්නත් ජෝර්ජ් අමතක කළේ නෑ .

පාර දිගේ පාපැදි පදින සත්තකින් ම ළමුන් තුන්දෙනාට දූපතේ සීතලේ සිටින මිනිසුන් තිදෙනාව සිහියට නැගෙනවා .තවත් ටික වෙලාවකින් ඔවුන් නැවතත් කූඩාරම් කරා සේන්දු වුනා . කූඩාරමට කිට්ටු වෙන කොට ම කාරණා දැන ගැනීමේ බලා පොරොත්තුවෙන් පුල පුලා බලා සිටින ඈන් ව ඔවුනට හමු වුනා . ජෙනී පවා ඒ වන විට සිටියේ ඈන් සනසවීමේ අරමුණෙන් ඈන් සමගයි .



Scanned with CamScanner

sinhalaebooks.com



“ වැඩි විස්තර උදේට කියන්නම් .එතකන් සේරම කෙටියෙන් කියන්නම් . ජෝර්ජ් අපි යන කොටත් සේරම ප්‍රශ්න විසදලා ඉවරයි’ කියමින් පටන් ගත් කතාව බොහෝ දුර ඇදෙනු ඇතැයි ජුලියන් නම් යන්තමින් වත් සිතුවේ නෑ . එහෙත් වූ මහතා ගැනත් ජෝර්ජ්ගේ වික්‍රමය ගැනත් අකුරක් නෑර ඇන්ටත් ජෝර්ජ්ටත් විස්තර කිරීමට ඔහුට සිදු වුනා .

“ දෙවියනේ ජෝර්ජ් මේ සේරම තනියෙන් කරා කියලා මට නම් හිතා ගන්නවත් බෑ . මේ කෙල්ල නම් නාහෙට අහන් නැති බය කියන එක චුට්ටක්වත් ගෑවිලා නැති හරිම දක්ෂ කෙල්ලෙක් .දැං ජෝර්ජ් පුතේ ඔයා නිදා ගන්න ඕන . ඔයාට හොදට ම මහන්සියි”

කතව අසා සිටි ජෙනී පුදුමයෙන් මහත් කර ගත් දෑසින් ජෝර්ජ්ට කිව්වේ ඒ විදිහටයි . ඉතිං තවත් නින්ද පමා කර ගන්නට ජෝර්ජ්ට වුවමනා වුනේ නෑ . කවුරු කවුරුත් ඉතා ඉක්මනින් නින්දට වැටුනා . ඒත් ඒ රාත්‍රිය පහන් වෙන තුරුත් ඩික් ජුලියන් අයියා මලෝ ජෝර්ගේ වික්‍රමය ගැන තොරතෝව්යක් නැතිව කරගෙන ගිය කතාව නැවතුනේ නෑ .කොහොම වුනත් ඔවුන්ට සිටින්නේ පුදුමාකාර ඥාති සහෝදරියක් බව නම් නොකියා ම බෑ .

“ ඔයාලා මිස්ටර් වූ ව දැක්ක ද ? එයා අතුරුදන් වෙලා . උදේ ඉදන් කූඩාරමේ නෑ . අනේ අහිංසක චාලි නිකන් සාන්කාවෙන් වගේ ඉන්නෙ’

DO NOT COPY

sinhalaebooks.com



උදෑසන ආහාර ගනිමින් හුන් ළමුන් දෙස ජනේලයෙන් එබී බලමින් ඒ වගේ කතාවක් කියන ලද්දේ ජෙරමි විසින් . ඒ අතර ජූලියන් වූ ට සිදු වූ දේ කියන්නට උත්සාහයක් ගත්තා .

" අපි නම් දන්නවා වූ මහත්තයා කොහේද ඉන්නේ කියලා .ආ ටින්කර මේ හදිස්සියේ උබ ඔය කොහේ යන්න ද හදන්නේ ?"

ජූලියන්ට උත්තර දීමට මොහොතක් වත් පමා වුනේ ටින්කර් නොවේ . ඔහු ජෙරම්මි ද කැටුව හැකි උපරිම වේගයෙන් චිම්පන්සි කූඩුවට දිව්වා .ඒ වන විටත් ඉහ අත බදගෙන වැලපෙමින් සිටින චාලි දකින විට ම ටින්කර්ට ඇති වන්නේ වචනයෙන් විස්තර කළ නොහැකි තරම් ශෝකයක් .

ජෙරමි සහ ටින්කර් එක හෙලා ම චාලිගේ කූඩුව ඇතුළට පිවිසුනා .වූ නැති සොවින් හඩා වැටෙනා චාලිගේ හිත හදන කටයුත්ත සත්තකින් ම පහසුවෙන් ලේසියෙන් කළ හැකි දෙයක් වුනේ නෑ . සීයා ජෙරමි කොහේදැයි සොයාගෙන චාලිගේ කූඩුව දෙසට පැමිණියේ ඒ වෙලාවේදියි . ළමුන් දෙදෙනා ම කූඩුව ඇතුළේ සිටිනු දැකීම ඔහු තුළ ඇති කළේ පුදුමයක් .

" වූ ට මොකද වුනේ කියලා මටත් හොයාගන්න බෑ ජෙරමි . කොහොම වුනත් දැං ඔයා ඔතනින් එළියට ඇවිල්ලා මා එක්ක ආවොත් හොදයි . ටින්කර්ට කැමති නම් චාලි එක්ක තව ටිකක් හිටියාට කමක් නෑ"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



ඒ අනුව අකමැත්තෙන් වුනත් සීයා සමග පිටවෙන්නට ජෙරමිට සිද්ද වුනා . අසනීපයෙන් , හාම්පුතා නැති විස්සෝපයෙන් ලතැවන වාලිගේ හිත හැදීමේ කටයුත්ත ටින්කර් බාර ගත්තා .

---

එක පාරට ම බිම දිගේ යන රොකට්ටුවක් වගේ වේගයෙන් නිවසට දිව එන ටින්කර් දැකීමෙන් ළමුන් පිරිසට ඇති වුනේ පුදුමයක් .

" මං දන්නවා කවුද කුලුනට ඇතුළු වුනේ කියලා . අන්තිමට මම ඒක හොය ගත්තා"

ටින්කර් කීවේ හති හෙලන අතරයි

" කවුද ?' කුතුහලයෙන් සිටි කවුරුත් ඇසුවේ එක් හඬින් .

" වාලි . අපිට ඒක මුලින් හිතුනේ නැත්තෙ ඇයි කියල මම දන්නෙ නෑ .ඒ වුනත් හිතන්න .ඌට ඕනම දේකට නගින්න පුලුවන් . අර වැල්වල එල්ලිලා නැගලා ගල් බිත්තියේ උඩට නැගලා ඌ කුළුනේ ජනේලෙන් කාමරේට පනින්න ඇති .ඒ කරලා දකින්න ලැබුණු සේරම පේපර්ස් අරගෙන පල්ලට රූටන්න ඇති"

" හරියට හරි . මම කිව්වේ මට ලිස්සන සද්දයක් ඇහුණා කියලා" ජෙනී කිව්වේ පුදුමාකාර සතුටකින් .

ඒ අතර ම ජූලියන් ද තවත් අදහසක් ඉදිරිපත් කළා .

DO NOT COPY

sinhalaebooks.com





Scanned with CamScanner

sinhalaebooks.com



" ජෙනී ඔයා කිව්වා නේද කවුරු හරි කතා කරනවාත් ඔයාට ඇහුණ කියල .අනිවාරෙන් ම ඒ තමයි වූ මහත්තයා චාලිට අණ දෙන සද්දෙ . අනේ පව් චාලි . ඌට කියන්න ඇති ජනේලෙන් ඇතුලට ගිහින් දකින්න හම්බෙන සේරම දේවල් අරගෙන එන්න කියල .මිස්ටර් වූ මුල ඉදල ම දැනගෙන ඉන්න ඇති ටින්කර්ගේ තාත්තා පරීක්ෂණ කටයුතු කරන්නේ අර කුළුණ උඩ තියෙන කාමරේ කියල"

" ඔව් ඒ වගේ ම එයාට ලේසියෙන් ම ලිපි ගොණු වගේ දේවල් අරගෙන එන්න උගන්වන්නත් පුළුවන්නේ .දැං නම් මට බලන් හිටියා වගේ කියන්න පුළුවන් චාලි මේ දේවල් කරේ කොහොමද කියලා .එයා උඩට ගිහින් සේරම අරන් එන්න උත්සහ කරන්න ඇති . ඒත් එයා දන්නවා සේරම අරගෙන එයාට බිමට බහින්න බෑ කියලා .ඉතින් එයා පුලුවන් තරම් කටේ තියාගෙන පල්ලට රූටන්න ඇති .පව් අසරණ චාලි . කවුද දෙයියනේ හිතන්නේ මේ වගේ දෙයක් කරන්න ඇත්තේ ඌ කියලා"

එහෙම කිව්වෙ ඩික් .ඒ අතරම එයා තවත් ප්‍රශනයක් එයට ම එකතු කළා . " ඒත් මට කියපන් ටින්කර් උඹට කොහොමද එක පාරට ම මෙ වැඩේ කරන්න ඇත්තේ චාලි කියන අදහස ඔලුවට ආවෙ කියලා"

ඇත්තට ම ඒ සම්බන්දයෙන් නම් ටින්කරට කියන්නට ලොකු කතාවක් තිබ්බා.

" ඒක වුනේ මෙහෙමයි . ඔයාලට මතකනේ අර ගිනි උදුන උඩ තිබ්බ ඔරලෝසුව . අද චාලි පොඩ්ඩක් සනසන්න කියලා මම ඌගේ කූඩුවට ගිය වෙලාවේ මට ඇහුණා ඔරලෝසුවේ කටු වැඩ කරන සද්දේ .ටිකක්

sinhalaebooks.com



හොයල බලද්දී පිදුරු ගොඩ අස්සේ තිබිලා මම ඔරලෝසුව හොයා ගත්තා . මට විස්වාසයි ඌ මේ අරුමෝසම් බාණ්ඩෙට පිස්සු වැටෙන්න ඇති . ඊට පස්සේ ඒක වූට නොදී හංගලා තියාගන්න ඇති . ඒ වැඩේ ඌට කටේ දාගෙන වුනත් කරන්න පුලුවන් . කවුරු හරි කූඩුව සුද්ද කරන්න එනකොට ඌ ඒ ඔරලෝසුව කටේ දාගන්න ඇති . අනික මම ඔරලෝසුව ගන්න හදද්දිත් ඌ මට ගෙරෙව්වා.ආ තව එකක් ඊයේ ඌ ඇදපු අංක ජුලියන්ට මතක ඇතිනේ .ඉතිං අතින් ඒ වගේ දේවල් කරන්න පුලුවන් වාලිට ඔරලෝසුව කරකවලා වයින් කරන එකත් කජ්ජක් නෙමේනේ. මොන දේ කලත් මට ඌ ගැන හරි දුකයි . දැං වූ නැති එකෙන් වාලි ඉන්නේ හරි හිතේ අවුලකින්”

“ අබිරහස සම්පූර්ණෙන් ම විසඳුනු එකේ දැන් අපි පොලීසියට කතා කරලා මේවා පිළිවෙලක් කරන එක හොඳයි” ටින්කර්ගේ කතාව අවසානයේ ජුලියන් කිව්වා . “ වූ මහත්තයා මිනිහගේ මැර යාලුවත් එක්ක දූපතේ කොටු වෙලා ඉන්න නිසා ඌ ව අල්ල ගන්න පොලීසියට අමාරුවක් වෙන එකක් නෑ .ඔයාල හිතන්නකෝ වූ වාලි ව මේ විදිහට හොරකම් කීයකට නම් පාවිච්චි කරන්න ඇත්ද ? ගොඩක් ගෙවල්වලට වාලිව යවන්න ඇති”

“ ඒක ඇත්ත . සර්කස් එක යන යන පළාත්වල සොරකම් වෙන්න ඇති සෑහෙන්න . අහිංසක මිනිස්සු සෑහෙන දෙනෙක් නිකන් ඉඳලා ඒවට අහුවෙන්නත් ඇති”

ජෙනී කිව්වෙ දැඩි සේ කලකිරුණු හඬකිනි .

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



" වූ මහත්තයා පොලීසියෙන් අල්ලා ගත්තට පස්සේ අසරණ චාලිට මොනව වෙයි ද ?"

ඈන්ගේ ඒ ප්‍රශ්නයට පිළිතුරක් තිබුණේ ටින්කර් ළඟ ය .

" ජෙරමි එයාව අයිති කර ගනී කියල මට සහතිකයි . ජෙරමි චාලිට ආදරෙයි . චාලිත් ජෙරමිට කැමතියි . ඉතිං සීයයි ජෙරමියි ඉන්න කොට චාලිට දුකින් ඉන්න හේතුවක් නෑනේ'

" හරි ටින්කර් දැං ඔයා තාත්තට මේ හැම දෙයක් ම කියන්න ඕනි . එයා කොච්චර බිසී වුනත් මේ වෙලාවෙ නම් එයා පොලීසියට කතා කරන්න ම ඕනි . ඒ වගේ ම ජෝර්ජ් ඔයත් එයාට මුලු කතාව ම විස්තර කරලා කියන්න . ඉතිං අන්තිමේ මිස්ටර් වූ කරපු අපරාද වලට වන්දි ගෙවන්නයි හදන්නේ"

ජෙනී එහෙම කියලා ඉවර වෙනවත් එක්ක ම ටින්කර් කන්දක් නගින මෝටර් රථයක් බවට පත් වුනා .ගේ දෙදරවන තරම් ශද්දයක් නගා ගනිමින් ඔහු තාත්තාගේ කාමරය දෙසට දුවන්නට පටන් ගත්තේ මිස්චීෆ්වත් උරයේ තබාගෙනයි . ටින්කර්ගේ විකාර හැසිරීමෙන් කෝපයට පත් මහාචාර්‍ය තුමා ඔහුගේ කතාවට සවන් දීම ප්‍රතික්ශේප කරනු ඇතැයි බියක් ළමුන් තුළ මෙන් ම ජෙනී තුළත් ඇති වුනා . ඒ වුනත් පූරුවේ වාසනාවකට දෝ එවන් දෙයක් නම් සිදු වුනේ නෑ .

මහචාර්‍යතුමා ටින්කර්ගේ කතාව අසා සිටින හඬ ඔවුනට ඇසුනා . ඊ ළඟට ජෙනී කියා සිටියේ එතුමා පොලිස් ස්ථානයට දුරකතන ඇමතුමක් ගන්නා හඬ තමාට ඇසෙන බවයි .

DO NOT COPY

sinhalaebooks.com



" තවත් වීරක්‍රියවක අවසානය ." ජෝර්ජ් ගැඹුරු හුස්මක් හෙලන ගමන් කිව්වා . " මේකත් ගොඩක් ත්‍රාසජනක උද්වේගකර එකක් වුනානේ . ටින්කර් ඔයාගේ දක්ෂකම නිසා තමා අර ඔරලොසුව චාලිගේ කූඩුවේ තිබිලා හොයාගන්නට හම්බුනේ .අන්තිමට ලොකුම අබිරහස විසඳලා තියෙන්නේ අපි කවුරුවත් නෙමේ ඔයයි . චාලි ඔරලෝසුව ගත්ත බව වූ දැනගන හිටියා නම් කීයටවත් ඌට ඒක තියා ගන්න නම් ඉඩ තියන්නේ නෑ . පව් අහින්සක චාලි"

" මට නිකන් නිකමට හිතෙනවා චාලි මට තියාගන්න පුලුවන් ද කියලා තාත්තගෙන් අහල බලන්න ."

බලාපොරොත්තුවේ දැස් දල්වා ගනිමින් ටින්කර් එසේ කීවත් ජෙනීගෙන් නම් ඊට ලැබුණේ ඒ තරම් ප්‍රියමනාප පිළිතුරක් නෙමෙයි . ඇත්ත වශයෙන් ම ටින්කර් ඒ කතාව කියන කොට ම ඇයට කෑ ගැස්සුනා .

" බුදු අම්මෝ ටින්කර් . ඔයා තාත්තගෙ ඔලුවට ඒ අදහස දැම්මොත් නම් මං එක විනාඩියක් මේ ගෙදර ඉන්නේ නෑ . මම ආයෙ කවදාවත් ම එන්නෙත් නෑ .චිම්පන්සියා මිස්චීෆ් එක්ක එකතු වෙලා කුස්සියේ යකා නටයි . එක පාරට ම දත් තිස් දෙකම එළියට දාගෙන කුස්සියට එබෙයි . කබඩ් අදියි . කෑම බීම හොරකම් කරයි . බුදු අම්මෝ මට නම් ..."

" හරි හරි ජෙනී .. මම ඇත්තට ම තාත්ත ගෙ ඔලුවට ඒ වගේ අදහසක් දාන්න යන්නේ නෑ . මම චිම්පන්සියාට වඩා ඔයාට ටිකක් ආදරෙයිනේ

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



.. ඒත් ඉතින් හිතන්නකෝ මේ මිස්චීෆ්ට චාලි කොයි තරම් හොඳ යාලුවෙක් වෙයි ද කියලා ..''

" අනේ අනේ මේ ටින්කර් . මම නම් මුං දෙන්නාගේ යාලු මිත්‍රකම් ගැන හිතන්න යන්නේ නෑ . ඒ වගේ ම ඔයාගේ ඔය බටර් පාරවල් වලට මාව අහු කරගන්නත් බෑ"

සිනා වෙමින් ම බොරු අමනාපී මුහුණක් මවා ගනිමින් ඊ ජෙනී තවදුරටත් මෙහෙමත් ටින්කර්ට කිව්වා .

" චාලි ගැන හිතන්න කලින් ඔය මිස් චීෆ්ට පොඩ්ඩක් සිරිත් විරිත් ගැන උගන්නවන්න බලන්න . ඔය දැනට ම ඌ ජෑම් බෝතලේ එල්ලිලා අහුරු පිටින් මූනේ උලා ගන්නවා . බලන්ඩ ඌගේ මූනත් ජෑම් අලෝගෙන . අයියෝ මේක නම් මාර සතියක් තමයි . චිම්පන්සියොයි , වදුරොයි , ළමයිනුයි , හොරුයි , ඇයි ජෝර්ගේ හදිසි අතුරුදන් වීමයි ... මාර සතියක් තමා මේක නම් .."

එහෙම කියා ගෙනම ජෙනී කුස්සිය දිහාවට ඇවිදගෙන ගියා . ඈ නොපෙනී ගිය පසුව ජෝර්ට ඈ ගැනත් කියන්නට යමක් තිබුණා .

" අනේ පව් හිත හොඳ ජෙනී . එයා අපි නිසා කොයි තරම් වද වුනා ද ? ඒ වුනට අපි කට්ටිය එකතු වෙලා මේ ගත කරපු දවස දෙක තුන නම් ජීවිතේට ම අමතක වෙන එකක් නෑ . අපි ඔක්කොම ගොඩාක් සතුටු වුනානේ .. හා නැද්ද ? මම නම් හැම විනාඩියක් ම හිටියේ සතුටින්"

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



අපිත් එහෙම ම තමයි ජෝර්ජ් . සත්තකින් ම ඔයාලා පස් දෙනාගෙම වැඩවලින් අපිත් සතුටට පත් වුනු බව නම් නොකියා ම බෑ . ඉතිං සුබ අනාගතයක් හැමෝටම ම ..

***[ එනිඩ් බ්ලයිටන් විසින් ලියන ලද The Famous Five කතා මාලාව මෙතනින් අවසන් වෙනවා . පන් පසිඳුවන් ගේ 22 වන වික්‍රමය පාලු නගරයේ වික්‍රමය සමගින් හමුවෙමු ]***

DO NOT COPY

---

i

## අප විසින් සිංහලයට නගන ලද ෆේමස් ෆයිව් කතා මාලාවේ පෙළ ගැස්ම

01 නිධන් දූපත
02 පන් පසිඳුවන් තවත් අබිරහසක



Scanned with CamScanner

sinhalaebooks.com



03 පන් පසිඳුවන් සහ ස්ටික් අබිරහස
04 හොර බඩු කන්දේ අබිරහස
05 කැරවෑන් සවාරිය
06 අබිරහස් පරීක්ෂණය
07 භූත කෝච්චි අබිරහස
08 බකුසු කන්දේ අබිරහස
09 රතු කුලුනේ අබිරහස
10 අබිරහස් පණිවුඩ
11 ෆේ නයිට් බලකොටුවේ අබිරහස
12 මහ මුහුද යටින් ගමනක්
13 අබිරහස් කන්දක වික්‍රමය
14 ………………………
15 අබිරහස් නිම්නයේ වික්‍රමය
16 බිලිකොක් කන්දේ අබිරහස
17 සීත හිමේ අබිරහසක්
18 ෆිනිස්ටන් ගොවිපලේ වික්‍රමය
19 පන් පසිඳුවන් සහ යක්ෂයාගේ නවාතැන
20 තහනම් දූපතේ අබිරහස
21 අවසන් වික්‍රමය
22 පාලු නිම්නයේ අබිරහස
23 පාසැලේ අබිරහස
24 පන් පසිඳු රහස් පරීක්ෂකයෝ

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



25 මළ මිනිසුන්ගේ දූපත
26 අඳුරු රැයේ නිදන් සොයා
27 පන් පසිඳුවන් සහ ගිනි කඳු සවාරිය

DO NOT COPY



Scanned with CamScanner

sinhalaebooks.com



පාලු නගරයේ අබිරහස

පාලුවට ගිය නගරයක නිවාඩුවක් ගත කිරීමට යන ජුලියන් ඈන් ඩික් ජෝර්ජ් හදිසියේ අතුරු දන් වන ටිමියා සොයා නගරය සෙවීමකට බඳුන් කර යි . ටිමියා සොයා යන ඈන් ඊ ළගට සොයා ගත නො හැකි වීමත් සමග ඔවුන් නොසිතූ විරූ කරදරයකට ලක් වෙයි .

“ ඔය කියන ගෙදරින් මට රෑ දොළහට විතර මහ විලාපයක් ඇහුණා ’ ස්මිත් නෝනා කීවේ භීතියට පත් හඬිනි . “ තරුන ගෑණු ළමයෙක් බෙරිහන් දෙන සද්දෙ කියල තමයි මටත් ඒ වෙලාවෙ හිතුනෙ”

“ හරි හරී ජුලියන්’ ඈන් අයියා දිහා බැලුවේ සිනා පිරි මුහුණිනි . “ දැං ඉතිං අපි ලොකුයි තමයි .ඒ වුනත් මට තාමත් මහ රෑට හීනෙන් ඒ බයානක මූන පේනවා .අනේ උඹ මාව අල්ලගන ගියොත් විනාඩියක් වත් යන්න කළින් මාව බේර ගන්න”

DO NOT COPY



Scanned with CamScanner




Scanned with CamScanner